# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2016 පෙබරවාරි 09** වන අඟහරුවාදා
2016 மாசி 09 செவ்வாய்க் கிழமை
Tuesday 09th February 2016

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை .ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.40 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.40 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.40 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு .தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# නිවේදන
ANNOUNCEMENTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යවරයා ලෙස ගරු ඇම්. සුමිත් ලාල් මැන්දිස් මැතිතුමාව 2016.02.08 දින බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පත් කර ඇති බව ආණ්ඩුකාර ලේකම් කාර්යාලයෙන් 2016.02.08 දිනැතිව ලිඛිත දැනුම් දීමක් සහා ලේකම්තුමා වෙත එවා ඇති බව කාරුණිකව දැනුම් දෙනවා."*

විශේෂයෙන් එතුමා අපේ පළාත් සභාවේ සිටින ජ්‍යෙෂ්ටතම මන්ත්‍රීවරයෙක්. මට මතක හැටියට එතුමා 1999 දී තමයි පළාත් සභාවට සම්බන්ධ වුණේ. ඊට පෙරාතුව එතුමා නාගරික මන්ත්‍රීවරයෙකු වශයෙන් කළුතර නගර සභාවේත් සේවය කර තිබෙනවා. ඒ නිසා අත්දැකීම් සපිරි ගරු මන්ත්‍රීවරයෙක්. දේශපාලඥයෙක්. ඒ නිසා මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මගේ සහ බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා, අනෙකුත් අමාත්‍යවරුන්ගේ, විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගේ සුභ පැතුම් මම මේ අවස්ථාවේදී එක් කරනවා.

*ii*

*"පසුගිය සභා රැස්වීමේදී නිවේදනය කළ පරිදි අද දින සිට ඉදිරියට පැවැත්වෙන සභා රැස්වීම් පෙ.ව. 9.30 සිට තේ විවේකයකින් තොරව පවත්වාගෙන යනු ලබන බව නැවතත් කාරුණිකව දැනුම් දෙනවා. භෝජනාගාරය පෙ.ව. 9.30 ට පෙර සිටම විවෘතව තැබීමට අවශ්‍ය පියවර ගෙන තිබෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා."*

ඉන් අදහස් කරන්නේ අද දින සිට මින් ඉදිරියට අපේ මේ පළාත් සභාවේ උදෑසන තේ විවේකය සඳහා කාලය වෙන් කිරීමක් කරන්නේ නැහැ. පළාත් සභාව උදෑසන 9.30 ට ආරම්භ වුණු මොහොතේ පටන් අවසන් වන මොහොත දක්වාම පළාත් සභාව, එක දිගට පවත්වාගෙන යනවා.

ඒ වාගේම තවත් විශේෂ නිවේදනයක් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමන්ලාගේ වාහන පිළිබඳව ප්‍රශ්නයක් මට යොමු වෙලා තිබෙනවා. ගියවර පළාත් සභා වාරයේත් අපේ හරිස්චන්ද්‍ර කොස්තා ගරු මන්ත්‍රීතුමාගේ රථයේ පැති කණ්නාඩි දෙක කවුරු හරි ගලවාගෙන තිබෙනවා. මේක බරපතළ ප්‍රශ්නයක්. මොකද, වාහන නවත්වන්න අපට තවම ඉඩකඩ නැහැ. අපේ අලුත් සභා සංකීර්ණය හදන තෙක් අපට ඒ සඳහා පහසුකම් ලබා දෙන්න ක්‍රමයක් නැහැ. බොහෝ මන්ත්‍රීවරු වාහන නවත්වන්නේ ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත දෙපස. ඒ නිසා පොලීසියට ආරක්ෂාව දෙන්න කිව්වාමත් ප්‍රශ්නයක්. මොකද, වාහනයට එක එක්කෙනා දාන්නත් බැහැ. ඒ නිසා මම විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා, අඩු වශයෙන් සභාව තිබෙන දවසටවත් ඔබතුමන්ලා රියැදුරෙකු සමඟ පැමිණෙන්න. එතකොට ඒ රියැදුරාට පුළුවන් වාහනය බලාගන්න. නැත්නම් අපට -

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

අපේ ආරක්ෂාව අපි බලාගන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙමයි. ඒක තමයි වෙන්න ඕනෑ. නැත්නම් ගරු මන්ත්‍රීතුමා මේක කරන්න අමාරුයි, අපේ සභා ගොඩනැගිල්ල හදන තෙක්. ඒ නිසා මම ගරු ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා, සභා රැස්වීම පැවැත්වෙන දිනට විතරක් රියදුරු මහතෙකුගේ සේවය ලබා ගන්න. එහෙම වුණොත් මේ ප්‍රශ්නය බොහෝ දුරට අවම කර ගන්න අපට හැකියාව ලැබෙනවා.

## කාරක සභා වාර්තා
COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා රැස්වීම් වාර්තා මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

i. 2015.12.07 දින පැවති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.

ii. 2015.12.08 වන දින පැවති අවදි කාරක සභා රැස්වීම් වාර්තාව හා

iii. 2016.01.20 දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*The Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

## පෙත්සම්
PETITIONS

**ගරු නන්දන පත්මකුමාර**
Hon. Nandana Pathmakumara

ගරු සභාපතිතුමනි, පයාගල, හල්කඳවිල හි පදිංචි පී.බී.කේ. කළුතරගේ යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු කාමල් කුරුප්පු**
Hon. Kamal Kuruppu

ගරු සභාපතිතුමනි, ගම්පහ, අස්ගිරිය, බණ්ඩාරනායක පාර, 176 හි පදිංචි ගාමිණී ධර්මසිරි සුදුගල යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. කළුතර දකුණ, පරණ පාර, අංක 129/3 හි පදිංචි ශ්‍රියානි වික්‍රමාරච්චි යන අයගේ පෙත්සම සහ

ii. මතුගම, වැල්කන්දල, අංක 269/1 හි පදිංචි එච්.වී. දයානන්ද ගුණසිංහ යන අයගේ පෙත්සම.

**ගරු කීර්ති කාරියවසම්**
Hon. Keerthi Kariyawasam

ගරු සභාපතිතුමනි, මොරපිටිය, ගල්පොත්ත විද්‍යාලයේ පී.ඩී. දිස්නා චතුරානි ද සිල්වා මහත්මියගේ පෙත්සම ඉදිරිපත් කරනවා.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්න අංක 01 යටතේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ අමාත්‍යතුමාට ප්‍රශ්නය යොමු කිරීමේ අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැහැ. ගරු ඇමතිතුමා, පිළිතුර සභාගත කරන්න.

**ගරු ලලිත් වනිගරත්න** (ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදි කිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Lalith Wanigarathne (Minister of Fisheries, Roads, Transport, Cooperative Development and Trade, Housing and Construction, Estate Sector Infrastructure Facilities, Industries and Rural Development)

ගරු සභාපතිතුමනි, පිළිතුර සභාගත කරනවා.

*** [සභාගත කරන ලද පිළිතුරු]**
*[Tabled Answer]*

*ප්‍රශ්නය :*

*අ. බස්නාහිර පළාත් සමූපකාර අමාත්‍යාංශය විසින් 2011 වසරේදී රුපියල් ලක්ෂ පනස් අටක් (රු. 5,800,000/-) වියදම් කර බොරලැස්ගමුව එගොඩවත්ත ප්‍රදේශයේ සමූපකාර ගොඩනැගිල්ලක් වසර 4 ක් තිස්සේ ඉදිකරමින් තිබේද?*

*පිළිතුර :*

*අ. සී/ස මහරගම විවිධ සේවා සමූපකාර සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර එගොඩවත්ත ප්‍රදේශයේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කර ඇත. ඒ සඳහා බස්නාහිර පළාත් සමූපකාර අමාත්‍යාංශයෙන් ලක්ෂ 58 ක මුදලක් ලැබී නැත. මේ වන තෙක් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර නැත.*

*ප්‍රශ්නය :*

*ආ. මෙම ඉදිකිරීම අතරමග නවතා දැමීමට හේතුව කුමක්ද?*

*පිළිතුර :*

*ආ. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබී තීරණය මත මිල ගණන් කැඳවා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ කොන්ත්‍රාත්කරු වෙත ඉදිකිරීම් කටයුතු භාර දී ඇති අතර ඔහු විසින් පළමු මහළ දක්වා වූ ඉදිකිරීම් කටයුතු නිම කිරීමෙන් අනතුරුව, සම්පූර්ණ ඉදිකිරීම් කටයුතු අවසන් නොකර අතරමග නතර කර ඇත. එයට හේතුව වශයෙන් ඔහු වාචිකව දන්වා ඇත්තේ, වර්තමානයේ අමුද්‍රව්‍ය මිල ඉහළ ගොස් ඇති බැවින් ඉදිරිපත් කර ඇති මිල ගණන් යටතේ ඉදිකිරීම් කටයුතු අවසන් කළ නොහැකි බවයි.*

*ප්‍රශ්නය :*

*ඇ. මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය ඉතිරි මුදල කොපමණද?*

*පිළිතුර :*

*ඇ. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත්තේ 2011 වසරේ පැවති මිල ගණන් අනුව ය. දැනට වසර 05 ක පමණ කාලයක් ගත වී ඇති බැවින් නව මිල ගණන් යටතේ කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව අවශ්‍ය මුදල කොපමණද යන්න ඉදිරිපත් කළ හැකිය.*

*ප්‍රශ්නය :*

*ඈ. එම ඉතිරි මුදල ලබා දෙන්නේ කවදාද?*

*පිළිතුර :*

*ඈ. ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.*

*ප්‍රශ්නය :*

*ඉ. සමූපකාර ප්‍රාදේශික ගොඩනැගිල්ලක් ඉදිකිරීමට මෙවැනි මුදලක් වියදම් කර ඇත්තේ බස්නාහිර පළාතේ සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක බව ඔබතුමා දන්නවාද?*

*පිළිතුර :*

*ඉ. පර්චස් 03 ක බිම් ප්‍රමාණයක් සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් සමිතියට පවරා ඇත.*

*ප්‍රශ්නය :*

*ඊ. මෙවැනි නාගරික ප්‍රදේශයක සමූපකාර ප්‍රාදේශිකයක් පිහිටුවීමෙන් සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකි යැයි ඔබතුමා විශ්වාස කරන්නේද?*

*පිළිතුර :*

*ඊ. ඔව්.*

**02.**

**ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/16/(02)**

අ. හොරණ අධ්‍යාපන කලාපයේ බුලත්සිංහල කොට්ඨාශයේ පහල නාරගල ශ්‍රී සාරානන්ද ප්‍රාථමික විද්‍යාලය නම් පාසලක් තිබෙන බව ඔබතුමා දන්නෙහිද?

ආ. එම පාසලෙහි 2012 වසරේ සිටි ළමුන් සංඛ්‍යාව කොපමණද?

ඇ. 2016 වර්ෂයේ ළමුන් සංඛ්‍යාව කොපමණද?

ඈ. 2015 වර්ෂයේ පහ වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි ළමුන් සංඛ්‍යාව කොපමණද?

i. එයින් සමත් සංඛ්‍යාව කොපමණද?

ii. වැඩිම ලකුණු කීයද?

iii. අඩුම ලකුණු කීයද?

ඉ. එසේනම් ශිෂ්‍යත්ව ලකුණු ප්‍රතිශතය අනුව පාසල සමස්ත ශ්‍රී ලංකාවෙන්ම කුමන ස්ථානයේ පසුවන්නේද?

i. බස්නාහිර පළාතෙන් හිමි ස්ථානය කුමක්ද?

ii. කළුතර දිස්ත්‍රික්කයෙන් හිමි ස්ථානය කුමක්ද?

iii. හොරණ කලාපයෙන් හිමි ස්ථානය කුමක්ද?

ඊ. ප්‍රතිශතයක් ලෙස අධ්‍යාපන තත්ත්වය උසස් මට්ටමක පවතින බව පෙන්නුම් කරන්නේ නම් එම පාසල කිසිදු ස්ථානයකදී හෝ ආයතනයකදී ඇගයීමකට ලක් නොකරන්නේ මන්ද?

උ. ප්‍රදේශයේ ජනප්‍රිය පාසලක් බවට පත්ව ඇති මෙම පාසලේ ගොඩනැගිලි අවශ්‍යතාවය පිළිබඳ ඔබතුමා කුමන පියවරක් ගන්නේද?

**ගරු රංජිත් සෝමවංශ** (අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමා)

Hon. Ranjith Somawansa (Minister of Education, Cultural and Arts Affairs, Sports and Youth Affairs and Information Technology.)

අ. ඔව්.

ආ. 08.

ඇ. 106

ඈ. 12

i. 07

ii. 181

iii. 122

ඉ. සිසුන් 20 ට අඩුවෙන් ඉදිරිපත් කළ පාසල්වලින් සිව්වන ස්ථානය.

i. සිසුන් 20 ට අඩුවෙන් ඉදිරිපත් කළ පාසල්වලින් පළමු වන ස්ථානය.

ii. සිසුන් 20 ට අඩුවෙන් ඉදිරිපත් කළ පාසල්වලින් පළමු වන ස්ථානය.

iii. සිසුන් 20 ට අඩුවෙන් ඉදිරිපත් කළ පාසල්වලින් පළමු වන ස්ථානය.

ඊ. බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව අන්තර් දෙපාර්තමේන්තු ඵලදායිතා තරගයේදී 2014 වර්ෂයේ ජාතික ඵලදායිතා සම්මාන උළෙල විශිෂ්ට කුසලතා සහතිකයක් හිමි කර ගෙන ඇත.

ඉහළ පාසල් සාධන දර්ශකයක් දක්වා ඇති හොරණ කලාපයේ සියලු පාසල් සහ ඉහළ දක්ෂතා දක්වන ලද සිසුන් ඇගයීම සඳහා හොරණ කලාපයේ ප්‍රාථමික අධ්‍යාපන අංශය මඟින් කටයුතු සංවිධානය කර ඇත. එම උත්සවය 2016 පෙබරවාරි මුල් සතිය තුළ බප/හෝ/ඉංගිරිය ශ්‍රී සුමනජෝති ප්‍රාථමික විද්‍යාලයේදී පැවැත්වීමට නියමිතය.

2015 ශිෂ්‍යත්ව ප්‍රතිඵල නිකුත් කළ විට ලැබුණු තොරතුරු අනුව කලාපයේ විදුහල්පති රැස්වීමේදී ඉතා ඉහළ ප්‍රතිඵල දක්වා ඇති බප/හො/පහළ නාරගල ශ්‍රී සාරානන්ද ප්‍රාථමික විද්‍යාලය සහ එවැනි අනෙකුත් සියලුම පාසල් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමියගේ ඇගයීමට ලක් වූ අතර කලාපීය ඇගයීම් උළෙලේදී ඉහළ අධ්‍යාපන තත්ත්වයක් පවතින පාසල් ඇගයීමට අපේක්ෂිත ය.

එමෙන්ම මෙම වර්ෂයේදී පද්ධතියට විශිෂ්ට සේවාවක් සිදු කළ විදුහල්පතිවරුන් හා ගුරුභවතුන් ඇගයීමට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මට්ටමින් වැඩ පිළිවෙළක් සකස් කිරීමට උපදෙස් දී ඇත.

උ. දැනට ඉදි වෙමින් පවතින දෙමහල් ගොඩනැගිල්ලේ වැඩ අවසන් කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

**03.**

**කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/16/(02)**

අ. බස්නාහිර පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල කොපමණ ප්‍රමාණයක් තිබේද?

ආ. එම අධ්‍යාපන කලාප සඳහා 2016 වර්ෂයට අධීක්ෂණ මන්ත්‍රීවරු පත් කර තිබේද?

ඇ. එසේ පත් කර තිබේ නම් ඒ ඒ කලාප සඳහා පත් කර ඇති මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනයක් සභාගත කරන්නේද?

ඈ. කලාප කාර්යාලවලට අධීක්ෂණ මන්ත්‍රීවරුන් පත් කරන්නේ කුමන පදනමක් මතද?

ඉ. එසේ පත් කළ අධීක්ෂණ මන්ත්‍රීවරුන්ට පවරා ඇති කාර්යභාරය කුමක්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අ. 11.

ආ. නැත.

ඇ. අදාළ නොවේ.

ඈ. අදාළ නොවේ.

ඉ. අදාළ නොවේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා විසින් 2 (ආ) ට උත්තරයක් දීලා තිබෙනවා. පත් කර තිබේද කියලා ඇහුවාම නැහැයි කියනවා. ගරු සභාපතිතුමනි, සියලුම කලාප කාර්යාලවල අපි උත්සවවලට සම්බන්ධ වුණාම, ඒ උත්සවවලදී ඒ ඒ විෂය භාර නිලධාරීන් විසින් ප්‍රකාශයට පත් කරනවා, අහවල් මන්ත්‍රීවරයා කලාප අධීක්ෂණ මන්ත්‍රීවරුන් හැටියට පත් කරලා තිබෙනවාය කියලා. ගරු සභාපතිතුමනි, ඒක ලොකු අසාධාරණයක්. මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ඇමතිතුමාට යොමු කරන්න කැමැතියි. සියලුම කලාප කාර්යාලවලට ඔබතුමා යම්කිසි ලිපියකින් හෝ යම්කිසි දෙයකින් දැනුවත් කිරීමක් කරන්න එහෙම දෙයක් මේ බස්නාහිර පළාතේ 2016 වසරේ නැහැයි කියන එක. එහෙම දැනුම් දෙන්නය කියන එක ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු ඇමතිතුමාට යොමු කරනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

බොහොම ස්තුතියි. ගරු සභාපතිතුමනි, මේ අධීක්ෂණ මන්ත්‍රීවරු කියලා පත් වීමක් නැහැ. හැබැයි, ඉතින් ව්‍යුහ කමිටු තිබෙනවා. ඒ ඒ පළාත්වල මන්ත්‍රීවරු තම තමන්ගේ ප්‍රදේශයේ පාසල්වල අඩුපාඩු සොයන්න, අධීක්ෂණය කරන්න එහෙම යනවා. ඒක හොඳ දෙයක්. දැන් මෙතුමාත් යනවා. ගිහිල්ලා ඒ තොරතුරු වාර්තා කරනවා. එවැනි තැනකදී අධීක්ෂණ කියලා සමහර විට කථාබහ කරනවා ඇති. ලිඛිතව නම් අපට සඳහනක් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

උත්සවවලදී ප්‍රකාශ කරනවා. අපේ යසපාල කෝරළගේ ගරු නියෝජ්‍ය සභාපතිතුමායි මමයි දෙන්නාම එක උත්සවයකට ගියා. ආරාධනා පත්‍රයේත් සඳහන් කරනවා. අපි දෙන්නාම කථා කරලා තමයි මේ ප්‍රශ්නය දැම්මේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඒක හරි. ලොකු දෙයක් නොවෙයි, මේ මතු කළේ. සාමාන්‍ය දෙයක්. අපි ඔබතුමා කියන එකට එකඟයි. ප්‍රශ්නයක් නැහැ. ගරු සභාපතිතුමනි, අනික් එක තමයි මේ නැති දේකට ලියුම් යවන්න බැහැ. අද හවස කලාප රැස්වීමක් තිබෙනවා. මම එතැනදී මේක පැහැදිලි කරලා දෙන්නම්. ලියුම් යවන්න දෙයක් නැහැ. ඒගොල්ලෝ ඒක දැන ගන්න ඕනෑ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එහෙම උත්සවවලදී ප්‍රකාශ කර ඇත්නම් සහ ආරාධනා පත්‍රවල සටහන් කරලා තිබෙනවා නම් ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

දැන් අද හවස උපදෙස් දෙනවා, මීට පස්සේ එසේ සඳහන් කරන්න එපාය කියලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක හරි. මොකද, තුන්වැනි පරිච්ඡේදය අනුව තමයි අධ්‍යාපන විෂයෙහි බලතල අපට දීලා තිබෙන්නේ. මම ඒකයි ඇහුවේ. ඔබතුමා අදාළ නොවේ කියලා කියනවා. ඒ නිසා මේක ඇතුළේ තිබෙන ඒවාට පිටස්තර දෙයක් තමයි ඔය කරන්න යන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

නැහැ. ඉතින් පරණ දේවල් තවම හොල්මන් කරනවා. දන්නවා නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇයි? ගිය පළාත් සභාව කාලයේ එක්සත් ජාතික පක්ෂයෙනුත් පත් කළා නේ මන්ත්‍රීවරු අධීක්ෂණ මන්ත්‍රීවරු කියලා.

**ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumith Lal Mendis - Minister

ගරු සභාපතිතුමනි, සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා තමයි මේ අධීක්ෂණ මන්ත්‍රීකම් දුන්නේ. මටත් දුන්නා ලියුමක්. අධීක්ෂණ මන්ත්‍රීවරයා වශයෙන් පත් කරනවා. මෙපමණ දීමනාවක් දෙනවාය කියලා. ඒ ලිපිය, තවමත් තවත් ලිපියකින් අහෝසි කරලා නැහැ. ඒ නිසා තවම ඒ ලිපිය වලංගුයි. ඒකයි මම කියන්නේ. ඒ ලිපිය තවම මා ළඟ තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, රෙජිනෝල් කුරේ හිටපු මහ ඇමතිතුමාගේ කාලයේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන්ට - ලෝරන්ස් මාදිවල ගරු මන්ත්‍රීතුමාට දුන්නා. සිරිකමල් පිලීෂියන් ගරු මන්ත්‍රීතුමාට දුන්නා. අධීක්ෂණ මන්ත්‍රීකම් ඔක්කෝටම දීලා තිබෙනවා. (බාධා කිරීම්) මම කිව්වේ ඒ කාලේ දුන්නා නේ? මෙතුමා නැහැයි කියනවා.

**ගරු සේනක දමයන්ත ද සිල්වා**
Hon. Senaka Damayantha de Silva

ඒ කොට්ඨාශවල ආණ්ඩු පක්ෂයේ වෙනත් මන්ත්‍රීවරු හිටියේ නැත්නම් ඒ අයට දුන්නා. මටත් ලැබුණා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ. ආණ්ඩු පක්ෂයේ හිටියත් දුන්නා.

**ගරු සේනක දමයන්ත ද සිල්වා**
Hon. Senaka Damayantha de Silva

නැහැ. එහෙම දුන්නේ නැහැ. ආණ්ඩු පක්ෂයේ නැති නිසා අපට හම්බ වුණා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මම කියන්නේ, එක්සත් ජාතික පක්ෂයට දුන්නාය කියලා. එහෙම නැහැයි කියන්න බැහැ. එහෙම දීලා තිබෙනවා.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු සභාපතිතුමනි, දැන් මෙතුමා කියන විධියට ඒ පත්වීම කැන්සල් වෙලා නැත්නම් මුදල් ගෙවන්න ඕනෑ. තවම ඉන්නවා නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු සභාපතිතුමනි, මේ පළාත් සභාව කාලයේ කාටවත් දීලා නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ කාරණාව ගරු සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා මහ ඇමතිවරයා හැටියට කටයුතු කරපු කාලයේ තිබුණා. ඊට පස්සේ අපි ජනතා විමුක්ති පෙරමුණත් එක්ක පරිවාසයකට ගියා. ඊට පස්සේ මේ අධීක්ෂණකම නැති කරලා, ඒ කාලේ රු. 2000 ක් ගෙව්වා, ඉන්ධන වියදම් කියලා. මන්ත්‍රීවරු කොහොමත් අහිංසකයි. මේ ඉන්න මන්ත්‍රීවරුන් හුඟ දෙනෙකුට මුදල් නැහැ. අපි දන්නවා නේ? හරි අමාරුවෙන් මේගොල්ලෝ යන්නේ. මම ඒක දන්නවා. හැබැයි, රු. 2000/- ක් අර ඇවිදිනවාට ඉන්ධන වියදම හැටියට දුන්නා. එතකොට ඒකත් එක්ක අහෝසි වුණා. පරිවාස කාලයේ එකඟත්වයකට පත් වුණා. ඔය අධීක්ෂණ තනතුරු නැහැ. ගෙවීමක් නැහැයි කියලා. ඒක ඇත්ත. දැන් ඒක අපි ලිඛිතව දැනුම් දීලා නැහැ. දැන් මේ පරණ ඒවා ඇදලා වැඩක් නැහැ. අද හවසට මම දැනුම් දෙන්නම්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අපට කිසිම තැනක එහෙම එකක් දෙන්න බලයක් නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ඒ කාලේ ඕවා කිව්වේ නැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හැබැයි ඉතින්, කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විපක්ෂ නායකවරයා හැටියට ඉන්න කාලයේ මේවා ඇහුවේ නැහැ. ඒක අහන්න එපැයි විපක්ෂ නායකවරයා වෙලා ඉන්න කොට. දැන් තැන නැති වෙන කොට අහනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර අනවශ්‍ය විවාදවලට යන්න එපා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මම එකක් එතුමාට කියන්න ඕනෑ. මේ තැන ඇති නැති එක ගැන අපට කිසිම ප්‍රශ්නයක් නැහැ. අපට තිබෙන්නේ දැනුම ඇති තැන වැඩ කරන්න. ඒ නිසා පළාත් සභාවේ තුන්වන පරිච්ඡේදයේ තිබෙන බලය ඔබ පාවිච්චි කරන ආකාරයේ වැරැද්දක් පෙන්වා දීම, අපේ යුතුකමක්. ඒක නිවැරදි කිරීම විෂය භාර ඇමතිතුමාගේ වගකීමක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මෙහෙමයි. මේ ප්‍රශ්නයට ගොඩක් වෙලාව ගියා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මගේ කථාවෙන් අවසන් කරමු. මම ඕනෑම උත්සවයකට ගියාම මේ මොන තනතුරු ඇතත්, නැති වුණත් - කහටපිටිය මහත්තයායි අපි එකට ආපු අය. මේ තනතුරු අපි අතහැරලා දාලා යනවා. ඒක කෙළින් කියන්න ඕනෑ. අපි කිසි දේකට සැලෙන්නේ නැහැ. ඔය ශබ්ද වැඩක් නැහැ. ශබ්දවලට භයත් නැහැ. දාලා යනවා. හැබැයි, එකක් කියන්න ඕනෑ. අපි ගියාම, ජ්‍යෝෂ්ටත්වය සලකලා කිත්සිරි කටහපිටිය මහත්තයාගේ නම මම මුලින් කියනවා. අපි එහෙම කියනවා. පරණකමට එහෙම ගතියක් අපි ළඟ තවම තිබෙනවා. ඒ අපි හැදුණු පරිසය. අපි හිටපු විපක්ෂ නායක කියලත් කියනවා. එතුමා මේ අපි ගැන වරදවා හැඟීමක් ඇති කර ගෙන තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ගොඩක් වෙලා මේ ගැන කථා කළා. දැන් මේ ප්‍රශ්නය පිළිබඳව මගෙත් පුංචි අදහසක් තිබෙනවා. මොකද, මේ අධීක්ෂණ මන්ත්‍රීකම් මුලින්ම ඇති කළේ, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය. 1993 දී ඇති කළේ. මට මතකයි. ඉන් පස්සේ ගොඩක් ඇමතිවරු මේක ක්‍රියාත්මක කළා. නමුත් මට මතක හැටියට ප්‍රසන්න රණතුංග හිටපු මහ ඇමතිතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් ඉන්න කාලයේ තමයි මේ අධීක්ෂණ මන්ත්‍රීකම්වලට පත් නොකර සිටියේ. පත් කළේ නැහැ. ඊට පස්සේ එතුමා කලාප මට්ටමෙන් ව්‍යූහ කමිටු පත් කළා. ව්‍යූහ කමිටුවට ඒ ප්‍රදේශය නියෝජනය කරන ඕනෑම මන්ත්‍රීවරයෙකුට යන්න පුළුවන්. ඒකේ දේශපාලන ප්‍රශ්නයක් නැහැ. ඕනෑ කෙනෙකුට සහභාගී වෙලා අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. නමුත් ගරු ඇමතිතුමනි, මේ ව්‍යූහ කමිටුත් තවම හරියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මොකද, මේ ව්‍යූහ කමිටුවල නායකත්වය දරන්නේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා. මන්ත්‍රීතුමාට තැන දෙන්නේ නැහැ. ව්‍යූහ කමිටුව කියන්නේ, පළාතේ මන්ත්‍රීතුමන්ලාගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන කමිටුව. නමුත් ඒ කමිටුවේදී මහජන මන්ත්‍රීවරුන්ගේ අදහස් ප්‍රකාශ කරන්න විධියක් නැහැ. මොකද, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා තමයි තීන්දු අරන් ඒක ක්‍රියාත්මක කරන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, ඔය කාරණාව අපි පිළිගන්නවා. යම් තැනක විතරයි ඔහොම වෙන්නේ. මම හිතන්නේ, ඔබතුමා නියෝජනය කරන ප්‍රදේශයේ විතරයි. අපි ඒක පිළිගන්නවා. හැබැයි, අපි උපදෙස් දීලා තිබෙන්නේ, තනතුර සහ ජ්‍යෝෂ්ටත්වය දෙකම සලකා ප්‍රමුඛතාවය දෙන්න කියලා. සභාපතිකම දෙන්න කියලා. අද හවස රැස්වීමේදී අපි ඒක නිවැරදි කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බොහොම ස්තුතියි. ගරු ඇමතිතුමා, තවත් පුංචි පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවා. ගම්පහ කලාපයේ ඊයේ පෙරෙයිදා - මට ආපු පැමිණිල්ලක්. අශෝක දයාරත්න ගරු මන්ත්‍රීතුමා මට පැමිණිල්ලක් කළා. එදා දවසේ හැන්දෑවේ මට පැමිණිල්ලක් කළා. එතුමා සහභාගී වුණු ක්‍රීඩා උත්සවයකදී, එතුමා ඒ උත්සවයේ සිටියදී, ජාතික කොඩිය ඔසවලා තිබෙන්නේ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා. එතුමාව පැත්තකට දාලා තිබෙනවා. ඒ වාගේ සිද්ධි ඇති වෙනවා. (බාධා කිරීමක්) ඒ නිසා ඒ ගැන මම පොඩි පැහැදිලි කිරීමක් කළේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, අධ්‍යාපන ඇමතිතුමා කියනවා, ඔබතුමාගේ කොට්ඨාශයේ විතරයි වෙන්නේ කියලා. මම මේ අද ආරාධනා පත්‍ර තුනක් සභාගත කරනවා.[1] දැන් මීට ඉස්සෙල්ලා මේ සභාවේ, මම හිතන්නේ ජගත් මන්ත්‍රීතුමා හෝ සලෝචන මන්ත්‍රීතුමා කොළඹ දිස්ත්‍රික්කය ගැන කථා කළා. මීන් එකක් කළුතර අධ්‍යාපන කලාපයේ. මේ අනික හොරණ අධ්‍යාපන කලාපයේ. දැන් ඔය කියන කාරණයමයි. සභාවේ කථා කළත් නිවැරදි වෙන්නේ නැති තත්ත්වයක් තිබෙනවා. කථා කළාට වැඩක් නැහැ, නිවැරදි වෙන්නේ නැත්නම්. මේ ආරාධනා පත්‍රයට අනුව පානදුරේ ප්‍රධාන පාසලක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තිය වෙන්නේ - මහජන නියෝජිතයෝ ඉද්දී, මේකේ බැන්ඩ් ගහලා, ජාතික කොඩිය ඔසවලා සියලු දේවල් කරන්නේ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂිකාව. ඒ හොරණ කලාපයේ. මේකේත් ඒ විධියමයි. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂිකාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් පැහැදිලියි. ඔබතුමා ඔය ටික සභාගත කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේ අනික් එක. කෘෂිකර්ම ඇමතිතුමා. අද උදේ අපේ ගේ ළඟ කඩේකින් මගේ ආරාධනා පත්‍රය ගෙනත් තියලා ගිහිල්ලා. හෙට තිබෙන උත්සවයක් ගැන. කඩකාරයා මට කථා කරලා කියනවා, මන්ත්‍රීතුමාට ආරාධනා පත්‍රයක් තිබෙනවාය කියලා. හෙට තිබෙන උත්සවයක්. 2016.02.11 වන දින පෙ.ව. 9.20 ට යෙදෙන සුභ මොහොතින් ගරු ගාමිණී තිලකසිරි අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් විවෘත කිරීමට. මේ ගෙවල් ළඟ කඩේකින් ගෙනැත් තියලා ගිහිල්ලා මගේ ආරාධනා පත්‍රය. (බාධා කිරීම්)

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මම මගේ නිලධාරීන් වෙනුවෙන් සමාව ඉල්ලනවා. මොකද, ගෙදර පොඩි එකා අල්ලපු ගෙදර පොඩි එකාට ගැහුවාම තාත්තා සමාව ඉල්ලනවා. ඒක අපි අද හවස නිවැරදි කරනවා. හැබැයි, යකඩ මල්ලටත් ගුල්ලෝ ගහපු කතන්දර පළාත් සභාවේ තිබෙනවා. මෙවරත් තිබෙනවා. බුද්ධියෙන් කටයුතු කළොත් හොඳයි. මොකද, මම නිවැරදි තැනක ඉන්න කැමැතියි. මම අද හවස මේක නිවැරදි කරනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාට තිබෙන ඕනෑකම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

යකඩ පෙට්ටිය ගැන මම කියන්න යන්නේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඇමතිතුමාට ඕනෑකම තිබෙනවා. ඇමතිතුමා උත්සවවලදී අපට නිසි ගරුත්වය දෙනවා. හදවතින්ම කියන්නේ. එතුමා අපි ඉන්න උත්සවයක අපට නිසි ගරුත්වය දෙනවා. හැබැයි, ඔබතුමාගේ තිබෙන නිහතමානීකමයි, ඔබතුමාගේ තිබෙන ඒ පරිණතකම අනුව කලාප අධ්‍යක්ෂවරු දෙන්නා ඒ කටයුත්ත කරන්නේ නැහැ. ඔබතුමාවත් අභිබවා කටයුතු කරන්නයි ඒ දෙන්නාට ඕනෑකම තිබෙන්නේ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම අද හවස ඒක නිවැරදි කරනවා. අපේ නිහතමානීකම වැරදි විධියට තේරුම් ගත් අවස්ථා හරියට තිබෙනවා. ඉතින් මොකද කරන්නේ?

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් දිගින් දිගටම -

**ගරු අශෝක දයාරත්න**
Ashoka Dayarathne

ගරු සභාපතිතුමනි, ගම්පහ දිස්ත්‍රික්කයේ අපේ මන්ත්‍රීවරු ඉතාමත් අසහනයට පත් වෙලා තිබෙන්නේ. මොකද හේතුව, අපේ අධ්‍යාපන ඇමතිතුමාට කිව්වා, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා එක්ක ප්‍රශ්නයක් තිබෙනවාය කියලා. අපට මේක නිවැරදි කරලා දෙන්නය කියලා කිව්වා. දැන් ව්‍යුහ කමිටුවලට අපේ කවුරුවත් යන්නේ නැහැ. ඉතින් අපි කොහොමද වැඩ කරන්නේ? උත්සව සංවිධානය කරන්නේ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක. අපි එයා යටතේ ගිහිල්ලා ඉන්න ඕනෑ. එයා තමයි ජාතික කොඩිය ඔසවන්නේ. ඒ වාගේ එයාගේ ක්‍රියාකලාපය ඉතාමත්ම නින්දිතයි. මම හිතන්නේ, ඔබතුමාත් ඒ ගැන කිව්වා. නමුත් තවම සිද්ධ වුණේ නැහැ. අපි ව්‍යුහ කමිටුවට යන්න ඕනෑ නම්, අනිවාර්යයෙන්ම ගරු ඇමතිතුමනි, එතුමා සම්බන්ධව ඔබතුමා පියවරක් ගන්න.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න. ඔබතුමිය මොකක්ද දන්නේ නැහැ කථා කරන්න යන්නේ.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

මගේ වරප්‍රසාද ප්‍රශ්නයක්. සාවදානව පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමියට අවස්ථාව දෙන්නම්. අපි මේක ඉවර කරලා ඉමු. මේකට අදාළ නැහැ නේ? ඒ නිසා පසුව කාලය දෙන්නම්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට ජේනවා අතේ කාඩ්පතක්. මම ඔබතුමියටත් අදාළව උත්තර දෙන්නම්.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

විනාඩියක් දෙන්න. ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්න දෙකක් තිබෙනවා. පළමුවෙන්ම කියන්න ඕනෑ, කටාන ආසන සංවිධායක හැටියටත්, පළාත් සභා මන්ත්‍රීවරියක් හැටියටත් මම දැන් වසර ගණනාවක සිට කටයුතු කරනවා. එතකොට මේ තිඹිරිගස්කටුව දුටුගැමුණු මහා විද්‍යාලය. මේ දුටුගැමුණු මහා විද්‍යාලයේ ආරාධනා පත්‍රයක් අපට එවලා තිබෙනවා. ඇමතිවරියකගේ නමක් සහ අපේ ලලිත් වනිගරත්න ගරු ඇමතිතුමාගේ නම එක්කලා. ඊට පස්සේ තිබෙන්නේ විසුරුවා හැරපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උදාර සහ රෝහිත කියලා නම් දෙකක්. එතකොට මගේ කොට්ඨාශයේ ඉන්වා පළාත් සභාවේ මන්ත්‍රීවරු ඔක්කොම හත් දෙනෙක්. හය දෙනෙක් ඉන්නවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන. මේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන අයගේ නම් දාලත් නැහැ.

අපි නම් දැන් පළාත් සභාව හැටියට විපක්ෂය නියෝජනය කරනවා. මම එහේ සංවිධායක හැටියටවත් මගේ නම දාලා නැහැ. මේ පාසලට මගේ මූල්‍ය ප්‍රතිපාදන පවා මම ලබා දීලා තිබෙනවා. එතකොට මේ ගැන අපි කලින් දැනුවත් කළා. එතකොට මේ සමහරු හිතාගෙන ඉන්නේ, මේ රජයේ නිලධාරීන් තමන්ගේ බූදලයක් කියලා. තමන්ට ඕනෑ විධියට කටයුතු කරන්න, තමන්ගේ පිරිස වටේ තියා ගන්න, තමන්ගේ Business එක run කර ගන්න, ගාණ එකතු කර ගන්න තමුන්ගේ කට්ටිය විතරයි ගෙන්වන්නේ. අනික් අය ගෙන්වා ගත්තොත් මේවා දැන ගන්නවා. අනික් දවසේ මෙහෙම තිබුණොත් අපි උද්ඝෝෂණ කරනවා. වහාම එතැනට ගිහිල්ලා උද්ඝෝෂණයක් කරලා නතර කරනවා. නැත්නම් හූවක් හරි තියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාගත කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මගේ ප්‍රශ්නයටත් එක්කම ගරු ඇමතිතුමා උත්තර දෙන්න. ගරු සභාපතිතුමනි, මේ මාතෘකාවටත් ටිකක් අදාළයි. මම වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට මේක මතු කරන්නේ. මම හිතන්නේ, සභාවේ බොහෝ දෙනෙකුට අදාළ වෙයි. විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව සම්බන්ධයෙන් මට ගැටළුවක් තිබෙනවා. පසුගිය 19 වැනිදා උපදේශක කාරක සභාව කැඳෙව්වා. හැබැයි, අපට ලියුම් එව්වේ, ඒ වාගේම SMS පණිවුඩ ලැබුණේ 17 හෝ 16 වාගේ ආසන්න දිනයක. ඒ හරහා බරපතළ විධියට අපේ වරප්‍රසාද කඩ වෙනවා. ඒ වාගේම අපට මේ උපදේශක කාරක සභාව ඇතුළේ කරන්න තිබෙන මැදිහත්වීම් කරන්න නොහැකි වෙනවා. විශේෂයෙන්ම හෙට කියන කොට මේ වාගේ දේවල්වලට සහභාගී වෙන්න අපි අපේ කාල සටහන නිදහස් කරලා තියාගෙන ඉන්නේ නැහැ, ගරු සභාපතිතුමනි. ඒ නිසා අඩුම තරමින් සති දෙකකටවත් කලින් මේ උපදේශක කාරක සභාව - ඒ වාගේම එදාම උදේ ඒ ආසන්නම දිනයක තවත් රැස්වීමකට කථා කළා. රැස්වීම්වලට ක්ෂණිකව කථා කරනවා. හෙට කියලා එන්න කියනවා. ඒ වාගේ දේවල්වටල අපට සහභාගී වෙන්න බැහැ. ගරු සභාපතිතුමනි, ඒ නිසා කරුණාවෙන් ඉල්ලනවා. මේ වාගේ කටයුතු සඳහා පූර්ව දැනුම් දීමක් සහිතව, අඩුම තරමින් සති දෙකකටවත් පෙර පූර්ව දැනුම් දීම් කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, න්‍යාය පත්‍රයට කාලය මදි වන නිසා මම කෙටි උත්තරයක් දෙන්නම්. දැන් මේක වැඩි හොඳට කුල්ලේ ගොම ගැවා වාගේ කතන්දරය. මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමනි, මතක තියා ගන්න ඕනෑ. අපි එහෙම කැඳෙව්වේ අධ්‍යාපනයේ තිබුණු ගැටළු සාකච්ඡා කළ යුතු නිසාවෙන්. නැතිව වෙන කිසිම හේතුවක් නිසාවෙන් නොවෙයි. අපි නිසි පරිදි නිවැරදිවම මීට පස්සේ අදාළ දිනයටම කැඳවනවා. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. අපි හදිසියේ කැඳෙව්වේ, එවෙලේ මතු වෙලා තිබුණු පාසල්වල ගැටළු සාකච්ඡා කරන්න. නැතිව වෙන මුකුත් නොවෙයි. ගැටළු සාකච්ඡා කරන්න කැඳෙව්වේ.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉතින් අපට සහභාගී වෙන්න බැරි නම් ඒකේ තේරුමක් නැහැ නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පාසල් සඳහාම, අධ්‍යාපනය සඳහාම කැප වෙලා ඉන්න ඔබතුමාට ඕකට සහභාගී වෙන්න බැහැයි කියනවා නොවෙයි නේ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එහෙම නැහැ. මේක ඉවර වුණු ගමන් තව රැස්වීමක්. එහෙම සහභාගී වෙන්න බැහැ. ඒ නිසා තමයි -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හරි. අපි ඔබතුමාගේ නායකතුමාට මතක් කරන්නම් කෝ නිවැරදි දිනය. අපි දැන් නියමිත දිනයේදී මීට පස්සේ කැඳවනවා. ප්‍රශ්නයක් නැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Filician de Silva

න්‍යාය පත්‍රයට යන්න. ඔබතුමා කියන්න එදා නියමිතව තිබුණු න්‍යාය පත්‍රයේ එක වචනයක් කථා කළාද කියලා. එකක්වත් කථා කළේ නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා ගියාට පස්සේ කථා කළා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මෙහෙමයි. උගත් මන්ත්‍රීතුමන්ලා මේ ඉන්නේ. මම එතැන ඇමතිවරයා වුණාය කියලා ඒ මන්ත්‍රීතුමන්ලාගේ පුද්ගලික හැසිරීම් රටාව අනවශ්‍ය විධියට පාලනය කරන්න අවශ්‍ය වෙන්නේ නැහැයි කියලා මම අදත් විශ්වාස කරනවා. තම තමන් ස්වයං පාලනය වෙන්න දැන ගන්න ඕනෑ. තමන් එහෙම නරක විධියට මේ සභාවේ හැසිරෙනවා නම්, මම මොකක්ද කරන්නේ? ඒක නේ වැඩේ. මට නියෝග

දෙන්න පුළුවන්. නියෝග දෙන්න සුදුසු ආයතනයක් නොවෙයි. මේක ඇවිල්ලා බස්නාහිර පළාත් සභාව. මේක ඉස්කෝලයක් නම් කමක් නැහැ. පොඩි ළමයින් හදන තැනක් නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. දැන් ඒ ප්‍රශ්නය ඉවරයි.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, මම පෞද්ගලිකව එක අමාත්‍යාංශයක් පිළිබඳව නොවෙයි. පොදුවේ ගරු ඔබතුමාගේ වගකීම තමයි ගරු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද සහ ගෞරවය ආරක්ෂා වන පරිදි යම් යම් ක්‍රියාමාර්ග ගැනීම. ඒ නිසා කරුණාකරලා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් යටතේ හෝ වෙන යම් කාරණයක් යටතේ හෝ යම් යම් උත්සව අවස්ථාවලදී සහභාගී වීමේදී හෝ එසේ නැත්නම් යම් උත්සව අවස්ථාවකදී මේ මන්ත්‍රීවරුන්ට ධූරාවලියේ හිමි ස්ථානය පිළිබඳව පැහැදිලි කිරීමක් මේ සභාවේදී කරන්නය කියලා කරුණාකරලා ඉල්ලා සිටිනවා. නිලධාරීන් ඉදිරිපිට. ඒක අපට දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි. ඔබතුමාට ඒක මම ඉදිරිපත් කරනවා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඒක අපට දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ව්‍යුහ කමිටු සහ මේ වැඩ පිළිවෙළ හැදුවේ සංවිධායකතුමාගේ සම්පූර්ණ බලතල එතුමාට දීලා. අපේ ගරු අලුත් ඇමතිතුමා. එතුමාට සුභ පතනවා. එතුමාගේ වැඩ කටයුතු සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා. අපි සම්පූර්ණ සහයෝගය දෙනවා. එතුමාට තමයි බලය දුන්නේ. මම දැන් එතුමාට යළි ආරාධනා කරනවා, මේ Protocol එක, ධූරාවලිය නිවැරදි කරන්නය කියලා මම ආරාධනා කරනවා. අපි මේ සතිය තුළ මේක නිවැරදි කරලා දෙනවා.

**ගරු ජගත් පින්නගොඩ විතාන**
Hon. Jagath Pinnagoda Withana

ගරු සභාපතිතුමනි, පසුගිය හත්වැනිදා මතුගම නගරයේ මාදුළුවාවේ සෝභිත නායක ස්වාමීන් වහන්සේගේ ප්‍රතිමාවක් සඳහා මුල් ගල තියන්න මුදල් එකතු කළා. වංචනිකයින්ගේ කණ්ඩායමක්. ගජ සවි මිතුරෝ කියලා. මම අපේ මහ ඇමතිතුමාව ඇත්තටම අගය කරන්න ඕනෑ. මම එතුමාව දුරකථනයෙන් දැනුවත් කළා. එතුමා එදාම මේක නවත්වන්න නියෝගයක් දුන්නා. පරීක්ෂණයක් කරන්න ඕනෑය කියලා. මොකද, පොදු ස්ථානයක එහෙම කරනවා නම් විරෝධතා කැඳවන්න ඕනෑ. ඒ මොකුත් නොකර මේ කණ්ඩායමට ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා අවසර දීලා තිබුණා. ඊට පස්සේ ගරු මහ ඇමතිතුමාගේ නියෝගය පරිදි ඒක අත්හිටෙව්වා.

නමුත් ගරු සභාපතිතුමනි, අපි සියලු දෙනාගේම වරප්‍රසාද හෑල්ලුවට ලක් කරමින්, ඒ සංවිධානය මගින් ඒ නියමිත වෙලාවට - ඒ ස්ථානයේ ප්‍රදර්ශනය කරලා තිබුණා මහ ඇමතිතුමාගේ නියෝගය පරිදි මේක තහනම් කරලා තිබෙනවාය කියලා. ඒ විරෝධතා නොතකා හරිමින්, ඒ ස්ථානයේ පූර්ණ පොලිස් ආරක්ෂාව සහිතව - පත්තරවල තිබෙනවා. ලේකම්තුමාගේ පූර්ණ අනුග්‍රහය යටතේ ප්‍රතිමාවට මුල්ගල තිබ්බා. මම අද මහ ඇමතිතුමාට ගෙනැල්ලා ඒ ලියකියවිලි සියලු දේවල් භාර දුන්නා. ඒ වෙලාවේ ශබ්ද විකාශන යන්ත්‍ර පාවිච්චි කරමින් නොසෑහෙන විධියට මට පුදුමාකාර විධියේ අපහාස කිරීමක් කළා. විශේෂයෙන් කුමාර වෙල්ගම මන්ත්‍රීතුමාවත් සෙනල් වෙල්ගම ගරු මන්ත්‍රීතුමාවත්, මාවත්, ඒ ප්‍රදේශයේ අපේ මතුගම ආසනයේ කිසිම දේශපාලඥයෙකු සහභාගී නොකර මේ වාගේ දෙයක් කිරීම පිළිබඳව දැනටත් පොලීසිය මුණිවත රකිනවා. ප්‍රාදේශීය සභාව නිහඬව ඉන්නවා. මම ගරු ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ මන්ත්‍රීවරු සියලු දෙනාගේම වරප්‍රසාද බලවත් සේ කඩ කරපු අවස්ථාවක්. මේ ගැන පරීක්ෂණයක් පවත්වලා අදාළ පුද්ගලයන්ව අධිකරණය හමුවට පමුණුවන්නය කියලා. මම ලේකම්තුමාට කියලා පොලීසියේ ඒ සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කළා. මේ ගැන ක්‍රියා මාර්ගයක් ගන්නය කියලා මම ගරු ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අපි එන කොට මේ මන්ත්‍රීවරුන්ව පරික්ෂා කරන්න කණ්ඩායමක් ඉන්නවා. මම සාමාන්‍යයෙන් වේගයෙන් යන්නේ එන්නේ. හිමින් යන කෙනෙක් නොවෙයි නේ? වැඩ වැඩි හින්දා. මම මේ පොත් ටික පුටුව උඩින් තියද්දී මෙයින් පොතක් බිමට වැටුණා. වැටුණාම මේ පරික්ෂා කරන නිලධාරිනිය කියනවා, මේ වැටුණු එක අහුලලා දෙන්නය කියලා. ඔයා නේ වැට්ටුවේ. මේක අහුලලා දෙන්නලු පරික්ෂා කරන්න. මම කියන්නේ, මට නැමෙන්න කොන්දක් තිබෙනවා. නමුත් යම්කිසි මිත්‍රශීලී සේවයක් කරන ආකාරය අපි දැන ගන්න ඕනෑ.

ඇත්තටම කියන්න ඕනෑ. මම දෙවරක් පළාත් සභාවට පත් වෙලා තිබෙනවා. පළාත් සභාවේ සියලුම නිලධාරීන් ඉතා විනීතයි. හරිම ප්‍රසන්නව රාජකාරී කරනවා. අපි දුරකථනයෙන් මොනවා හරි දෙයකට කථා කළත් පොඩ්ඩක් ඉන්න කියලා ඇත ඉඳලා හරි කෙනෙකුව සම්බන්ධ කරලා ඒ දේ කරනවා. ඉතාම විනීත නිලධාරී මණ්ඩලයක් ඉන්නේ පළාත් සභාවේ. නමුත් මේ තැනට අගෞරවයක් වෙලා තිබෙනවා, අද මේ ඇවිල්ලා ඉන්න කණ්ඩායම. මම කියන්නේ, අපට යුධ සමයක් තිබුණා. ඒ වෙලාවේ අපි සියලු දෙනාවම පරික්ෂා කළා. පාර්ලිමේන්තුව, පළාත් සභාව ඔක්කොම පරික්ෂා කළා. දැන් එපමණ ප්‍රශ්න නැහැ. මෙතැන එක්කෝ යන්ත්‍රයක් සවි කරන්න ඕනෑ. එහෙම නැත්නම් මට පෙණුනු විධියට යම් යම් ඉහළ අයත් එක්ක සම්බන්ධකම් තිබෙන අය ඉන්නවා. එක්කෝ ප්‍රේම සම්බන්ධකම් වෙන්න පුළුවන්. වෙන සම්බන්ධකම්. ඥාති සම්බන්ධකම්. ඔලුව ඉදිමිලා තමයි රස්සාවට එන්නේ. ඒ ඉදිමිලා රස්සාවලට ආවාම අනික් අයටත් අර ලොකු තැනේ රස්නේ පෙන්වන්න යනවා. අපි නිහතමානීව වැඩ කරන්න ලැහැස්තියි. මෙතැන ඉන්න ලේකම්තුමා පවා ඕනෑම පුංචි නිලධාරියකු එක්ක නිහතමානීව වැඩ කරනවා. අද මේ වන තෙක් කිසිම ප්‍රශ්නයක් මේ පළාත් සභාවේ නිලධාරීන්ගෙන් අපට ඇති වෙලා නැහැ. මේ ගැන වහාම අවධානය යොමු කරන්න. පුළුවන් නම් යන්ත්‍රයක් සවි කරන්න. වෙන වෙන සම්බන්ධකම් තියාගෙන මෙතැනට ඇවිල්ලා respect පෙන්වනවා. ඒක එපමණ සුහදශීලී සේවයක් නොවෙයි. මේ ගැන අපේ වරප්‍රසාද කඩ වෙනවා. ගරු ඔබතුමාගේ අවධානය ඒ පිළිබඳව යොමු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමියගේ වරප්‍රසාද ප්‍රශ්නය පිළිබඳව මටත් උදෙන්ම ආරංචි වුණා. ඇත්ත වශයෙන්ම ඒ නිලධාරීන් පොලිස් සේවයට සම්බන්ධ නිලධාරීන්. අපේ ආරක්ෂාවට තමයි ඒගොල්ලන්ව අපි ගෙන්වලා තිබෙන්නේ. සභා ගර්භයේ සහ මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාවට. ඒ අය ඒක හරියට කරනවා කියලා මම විශ්වාස කරනවා. දැන් කාන්තාවන් පරික්ෂා කරන්න කාන්තා නිලධාරිනියක් ඉන්නවා. අනෙකුත් මන්ත්‍රීවරු පරික්ෂා කර බලන්න අය ඉන්නවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

දැන් යුද්ධයක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ නිසා අපේ මන්ත්‍රීවරුන්ගේ යුතුකමක් තමයි ඒ අයට සහාය දැක්වීම. අපි සහාය දක්වන්න ඕනෑ. ඒ අයගෙන් වරදක් වුණාද කියලා මම දන්නේ නැහැ. නමුත් අපි තේරුම් ගන්න ඕනෑ. ඒ අය පැමිණෙන්නේ අපි හැමෝගේම ආරක්ෂාවට. පෞද්ගලික අදහසක් ඒගොල්ලන්ගේ නැහැ. ඒ ප්‍රශ්නය පිළිබඳව එම නිලධාරිනියට දැන් නිදහසට කරුණු කියන්නත් බැහැ. අපට සභා ලේකම් කාර්යාලයට ඇවිල්ලා මේ රාජකාරිය කරන්න බැහැයි කියලා, සමහර විට ඒ අය අයින් වෙන්නත් ඉල්ලයි. දැනුම් දීලා අයින් වෙන්නත් පුළුවන්. හැමෝටම බලපාන ප්‍රශ්නයක් මේක. අපි පුළුවන්තරම් ඒ අයට උදව් කරමු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපට ආරක්ෂාවක් අවශ්‍ය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවශ්‍ය අයත් ඉන්නවා නේ ගරු මන්ත්‍රීතුමිය? එහෙම නැහැයි කියන්න බැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, එහෙම අයින් වෙනවා කියලා අපට එහෙම යටත් වෙලා ඉන්න බැහැ. ඒකට අපි මොකක් හරි

ක්‍රමවේදයක් හදන්න ඕනෑ. ඒ අය අයින් වුණාය කියලා මේ සභාව නවත්වන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව නවත්වන්නේ නැහැ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

එතුමියට ලොකු අසාධාරණයක්, අගතියක් වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අසාධාරණය අපි දන්නේ නැහැ නේ? අපි එහෙම නම් සොයලා බලන්න ඕනෑ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

වැටුණු පොත අහුලලා දෙන්න ඕනෑ නැහැ. ඕඩර්ස් දෙන්න බැහැ නේ පොත අහුලලා දෙන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක අපට කියන්න බැහැ. අපිත් නම්‍යශීලී වෙන්න ඕනෑ.

**ගරු ඉසුර දේවප්‍රිය** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලිබල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Isura Devapriya (Chief Minister and Minister of Finance and Planning, Engineering Services, Law and Order, Local Government and Provincial Administration, Economic Promotion, Electricity and Energy, Environmental Affairs, Water Supplies and Drainage and Tourism Affairs)

එතුමිය මන්ත්‍රීවරියක් හැටියට ඒ අදහස දැන ගැනීම සඳහා ප්‍රකාශ කිරීමේ ඇති වරදක් නැහැ. නමුත් ආරක්ෂක හේතූන් මත අපේ අතින් වැටෙන, අපේ දෙයක් අහුලලා දෙන්න ඒගොල්ලන්ට අයිතියක් නැහැ. ඒක අපි පැහැදිලි කර ගන්න ඕනෑ. ඔබතුමිය ඒ අදහස ප්‍රකාශ කළ එකේ වරදක් නැහැ. නමුත් ඇත්ත ප්‍රශ්නය, වචන මොනවා හරි කිව්වා නම්, අපේ දෙයක් අපිමයි අහුලලා දෙන්න ඕනෑ.

**ගරු හරිස්චන්ද්‍ර ද කොස්තා**
Hon. Harischandra de Costa

ගරු සභාපතිතුමනි, ඒක වැටෙන්නේ පරීක්ෂණය කරන්න යන කොට නේ? පොඩි සුහදශීලීත්වයක් තිබෙන්න එපැයි. පොඩි ගරු කිරීමක්.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ඒ ආචාරශීලීකම ගැන නොවෙයි මම මේ කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ අදහස නම් හැකිතාක් දුරට අපි ඒ අයට උදව් කරමු. දැන් ගොඩක් වෙලා ගියා. අපි න්‍යාය පත්‍රයට යමු.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි. වරප්‍රසාද ප්‍රශ්නයක්. පළාත් පාලන ආයතනයක් සම්බන්ධව. ඒ නිසා ගරු මහ ඇමතිතුමාගේ අවධානය යොමු කරන්නය කියනවා. බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට අයිති නාරගල කියන ප්‍රදේශයේ - ඒ ප්‍රදේශයේ මම ඇතුළු සියලුම දෙනා වරිපනම් ගෙවනවා. නමුත් පළාත් පාලන මන්ත්‍රීවරු නැති වුණාට පස්සේ අපේ ගම හරහා යන කුණු ට්‍රැක්ටරය එන්නේ නැහැ. නැවතුනා. මේ කුණු ප්‍රශ්නයක්. මට නම් මගේ කුණු ටික මදුරාවල ප්‍රාදේශීය සභාවට හරි ගිහිල්ලා දාන්න පුළුවන්. නමුත් ගමේ අය මට මේ ගැන දැනුම් දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මෙය වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. පොදු ප්‍රශ්නයක්.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

වරප්‍රසාද ප්‍රශ්නයක්. මම ඉන්නේත් එතැන. මගේ කුණු ටික ගෙනියන්නෙත් නැහැ. ඒක නොවෙයි ප්‍රශ්නය. නමුත් සභාවේ තිබෙන කැබ් රථ සියල්ලම උදේට ලේකම්තුමියව ගේන්න යනවා. ආපහු එනවා. ආයිත් හවසට යනවා. ආපහු එනවා. හැම නිලධාරියාම යන්නේ ඒකේ. එහෙම

[ගරු ලලිත් වර්ණකුමාර]

නම් මේ වරිපනම් ගෙවන මා ඇතුළු මිනිස්සුන්ගේ කුණු ටික ගෙනියන්න ට්‍රැක්ටරය මීටර් 200 ක් එහාට ඇවිල්ලා හරවලා යන්නේ ඇයි? මේ ආණ්ඩුව වෙනස් වුණත් එක්කම. අන්න ඒකයි මට තිබෙන ප්‍රශ්නය. ඒකයි වරප්‍රසාදය. මමත් වරිපනම් ගෙවන මන්ත්‍රීවරයෙක්. එතකොට වාහනය ඒ නිලධාරීන් සියලු දෙනාම සුඛෝපභෝගීව විඳිනවා නම්, මම ඇතුළු ඒ අහිංසක මිනිස්සුන්ගේ කුණු ටික ගන්න එන්න බැහැයි කියනවා. ඒ ගැන අවධානය යොමු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මහ ඇමතිතුමා, ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. ඔබතුමා මගින් මම අපේ නව සෞඛ්‍ය අමාත්‍යතුමාට ඉදිරිපත් කරනවා. පිළියන්දල රෝහලට අපේ පවුලේ සියලු දෙනා එකතු වෙලා පෞද්ගලිකව වාට්ටු සංකීර්ණයක් හදලා දුන්නා. එහිදී අපි ගිවිසුමකට අත්සන් කළා. එහි කළ යුතු ක්‍රියාකාරකම්. ඒ අනුව දන්ත සායනයත්, දියවැඩියා රෝගී ඒකකයත්, ඒ වාගේම හෘද රෝගීන් සඳහා පරීක්ෂණයත්, ඒ වාගේම තවත් වාට්ටු තුනක් සහිතව ඉදි කළේ. නමුත් අපේ ගිවිසුමට පරිබාහිරව බස්නාහිර පළාතේ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වෛද්‍යවරුන් සඳහා මෙහි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පෞද්ගලික පැහැදිලි කිරීමක් කරන්නේ. වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මගේ වරප්‍රසාදයක් නේ? පළාත් සභාවට හදලා දුන්න එකක් නේ? මම හදලා දුන්න එකක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද කඩ වීමක් නැහැ. ඔබතුමා ඒක වෙනම ගේන්න. අපට එහෙම ගන්න බැහැ. වරප්‍රසාද ප්‍රශ්න කියලා ඔක්කොම ගේන්න ගියොත් - බලන්න දැන් 10.20 යි වෙලාව. එහෙම වුණොත් අපට න්‍යාය පත්‍රයට යන්න බැහැ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මන්ත්‍රීවරයෙක් නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මන්ත්‍රීවරයෙක් හරි. ඔබතුමාට වුණු ප්‍රශ්නයක් නොවෙයි නේ?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මට බෙහෙත් ගන්නවත් නැහැ නේ? මගේ මානසික රෝගයට බෙහෙත් ගන්න ගියාම නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේක ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයිනේ? පොදු ප්‍රශ්නයක් නේ කථා කරන්නේ.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමාගෙන් ඉල්ලන්නේ. අලුත් සෞඛ්‍ය ඇමතිතුමාගෙන්. මම ලිඛිතව ලිපියක් එවලා මාස තුනක් උත්තර නැහැ. මන්ත්‍රීවරයෙක් විධියට ඒ තුළින් මගේ වරප්‍රසාද කඩ වෙන්නේ නැද්ද? සෞඛ්‍ය ඇමතිවරයාට ලියුමක් එවනවා. මාස තුනක් තිස්සේ උත්තර නැහැ. ඒ නිසා මේ පිළිබඳව අලුත් සෞඛ්‍ය ඇමතිතුමාගේ අවධානය යොමු කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා උපදේශක කාරක සභාවට ගිහිල්ලා ඔය ප්‍රශ්නය යොමු කළා නම් වඩා හොඳයි. ඊයේත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව තිබුණා.

## අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු සුමිත් ලාල් මැන්දිස්** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමා රක්ෂණ සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා)
Hon. Sumith Lal Mendis (Minister of Health, Indigenous Medicine, Social Welfare, Probation and Child Care Services, Women's Affairs and Council Affairs.)

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. ඇත්ත වශයෙන්ම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විධියට මම කටයුතු කරන අවස්ථාවේදී මට ආණ්ඩු පක්ෂයේ පමණක් නොවෙයි, විපක්ෂයේත් පූර්ණ සහයෝගය ලැබුණා. මම ස්තූතිවන්ත වෙනවා, ඒ පිළිබඳව. ඒ වාගේම ඊයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඉදිරියේදී මම සෞඛ්‍ය අමාත්‍යවරයා වශයෙන් දිවුරුම් දුන්නා. ඒ නිසා මම පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මම දේශපාලන වශයෙන් තමුන්නාන්සේලා දන්නවා. නොදන්න අයත් ඇති සමහර විට. මම දේශපාලනයට ආවේ 1991 දී කළුතර නගර සභාවෙන්. දේශපාලනයට එන්න හේතුව වුණේ, මගේ සහෝදරයා 1989 භීෂණ සමයේදී මිය ගිය නිසා. ඒ කාලයේ තිබුණු වාතාවරණය අනුව. ඒ මිය ගියේ පක්ෂයේ උප ලේකම් ඉන්ද්‍රපාල අබේවීර මැතිතුමාත් එක්ක. අපි දේශපාලනය කළේ බොහොම අවංකව. ඒ දේශපාලනය සමහර කාලවලදී නැතිව ගියා. නමුත් මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා පක්ෂය ගැන හිතලා, පක්ෂයේ කැපවීම වෙනුවෙන්. පක්ෂයේ දේශපාලනය වෙනුවෙන් අඩන්තේට්ටම්වලට ලක් වුණු ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයින්ට සැලකීමක් වශයෙන් මට මේ අමාත්‍ය ධූරය ලබා දීම පිළිබඳව එතුමාට විශේෂයෙන් ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම අපේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා. එතුමා මේ කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වලා මේ අමාත්‍ය ධූරය ජ්‍යෝෂ්ටත්වය වශයෙන් සලකා මා හට පිරිනැමීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම පිළිබඳවත් එතුමාට ස්තූතිවන්ත වෙන්න ඕනෑ.

ඒ වාගේම මම අද පත්තරේක දැක්කා, අපේ ගරු අරුණ දීපාල් මන්ත්‍රීතුමාගේ ප්‍රකාශයක්. ඒක ඇත්තද බොරුද කියලා මම දන්නේ නැහැ. මට මෙම අමාත්‍යධූරය ලබා දීම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ කුමන්ත්‍රණයක් කියලා තිබුණා. එහෙම කුමන්ත්‍රණයක් තිබුණේ නැහැ. කුමන්ත්‍රණයක් කරලා නොවෙයි. මම හිතන්නේ, ගරු ප්‍රධාන අමාත්‍යතුමා කෙළින් වැඩ කරන අමාත්‍යවරයෙක් හැටියට එතුමා ඍජු තීරණ අරගෙන, කරන්න ඕනෑ වැඩේ හරියට කරලා තිබෙනවා. ඒ නිසා මම බලාපොරොත්තු වෙන්නේ කළුතර නගර සභාවෙන් 1991 දී -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු ඇමතිතුමා, ඔබතුමාට මේක දෙන්න ඉස්සෙල්ලා මම අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගෙන් ඇහුවා. එතුමා කිව්වා මට උසාවි යන්න තිබෙනවා. ඒ නිසා එපා කියලා.

**ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumith Lal Mendis - Minister

නමුත් මම හිතන්නේ නැහැ එතුමා හදවතින් කරපු ප්‍රකාශයක් කියලා. එතුමා අපිත් එක්ක බොහොම සහයෝගයෙන් වැඩ කරන මන්ත්‍රීවරයෙක්. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියන එක මේ රටේ මහා දැවැන්ත පක්ෂයක්. එක්සත් ජාතික පක්ෂය කියන්නේත් මහා දැවැන්ත පක්ෂයක්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් දැවැන්තයෝ බිහි වුණා. බණ්ඩාරනායක අගමැතිතුමා ආරම්භ කරපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. අපි එතුමන්ලාට ගරු කරන්න ඕනෑ. එතුමන්ලාගේ ප්‍රතිපත්ති අපි ගෙනියන්න ඕනෑ. බණ්ඩාරනායක ප්‍රතිපත්ති තවම මේ රටේ තිබෙනවා. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ශක්තිමත් කරන්න නායකත්වය දෙන්න අපේ නායකයෝ, නායිකාවෝ ගත්තාම සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය. ඒ වාගේම චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය. ඒ වාගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අපේ හිටපු නායක මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඒ වාගේම අපේ මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා අද නායකත්වය දෙනවා.

ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට හොඳ බුලට් තිට්යේ. ඒ බුලට්වල ප්‍රතිඵලයක් වශයෙන් තමයි මේ රටේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටේ ප්‍රචලිත වුණේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බුලට් එකක් අරගෙන තමයි එක්සත් ජාතික පක්ෂය අද පාලන බලයේ ඉන්නේ. ඒ බුලට් එක නැත්නම් එක්සත් ජාතික පක්ෂයට අද පාලන බලයට එන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වැඩි කථා ඕනෑ නැහැ. ඇමතිකම ගැන කථා කරන්න. ඇමති වුණේ අපි හින්දා.

[සභාවේ ඝෝෂා]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මෙතුමා කොහොමද ඇමති වෙන්නේ අපි නැත්නම්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

අපි පාරවල්වල බැහැලා කෑ ගහලා ඉවර වෙලා -

**ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumith Lal Mendis - Minister

ඕගොල්ලෝ වැටට ඉස්සෙල්ලා පනිනවා නේ? වැටට ඉස්සෙල්ලා පනින්නේ නැතිව ඉන්න. මම මේ කියන්න හැදුවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, අනවශ්‍ය විවාදවලට යන්න එපා. ඇමතිවරයෙක් වශයෙන් ඉදිරිපත් කරන මංගල කථාව. ඔබතුමා කෙටියෙන් කථාව අවසන් කරන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

විශ්වාස භංගයක් ගන්නද හදන්නේ.

**ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumith Lal Mendis - Minister

මම මේ කියන්න හැදුවේ පක්ෂය ගැන තිබෙන වටිනාකම.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒවා කථා කරන්න ඕනෑ නැහැ. අවුලක් වෙනවා. ඔබතුමා මූලාසනයට කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සුමිත් ලාල් මැන්දිස් - අමාත්‍යතුමා**
Hon. Sumith Lal Mendis - Minister

දේශපාලන වශයෙන් වෙනස් වීම් වෙනවා. දේශපාලන වශයෙන් යම් යම් මත තිබෙනවා. මම කියන්නේ, මතවාදයක් පිළිබඳව. ඒ වාගේම මේ රටට දුන්න නායකත්වය පිළිබඳව. අපි පිළිගන්න ඕනෑ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මේ වාගේ නායකත්වයක් තිබෙනවාය කියන එක. ඒ නිසා ඔබතුමන්ලාත් පිළිගන්න ඕනෑ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයක්, අද ඔබතුමන්ලාගේත් ජනාධිපති. අපෙත් ජනාධිපති. ඒ නිසා මේ රට හදන්න රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක එකතු වුණු එක ගැන අපි සන්තෝෂ වෙනවා. ඒකට අපි විරුද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා පළාත් සභාවේ මන්ත්‍රීවරු සියලු දෙනාම අපි එකට ඉන්නවා. එක්සත් ජාතික පක්ෂයේ සහයෝගය නොමැතිව වුවත් මේ පළාත් සභාව ගෙනියන්න පුළුවන් මතයක් අපට තිබෙනවා. කවදාවත් මෙය බෙදිලා නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බෙදිලා නැහැ. ඒ නිසා අපි තමුන්නාන්සේලාත් එක්ක එකට වැඩ කරනවා. ජනාධිපතිතුමාට, රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක්ක එකට වැඩ කරන්න පුළුවන් නම් අපට විපක්ෂ නායක මංජු ශ්‍රී අරංගල මැතිතුමාත් එක්ක වැඩ කරන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒ නිසා තමයි අපේ මහ ඇමතිතුමා හැම දෙනාටම සම සමව එන විදියට මෙවර මුදල් වෙන් කරලා තිබෙන්නේ. ඒ නිසා අපි සන්තෝෂ වෙන්න ඕනෑ. මේ බස්නාහිර පළාත් සභාව මුළු රටටම ආදර්ශයක් වන විදියට අපි වැඩ කරමු. ඉදිරියේදී තමුන්නාන්සේලාගේ සහයෝගය මට ලබා දෙන්න. තමුන්නාන්සේලාට පෙරළා දේශපාලන භේදයකින් තොරව සහයෝගය දෙන බව ප්‍රකාශ කරමින් සියලු දෙනාටම බොහොම ස්තුතිවන්ත වෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මේ කුමන්ත්‍රණ කථාවට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කාලය දෙන්න අපහසුයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මගේ නම කිව්වා. අලුත් සෞඛ්‍ය ඇමතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. හැබැයි, මේ සෞඛ්‍ය ඇමති ධුරය

සම්බන්ධයෙන් කාරණය මාධ්‍ය තුළ පසුගිය දවස් කිහිපය තුළම සාකච්ඡා වුණා. ඒ සාකච්ඡා වෙන්න පටන් ගත්තේ සරත් ෆොන්සේකා මැතිතුමාත්, එක්සත් ජාතික පක්ෂයත් ගිවිසුමකට අත්සන් කරපු අවස්ථාවේ කබීර් හෂීම් මහ ලේකම්තුමාගෙන් මාධ්‍ය ප්‍රශ්නයක් ඇහුවා, මේ සෞඛ්‍ය අමාත්‍ය ධුරය පළාත් සභාවේ කාටද ලැබෙන්නේ? ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට ඒක ලැබෙනවාද කියලා. ඒ අවස්ථාවේ කබීර් හෂීම් ඇමතිතුමා මහ ලේකම්වරයා විධියට මාධ්‍යයට කිව්වා, ඒ ඇමතිකම ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ සුදුස්සෙක් ඉන්නවා නම්, ඒ සුදුස්සාට ලැබෙයි කියලා. අන්න ඒ ඔස්සේ මාධ්‍යය ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ඉන්න සුදුස්සා පස්සේ එලෙව්වා. එතකොට ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදී - (බාධා කිරීම්) ඒ හැරුණු කොට ගරු ප්‍රධාන අමාත්‍යතුමා කුමන්ත්‍රණ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර කථාව අවසන් කරන්න. කාලය ලබා දීමට අපහසුයි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ අවස්ථාවේදී මාධ්‍ය හොඳක් කළා. මේකේ කොහේවත් හිටපු නැති මාව උඩින් ගෙනැල්ලා තිබ්බා. නමුත් මගෙන් අහපු අයට මගේ ස්ථාවරය මොකක්ද කියන එක මම මහ ඇමතිතුමාටත් අපේ මන්ත්‍රීවරුන්ටත් කිව්වා. කුමන්ත්‍රණ කථාවක් මම කිව්වේ නැහැ.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
# PERSONAL EXPLANATIONS

**ගරු සුසාර දිනාල්**
Hon. Susara Dinal

ගරු සභාපතිතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මම අදාළ සිද්ධිය පළමුවෙන් පැහැදිලි කරන්නම්. මීට සතියකට පමණ පෙර කැලණිය කොට්ඨාශයේ පාසලක නිවාසාන්තර ක්‍රීඩා උත්සවයක් පැවති අවස්ථාවක මා එයට සහභාගී වෙලා ඉන්න කොට ඒ පාසලේ නියෝජ්‍ය විදුහල්පතිතුමිය අවුරුදු දහයක විතර පොඩි දරුවෙකුව අතින් අල්ලාගෙන ගෙනැල්ලා ප්‍රධාන පීඨිකාවේ පිටිපස්සෙන් වාඩි කෙරෙව්වා. ඒ දරුවා නිල ඇඳුමෙන් නොවෙයි හිටියේ. විදුහල්පතිතුමියට කනට කරලා මොකක්ද කිව්වා. මම ඇහුවා, මොකක්ද ප්‍රශ්නය කියලා. මේ අවුරුදු දහයක පමණ පොඩි දරුවා නිවාසාන්තර ක්‍රීඩා උළෙල පැවැත්වෙන ක්‍රීඩාංගනය ඇතුළේ ඒ වයසේම තවත් දරුවෙකු එක්ක මත් කුඩු පැකට් අලෙවි කරද්දී මේ නියෝජ්‍ය විදුහල්පතිතුමිය අල්ලා ගන්නවා. අනික් දරුවා පැනලා දුවනවා. ඊට පස්සේ විදුහල්පතිතුමිය පොලීසියට කථා කරලා එන්න කියනවා. පැය භාගයක් විතර යනවා. ඒත් පොලීසියෙන් එන්නේ නැහැ. මම නියෝජ්‍ය පොලිස්පතිතුමාට පෞද්ගලිකව කථා කරලා කිව්වාට පස්සේ පොලීසියෙන් මේ ස්ථානයට එනවා. මේ පාසල පැලියගොඩ එච්.කේ. ධර්මදාස විද්‍යාලය. මේ පාසලේ මේ ප්‍රශ්නය දීර්ඝ කාලයක් තිස්සේ අපි ව්‍යුහ කමිටුවේදී පවා - ජෝර්ජ් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉන්නවා. මේක සාකච්ඡා කරපු ප්‍රශ්නයක්. හැබැයි, මේකේ තිබෙන කනගාටුදායක තත්ත්වය තමයි ගරු සභාපතිතුමනි, අවුරුදු දහයක විතර මේ පාසලේම ඉගෙන ගත් දරුවෙක්. අවුරුද්දකින් විතර මේ දරුවා ඉස්කෝලේ ඇවිල්ලා නැහැ. මේ දරුවා තමන් ඉගෙන ගත් පාසල ඇතුළේ, නිවාසාන්තර ක්‍රීඩා උළෙල පැවැත්වෙන අතරතුරේ තවත් එවැනි දරුවෙකු සමඟ මත්කුඩු පැකට් අලෙවි කරනවා. මේක වැඩිහිටියන් විධියට, මහජන නියෝජිතයන් විධියට අපේ ඇඟ කිළිපොලා යන තත්ත්වයක්. ඊට පස්සේ මම පොඩ්ඩක් අවධානයෙන් බැලුවාම මම දකිනවා, මේ ක්‍රීඩාංගනය වටේට පාසලේ ගුරුවරු මුර සංචාරයේ යෙදෙනවා. පිරිමි ගුරුවරු පිට්ටනිය වටේට ඇවිදිනවා. ඇතුළේ දරුවන්ට කුඩු පැකට් අලෙවි කරයි කියලා. මෙය ඉතාම ශෝචනීය තත්ත්වයක්. මේ ගම්පහ දිස්ත්‍රික්කයේ, කොළඹ මායිමේ, පැලියගොඩ නාගරික සීමාවේ, කැලණිය ආසනයේ තිබෙන පාසලක්. මේක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මේ විදුහල්පතිතුමිය මේ පාසලට එන්නේ මීට සති තුනකට විතර කලින්. ඊට කලින් මේ පාසලේ හිටියේ විදුහල්පතිවරයා විධියට ස්වාමීන් වහන්සේ නමක්. ඒ ස්වාමීන් වහන්සේට සමු දෙන උත්සවය දවසේ මේ පාසල ඇතුළේ වැසිකිළියක් තුළ පාසලේ දරුවෝ කුඩු පැකට් අලෙවි කරද්දී අහු වෙලා තිබෙනවා. මේ පාසලක් ඇතුළේ තත්ත්වයක් ගරු සභාපතිතුමනි.

එතකොට මේ සතියේම තමයි ගරු ජනාධිපතිතුමා අපේ රේගු අධ්‍යක්ෂතුමා ඇතුළු පිරිස ගෙන්වලා රටට මත්ද්‍රව්‍ය එන විධිය ගැන, ඒවා නවත්වන වැඩ පිළිවෙළ ගැන සාකච්ඡා කරලා තිබුණේ. හැබැයි, එක පැත්තකින් රටක්

[ගරු සුසාර දිනාල්]

විධියට අපේ රට මේ මත්ද්‍රව්‍ය රකුසා එක්ක සටන් කළ යුතුයි. නමුත් අනික් අතට පාසලක් ඇතුළේ මත්කුඩු පැකට් විකුණන එක සම්බන්ධයෙන් මේ සමාජයේ සියලුම දෙනාට වගකීමක් තිබෙනවා. නමුත් මේ පාසල් බස්නාහිර පළාතේ මන්ත්‍රීවරුන් විධියට අපේ බස්නාහිර පළාතේ බල සීමාවට අයත් පාසල් විධියට අපට මේ දිහා බලලා, මේක පොලීසියේ වැඩක්. එහෙම නැත්නම් මේක මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ වැඩක් කියලා පැත්තකට වෙලා ඉන්න බැහැ. අපේ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දන්නවා. පසුගිය කාලයේ අපි මේ විදුහල්පතිවරුන් එක්ක ව්‍යුහ කමිටුවලදී මේ ගැන සාකච්ඡා කරනවා. මොකක්ද මේකට කරන්න පුළුවන් කියලා. ගරු සභාපතිතුමනි, මේකට පුළුල් වැඩ පිළිවෙලක් තිබිය යුතුයි. මා විශ්වාස කරනවා, මේ තත්ත්වයට මුහුණ දීලා තිබෙන්නේ, මේ පාසල විතරක් නොවෙයි. සමහර විට කොළඹ දිස්ත්‍රික්කයේ මේ කලාපයේ මේ ආසන්න ප්‍රදේශයේ මේ කැලණි ගං නිම්නයේ තිබෙන තවත් පාසල්වලට මේ ප්‍රශ්නය තිබෙන්නට පුළුවන්. එහෙම නම් මේ සඳහා පළාත් සභාව විධියට, විධිමත්ව කටයුතු කිරීමේ වගකීමක් අප සතුව තිබෙනවා. ඒ වාගේම තමයි තවත් වැදගත් කාරණයක් තිබෙනවා. පාසලේ ඉන්න අවුරුදු දහය, දොළහේ දරුවන්ගේ අතට මත් කුඩු අලෙවි කිරීමේ වරම ලබා දෙන්නේ කවුද? ඒ අය පාසලට ඇතුළට ගෙනැල්ලා මේ ව්‍යාපාරයේ නිරත වෙන්නේ කොහොමද? මේක පාලනය කළ හැක්කේ කෙසේද? අපි දන්නවා. මත්ද්‍රව්‍යවලට එරෙහිව කටයුතු කරපු දේශපාලන නායකයින්, ආරක්ෂක නිලධාරීන්ගේ පවා ජීවිතවලට තර්ජන එල්ල වුණා. එවැනි තත්ත්වයක් යටතේ ගුරුවරු කොහොමද මත්ද්‍රව්‍ය ව්‍යාපාරිකයන් එක්ක සටන් කරන්නේ? ගුරුවරු කොහොමද ගේට්ටුව ළඟ ඉඳලා ඉස්කෝලෙට මත්ද්‍රව්‍ය පැකට් විසි කරන මිනිස්සුත් එක්ක සටන් කරන්නේ. අඩුම තරමින් මේ නිවාසාන්තර ක්‍රීඩා උළෙලට පොලිස් ආරක්ෂාවක්වත් දීලා තිබුණේ නැහැ. පොලීසියට මීටර් 500 යි තිබෙන්නේ. පොලීසිය දන්නවා, මේ පාසලේ මේ ප්‍රශ්නය තිබෙන බව. මේක මීට කලින් සාකච්ඡාවට බඳුන් වුණු ප්‍රශ්නයක්. ඒ නිසා මේ සභාවේදී අපි ඉතාමත්ම වැදගත් ලෙස මේ පිළිබඳව අවධානය යොමු කළ යුතු වෙනවා.

ගරු සභාපතිතුමනි, එක පැත්තකින් මේ පාසලේ ඉගෙන ගන්න අනික් දරුවන්ගේ අනාගතය පිළිබඳව බරපතළ තර්ජනයක් තිබෙනවා. දෙවැනි කාරණය, මේ දරුවෝ හෙට සමාජයට එන්නේ. මේ සමාජය තුළ ඔබත් මමත් අපි හැමෝමත් ජීවත් වෙනවා. හෙට දවසේ මේ දරුවන්ගේ අනාගතය මොන පැත්තටද යන්නේ? ඒ නිසා නීතිය හා සාමය පිළිබඳ කාර්යභාරය අපේ මහ ඇමතිතුමා සතු වෙනවා. ඒ වාගේම අපේ අධ්‍යාපන ඇමතිතුමා පාසල් පද්ධතිය දියුණු කරන්න අවංක කැපවීමක් කරන බව අපට පෙනෙනවා. මේ පාසල් අධ්‍යාපනය පාසල්වල භෞතික සම්පත් දියුණු කිරීමෙන් ඔබ්බට ගිහිල්ලා සමාජමය වශයෙන් තිබෙන්නා වූ මේ ව්‍යසනයන් වැළැක්වීමට පොලිස් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරලා, අධ්‍යාපන දෙපාර්තමේන්තුව කිසියම් වැඩ පිළිවෙළක් යොදනවා නම්, ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී ඒක ඉතාමත්ම වැදගත් වෙනවා. ඊට අමතරව මම ඔබතුමාගේ අවධානයට යොමු කරන තවත් වැදගත් කාරණාවක් තිබෙනවා. ඒ තමයි මේ පාසලේ කටයුතු කරන විදුහල්පතිවරයා හෝ විදුහල්පතිවරිය - දැන් ඉන්නේ විදුහල්පතිනියක්. ඒ වාගේම ආචාර්ය මණ්ඩලයේ අය. මේ අය කොහොමද තමන්ගේ රැකියාව කරන්නේ? හැන්දෑවට කවුරු හරි ඇවිල්ලා පිස්තෝලයක් දික් කරලා කිව්වොත් එහෙම, මේ වැඩ කටයුතුවලට බාධා කරන්න එපා. මැදිහත් වෙන්න එපා කියලා. ඒ අයගේ ආරක්ෂාව පිළිබඳව කවුද කටයුතු කරන්නේ. ඒ නිසා මම ගරු සභාපතිතුමාගේ මාර්ගයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමාටත්, ගරු මහ ඇමතිතුමාටත් යොමු කරනවා. මෙවැනි පාසල් හඳුනාගෙන මේවායේ ආරක්ෂාව පිළිබඳව මධ්‍යම රජයේ ආරක්ෂක අංශවල නියෝජිතයන් සමඟ සාකච්ඡා කරලා, සාධාරණ වැඩ පිළිවෙළක්, විධිමත් වැඩ පිළිවෙළක් යෙදවීම සඳහා මේක අවස්ථාවක් කර ගන්නට කියලා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා විසින් කරන ලද ප්‍රකාශය ඉතාම ශෝචනීය ප්‍රකාශයක්. ඉතාමත් බරපතළ සහ කනගාටුදායක සිද්ධියක් එතුමා ප්‍රකාශ කළේ. අවුරුදු දහයක දරුවෙක් මත්කුඩු විකිණීම සම්බන්ධයෙන්. ඒ නිසා මේ පිළිබඳව විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිතුමාගේත්, ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේත් අවධානය යොමු කරනවා, ඉතාමත්ම කඩිනම්ව මේ පිළිබඳව තීන්දු ක්‍රියාත්මක කරන ලෙස.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න කැමැතියි. මෙය සියලුම මන්ත්‍රීවරුන්ට බලපානවා. ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා, අපේ ප්‍රධාන අමාත්‍යතුමාට. පක්ෂ භේදයකින් තොරව ලක්ෂ 50 ක මුදලක් 2016 වර්ෂයටත් ලබා දීම පිළිබඳව. හැබැයි, ඒ ලබා දීපු මුදල්වලට යම් නිර්ණායකයන් හදලා අපට එවලා තිබෙනවා. මෙය ඉතාම කනගාටුදායක තත්ත්වයක්. මේ පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමාට තීන්දුවක් ගන්නයි මේ කාරණය මතක් කරන්නේ. උදාහරණයක් විධියට කියනවා නම්, සමහර තැන්වල දැන් අවුරුදු පහක් තුළ යම් ස්වේච්ඡා සංවිධානයකට රුපියල් 20,000 ක හරි මුදලක් දීලා තිබුණොත්, අවුරුදු පහක් තුළ කිසි දෙයක් ඊට පස්සේ එතැනට දෙන්න බැහැ. දහම් පාසලකට උපරිම දෙන්න පුළුවන් රුපියල් 20,000 යි. අපි දැන් අර කුඩු ප්‍රශ්නය පිළිබඳව ගරු මන්ත්‍රීතුමා මතක් කළා. මේ රටේ දහම් අධ්‍යාපනය දියුණු කරන්න ඕනෑ. මේ අලුත් චක්‍රලේඛය අනුව රුපියල් 20,000 යි දෙන්න පුළුවන්. මේකේ අනන්ත අප්‍රමාණ වැරදි ගණනවක් තිබෙනවා. ඒ නිසා ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට අපි යෝජනා කරන්න කැමැතියි. මේ චක්‍රලේඛය පිළිබඳව මීට වඩා විධිමත්ව, අදාළ නිලධාරීන්ට උපදෙස් දීලා මේ සීත කාමර ඇතුළේ ඉඳලා තීන්දු ගන්න නිලධාරීන් ගම් මට්ටමේ අපට මිනිස්සුන්ට සම්බන්ධ වෙන්න තිබෙන උපරිම හැකියාව මේ චක්‍රලේඛය අනුව මේ වන කොට දුරස්ථ කරලා තිබෙන්නේ. ඒ නිසා එතුමාගේ රුපියල් ලක්ෂ පනහේ මුදල අපට හරි විධියට ගම් මට්ටමට ජනතාවගේ අවශ්‍යතාවයන්වලට බෙදා දෙන්න අවශ්‍ය කටයුතු කරලා දෙන්නය කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, මේක අපට අදාළ කාරණාවක් නොවෙයි. මම ගරු විපක්ෂ නායකතුමාට යෝජනා කරනවා. ගරු අග්‍රාමාත්‍යතුමාට මේ ගැන අවධානය යොමු කරන්න කියලා. මුදල් අමාත්‍යතුමා තමයි මේක පනවලා තිබෙන්නේ. ඒ නිසා ලක්ෂ පනහෙන් ලක්ෂ 25 කට ඔය කියන කාරණා බලපාන්නේ නැහැ. අනික් ලක්ෂ 25 මහ ඇමතිවරයා හැටියට දීලා තිබෙන්නේ මම. ඒ නිසා අපේ අරමුදල් නිසා බලපාන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුත් මේ ගැන කථා කළා. හකීම් ඇමතිතුමා මේ ගැන තදබල ලෙස කථා කළා. ඒ නිසා ඒ පිළිබඳව ගැටළුවක් තිබෙනවා. මේකෙන් ඇත්තටම අප්‍රසාදයට පත් වෙන්නේ තමුන්නාන්සේලාගේ ආණ්ඩුව. ඒ නිසා කරුණාකරලා මම ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපි දෙගොල්ලන්ගේම ආණ්ඩුව -

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

මේක දැන් තර්කයකට -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, මේ අයවැය ඉදිරිපත් කරන කොට මම මුලින්ම මතු කළා, මධ්‍යම ආණ්ඩුවෙන් මුදල් ලබා දීම සම්බන්ධව. දැන් එහිදී ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ සභාවට කිව්වා - එක පැත්තකින් මුළු සභාවේම මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාදයක්. ඒ ප්‍රශ්නය නිරාකරණය වුණා, ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් පොරොන්දු වුණාය කියලා. ඒ කලින් පැවති ක්‍රමවේදයට පළාත් සභාවට මුදල් ලබා දෙනවා කියලා. නමුත් අපට දැන ගන්න තිබෙන විධියට තවමත් ඒක එහෙම වෙලා නැහැ. ඒ නිසා ඇත්තටම දැන් අපට ප්‍රශ්නයක් තිබෙනවා, ප්‍රධාන ලේකම්වරියක් මොකටද දැන් මේ පළාත් සභාවට කියලා. එහෙම කෙනෙක් අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද, පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් හරහා තමයි තවමත් අපට දැන ගන්න තිබෙන විධියට ඒ කටයුතු යන්නේ. විශේෂයෙන්ම මේ සභාවට ඔබතුමා කිව්ව නිසාම ජනාධිපතිතුමා පොරොන්දු වුණාය කියලා. ඒ සම්බන්ධව දැන් මේ සභාවට කරුණු පැහැදිලි කිරීමක් ඇත්තටම ප්‍රධාන අමාත්‍යතුමාගෙන් අවශ්‍යයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බොහොම ස්තුතියි. දැන් දිගින් දිගටම -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, දැන් මම දන්න විධියට ප්‍රධාන අමාත්‍යවරු දිගින් දිගටම කැබිනට් මණ්ඩලය නියෝජනය

[ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා]

කළා. අලුතෙන් නම් මම දැක්කා පුවත්පත්වල ඒක. සත්‍යද නැද්ද මම දන්නේ නැහැ. මාස තුනකට සැරයක් ප්‍රධාන අමාත්‍යවරුන්ට කැබිනට් මණ්ඩලය නියෝජනය කරන්න පුළුවන් කියන තත්ත්වය ඇවිල්ලා තිබෙනවා. ඉතින් ඒක කනගාටුදායකයි. අපි ඉල්ලීමක් කරනවා. ප්‍රධාන අමාත්‍යවරු තිබෙන හැම කැබිනට් මණ්ඩල රැස්වීමකටම සහභාගි කරවා ගන්න පුළුවන් නම් හොඳයි. එතුමාට මුදල් ඇමතිවරයා ඇතුළු අගමැතිවරයා, ජනාධිපතිවරයා ප්‍රධානියා හැටියට ඉන්න අවස්ථාවලදී, මම හිතන්නේ මේ අදහස කියලා, පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ අදහස එතුමාට ප්‍රකාශ කරන්නත් පුළුවන්.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තත්පරයක් දෙන්න. මම ඔබතුමාට කාලය දෙන්නම්.

**ගරු ඉසුර දේවප්‍රිය - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Isura Devapriya - Chief Minister

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කිව්ව කථාව ඇත්ත. තවම ඒ ප්‍රශ්නය විසඳිලා නැහැ. දැන් අපට වෙලා තිබෙන්නේ, ජනාධිපතිතුමා නිසා අපට නීත්‍යානුකූල පියවර ගන්නත් විධියක් නැහැ. නැත්නම් දැනටමත් අපි ඒ ගැන කථා කළා. ඒ නිසා මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත් මාත් එක්ක මේ පිළිබඳව කථා කළා. එතුමා මට පැහැදිලි කරලා කිව්වා. කොහොමත් දැන් ඊළඟ අයවැයට යෝජනා ඉදිරිපත් කිරීම මාර්තු, අප්‍රේල්, මැයි වන කොට පටන් ගන්නවා. එතකොට ඒ ප්‍රශ්නය කථා කරලා, මේක විසඳ ගන්නය කියලා. එතෙක් ප්‍රමාදයකින් තොරව එන්න, ඒ කියන්නේ, රේඛීය අමාත්‍යාංශයට මුදල් යවන කොට වෙක්පත ප්‍රධාන ලේකම්තුමියට දෙන්නම් කියලා. දැන් ඒ විධියට තමයි යන්නේ. දැනට අපේ පළාත් සභාවට ගැටලුවක් වෙලා නැහැ. නමුත් ඉදිරි කාලය තුළ දී දේශපාලන වශයෙන් යම් බෙදීමකදී තමයි මේ පිළිබඳව ගැටලුවක් අපට මතු වෙන්නේ. අපට කොහොමත් ඊළඟ අවුරුද්දේ තමයි මෙය හරි විධියට නියමාකාරයෙන් කරගන්න පුළුවන් වෙන්නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ප්‍රශ්නය මොකක්ද ? 36(1) ද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

වරප්‍රසාද ප්‍රශ්නයක්. අපේ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා කිව්වා වාගේ දහම් පාසල් සඳහා රුපියල් 20,000 ක් එවලා තිබෙනවා, මුදල් කොමිෂන් එකෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඒක එතුමා කිව්වා නේ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ වෙන් කිරීමේ මුදල මේ පළාත් සභාවේ සුමිත් ලාල් මැන්දිස් අපේ නව ගරු ඇමතිතුමා යෝජනාවක් ගෙනැල්ලා මම සංස්කෘතික අමාත්‍යවරයාව සිටන කාලයේ දහම් පාසල්වලට ලක්ෂ පහක් දෙන්න පුළුවන් විධියට සංශෝධනය කරලා කැබිනට් පේපර් එකක් දාලා මේ සභාවේ ගරු මන්ත්‍රීවරුන්ට ලක්ෂ 05 ක් දෙන්න පුළුවන් වන පරිදි නීති හදලා ඒකමතිකව අනුමත කරලා තිබෙනවා. එතකොට නිලධාරියෙකුට ඒක චක්‍රලේඛයකින් අහෝසි කරන්න බැහැ. පළාත් සභාවේ නිලධාරයෙකුට ඒක අහෝසි කරන්න බැහැ. මේ දෙන අපේ විමධ්‍යගත මුදල් සඳහා එක එක නීති මුදල් කොමිෂමට දාන්න බැහැ. මේ විමධ්‍යගත මුදල්. මුදල් කොමිෂමෙන් දෙන මුදල්වලට නීති දාන්න පුළුවන් වුණත්, විමධ්‍යගත මුදල් දෙන්නේ අපේ පළාත් සභාවෙන් එන ආදායමෙන්. එතකොට පළාත් සභාවේ මුදල් මේ මන්ත්‍රීවරුන්ට ඕනෑම යෝජනාවකට දාන්න අයිතියක් තිබෙනවා. ඒ නිර්ණායක එකක්වත් දාන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි කියන්නේ, මේ ලක්ෂ 05 ක් දහම් පාසල්වලට දීම තුළ දහම් පාසල් සංවර්ධනයක් ගමේ පන්සලේ ආවා. ගමේ හාමුදුරුවන්, ගමේ දායකයන් ඒ මුදල දෙන කොට විශාල වශයෙන් ශක්තිමත් වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කෙටියෙන් ප්‍රකාශය කරන්න. ඔබතුමා දීර්ඝ -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ ලිපියෙන් එවලා තිබෙන රුපියල් 20000 යි කියන එක කපා දාලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි. මෙතුමාත් ඒ සම්බන්ධව කිව්වා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මහ ඇමැතිතුමාත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහ ඇමතිතුමාත්, හරි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

තීන්දු තීරණයක් අරගෙන ඒක සංශෝධනය කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ස්තුතියි.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ඒ වාගේම ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මේ වරප්‍රසාද ප්‍රශ්න කියලා දීර්ඝව කථා කරන්න දෙන්න බැහැ.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මට වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මේ සභාවේ කාරක සභා තිබෙනවා. මම මොන කාරක සභාවේද කියලා තවම මට ලිපියක් එවලා නැහැ. මට කිසිම කාරක සභාවක් නියෝජනය කරන්න අවස්ථාවක් ලබා දීලා නැහැ. මම ඔබතුමාට ලිපියක් දීලා ඇහුවා. මාව මොන කාරක සභාවටද යොමු කරන්නේ කියලා. නමුත් මාව කිසිම කාරක සභාවකට යොමු කරලා නැහැ. මොකද මම යහපාලනයට විරුද්ධ නිසාද කියලයි මට තිබෙන ප්‍රශ්නය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමාට බැහැ නේ? යහපාලනයට විරුද්ධයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කලාකරුවන්ගේ වත්මන් තත්ත්වය හා ඉදිරි ගමන පිළිබඳව රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 04 ක කාලයක් තිබෙනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

ගරු සභාපතිතුමනි, මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ඉතාමත් ස්තුතිය පුද කරනවා. ගරු සභාපතිතුමනි, අපි කථා කරද්දී ඔබතුමා වෙන කථාවක නියැලිලා සිටිද්දී අපි කථා කරන එකේ තේරුමක් නැහැ. ගරු සභාපතිතුමනි, මේ වත්මන් කලාකරුවන් පිළිබඳව සහ ඔවුන්ගේ අනාගතය පිළිබඳව මගේ අදහස් ප්‍රකාශ කරන්නයි මෙම අවස්ථාව ලබා ගත්තේ. මෙම සභාව නියෝජනය කරන කලාකරුවන් කිහිප දෙනෙක්ම ඉන්නවා. ඒ වාගේම සාමාන්‍යයෙන් සමාජය ගත්තොත් එහෙම, මේ කුටුම්බ තුළ කලාකරුවා කියලා කියන්නේ, එක්තරා ආකාරයක සමාජයේ යම් ස්ථරයක්. නමුත් වත්මනේ මේ පවතින තත්ත්වය යටතේ කලාකරුවන්ගේ අනාගතය පිළිබඳව නිසි ඇගයීමක් කෙරෙනවාදෝ කියලා සැකයක් ඇති වෙනවා. සාමාන්‍යයෙන් දැන් ගොවියෙක් ගත්තොත් එහෙම ගොවියාට ඉදිරි අනාගතයේදී තමන්ගේ යම් ගොවිතැන් කටයුතුවලදී විශ්‍රාම යද්දී අඩුම තරමේ ඒ ගොවියාට විශ්‍රාම වැටුපක් හරි තිබෙනවා. නමුත් අද, වත්මනේ ගත්තොත් එහෙම, මේ මෑත යුගයේදී කලාකරුවන් මිය ගියා. ඔබතුමාගේ ගම්පහ ප්‍රදේශයේ මා දැනුවත්ව ලෝකයේ

[ගරු රොඩ්නි රුඩොල්ෆ් ෆ්‍රේසර්]

තිබෙන දිගම ටෙලි නාට්‍යය, මම දන්නා තරමින් එකම නළු නිළියන් සංඛ්‍යාවක් සහභාගි වන, ඒ වාගේම ආසියාවේ දීර්ඝතම ටෙලි නාට්‍යය වන කෝපි කඩේ වාගේ ටෙලි නාට්‍යයේ ශිල්පීන් තුන් දෙනෙක්, හතර දෙනෙක් වාගේ මෑතකදී මිය ගියා. නමුත් ඔවුන්ගේ ජීවිත පිළිබඳව සහ ඒ අවසාන භාගය පිළිබඳව බැලුවාම ගරු සභාපතිතුමනි, මේ බස්නාහිර පළාතේ සංස්කෘතික අමාත්‍යාංශයකුත් තිබෙනවා. මමත් නියෝජනය කරනවා. මේ කලාකරුවන් සඳහා නිසි ඇගයීමක් සහ ඒ පිළිබඳව යම් සොයා බැලීමක්වත් කළාදෝ කියලා සැකයක් අපට මතු වෙනවා. ඇත්තටම ගරු ඇමතිතුමනි, අපට ඒ පිළිබඳව ලැජ්ජාවක් ඇති වෙනවා.

ඒ නිසා මම ගරු අමාත්‍යතුමාගේත් අවධානයට යොමු කරනවා. අපට පුළුවන් නම් බස්නාහිර පළාතේ සිටින - මේ සමස්ත ලංකාවේම සිටින කලාකරුවන් පිළිබඳව තමයි ඉතින් කථා කරන්න ඕනෑ. නමුත් බස්නාහිර පළාතේ, අඩුම තරමින් අපට අයිති ප්‍රදේශවල ඉන්න මේ කලාකරුවන් පිළිබඳව කිසියම් ඇගයීමක් කරලා, විවිධ ක්ෂේත්‍රවල නියැලිලා ඉන්න කලාකරුවන් ලියාපදිංචි කරලා ඔවුන්ට යම්කිසි භාරයක් වාගේ දෙයක් දෙනවා නම්, රක්ෂණයක් වාගේ දෙයක් කරන්න, පොදු රක්ෂණයක්, සමූහ රක්ෂණයක් වාගේ දෙයක් කරන්න. රෝගාතුර වුණු අවස්ථාවේදී ඔවුන්ට අඩුම තරමේ රෝහලකින් බෙහෙත් ගන්න පවා - මම නම් කරන්න කැමැති නැහැ. මෑතකදී මගේ ශිල්පියෙක් මියගිය අවස්ථාවකදී - ඔබතුමාගේ ප්‍රදේශයේ. එතුමාගේ මිනිය තියන්න ස්ථානයක් තිබුණේ නැහැ. හැබැයි, වත්මනේ ඉන්න ජනාධිපතිතුමාගේ ශෝකය කියලා මල් වඩමක් නම් එවලා තිබුණා. ගරු සභාපතිතුමනි, මේක නොවෙයි, කලාකරුවන් සඳහා විය යුතු කාර්ය භාරය වෙන්නේ. අද කලාකරුවෙකුට නාට්‍යයක් - අඩුම තරමින් වේදිකා නාට්‍ය ශිල්පියෙකුට ගරු අමාත්‍යතුමනි, අපට කියලා පුහුණුවීම සඳහා නිසියාකාර ස්ථානයක් නැහැ. ඒ වාගේම තමයි නාට්‍යයක් පෙන්වන්න ශාලාවක් නැහැ. අපට අයිති ශාලාවන් ගත්තොත් එහෙම, ඒ ශාලාවන් අරගෙන අපට නාට්‍යයක් පෙන්වන්න පුළුවන්කමක් නැහැ. අතිවිශාල මුදල් ප්‍රමාණයක් අය කරනවා. නෙළුම් පොකුණ ගත්තොත් එහෙම ඒක ප්‍රධාන වශයෙන් ප්‍රධාන පෙළේ ඉන්නා වූ කලා ශිල්පීන් කිහිප දෙනෙකුට පමණක් සීමා වුණු ස්ථානයක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා දැඩි කලකිරීමකට පත් වුණු යුගයකට කලාකරුවා පත් වෙලා තිබෙනවා. අද සමාජයේ කලාකරුවාට ඒ ලැබෙන නිසි ඇගයීම ලැබෙනවා දෝ කියලා පුංචි සැකයක් ඇති වෙනවා, ගරු සභාපතිතුමනි.

ඒ නිසා අද ටෙලි නාට්‍යය ගත්තත් ගරු අමාත්‍යතුමනි, අපට ඒක මේ හරහා කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. මාධ්‍ය තුළ අරගෙන යන්නා වූ මේ දිග නාට්‍යය. එහෙම නැත්නම් මෙගා ටෙලි නාට්‍යය. අද ටෙලි කම්කරුවන් බවට නළු නිළියන් පත් වෙලා තිබෙන්නේ. දවසක සේවාව ගන්නවා. දවසක සේවාව සඳහා යම්කිසි සොච්චම් මුදලක් දෙනවා. ඔවුන්ගේ අනාගතය කොහොමද අපට තීරණය කරගන්න පුළුවන් වන්නේ? ඒ නිසා අද කලාකරුවාට වෙන වෘත්තියක් කරමින් මේ ක්ෂේත්‍රයේ නියැලෙන්නට සිදු වෙලා තිබෙනවා. ඒ නිසා මම අපේ ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලනවා. ඇත්තටම මම අගය කරන අමාත්‍යවරයෙක්. අපි ඒ අංශවලත් ඉන්නවා. අපි සාකච්ඡා කළා. නමුත් ඉන් ඉදිරියට මොකක් වුණාද කියලා අපට තවමත් තීරණයක් නැහැ. ඒ නිසා අඩුම තරමේ බස්නාහිර පළාතේ ඉන්න කලාකරුවන් ලියාපදිංචි කරලා, අඩුම තරමේ ඔවුන්ව එක දවසක දිස්ත්‍රික් මට්ටමින් හරි කැඳවලා ඔවුන්ගේ තිබෙන දුක් ගැනවිලි පිළිබඳව සොයා බැලීමක් කරලා අපට පළාත් සභාව හරහා කරන්න පුළුවන් කාර්ය භාරයක් පිළිබඳව සොයා බැලීමක් කරලා ඒ කටයුතු කරනවා නම් වඩාත් හොඳයි. ඒ වාගේම තමයි අඩුම තරමින් බස්නාහිර පළාත තුළ ඉන්න කලාකරුවෙක් කියලා යම්කිසි නිර්ණායකයන් හඳුනා දෙන්න පුළුවන් හැඳුනුම්පතක් වාගේ දෙයක් හරි පිළිගන්වනවා නම්, ඒක ඉතාම වැදගත් වෙනවා, අඩුම තරමේ රෝහලකට ගිහිල්ලා ප්‍රමුඛ ස්ථානයක්වත් ලැබෙන ආකාරයට වෙනස් වෙනවා නම්. ගරු සභාපතිතුමනි, අද කලාකරුවා වයසට ගියාට පස්සේ - තරුණ අවධියේ නම් යම්කිසි තත්ත්වයක ඉන්නවා. නමුත් ඒ කලාකරුවා වයසට ගියාට පස්සේ මොනයම් ආකාරයෙන්වත් ඉන්න හිටින්න බැරි කලාකරුවන් ඉන්නවා. මහ මඟවල හිඟා කන තත්ත්වයට පත් වුණු ප්‍රධාන පෙළේ කලාකරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. මම හිතන්නේ, පළාත් සභාව හරහා අපට යම් දේවල් කරන්න පුළුවන් ගරු ඇමතිතුමනි. ඒ නිසා එම කාර්ය භාරය ඔබතුමාගෙන් සිදු වෙයි කියලා බලාපොරොත්තු වෙනවා. ඔබතුමාගේ අවධානය ඒ සඳහා යොමු කරන්නය කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, සාමාන්‍යයෙන් අපි පෞද්ගලික පැහැදිලි කිරීම්වලදී උත්තර දෙන්න කාලයක් දෙන්නේ නැහැ. වැරැදි සම්ප්‍රදායක්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම අවසර ඉල්ලා සිටිනවා. විශේෂ අවසරයකින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විනාඩියකින් ඔබතුමා ඒකට උත්තරයක් දෙන්න. වැදගත් ප්‍රශ්නයක් නිසා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මොකද, අපි මේ සම්බන්ධව අවබෝධයක් ඇති අමාත්‍යාංශයක්. කලාව සහ කලාකරුවන්ව ආරක්ෂා කළ යුතුයි. ඒ සඳහා දේශපාලනික වැට කඩොළු නොබැඳිය යුතුයි කියන මතයක ඉන්න කෙනෙක් මම. ඉතින් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මේ සභාවේ ඉන්න කලාවට සම්බන්ධ ගරු මන්ත්‍රීතුමන්ලා හතර දෙනෙක්ම මම නම් කළා. රොඩ්නි ෆ්‍රේෂර් ගරු මන්ත්‍රීතුමා, රොජර් සෙනෙවිරත්න ගරු මන්ත්‍රීතුමා, නලින්ද ප්‍රදීප් උඩවෙල ගරු මන්ත්‍රීතුමාත්, ඒ වාගේම අපේ රවීන්ද්‍ර යසස් ගරු මන්ත්‍රීතුමාත්. ඒ අයගෙන් එදා ආවේ දෙන්නෙක් විතරයි. අපි ආචාර්ය ජයලත් මනෝරත්න ගුරින්වත් කැඳවලා, තවත් කලාකරුවන් කැඳවලා අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මේ සම්බන්ධයෙන් බොහොම ලැදියාවෙන් මැදිහත් වුණා. මම කියන්න ඕනෑ. මම හරි ආසයි, ආදරෙයි කලාවට සහ කලාකරුවන්ට. ඒ නිසා ඔබතුමාගේ අදහස් බොහොම කැමැත්තෙන් ඉවසා වදාරනවා. සුදුසු වැඩ පිළිවෙළකට යන්න අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා.

**ගරු රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්**
Hon. Rodney Rudolph Fraser

අඩුම තරමින් රක්ෂණයක්වත් පවත්වාගෙන යන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට අවස්ථාව දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ බස් එකේ ඔබතුමන්ලා නග්ග ගෙන ඉන්නේ. ප්‍රශ්නයක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලියි. කොලොන්නාව කොට්ඨාශයේ කුණු ප්‍රශ්නයද? ගුරු ප්‍රශ්නය පිළිබඳව සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට අදහස් දැක්වීමට විනාඩි 03 ක කාලයක් ලබා දෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම හිතුවා කුඩු ගැන කිව්වාම කොලොන්නාව විතරයි කියලා. බලන කොට කැලණිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නිතරම කුණු ප්‍රශ්නය ගැන කථා කරන නිසා මට මතක් වුණේ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, කාලය ලබා දීම පිළිබඳව බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා කිව්වා වාගේ මෙපමණ කල් කුඩු ප්‍රශ්නයයි, කුණු ප්‍රශ්න යයි තිබුණා. දැන් ගුරු ප්‍රශ්නයකුත් ඒකට එකතු වෙලා තිබෙනවා, ගරු සභාපතිතුමනි. දැන් අපි සාමාන්‍යයෙන් දන්නවා, ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය අනුව දෙසැම්බර් 31 වැනිදා වන කොට කලින් වසරේ ගුරු මාරුවීම් කටයුතු සියල්ල අවසන් කරන්න ඕනෑ. ඒ කෙසේ වෙතත් ඒක යම් යම් හේතු නිසා ප්‍රමාද වෙනවා. දැන් මේ වසරේ ගුරු මාරුවීම් නියමිත වෙලා තිබුණේ, ජනවාරි 11 වැනිදා ඉඳලා ක්‍රියාත්මක වන විධියටයි. නමුත් ජනවාරි 04 වැනිදා ඉඳලා තමයි ගුරු මාරුවීම් සම්බන්ධයෙන් පාසල්වලට තොරතුරු එන්න, ලියුම් එන්න පටන් ගත්තේ. කොහොම වෙතත් මේ කටයුතු කෙරීගෙන යන කොට අපේ කලාපයේ, ඒ කියන්නේ කොලොන්නාව අධ්‍යාපන කොට්ඨාශයේ

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

විදුහල්පතිවරුන් කිව්වා, මේ විදියට ගියොත් පාසල් පවත්වාගෙන යන්න බැහැ. මේ මාරු කරලා තිබෙන ගුරුවරුන්ගේ ප්‍රශ්න තිබෙනවා. අනුප්‍රාප්තිකයන් දීලා නැහැ. මාරුවීම්වලට ගිය ගුරුවරුන්ගේ නිශ්චිත මාරුවීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වෙලා නැහැ. සමහරු අවුරුදු හතරෙන් මාරු කරලා තිබෙනවා. සමහරු පහෙන් මාරු කරලා තිබෙනවා. සමහරු නියමිත පරිදි අවුරුදු 10 න් මාරු කරලා තිබෙනවා. ඒ නිසා මේක බරපතළ තත්ත්වයක්. පාසල් පවත්වාගෙන යන්න බැරි තත්ත්වයක් තිබෙනවා කියලා ඒ විදුහල්පතිවරුන් ප්‍රකාශ කළා. මේ පිළිබඳව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමියට පැහැදිලි කළාට පස්සේ එතුමිය කිව්වා, එහෙමනම් මේ ගුරු මාරුවීම් තාවකාලිකව නතර කරන්න වෙනවා කියලා. කෙසේ වෙතත් ජනවාරි 07 වැනිදා වෙන කොට අභියාචනා දාන්න තිබුණා. දැන් අභියාචනා සඳහා කැඳෙව්වා. මේ කැඳෙව්වාම ගුරු මාරු මණ්ඩල දැඩි ලෙස මේවාට මැදිහත් වන බව අපි දන්නවා. ඊට පස්සේ විදුහල්පතිවරු පෙන්වන කොට මේ ගුරු මාරු මණ්ඩලයට පවා පෙනී ගියා, චක්‍රලේඛ අනුව ගුරු මාරුවීම් වෙලා නැහැයි කියලා. නමුත් මේ ගුරු මාරු මණ්ඩලයේ ඒකාධිපතියෙක්, පුංචිහේවා කියලා. මේ ගුරු මාරු මණ්ඩලය කැඳවපු වේලාවේ විදුහල්පතිවරුන්ට එන්න කියලා කලාප අධ්‍යක්ෂතුමිය ඉල්ලීමක් කළා. ඒ අනුව විදුහල්පතිවරුන් ආවා. විදුහල්පතිවරුන් ආවාම මේ පුංචිහේවා මැතිතුමා කිව්වේ මොකක්ද? එතුමා කිව්වා, මට විදුහල්පතිවරු එක්ක කථාවක් නැහැයි කියලා. එහෙම කියලා, විදුහල්පතිවරු ටික මේ ගුරු මාරු මණ්ඩලය ඉදිරියෙන් පන්නලා දැම්මා. විදුහල්පතිවරුන් කියන්නේ විශේෂ සේවයක්. මේ සාමාන්‍ය ගුරුවරුන් මේ ගුරු මාරු මණ්ඩලවල ඉන්නේ. බහුතරයක් මේ වෘත්තීය සමිති නියෝජිතයන්. නමුත් ඒක නොසලකා මේ විදුහල්පතිවරුන් ටික එළවා ගත්තා. මේකෙන් වුණේ මොකක්ද? ගුරු මාරු අවුලෙන් අවුලට පත් වුණු එකයි ගරු සභාපතිතුමනි.

දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මම කැමැතියි මේ වේලාවේ ගරු සභාපතිතුමනි, සභාගත කරන්න. කොලොන්නාව කොට්ඨාශයේ ගුරු හිඟය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම්තුමා වෙත මේ විදුහල්පතිවරුන් සියලු දෙනා අත්සන් කරලා යැව්ව ලිපියේ පිටපතක්. මම ගරු ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. දැන් මේ වෙලා තිබෙන්නේ මොකක්ද? මේ ප්‍රශ්නය සම්පූර්ණයෙන්ම අවුල් කළේ මේ ගුරු මාරු මණ්ඩලයයි. ප්‍රශ්නය තිබෙන්නේ ගුරු මාරුවීම්වල නොවෙයි. ගුරු මාරු මණ්ඩල මේ සියල්ල කණපිට හරවලා තිබෙන්නේ. දැන් බලන්න. මේ ප්‍රශ්නය ගොඩනැඟෙන්න හේතුව මොකක්ද? අපි දන්නවා, ගුරු මාරු මණ්ඩලවලට එන්නේ ගුරු වෘත්තීය සමිතිවලින්. මේකට කිසියම් නිර්ණායකයක් තිබෙන්න ඕනෑ. නිර්ණායකයන් ගණනාවක් තිබෙනවා. නමුත් මේ ගුරු මාරු මණ්ඩලවල හරි ප්‍රතිපත්තියක් නැහැ. විශේෂයෙන් ඒවායේ ප්‍රමිතියක් නැහැ. ගුරු මාරු මණ්ඩලයකට පත් වෙන්න අඩුම වශයෙන් නිර්ණායක කිහිපයක් සොයා බලනවා. විශේෂයෙන්ම මුළු ගුරු සංඛ්‍යාවෙන් 15% ක් නියෝජනය කරන ගුරු සංගම්වලට තමයි මේ ගුරු මාරු මණ්ඩලවලට එන්න පුළුවන්. එහෙම නැත්නම් සම්පූර්ණයෙන් වෘත්තීය සමිති කටයුතු සඳහා වෙන් වුණු ගුරුවරු වෙන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, ඊටත් වඩා වැදගත් කාරණයක් තිබෙනවා. වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර් ළඟ වාර්ෂිකව, යාවත්කාලීන ලෙස ලියාපදිංචි වුණු ගුරු සංගම්වලට විතරයි මේකට සම්බන්ධ වෙන්න පුළුවන්. නමුත් මම අහන්නේ මෙහෙම වෘත්තීය සමිති තිබෙනවාද කියලා. මේ මාරු මණ්ඩලවල මෙහෙම වෘත්තීය සමිති නියෝජිතයන් නොවෙයි ඉන්නේ. ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය උල්ලංඝණය කරලා තිබෙනවා. මේකෙන් වුණේ මොකක්ද? කොලොන්නාව කොට්ඨාශයට මේ වන විට මම ගණන් බලලා තිබෙනවා, ගුරුවරුන් 95 දෙනෙක් අඩුයි. ජාතික පාසල් දෙකක් තිබෙනවා. සියල්ල බැලුවාම ගුරු හිඟය 100 පනිනවා. ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ පිළිබඳව වහාම අවධානය යොමු කරලා, විශේෂයෙන් මේ ගුරු මාරු මණ්ඩලවලට පත් කරන වෘත්තීය සමිති නියෝජිතයන් ගැන සොයා බලන්න. මේ වෘත්තීය සමිති ගැන සොයා බලන්න. ඔවුන්ට තිබෙන බලතල ගැන සොයා බලන්න. ඒක නිසා මේක වහාම නියාමනය කරන්න, පාලනය කරන්න කියලා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් තවත් ලිපි දෙකක් මම මේ සමඟ සභාගත කරනවා. බස්නාහිර පළාත් ගුරු ප්‍රධාන අමාත්‍යතුමාටත්, සමූපකාර විෂයය භාර අමාත්‍යතුමාටත්. මම මීට කලින් වතාවලදී ප්‍රකාශයක් කළා. කොටිකාවත්ත සණස සමිතියේ දූෂණ පිළිබඳව. නමුත් තවමත් කිසිවක් සිදු වෙලා නැහැ. ඒ පිළිබඳව මා විසින්

සකස් කළ විශේෂ වාර්තාවක් අදාළ අයගේ දැන ගැනීම සඳහා අද සභාගත කරනවා.[2] ඊට අමතරව පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වත්මන් සැලසුම් අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙනුත්, ඔහුගේ පත්වීම හා ක්‍රියා කලාපය සම්බන්ධයෙන් මම මීට පෙර වතාවකදී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා සභාගත කරන්න. කාලයත් අවසානයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ප්‍රකාශයක් කළා. ඒ සම්බන්ධයෙනුත් කිසිම කටයුත්තක් කෙරිලා නැති නිසා ඒ පිළිබඳව වාර්තාවකුත්, ඒ පත්වීමට එරෙහිව තිබෙන චෝදනා සම්බන්ධ වාර්තාවකුත් මේ සමඟ සභාගත කරනවා,[3] ගරු සභාපතිතුමනි. කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

2016.02.09

ගරු සභාපතිතුමා මගින්,

<u>බස්නාහිර පළාත් සභා ප්‍රධාන අමාත්‍යතුමාගේ හා සමූපාකාර විෂය භාර අමාත්‍යතුමාගේ අවධානයට</u>

සීමාසහිත කොටිකාවත්ත සණස සමිතියේ දූෂිත ගණුදෙනු සහ දූෂිත පාලනය පිළිබඳ තත්වය පැහැදිලි කරමින් මවිසින් මීට පෙර මෙම සභාවේදී කල ප්‍රකාශයට අමතරව අවධානය යොමු කිරීම සඳහා මෙන්ම ඉදිරි පියවර ගැනීම සඳහා මා වෙත ලැබුණු තොරතුරු මෙසේ සභාගත කරමි.

(1) 2015-12-20 දින පැවති කාරක සභා (අධ්‍යක්ෂ මණ්ඩල) නිලවරණයේ දී සමිතියේ උප සභාපතිවරයා වශයෙන් තේරී පත්වූ ඇල්වලගේ සිසිර කුමාර මහතා නිලවරණයට ඉදිරිපත්වීම නීතිවිරෝධී බවත්, ඒ අනුව ඔහුගේ පත්වීම ශූන්‍ය සහ බලරහිත බවත් ප්‍රකාශ කර එම පත්වීම අවලංගු කරන ලෙස ඉල්ලා 2015-12-22 දින සමූපකාර සංවර්ධන කොමසාරිස්වරයා වෙත භාර දෙන ලද ලිපිය සම්බන්ධයෙන් මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට සමූපකාර කොමසාරිස්වරයා අපොහොසත් වී ඇත.

මෙම තැනැත්තා මේ දක්වා ම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගි වෙමින් සමිතියේ කටයුතු සිදු කරන බව අවස්ථා ගණනාවක සමූපකාර සහකාර කොමසාරිස්වරිය වෙත සමිතියේ සාමාජිකයන් විසින් දැනුම්දී තිබුනද මේ දක්වා කිසිදු විමර්ශණයක් සමූපකාර දෙපාර්තමේන්තුවෙන් සිදු කර නොමැත.

ඇල්වලගේ සිසිර කුමාර නැමැත්තා නිලවරණයට ඉදිරිපත්වන අවස්ථාවේ දී සමිතියෙන් ලබා ගෙන තිබූ ණය වර්ග 3 කට ගෙවිය යුතු ණය වාරික මාස 3 කට වඩා අතපසු කර තිබූ හෙයින් සමිතියේ අතුරු ව්‍යවස්ථාව අනුව ඔහුට නිලවරණයට ඉදිරිපත් විය නොහැක. නිලවරණය ගැන දන්වමින් සාමාජිකයන්ට සමිති ලේකම්වරයා යවන ලද ලිපියෙහි ද කාරක සභාවට පත්වීමට ඇති නුසුදුසුකම් දක්වා තිබූ බවත්, මාස 3 කට වඩා ණය වාරික ගෙවීම් අතපසු කර ඇති තැනැත්තකු නුසුදුස්සෙකු ලෙස එහි දක්වා තිබූ බවත් දැනගන්නට තිබේ.

(2) 2015-12-20 දින පැවති නිලවරණය ඉතා දූෂිත අයුරින් පවත්වා ඇති අතර ලැබී ඇති තොරතුරු වලට අනුව නිලවරණයට ආසන්න දිනවල සමිතියේ සභාපතිවරයා ඇතුළු කණ්ඩායම ජයග්‍රහණය කරවීම සඳහා සමිතියේ මුදල් වැය කරමින් තැපැල් මගින් හා දුරකථන ඇමතුම් මගින් එම කණ්ඩායමට පමණක් ඡන්දය ලබා දෙන ලෙස ඉල්ලා ඇත.

මෙම නිලවරණයෙන් පසුව සමිතියේ මූල්‍ය තත්වය සම්බන්ධයෙන් ගණුදෙනුකරුවන්ගේ විශ්වාසය පළුදු වීම හේතුවෙන් ගණුදෙනුකරුවන් විශාල පිරිසක් තම තැන්පතු ආපසු ලබාගැනීමට පෙළඹී සිටිති. සමිතියේ මූල්‍ය කළමනාකරණය දුර්වල බව ඔවුහු ප්‍රකාශ කරති.

(3) නිලවරණයෙන් දින 2 කට පසුව සමිතිය සිය සාමාජිකයන්ට ලබාදී ඇති ණය සඳහා අය කරනු ලබන පොලිය සියයට 19 සිට 15 දක්වා අඩු කර ඇත. මෙය සිදු කලේ ණය සඳහා අධික පොලියක් අය කරන බවට නිලවරණයට පෙර සිටම සාමාජිකයන් විසින් දැඩි විරෝධයක් පලකර සිටි නිසා බව පැවසේ.

එසේ අඩු කළ ද සාමාජිකයන් විසින් සමිතියෙන් තැන්පත් මුදල් නැවත ලබා ගැනීම ඉහල යාම බරපතල තත්වයකි. සමිතිය මූල්‍ය අර්බුදයකට මුහුණ දී ඇති බව වර්තමාන සභාපතිවරයාට වැටහී යාමෙන් පසුව ස්ථාවර තැන්පත් සඳහා සමිතිය විසින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලබා දෙන පොලිය සියයට 15 දක්වා වැඩි කර ඇත. මුලදී මෙම පොලී වැඩි කිරීම ජනවාරි 31 දින දක්වා පමණක් සීමා කර තිබූන ද පසුව එම දින සීමාව ඉවත් කර තවදුරටත් සියයට 15 පොලියට තැන්පත් මුදල් අය කර ගන්නා බව වාර්තා වෙයි.

මේ නිසා ජ්‍යෙෂ්ඨ නොවන පුරවැසි සාමාජිකයන් ද තම තැන්පත් මුදල් නැවත ලබා ගෙන තම වැඩිහිටි දෙමාපියන්ගේ නමින් නැවත සමිතියට වැඩි පොලියක් ලබා ගැනීම සඳහා මුදල් තැන්පත් කිරීම අරඹා ඇත. මෙයින් සිදුවී ඇත්තේ සියයට 10.5 කට මුදල් තැන්පත් කර තිබූ තැන්පත්කරුවන් එම තැන්පතු ඉවත් කර නැවත සියයට 15 පොලියක් ගැනීමට තැන්පත් කිරීමය.

නමුත් සාමාජිකයන් වෙනුවෙන් ණය සඳහා අය කරනු ලබන පොලිය ද සියයට 15 ක් වීම නිසා ස්ථාවර තැන්පත් පොලිය සහ ණය පොලිය අතර වෙනසක් නොමැතිවී ඇත. මේ අනුව මෙම පොලී අතර පරතරයක් නොවීම නිසා සමිතියට බරපතල පාඩුවක් සිදුවනු ඇත. නමුත් ඒ බව හොඳින්ම දැනගෙන ද මෙම තත්වය පවත්වාගෙන යනු ලබන්නේ සමිතියේ මූල්‍ය තත්වය දුබල බව සහ එහි පාලනය දූෂිත බව වටහාගෙන ඇති විශාල වශයෙන් මුදල් තැන්පත් කර ඇති බොහෝ සාමාජිකයන් තම ස්ථාවර තැන්පත් ඉවත් කර ගැනීම නිසා බව සාමාජිකයෝ පවසති. ***පසුගිය නිලවරණයෙන් පසුව මේ දක්වා සමිතිය මූල්‍ය වශයෙන් අස්ථාවර බව අවබෝධ කරගෙන <u>රුපියල් කෝටි 25 කට</u> අධික ප්‍රමාණයක මුදල් තැන්පත් ඉවත් කර ගැනීමට සමිතියේ ගණුදෙනුකරුවන් රාශියක් විසින් කටයුතු කර ඇත. මේ වන විට රුපියල් ලක්ෂ 25 සිට රුපියල් කෝටිය ඉක්මවා ස්ථාවර තැන්පත් තිබූ බොහෝ තැන්පත්කරුවන් තම මුදල් ඉවත්කර ගනිමින් සිටියි.***

(4) සමිතිය විශාල මුදල් අර්බුදයකට ගමන් ගනිමින් සිටින නිසා 2016-01-07 දින සිට දේපල ඇප මත සාමාජිකයන් වෙත ලබා දෙනු ලබන ණය සීමා කර ඇත. නිලවරණය දක්වාම සාමාජිකයකුට උපරිම වශයෙන් රු. ලක්ෂ තිස් පහක ණය මුදලක් ලබා ගැනීමේ හැකියාව තිබූ අතර මසකට රුපියල් ලක්ෂ 5ත් - 35ත් අතර ප්‍රමාණයේ ණය 20 ක් පමණ නිකුත් කර තිබුනි. නමුත් වර්තමාන මුදල් අර්බුදය හේතුවෙන් මෙම ප්‍රමාණයේ ණය දීම මේ දක්වා සිදු කර ඇත්තේ 4 ක් පමණි. සාමාන්‍ය ණය දීම රුපියල් 250,000.00 ට අඩු ණය වලට සීමා කර ඇත.

මෙම අර්බුදය වර්ධනය වෙමින් පවතින නිසා සමිතියේ ගණුදෙනු පවත්වාගෙන යාම සඳහා සීමාසහිත සණස සංවර්ධන බැංකුවෙන් රුපියල් කෝටි 3 ක ණය මුදලක් සමිතිය විසින් අයදුම් කර ඇත. සමිතියේ කටයුතු පවත්වාගෙන යාමට බාහිරින් ණය ලබා ගැනීමට කටයුතු කිරීමෙන් ද සමිතියේ මූල්‍ය අර්බුදය පැහැදිලි වේ.

මෙම ඉල්ලා තිබූ ණය මුදලින් රුපියල් කෝටි 2 ක් සමිතියේ ගිණුමට 2016-02-05 දින එම බැංකුව විසින් බැර කර ඇත. ඉතිරි රුපියල් කෝටිය ඉදිරි සතිය ඇතුලත සමිතියට ලැබෙනු ඇතැයි විශ්වාස කෙරේ.

මෙම තත්වය කූට ව්‍යාපාරික සක්විති රණසිංහ විසින් සිදු කරන ලද මුදල් ජාවාරම හා සමානය. ගණුදෙනුකරුවන්ගේ විශ්වාසය රැක ගැනීම සඳහා තැන්පත්වලට අධික පොලියක් ගෙවීම හා ආයතනය පවත්වාගෙන යාම සඳහා බාහිරින් ණය ගැනීම තුලින් සමිතිය ඉතා නුදුරු දිනක කඩා වැටීම වැලැක්විය නොහැකි බව සාමාජිකයෝ පවසති.

(5) සමිතියේ සභාපතිවරයා සහ ඔහුගේ පවුල ඉදිරි මාර්තු මාසය අවසානයේ දී රටින් පිටවීමේ උත්සාහයක යෙදෙන බවට තොරතුරු ලැබී තිබේ. එසේ වුවහොත් ඔහුගේ සියළු වංචා යටපත්වී 11000 ක් පමණ වන සාමාජිකයන්ගේ අයිතිවාසිකම් කඩවනු ඇත. තවද වංචා කල මුදල් යලි ගිණුම් ගත කර ගැනීමේ අස්ථාව ද මෙමගින් මග හැරී යනු ඇත.

<u>ගරු ප්‍රධාන අමාත්‍යතුමාගෙන් හා ගරු විෂය භාර අමාත්‍යතුමාගෙන් මා ඉල්ලා සිටින්නේ:</u>

- සමිතියේ දූෂණ පිලිබඳව ලැබී ඇති තොරතුරු සම්බන්ධයෙන් ස්වාධීන හා අපක්ෂපාතී විමර්ශනයක් වහාම සිදු කරන ලෙසයි.
- සමිතියේ සභාපතිවරයාගේ හා අධ්‍යක්ෂකවරුන්ගේ දූෂණ, අක්‍රමිකතා සම්බන්ධයෙන් ඔප්පු කල හැකි තොරතුරු ඇති බැවින් අදාළ පාර්ශව වලින් කරුණු විමසා මූලික විමර්ශනයකින් පසුව ඒ මත පදනම්ව වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය විසුරුවා හැර සුදුසු පාලක මණ්ඩලයක් පත් කර ඉන් පසුව පූර්ණ විමර්ශනයක් සිදු කරන ලෙසයි.
- සුදුසු විගණන නිලධාරියෙකු සමූපකාර දෙපාර්තමේන්තුව මගින් යවා නීති විරෝධී පත්වීම් පිලිබඳව විමර්ශන කඩිනමින් සිදු කරන ලෙසයි.
- එමගින් සියළු සාමාජිකයන්ගේ හා තැන්පත්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරදෙන ලෙසයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින් ස්තුතියි. පිළියන්දල ඔසුහල තවමත් විවෘත නොකිරීම හා මහජන උද්ඝෝෂණය පිළිබඳව ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

[2] කථාව අවසානයේ පළ කර ඇත.
[3] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඇත්තටම මේ සම්බන්ධයෙන් මම පැහැදිලි කිරීමක් ගිය සභාවේදී කළා. පිළියන්දල රාජ්‍ය ඔසුසල වසා දැමීම සම්බන්ධව. ඒක මධ්‍යම ආණ්ඩුව යටතේ, ඖෂධ සංස්ථාව යටතේ තිබුණු ඔසුසලක්. නමුත් මේ වන තෙක් මේ සඳහා විසඳුම් ලබා දීමට වගකිව යුත්තන් අපොහොසත් වීම සම්බන්ධව විශේෂයෙන්ම මේ සභාවේ මතු කරනවා. මේකෙන් කොයිතරම් ප්‍රමාණයකට පාඩුවක්, අලාභයක් සිද්ධ වෙලා තිබෙනවාද කියන එක සම්බන්ධව මම ගියවර ඒ ප්‍රකාශය කළා. ගරු සභාපතිතුමනි, මේ තත්ත්වය බැරෑරුම්කම නිසාම දැන් ජනතාව මේකට විශාල පෙළ ගැස්වීමක් ඇති වෙලා තිබෙනවා. හෙට උදේ 10.00 ට පිළියන්දල නගරයේ දැවැන්ත මහජන උද්ඝෝෂණයක් මේ සම්බන්ධව තිබෙනවා. විශේෂයෙන්ම රජයේ විශ්‍රාමිකයින් හෙට තමන්ගේ පැන්ෂන් එක අරගෙන යන්න පිළියන්දල නගරයට එනවා. ඒ එක්කම ඔවුන් මේ උද්ඝෝෂණය සඳහා සම්බන්ධවීමට වැඩ කටයුතු සූදානම් කරලා තිබෙනවා.

විශේෂයෙන්ම මම මේ සභාවේ මේ සම්බන්ධව මතු කරන්නේ, රාජ්‍ය ඖෂධ සංස්ථාවෙන් ඉදිරිපත් කරන දේ තමයි මේ සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ඔවුන්ට පිළියන්දලින් සොයා ගන්න බැරි වෙලා තිබෙනවා. ඔවුන්ට මේ සඳහා වියදම් කරන්න තිබෙන මුදලට සරිලන ආකාරයේ පෞද්ගලික අංශයෙන් හෝ ගොඩනැගිල්ලක් ලබා ගැනීමට තිබෙන බැරිකම තමයි ඔවුන්ගේ පැත්තෙන් මේ සඳහා ඉදිරිපත් වුණේ. නමුත් පසුගිය ආණ්ඩුව කාලයේ අපි සමත් වුණා, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලදී කථා කරලා දැනට තිබෙන තැනින් ඉවත් නොකර ඔසුසල පවත්වාගෙන යන්න. නමුත් මේ මොහොත වන කොට එක පාරටම මේ ඔසුසල වසා දැම්මා. ඒ හරහා සිද්ධ වන, මහජනතාව මුහුණ දෙන ප්‍රශ්නය සම්බන්ධයෙන් වගකිවයුත්තන් කල්පනා කළේ නැහැ. ඒ නිසා විශේෂයෙන්ම මම මේ සභාවේදී මේ සම්බන්ධයෙන් මතු කරන්නේ, පළාත් සභාවටත් මේ සම්බන්ධව අයිතියක් තිබෙනවා. විශේෂයෙන්ම ජනතාව සම්බන්ධ අයිතියක් මේ පළාත් සභාවට තිබෙනවා. ඒ නිසා පළාත් සභාවට අයිති ගොඩනැගිල්ලක්, ගරු අධ්‍යාපන ඇමතිතුමා මෙතැන ඉන්න නිසා මම යෝජනා කරනවා. ඇත්තටම කලින් කලාප කාර්යාලයට සුදුසු තැනක් තිබුණේ නැහැ. දැන් ඔබතුමන්ලා කොහොම හරි කලාප කාර්යාලයට හොඳ ගොඩනැගිල්ලක් හදලා දීලා තිබෙනවා. ඔබතුමාත් එක්ක අපි එදා ඒ ගොඩනැගිල්ලට ගියා. ඒ ගොඩනැගිල්ලේ ඉඩකඩ පහසුකම් බැලුවොත් එහෙම මම හිතන්නේ, ඒ ගොඩනැගිල්ලේ මේ වාගේ දෙයකට කිසියම් ආකාරයකට බදු පදනමකින් හරි දෙන්න පුළුවන් නම්, තාවකාලික පදනමින් හරි කොටසක් දෙන්න පුළුවන් නම් මේක ඉතාමත්ම වටිනවා. ස්ථිර ගොඩනැගිල්ලක් හැටියට නොවෙයි. තාවකාලික පදනමින් හරි. අලුත් සෞඛ්‍ය ගරු ඇමතිතුමා මෙතැන නැහැ. එහෙම නැත්නම් පිළියන්දල රෝහලේ ගොඩනැගිලි තිබෙනවා. විශාල ප්‍රමාණයක් ගොඩනැගිලි නිකන් තිබෙන්නේ. ඒ නිසා ඒ වාගේ ස්ථානයකින් හරි මේ රාජ්‍ය ඔසුසල පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිල්ලක් ලබා දීම පැත්තෙන් පළාත් සභාවට වගකීමක් තිබෙනවා.

**ගරු සුනිල් ජයමිණි -** සභා නායකතුමා
Hon. Sunil Jayamini - Leader of the House

නගර සභාවේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔව්. නගර සභාවේ ගොඩනැගිලිත් තිබෙනවා. ඒක නිසා තමයි මම මේ ප්‍රකාශය කරන්නේ. ඒ නිසා විශේෂයෙන්ම ගරු අධ්‍යාපන ඇමතිතුමා. ඒ වාගේම පළාත් පාලන ඇමති හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමාත්. ඒ වාගේම ගරු සෞඛ්‍ය ඇමතිතුමා. ඇමතිවරු තුන්දෙනෙක්ම සාකච්ඡා කරලා පුළුවන් තැනකින් පිළියන්දල නගරයේ ගොඩනැගිල්ලක් ඒ සඳහා ලබා දෙන්නය කියන ඉල්ලීම තමයි මම මේ හරහා කරන්නේ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු අධ්‍යාපන ඇමතිතුමාට යොමු කරන්න කැමැතියි. හොරණ කලාප කාර්යාලයට අයත් කෙසෙල්හේනාව විද්‍යාලයේ 1 සිට 5 දක්වා පන්ති පැවැත්වීම. ඒ වාගේම ඒ ප්‍රදේශයේ ඉතාමත් දුප්පත්, අසරණ ජනතාවකගේ දරුවන් තිස් දෙනෙක් පහේ පන්තියෙන් සමත් වෙලා හයේ පන්තියේ ඉගෙනුම ලබන්න මෙම පාසලේ ඉන්නවා. ගරු සභාපතිතුමනි, මෙතුමා හොරණ කලාප කාර්යාලයට ආවා. ඇවිදින් එතුමා කිව්වා, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ විජේතුංග සහකාර ලේකම්තුමාවත්, අපේ

කලාපයේ කලාප අධ්‍යක්ෂතුමාවත් ගෙනිහිල්ලා මෙම පාසලේ දෙමව්පියන්ව රැස් කරලා, මේ පාසලේ හයේ පන්තියේ ඉගෙනුම ලබන දරුවන්ට මේ ඉස්කෝලය පවත්වාගෙන යාමට අවශ්‍යද කියන එක දෙමව්පියන්ගෙන් විමසන්නය කියලා. මෙතුමාගේ උපදෙස් අනුව මමත් ගියා. මම හිතන්නේ, අපේ ලලිත් ගරු මන්ත්‍රීතුමාට එදා එන්න බැරි වුණා. එතැනට පැමිණිලා හිටපු සියලුම දෙමව්පියන් හයේ පන්තිය ඉවත් කිරීම පිළිබඳව දැඩි විරෝධයක් දක්වලා, ඒ ගමේ දුප්පත් දරුවන්ට මෙම පාසලේ ඉගෙනුම ලබන්න, හයේ පන්තියේ සිට ඉහළට ගෙනි යන්න අවශ්‍ය වැඩ කටයුතු කරන්නය කියලා ඉල්ලීමක් කළා. අපි හොයලා බැලුවාම, මෙම පාසලේ ගොඩනැගිලි පහසුකම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ක්‍රීඩා පිටිය තිබෙනවා. උසස් පෙළ අධ්‍යාපනය සඳහා අවශ්‍ය ලැබ් එක, ඒ වාගේම අනිකුත් අංශවලට අවශ්‍ය ඒ ගොඩනැගිලි සියල්ලක්ම සලසා ක්‍රියාත්මක වන පාසලක් හැටියට අපි දකිනවා. හැබැයි, මේ අධ්‍යාපන අමාත්‍යාංශයේ කලාප කාර්යාලයෙන් කියනවා, රෙමුණ මහා විද්‍යාලයටත්, ඒ වාගේම දොඹගොඩ විද්‍යාලයටත් මේ ළමයින් ටික යවන්නය කියලා. හැබැයි, ඒ ගමේ මේ ළමයින්ගේ දෙමව්පියන් කියනවා, අපි කිරි ටික කපලා, කළු ගඟේ වැලි ගොඩදාන්න ගිහිල්ලා එක ළමයෙක්ව අරගෙන රෙමුණට යන්නත්, අනික් ළමයාව කෙසෙල්ලෙනාව විද්‍යාලයේ පුංචි පන්තියේ තියාගෙන ඉන්න අම්මයි තාත්තයි දෙන්නාම ගියාම කන්න ටික සොයා ගන්න, ජීවන වියදම රැක ගන්න පුළුවන්කමක් නැහැයි කියලා.

ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ කෙසෙල්ලෙනාවේ නැවතිලා ඉන්න අඩු ආදායම් ලාභී දරුවන්ට රෙමුණට යන්නවත්, දොඹගොඩට යන්නවත් විධියක් නැහැ. මේ අයගේ දෙමව්පියන්ගේ ප්‍රශ්න හා ආර්ථික ප්‍රශ්න උඩ. එහෙමනම් ඔබතුමාගේ මාර්ගයෙන් මම ඉල්ලීමක් කරන්න කැමැතියි. උද්ඝෝෂණ ගණනාවක් මෙතැන පැවැත් වූවා. මම කිව්වා, ඒවා කරන්න යන්න එපා කියලා. ඒක නිසා අපි සාකච්ඡා කරලා, මේ විද්‍යාලය ඉදිරියට ගෙනි යන්න වැඩ කටයුතු කරන්න, මෙය ක්‍රියාත්මක කරන්න වැඩ කටයුතු කරන්නය කියන එක ඔබතුමාගේ මාර්ගයෙන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාට මම යොමු කරන්න කැමැතියි. එහෙමනම් මට ලබා දීපු කාලය පිළිබඳව ස්තුතිවන්ත වෙමින් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරලා මෙම විද්‍යාලය හය වසර දක්වා ක්‍රියාත්මක කරන්න වැඩ කටයුතු කරන්න කියන එක මම මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඒ එක්කම මම පෙන්වා දෙන්න කැමැතියි. කළුතර දිස්ත්‍රික්කයේ මෙතුමා නියෝජනය කරන ආසනය බැලුවාම ඉතාම දුෂ්කර, අසරණ දරුවන් ඉන්න පාසල් තිබෙන පළාතක්. ඒ නිසා ඔබතුමා මේ අධ්‍යාපන විෂයයේ පරිශිෂ්ට තුන, අධ්‍යාපනය පිළිබඳව අපට ලැබිලා තිබෙන බලය අනුව ගරු සභාපතිතුමනි, ඒකේ 09 වැනි ඡේදයේ පෙන්වනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු ඇමතිතුමා මේ පනතේ 09 වැනි ඡේදයේ පෙන්වනවා.

*උපදේශක කර්තව්‍යය භාර පළාත් අධ්‍යාපන මණ්ඩල පත් කිරීම අධ්‍යාපන අමාත්‍යවරයාගේ වගකීම වන්නේය කියලා.*

මේ පනතේ පෙන්වනවා. හැබැයි, ඔබතුමා ඉස්සෙල්ලා කිව්වා අදාළ නොවේ කියලා. මම මේ කරුණ ඇහුවාම. ඒක හැබැයි ගරු සභාපතිතුමනි, -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා ඇහුවේ උපදේශක මණ්ඩල ගැන නොවෙයි. අධීක්ෂණ මන්ත්‍රීවරු ගැන.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ, නැහැ. මම උපදේශක මණ්ඩලයක් ගැන කියන්නේ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා, මගේ මේ තවම තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ග්‍රාමීය මට්ටමේ -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මගේ ළඟ එහෙම එකක් නැහැ. ඔබතුමා මගෙන් විමසුවෙත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපදේශක මණ්ඩල නොවෙයි. එතුමා කිව්වේ අධීක්ෂණ මන්ත්‍රී සම්බන්ධව.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

කර්තව්‍යය භාර වැඩ පිළිවෙළ සම්බන්ධව මෙතුමාට බලයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි, ගරු මන්ත්‍රීතුමා. මට කාලය දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට බලයක් තිබෙන එක ගැන සහ -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ පනතේ තිබෙන -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට බලයක් තිබෙන එක ගැන සහ ඒ ගැන සහයෝගය පළ කරලා කථා කරන එකට මම එකඟයි. හැබැයි, මේ ප්‍රශ්නයේ එහෙම එකක් අහලා තිබුණේ නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

අධිකාරිය ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදෙස් අනුව පත් කරන්නය කියලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

හිතවත් ගරු මන්ත්‍රීතුමනි, එහෙම එකක් මගෙන් ඇහුවේ නැහැ. එච්චරයි කියන්න තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න එපා. කථාව අවසන් කරන්න දෙන්න. සමාවෙන්න. කාලය දෙන්න බැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කැමතියි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට තව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ, ගරු ඇමතිතුමා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේ සම්බන්ධව නොවෙයි. විනාඩියක් ඕනෑ, ගරු සභාපතිතුමනි. මේ සම්බන්ධව නොවෙයි. මේ සභාවේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ මට විවාදවලට යන්න දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට සමා වෙන්න. පොදු කාරණාවක්. මම කියන්නේ, මේ වාගේ කරුණු ගරු මන්ත්‍රීතුමන්ලා සභාවට ඉදිරිපත්

කරනවා. මගේ අමාත්‍යාංශයටත්, අනික් අමාත්‍යාංශවලටත් එහෙමයි. මේ වාගේ පුද්ගලික ප්‍රකාශ. හැබැයි, කිසිම දවසක අපි ළඟට ඇවිල්ලා නැහැ. ඒ ප්‍රකාශ. දැන් අපි මෙතැන අහගෙන ඉන්නවා. මම නම් මේ Note එක දාන මිනිහෙක් පුරුද්දකට. නමුත් සාමාන්‍යයෙන් මට ඇවිල්ලා නැහැ. මම ඒ නිසා කියන්නේ අපට එවන්නය කියන එකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු අමාත්‍යතුමා, මේ සෑම හැන්සාඩ් එකක්ම අමාත්‍යාංශ ලේකම්තුමාට අපි අරිනවා. මේ හැම දෙයක්ම අරිනවා.අමාත්‍යාංශ ලේකම්තුමාට අපි හැන්සාඩ් ඔක්කොම වාගේ යොමු කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔව්. ඔව්. ලේකම්තුමා මෙතුමාට උපදෙස් දෙන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අමාත්‍යාංශ ලේකම්තුමන්ලාට අපි හැම හැන්සාඩ් එකක්ම අරිනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

උපදේශක කාරක සභාවේ කථා කරන්න පුළුවන් නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

හැන්සාඩ් එක දෙන්නේ අද නේ. කවදාද මේ හැන්සාඩ් එක දෙන්නේ? හැන්සාඩ් එක දෙන්නේ අද. දැන් මේ මාස ගණන් ගිහිල්ලා නේ ගරු සභාපතිතුමනි. මේක නොවෙයි අපි කියන්නේ. වැඩේ පහු වෙලා, කොහු වෙලා යනවා. ඒ නිසා මේ සභාවේ එක් එක් අමාත්‍යාංශවලට ඉදිරිපත් කරන යෝජනා, චෝදනා මොනවා හරි දෙයක් තිබෙනවා නම් අපට හැකි ඉක්මණින් අපේ අමාත්‍යාංශ ලේකම්වරයාට එව්වාම, අපි ඉක්මණින් කියවලා, ඉක්මණින් ඒවාට පිළියමක් යොදන්න අපට පුළුවන් උපරිම විධියට අපි කැප වෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නව වන ජේදය බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා, මම ඔබතුමාට ගොඩක් පහසු නිසා මේ කියන්නේ. මේ පළාත් සභා රැස්වීම් දවස්වලට ඔබතුමාගේ නිලධාරියෙක් ගෙනැල්ලා වාඩි කරවලා තිබුණා නම් ඔබතුමාගේ අමාත්‍යාංශය වෙනුවෙන් කථා කරන දේවල් සටහන් කරගන්න පුළුවන්. මම හිතන්නේ ඒක හොඳයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමාගේ උපදේශයට මම ගරු කරනවා. මම කියන්නේ එහෙම නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම වුණා නම් හොඳයි.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේ කාරණා අපට විශේෂයෙන් අමාත්‍යාංශයට එල්ල කරලා එවන ඒවා. අපට එහෙම එව්වොත් අපට වඩා පහසුයි.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මම එක වරක් මෙම සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා. ලිපි ලේඛන පිළිගැන්වීමේ අවස්ථාවේදී මන්ත්‍රීවරුන්ට ඒ අවස්ථාව ලබා දෙන්න. ගරු ඇමතිතුමන්ලාට අදාළව තමන්ගේ තිබෙන යෝජනා, චෝදනා තිබෙනවා නම් ලිඛිතව ලබා දෙන්න. ඒක පොඩි සදාචාර සම්පන්න දෙයක්. අපි ළඟ තිබෙන දේවල් අඩුම ගණනේ මේ ඉස්සරහා පෙළේ අයට ලිඛිතව ලබා දෙන්න, අවස්ථා එහෙම කරගන්න බැරි නම් මේ සභාවේ - ඒක සමහර පළාත් සභාවල ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා හරි. ගොඩක් අඩුපාඩු ප්‍රශ්න තිබෙනවා.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

සභා කටයුතු එකේදී කථා කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි සභා කටයුතු එකේදී කථා කරමු.

## 2015 අංක ... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය : දෙවන වර කියැවීම
FINANCIAL (AMENDMENT) STATUTE, NO… OF 2015 : SECOND READING

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ 2015 අංක ... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය"* දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමා මේ සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය සාකච්ඡාවකට යනවාද?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අවශ්‍යද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

යනවා නේද? එහෙමනම් මම ගරු සභා නායකතුමාට හෝ ගරු ඇමතිවරයෙකුට ආරාධනා කරනවා, මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කරන ලෙස. අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමා, මේ සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් කරන ලෙසට යෝජනා කරන්න කෝ.

## පූර්ණ කාරක සභාව
COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු රංජිත් සෝමවංශ -** අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, *"මෙම සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් විය යුතු යැයි* යෝජනා කරනවා.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***
*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සෙංකෝලය ස්ථානගත කරන්න. මෙම අවස්ථාවේදී පළාත් සභාව පූර්ණ කාරක සභාවක් බවට පත් වෙනවා. අපේ තිබෙන සම්ප්‍රදාය අනුව මෙම ප්‍රඥප්තිය සම්බන්ධව එක් එක් වගන්තිය යටතේ සාකච්ඡා කරන්න මම හිතන්නේ නැහැ, අවශ්‍ය ඇතියි කියලා. මම හිතන්නේ, මෙය කිහිප අවස්ථාවකදීම සාකච්ඡා කළා. ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදීත් ගරු මන්ත්‍රීතුමන්ලා මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කළා. ඒ නිසා මගේ අදහස නම් - කාලය නම් ප්‍රශ්නයක් නැහැ.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සංශෝධන තිබෙනවා නම් ඉදිරිපත් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද 2014 අංක ... දරන මුදල් ප්‍රඥප්තියේ සංශෝධන පිළිබඳව මේ අවස්ථාවේදී අපට ඔබතුමාගේ මාර්ගයෙන් එතුමාට යමක් පෙන්වන්න කැමැතියි. මෙම

ප්‍රඥප්තියේ "ආදායම් දිරි ගැන්වීම් අරමුදල" කියන එක සඳහන් වෙනවා. ආදයම් දිරි ගැන්වීම් අරමුදල යනුවෙන් සඳහන් වන එක ඊට පස්සේ පෙන්නුම් කරනවා, "ආ" යන්නෙන්, අරමුදලින් පෙන්නුම් කරනු ලබන ගෙවීම් කියලා. මේ ගෙවීම් සහ ආදායම් පිළිබඳ විස්තර දීලා, දිරි දීමනාව උපයා ගත යුතු ආකාරය පිළිබඳව කියලා තවත් තැනක සඳහන් කරනවා. 05 සඳහන් කරනවා, *"අනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂාව බල පැවැත් වෙන්නේය"* කියලා සටහන් කරනවා. මම ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට පෙන්නුම් කරන්න කැමැතියි. මේ අරමුදලින් වියදම් කරන ගෙවීම් සහ ආදායම් මෙතැන සඳහන් කර ගත්තොත් හොඳයි. මේ පළාත් සභාවට දාලා, පළාත් සභාවේ මන්ත්‍රීවරු දැනුවත් කරලා වියදම් කරන ආකාරය සහ ආදායම් ලබා ගත්ත ආකාරය පිළිබඳව කටයුතු කිරීම වඩාත්ම සුදුසුයි කියන එක මම මේ අවස්ථාවේදී ඔබතුමාගේ මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරන්න කැමැතියි.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

තනියෙන් වියදම් කරන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ. එහෙම කරන්නේ නැහැ.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

එහෙම එකක් නැහැ නේ, පළාත් සභාවේ සල්ලි තනියෙන් වියදම් කරන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ආයේ කියවන්න බලන්න ඒක එහෙම -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මේකේ තිබෙන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තනි මතයට වියදම් කරන්න -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

102 අ යන්න, මේ වගන්තියේ සඳහන් කරනු ලබන ආදායම් දිරි ගැන්වීමේ අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටවනු ලැබිය යුතුය කියන එක. ඒකට අපි විරුද්ධ නැහැ. අපි කියන්නේ, ඒක පිහිටුවලා, ඒ පිහිටවපු මුදල් - ආපසු තිබෙනවා, අරමුදලින් කරනු ලබන ගෙවීම් කියලා. ඒකේ "ආ" යන්නේ තිබෙන්නේ,

*"පළාත් ආදායම් කොමසාරිස් විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීමෙහිලා කාර්යක්ෂමතාවය සහතික කරනු පිණිස පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන් සඳහා සමූහ දිරි ගැන්වීමේ දීමනා."*

එතකොට මේවා දීපු ආකාරය පිළිබඳවත්, එකතු කරපු ආකාරය පිළිබඳවත් සභාවේ ගරු මන්ත්‍රීවරු දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළකට යොමු කරවන්නය කියන එක තමයි අපේ යෝජනාව.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ඒක කොහොමත් වෙනවා නේ? සභාවට එනවා නේ? Audit වෙනවා නේ?

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ. නැහැ. දැන් මේකේ තිබෙන විධියට ගෙවීම් කරන්න පුළුවන් කොමසාරිස්වරයාට. අපටත් දාලා ඒ පිළිබඳව, අපවත් දැනුවත් වන ආකාරයට තිබුණාට ප්‍රශ්නයක් නැහැ. ගෙවීම් කරන්න එපා කියන එක අපි කියන්නේ නැහැ. අපි කියන්නේ මන්ත්‍රීවරුනුත් දැනුවත් වෙන එක හොඳයි කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කොහොමත් දැනුවත් වෙනවා. මේක දැන් අපි කොහොමත් ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරනවා නේ?සාකච්ඡා කරන්න පුළුවන්. ඔබතුමාගේ අදහස් -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

සභාව කියන එක -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඊළඟට මේකේ සංශෝධනය වුණු ආකාරය 91 සිට තිබෙනවා. මේකේ සටහන් කරලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මට සමා වෙන්න. මට විනාඩියක් දෙන්න. මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***
*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කිව්වේ, සභාවේ ගරු මන්ත්‍රීවරුන්ටත් දැන ගැනීම සඳහා යොමු කරන්නය කියන එක. මෙතැන මුදල් ප්‍රඥප්තියේ 39 වන වගන්තියත් සංශෝධනය වෙලා තිබෙනවා. 40 සංශෝධනය වෙලා තිබෙනවා. 43 සංශෝධනය වෙලා තිබෙනවා. 102 සංශෝධනය කරලා තිබෙනවා. පරණ එක. මම කිව්වේ, 1991. ඒ එහෙකවත් අපට දැනගන්න ලැබුණේ නැහැ, මේ සභාවේ මේවා කොහොමද වියදම් වුණේ කියලා. මොකක්ද වුණු ආකාරය කියලා.

ඒ එක්කම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා දැනුවත් කිරීම සඳහා මම මතක් කරන්න ඕනෑ. මෙම සභාවේ ගරු මන්ත්‍රීවරුන් සඳහා අපි ඔබතුමාගේ උපදේශක කාරක සභාවට යොමු කළා, ආණ්ඩුකාරතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් සකසා දීමේ වැඩ සටහන. මම ඔබතුමාට මතක් කරලා දෙන්න කැමැතියි. පළාත් සභාවේ මේ වාගේ අරමුදලක් ඇති කරලා, ඒ අරමුදලට වාර්ෂිකව අපේ පළාත් සභාවෙන් මුදලක් යොමු කරලා මන්ත්‍රීවරුන්ට විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා ගැනීම සඳහා ක්‍රියාත්මක කරන්න පුළුවන් ක්‍රමවේදයක් තිබෙනවා. මොකද අපි අධ්‍යයනය කරලා බැලුවා. මේ නීති ක්‍රමවේදය. ඒක මම ඔබතුමාට මතක් කරන්න ඕනෑ. අපේ නීති උපදේශකයන් ඉන්නවා. ඒ අයගෙනුත් අහලා, අපවත් කමිටුවකට දාගෙන මේක කරන්න. මේ වාගේ පනතක් ගෙනැල්ලා, අරමුදලක් ඇති කරලා ඒකෙන් ක්‍රියාත්මක කරන්න වැඩ කටයුතු කරන්නය කියලා.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශ්‍රාම වැටුප් ගෙවන්න බලාපොරොත්තු වෙන්නේ, අපි උපයන ආදායමෙන් මිසක් රජයෙන් හෝ මේ පළාත් සභාවේ දැනට අපි ආදායමකින් පිට. ඔබතුමාගේ අදහසට මම ගරු කරනවා. ඒ අනුව අපි කමිටුවක් හදලා ඒ වැඩේ කරමු.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක කරන්න පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

කරන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇත්තටම සභාවේ මොකක් හරි තීන්දුවක් එයි. විශේෂයෙන්ම අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා දීර්ඝ කාලයක් තිස්සේ මෙයට ෆයිට් කළා. ඒ වාගේම අපේ නව මහ ඇමතිතුමාට මේකේ ඕනෑකම තිබෙනවා. ඒ නිසා මේ සඳහා පැහැදිලි පිළිතුරක් ලැබෙයි කියලා විශ්වාසයක් අප තුළ තිබෙනවා.

**ගරු සුසාර දිනාල්**
Hon. Susara Dinal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් පොඩි ඉල්ලීමක් කරන්න තිබෙනවා. මම පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ කාරණාවක් මතු කරනු ලැබුවා. ඒ කාරණාව සම්බන්ධයෙන් අදාළ පාසලේ නම මම සඳහන් කළා. මම අපේ ගෞරවනීය මාධ්‍යවේදීන්ගෙන් ඔබතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. ඒ පාසලේ ඉගෙන ගන්න

දරුවන්ගේ ආත්ම ගරුත්වය සහ ආදි සිසුන්ගේ සහ දෙමව්පියන්ගේ ආත්ම ගරුත්වය සලකලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒ පාසලේ නම දාන්න එපා කියලා.

**ගරු සුසාර දිනාල්**
Hon. Susara Dinal

ඒ තොරතුරු වාර්තා කරන්නේ නම් පාසලේ නම භාවිතා නොකරන ලෙස මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම හොඳයි. ඒ අදහස සියලු මාධ්‍යවේදීන්ට ඇහුණා කියලා මම විශ්වාස කරනවා. අමුතුවෙන් දැනුම් දීමක් කරන්න අවශ්‍ය වන එකක් නැහැ.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, 2014 අංක 04 දරන ප්‍රඥප්තිය සංශෝධිත, 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සම්බන්ධව යම් අදහසක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මේ ප්‍රඥප්තිය සම්බන්ධව අපි ඉතාමත් සූක්ෂමව සැලකිලිමත් විය යුතු කාරණයක් තිබෙනවා. මොකද, ජනතාවගෙන් බදු මුදල් හෝ දඩ අය කර ගැනීමේදී එම දඩ මත සහ බදු මුදල් මත රඳා පැවතිලා යම් දිරි ගැන්වීමේ දීමනාවක් ලබා දෙනවා නම් මේකෙන් ප්‍රදේශයේ ජනතාව, පළාතේ ජනතාව පීඩාවට පත් වෙන්න ඉඩ තිබෙනවා. වඩ වඩාත් බදු මුදල් උකහා ගන්න පරමාර්ථයෙන් දිරි ගැන්වීම් දෙනවයි කියන එක ලෝකය පිළිගත්ත සදාචාර සම්පන්න ක්‍රමයක් නොවෙයි. එහෙම දිරි ගැන්වීමේ දීමනාවක් දෙනවා නම් දෙන්න සිද්ධ වෙන්නේ බදු මුදල් සම්බන්ධව, බදු මුදල් ලබා දෙන අයවයි දිරි ගන්වන්න ඕනෑ. ඒක තමයි ක්‍රමිකව බදු මුදල් එකතු වන ක්‍රමය ලෙස ලෝකයේ පිළිගත්ත සම්ප්‍රදාය. නමුත් මෙහෙම ක්‍රමයක් ඇවිල්ලා තිබෙනවා. පොලිස් දෙපාර්තමේන්තුව තුළ මෙවැනි ක්‍රමයක් අනුගමනය කිරීම තුළ ඉතාමත් විශාල වංචාවක් සිදු වෙලා තිබෙනවා. ඒ මුදල්වලට මොකක්ද සිද්ධ වුණේ කියලා වග කියන්න පුද්ගලයෙක් නැහැ. ඒක නිසා ඒ අරමුදල සම්බන්ධව බරපතළ ගැටලු පැන නැඟිලා තිබෙනවා. විශේෂයෙන්ම නිලධාරීන්ගේ සුභ සාධනය සඳහා අවශ්‍ය මුදල් නම් මෙතැනින් සොයන්නේ තව තවත් නිලධාරීන් පෙළඹෙනවා, මේ අරමුදල තර කර ගැනීම සඳහා ජනතාව පීඩාවට පත් කරන්න. බදු ගෙවන ජනතාව පීඩාවට පත් කරන්න. දඩ මුදල් සම්බන්ධව ජනතාව පීඩාවට පත් කරන්න. පුංචි උදාහරණයක් දෙන්නම්. අද පොලීසියට දඩ කෙළියේ යන්න සිද්ධ වෙලා තිබෙනවා. තමන්ගේ මීටරය අමුණගෙන කැළෑ අස්සේ රිදිලා සිටලා ජනතාව පීඩාවට පත් වන ආකාරයෙන් තැනින් තැන දඩ අය කරගන්න ක්‍රියාත්මක වෙලා තිබෙනවා. නමුත් ජනතාව තුළ මේක -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පඩිය එකතු කර ගන්න.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඔව්. ඒ තමන්ගේ පඩිය එකතු කරගන්න. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා. මෙන්න මෙවැනි ප්‍රඥප්තියකින් එවැනි තත්ත්වයකට නිලධාරීන්ව ඇද වට්ටවන්න එපා. එහෙම අරමුදලක් සම්බන්ධව ගැටලු පැන නඟින නිසාම මේ අරමුදලේ එහෙම සුබ සාධනී කරන නිලධාරීන්ගේ යම් සහභාගීත්වයක් තිබෙනවාද? නැද්ද? කියන කාරණය. අරමුදලට වග කියන්නේ කවුද? මෙවැනි අරමුදලක් ඉතාමත් කෙටි කාලයක් ඇතුළත දැවැන්ත මුදලක් බවට පත් වෙනවා. ඒ අවස්ථාවේදී පොලිස් නිලධාරීන්ගෙන්, පොලිස් කොස්තාපල් වරයාගෙන් එකතු කරගත්ත ඒ මුදල් ප්‍රමාණය වග කියන පුද්ගලයෙක් නැති නිසා පොලීසියේ ඉහළ නිලධාරීන්ගේ තෝ තැන්නක් බවට පත් වුණා. ඒක අක්‍රමිකතාවකට ලක් වුණා. වරායේත් මේ ආකාරයටම සිද්ධ වෙලා තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ නිලධාරීන්ගේ දිරි ගන්වන්න කියලා මේ එකතු වන මුදල සුළු අතපසුවීමක් සිද්ධ වුණොත් අස්ථානගත වෙන්න ඉඩ තිබෙනවා. ඒක නිසා ඒ අරමුදල සුරක්ෂිත වීම සම්බන්ධව මේ ප්‍රඥප්තියේ කොහෙවත් තැනක සඳහන් වෙලා නැහැ. කලින් කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණයටත් වැඩිමනක් වශයෙන් කියන්නේ. මන්ත්‍රීවරුන් අධීක්ෂණය කරන්න හෝ මන්ත්‍රීවරුන්ට මේක ඉදිරිපත් කරන්න පුළුවන් වාර්තාවක් විදියට. හැබැයි, මේ අරමුදල සුරක්ෂිත වෙන්නේ කොහෙන්ද? ඒ අරමුදල සම්බන්ධව වග කියන්නේ කවුද? කොමසාරිස්වරයාට තීන්දු ගන්න පුළුවන්කම තිබෙනවා නම්, අරමුදලේ මුදල සම්බන්ධව තීන්දු කරන්න ඒ අරමුදල සුරක්ෂිත වන ස්ථානයක් නැහැ.

[ගරු අසෝක සපුමල් රන්වල]

ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙත් මෙවැනි අරමුදල් ගණනාවක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ අරමුදලුත් බරපතළ ව්‍යසනයනයන්වලට ලක් වෙලා තිබෙනවා. හැබැයි, අරමුදල්වල වෘත්තීය සමිති නියෝජනයකුත් තිබෙනවා. ඒවායේ නිලධාරීන්ගේ නියෝජනයකුත් තිබෙනවා. එහෙම තිබිලත් සුරක්ෂිත කරන්න අමාරු වෙලා තිබෙනවා. හැබැයි, මෙහෙම තත්ත්වයක් මේ අරමුදල තුළ නැහැ. මේක දැවැන්ත අරමුදලක් බවට අනාගතයේදී පත් වේවි. ජනතාව පීඩාවට පත් වන අරමුදලක් බවටත් පත් වේවි. එදාට මේ සභාවේ ඉන්න සියලු ගරු මන්ත්‍රීවරුන්ට මේ සම්බන්ධව වග කියන්න සිද්ධ වෙනවා. ඒක නිසා අපි කියන්නේ, විශේෂයෙන් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභ සාධනය සඳහා අවශ්‍ය වන මුදල් මෙවැනි ප්‍රඥප්තියකින් අපට හදන්න අවශ්‍යද? හැදිය යුතුද? ඒ සම්බන්ධව ගැටලුවක් පැන නඟිනවා. ඒ නිසා පොදුවේ ඒ සම්බන්ධව විරෝධත්වය ප්‍රකාශ කරනවා. ඊට අමතරව මේකේ සිංහල භාෂාව සම්බන්ධව පොඩි ගැටලුවක් තිබෙනවා. 102 අ(1) වගන්තියේ. මේ වගන්තිය අවසන් කරන්නේ,

"පිහිටවනු ලැබිය යුතුය. "*මේ වගන්තියේ මින් මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන ආදායම් දිරි ගැන්වීමේ අරමුදල යනුවෙන් හැඳින් වෙන අරමුදලක් පිහිටවනු ලැබිය යුතුය.*"

මේකේ භාෂාමය වශයෙන් ගැලපීමේ තත්ත්වයක් නැති බව පෙනී යනවා. ඒක සංශෝධනය කරන්නත් කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම මේකේ පරණ තිබුණු ප්‍රඥප්තියත්, 1991. පරණ තිබුණු ප්‍රඥප්තියත් මේකත් අතර වෙනස ප්‍රතිශතමය වශයෙන් වෙන් කිරීම පමණක්ද? ඒ ප්‍රතිශතය වැඩි කරන්න බලපාපු කාරණා මොනවාද කියන එක දීර්ඝ ලෙස මේ වාර්තාව තුළ නැහැ. ඒක නිසා ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ව දැනුවත් කරන්නය කියලා ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධව මෙවැනි තත්ත්වයකින් එකතු කරන මුදල් සම්බන්ධව වාර්තාවක්, කොපමණ මුදල් ප්‍රමාණයක් වාර්ෂිකව එකතු වෙයිද? දැන් උදාහරණයක් විධියට නීතිඥවරුන් බරපතළ අපහසුතාවයට පත් වෙනවා, මේ ඉඩම් තක්සේරුකරණය සහ බදු මුදල් එකතු කිරීම සම්බන්ධව. මුද්දර ගාස්තු එකතු කිරීම සම්බන්ධව. දැනටමත් ආදායම් දෙපාර්තමේන්තුවෙන් සමහර නිලධාරීන් එවැනි නීතිඥ මහත්වරුනුත්, ඒ වාගේම සේවා දායකයනුත් බරපතළ අපහසුතාවයට පත් කරන තැන් වාර අනන්තයි. ඊළඟට තක්සේරුකරු කියන එක නිවැරැදි අර්ථ කථනයක් නැති නිසා රජයේ තක්සේරුකරුගේ තිබෙන සුදුසුකම් මේ තක්සේරුකරුවන්ට තිබෙනවාද? නැද්ද? කියන කාරණයත් තිබෙනවා. මේකේ තක්සේරුකරු කියන වගන්තියේ හරි පැහැදිලිව සඳහන් වෙලා තිබෙනවා. මේ කාරණා සියල්ලම එකට සම්පිණ්ඩනය කරලා ගත්තාට පස්සේ මෙවැනි බරතළ කාරණයකට පළාත් ආදායම් දෙපාර්තමේන්තුව කියන සුළු ව්‍යූහය මේක හැදුවේ පුංචි උවමනාවකට. BTT එකතු කරන්න. අද BTT එකක් ඇත්තේම නැහැ. අද මේක පල්ලම් බහින්න සිද්ධ වෙනවා, ජනතාවගේ බදුවලට සහ එහෙම නැත්නම් දඩ මුදල්වලට.එවැනි තැනකට පල්ලම් බැහැලා හරියටම තමන්ගේ වගකීම නිර්වචනය කරලා නැති, ස්ථාපිත කරලා නැති තැනකට මෙවැනි ප්‍රඥප්තියක් රිංගුව ගමන්ම ඒ නිලධාරීන් ක්‍රියාත්මක වෙන්න පටන් ගන්නවා, තනිකර තමන්ගේ වගකීම බදු ටික සූරාගෙන කෑම සහ ඒ වාගේම දඩ එකතු කර ගැනීමට. එතකොට එතැනට එන යම් නීතිඥ මහත්මයෙකුට යම් ඉඩමක් විකුණන පුද්ගලයෙකුට, එහෙම නැත්නම් ඉඩම් develop කරන පුද්ගලයෙක් එතැනට ආවාට පස්සේ ඔහු අපහසුවට පත් කරන්න නිලධාරී යාන්ත්‍රණය ක්‍රියාත්මක වෙන්න පුළුවන්. ඒක නිසා ප්‍රදේශයේ බදු ගෙවන ජනතාව අපි සුරක්ෂිත කරන්න ඕනෑ. යම් දිරි ගැන්වීමක් මොවුන්ට ලැබෙනවා නම්, ඒ වාගේම බදු ගෙවන ජනතාව දිරි ගන්වන්න ක්‍රමවේද සකස් කරන්න ඕනෑ. මෙහෙම නැතිව ප්‍රඥප්තියක් තුළින් මේක රිංගෙව්වාට පස්සේ පළාත් අදායම් දෙපාර්තමේන්තුව තුළ විෂමතා ගණනාවක් ඇති වෙන්න පුළුවන්. ඒක නිසා සභාවට මේ කාරණය යොමු කරනවා.

ඒ වාගේම මේ සම්බන්ධව ඉතිහාසයේ ඕනෑවටත් වඩා අත්දැකීම් තිබෙනවා. ලගාන් කියන චිත්‍රපටිය අපි බලමු. ඒකේ ඉතාමත් හොඳින් තිබෙනවා. බදු එකතු කිරීම සම්බන්ධව ගිහිල්ලා නිලධාරීන් දිරිමත් කළොත්, රජයක්, රජ කෙනෙක්, ඒකාධිපතියෙක් ජනතාව සූරාගෙන කන හැටි. ජනතාව පීඩාවට පත් කරන හැටි. එහෙමනම් රජයක් හැටියට ප්‍රතිපත්තිය වෙන්න ඕනෑ, බදු ගෙවන ජනතාව සුරක්ෂිත කරලා ජනතාවට වඩ වඩාත් වරප්‍රසාද ලබා දීලා, ජනතා වරප්‍රසාද තුළින් බදු ගෙවන්න දිරි ගැන්වීමට. බදු එකතු කරන නිලධාරීන් දිරි ගන්වන්න ගියොත් බරපතළ අපහසුතාවයකට පත් වෙනවා. මේ සම්බන්ධව සභාව දැනුවත් කරමින් මා කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ ගරු මන්ත්‍රීතුමා හොඳ විග්‍රහයක් කළේ. ඒ එක්කම කියන්න ඕනෑ. මේ දෙවන වර කියැවීම. ඔබතුමන්ලාට සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්. වැඩි විසඳුම්. කොයි ආකාරයෙන් කරන්නේ කියන එක පිළිබඳවත්, මේ වේලාවේ කාටත් සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අර කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා විමසූ කරුණට අදාළව. අරමුදලින් කරනු ලබන ගෙවීම් සහ අරමුදලට ලැබෙන ආදායම් සම්බන්ධයෙන් විගණකාධිපති විසින් විගණනය කර ඒ පිළිබඳව විමසුම් ඉදිරිපත් කරනු ලබනවා. එය ගිණුම් කාරක සභාවේදීත් විමර්ශනය කරනවා. මධ්‍යම රජයේද මේ ක්‍රමවේදය වෙනවා. ඉතින් ඔබතුමාගේ එකත් අපි බලලා - එතකොට ඒක හරිද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සංශෝධන තව ඉදිරිපත් කරන්න තිබෙනවාද? ඉදිරිපත් කරන්න පුළුවන්. වෙනත් සංශෝධන නැත්නම් ඉදිරිපත් කරපු කරුණුත් එක්ක ඒ සංශෝධනයන්ට යටත්ව ප්‍රඥප්තිය, ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සංශෝධනයන්ටද යටත්ව අනුමත කරනවාද?

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒ සංශෝධන 1, 2, 3 විධියට කිව්වොත්, පොදුවේ ගත්තාට පස්සේ මෙවැනි ප්‍රඥප්තියක් අවශ්‍ය නැහැයි කියන මතයක තමයි අපි පක්ෂයක් හැටියට ඉන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි සංශෝධන ඉදිරිපත් කරන්න එපැයි.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඒකට යටත්ව මේ අරමුදලට යම් නිශ්චිත එකක් දාන්න. යම් මට්ටමකදී මේ අරමුදල පාලනය කිරීම සඳහා ඒ අරමුදලේ ප්‍රතිශතාත්මකව යම් නිශ්චිත මුදලක් තීරණය කරන්න ඕනෑ, මීට වඩා මේ අරමුදල තර ගන්න අවශ්‍ය නැහැයි කියන එක.

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

මේක අපේ එකක් නොවෙයි. මේක මධ්‍යම රජයේත් ක්‍රියාත්මක වන දෙයක්.

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු මහ ඇමතිතුමා, ඒක අසාර්ථකයි නේ?

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අඩුපාඩු තිබෙනවා නම් බලලා නිවැරැදි කර ගනිමු.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මහ ඇමතිතුමා, සංශෝධනයන්ට යටත්ව එකඟතාවය -

**ගරු අසෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

නිලධාරීන්ගේ නියෝජනයක් මේක තුළ සිද්ධ වෙන්න ඕනෑය කියලා මේක පරීක්ෂා කිරීම සහ ඒ සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට වෘත්තීය සමිති මට්ටමින් හෝ ඒ නිලධාරීන්ගේ මට්ටමින් හරි මේක අධීක්ෂණය කරන ක්‍රමවේදයක්. ඊළඟට මේක -

**ගරු ඉසුර දේවප්‍රිය -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Isura Devapriya - Chief Minister

අපේ ගරු මන්ත්‍රීතුමා මම ගෞරව කරන, අපට හුඟක් වැදගත් මන්ත්‍රීවරයෙක් නිසා, අපි මෙය නැවත සාකච්ඡා කරලා ඉදිරිපත් කරන්නම්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙම කෙටුම්පත නැවත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරනවා. කාරක සභාවේ නිර්දේශ අනුව ඉදිරියේදී සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් ලේකම්වරයාට දැනුම් දෙනවා.

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පූර්ණ කාරක සභාව පළාත් සභා තත්ත්වයට පත් කරන්න.

***ඊට අනුකූලව පූ.භා. 11.29 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 11.29 a.m. the Provincial Council resolved it self in to a committee of the whole Council.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බස්නාහිර පළාත් සභාවේ 2015 අංක ... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යළි ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යළි ඉදිරිපත් කරලා අපි සාකච්ඡාවට භාජනය කරනවා. අනික් ගරු මන්ත්‍රීතුමන්ලාට සංශෝධන තිබෙනවා නම් ඉදිරිපත් කරන්න පුළුවන්. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, විශේෂයෙන් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. මේ සම්බන්ධයෙන් පොඩ්ඩක් අවධානය යොමු කරලා අධ්‍යයනයක් කරන්නය කියලා.

කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ රීති අත්හිටුවීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව.

## රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"පොදු වැදගත්කමකින් යුක්ත වූද, හදිසි වූද පහත සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්ය පටිපාටි රීති අංක 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව හා ඊට ආනුෂාංගිකව කාර්ය පටිපාටි රීති 8(5), 8(6), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටු විය යුතු යැයි යෝජනා කරමි."*

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## පළාත් පාලන මැතිවරණය කඩිනමින් පවත්වන ලෙස ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවෙන් හා රජයෙන් ඉල්ලා සිටීම
REQUESTING FROM THE INDEPENDENT ELECTIONS COMMISSION AND GOVERNMENT TO HOLD THE LOCAL GOVERNMENT ELECTION IMMEDIATELY

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, *"අප රට තුළ ක්‍රියාත්මක පළාත් පාලන ආයතන බොහොමයක් නිල කාලය සම්පූර්ණ වීමෙන් අනතුරුව විසුරුවා හරිනු ලැබ ඇත. තවත් පළාත් පාලන ආයතන කිහිපයක් ජනතා පරමාධිපත්‍යයට පිටුපා අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල යටතේ මේ වන විට අවස්ථා දෙකකදී කාලය දීර්ඝ කර ඇත. ජනතාව විසින් පළාත් පාලන ආයතන නියෝජිතයන් පත් කර ගැනීමේදී ඡන්දය ප්‍රකාශ කරනු ලැබුවේ වසර 04 කට කාලයකට පමණි. එසේ වුවද ජනතාවගේ ඡන්ද අයිතිය වළකාලමින් මැතිවරණ නොපවත්වා සිටීම සම්බන්ධයෙන් එකඟ විය නොහැකි අතර, ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවක් පිහිටුවා තිබියදී මෙවැනි තත්ත්වයක් පැවැතීම පිළිබඳවද එකඟ විය නොහැක. එසේ හෙයින් කඩිනමින් ජනතාවගේ නියෝජිතයන් තෝරා පත් කර ගැනීම සඳහා පළාත් පාලන මැතිවරණයක් පැවැත්වීම ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවේ වගකීම බව විශ්වාස කරන අතර, එම පළාත් පාලන මැතිවරණ කඩිනමින් නියමිත පරිදි පැවැත්වීමට පියවර ගන්නා මෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවෙන් හා රජයෙන් ඉල්ලා සිටී."*

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට, විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රීති ප්‍රශ්නයක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාවේ තිබෙන පරිදි දැන් කොට්ඨාශ නිර්ණය කරමින් පවතින අවස්ථාවක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක කථාවේදී ඉදිරිපත් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කථාවේදී නොවෙයි. අනික් එක, මේක උසාවියේ තිබෙන ප්‍රශ්නයක්. ඊට අමතරව මේ ඡන්දය තියන්න ඕනෑය කියලා අපි දැන් මෑතකදීත් යෝජනාවක් ගෙනාවා. මාස දෙක තුනකට ඉස්සෙල්ලා අපි මෙවැනිම යෝජනාවක් ගෙනාවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපි අදහස් ඉදිරිපත් කරමු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාවට.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අදහස් ප්‍රකාශ කරන්න. කමක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කමක් නැහැ. අපට බාධාවක් වෙන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එකම යෝජනාවක් මේ ගෙනෙන්නේ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කමක් නැහැ. එකම දේ කොච්චර කරනවාද? එකම එක්කෙනාට. ඕක තමයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම බැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

බැහැයි කියලා බැහැ. කරන්න වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම යෝජනාවක් ගෙනෙන්න බැහැ. තවම මාස 06 ක්වත් ගිහිල්ලා නැහැ. අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මාස 06 ක් වත් නැහැ, අපි යෝජනාව ගෙනැල්ලා. නොවැම්බර් හරි දෙසැම්බර් මාසයේ හරි ගෙනාවේ. මේ පළාත් පාලන ඡන්දය පවත්වන්න කියලා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දෙසැම්බර් මාසයේ සභාවක් තිබුණෙත් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොඩ්ඩක් ගිහිල්ලා බලන්න කෝ. මාස 06 ක්වත් ගිහිල්ලා නැහැ, මේ යෝජනාව ගෙනල්ලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අකැමැති නැත්නම්, මේ සම්බන්ධව කාලීන ගැටලුවක් නිසා දෙපැත්තම කථා කරන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

කථා කරමු. එච්චරයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක ආයේ පාරක් මේ සභාවේ රීති අනුව කථා කරන්න ගන්න බැහැ. අපි යෝජනාවක් ගෙනැල්ලා මේක සම්මතත් කර ගත්තා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

යෝජනාවක් ගෙනැල්ලා විවාද කෙරුවේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

විවාද කළා. අපි සම්මත කර ගත්තා. පළාත් පාලන ඡන්දය තියන්න කියලා අපි යෝජනාවක් ගෙනැල්ලා සම්මත කර ගත්තා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සම්මත කළාට වැඩක් නැහැ නේ. තවම තිබ්බේ නැහැ නේ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා ඡන්දය තියනවාට විරුද්ධයිද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක උසාවියේ තිබෙන ප්‍රශ්නයක්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

මේ කාලීන යෝජනාවට අදහස් ප්‍රකාශ කරන්න කියන්න. යෝජනාව ගන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අනික් එක උසාවියේ තිබෙන ප්‍රශ්නයක් අපට ගන්න බැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ. නැහැ. උසාවියේ නැහැ තියන්න කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේකට විරුද්ධව උසාවි ගිහිල්ලා තිබෙනවා. මාස හයක් ඇතුළත තියන්න බැහැයි කියලා කාර්ය පටිපාටි රීතිවල තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම කියන්නේ, මේ යෝජනාවමද ගෙනාවේ. ඊට පස්සේ ඒක විවාදයකට ගත්තාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පළාත් පාලන ඡන්දය පැවැත්විය යුතුයි කියලා, අපි කිව්වේ මාස දෙකක් ඇතුළත පවත්වන්න කියලා යෝජනාව ගෙනාවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නමුත් ඉතින් මේක -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කවද්ද යෝජනාව ගෙනාවේ? යෝජනාව ගෙනාපු දවස කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ මේක කාටවත් පුද්ගලිකව බලපාන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාත් හිටියා. අපි මේ යෝජනාව ගෙනාවේ, මාස දෙකක් ඇතුළත මේ ඡන්දය පවත්වන්න කියලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතකොට කොමිෂන් එක පත් කරලාත් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සම්මත කරලා මේක ආණ්ඩුවටත් ඇරියා. ජනාධිපතිතුමාටත් ඇරියා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මෙය කථා කළා කියලා අපට ගැටලුවක් වෙන්නේ නැහැ. මම හිතන්නේ කාටවත්. මින් අදහස් කරන්නේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙමනම් ඔබතුමා එක හා සමාන යෝජනා ගෙනාවොත් අවස්ථා ලබා දෙන්න. රීතිවල තිබෙන විධියට මෙවැනි යෝජනා තවත් එකක් ගෙනාවොත් ඔබතුමා අවස්ථාව ලබා දෙනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හානියක් නොවෙනවා නම් - අපි මේවා කථා කළාද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නමුත් රීතිවලට අනුව -

**ගරු ජනක වැලිවත්ත**
Hon. Janaka Weliwatte

එතුමාට එහෙම විරුද්ධ වෙන්න පුළුවන්කමක් නැහැ. එහෙම විරුද්ධ වෙනවා නම් ඒ කාලවකවානුත් එක්ක ඉදිරිපත් කරන්න. නිකන් මේ සභාවේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාවේ තිබෙනවා, සම්මත කර ගත්තු එක. අපි කාල වකවානු කියන්න ඕනෑ නැහැ. අනික් එක උසාවියේ -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, දෙපැත්තෙන් දෙන්නා දෙන්නා කථා කරලා මේ වැඩේ අවසන් කරමු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක උසාවියේ තිබෙන ප්‍රශ්නයක්. මේකට උසාවි ගිහිල්ලා තිබෙනවා. උදය ගම්මන්පිල ගරු මන්ත්‍රීතුමා මේකට උසාවි ගිහිල්ලා තිබෙනවා.

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon . Neel Sunethra Lal Fernando

ගරු මන්ත්‍රීතුමා ඒක තවම විභාගයට අරගෙන නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නඩුවක් දාලා තිබෙනවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උසාවියට ගිහිල්ලා තිබෙන්නේ ඡන්දය තියන්න කියලා. නඩුවක් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක තවම උසාවි ගිහිල්ලා නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, දැන් මේක න්‍යාය පත්‍රයට ආවා. දැන් මේක මෙතැනට ගෙනැල්ලා නේ තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

න්‍යාය පත්‍රයේ අවාට මේක නීති විරෝධීයි නේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

නීති විරෝධී නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කොහොමද එහෙමනම් මේක න්‍යාය පත්‍රයට ආවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අත්හිටුවීමේ යෝජනාවක් වශයෙන් නේ දැන් ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රීති අත්හිටුවීමේ යෝජනාවක් වුණත් මාස 06 ක් ඇතුළත -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මම හිතන්නේ කාටවත් මේ යෝජනාවෙන් හානියක් වෙන්නේ නැහැ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

විරුද්ධයිද?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

මෙතුමා තර්ක ඉදිරිපත් කරනවා නම් මෙතුමාට දින වකවානුත් එක්ක මෙය අහවල් දින මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙනවා කියලා පෙන්වන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අන්න ඒකයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මාස හයක් ඇතුළත -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එහෙම පෙන්වන්න බැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, මට මෙතැන කියන්න බැහැ මාස හයද? හතද? මාස දෙකද? කියලා මෙතැන නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි ඔක්තෝබර් මාසයේ මේ යෝජනාව ගෙනාවා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නැහැ. නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා නැහැයි කියලා ඔප්පු කරන්න එහෙමනම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාත් කියන්න කෝ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක එක්කෙනාට ඕනෑ විධියට මේවා කරන්න බැහැ. මේ සභාවේ රීතියක් තිබෙනවා. ක්‍රමයක් තිබෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, නීති ප්‍රශ්නයක් නැහැ. මොකද, අලුත් ක්‍රමයකට තියන්න නීතියක් මිසක් මේකට නීති ප්‍රශ්නයක් එන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

නැහැ නේද?

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අලුත් ක්‍රමයක් ගැන අධ්‍යයනයක් මිසක් මේ විවාදයට නීති ප්‍රශ්නයක් නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කෙටියෙන් විවාදයක් කරමු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කෙටියෙන් තර්ක කරන්නත්, වෙන යෝජනාවක් මේ වාගේ ගෙනාවොත් ගන්න ඔබතුමා නැවත අවස්ථාව දෙනවාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කලෝචිතයි නම් දෙනවා. ගැලපෙනවා නම්, හානියක් නොවෙන එකක් නම් (බාධා කිරීම්) මම හිතන්නේ, මේකෙන් කාටවත් හානියක් වෙන්නේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හානියක් නොවන එක වෙනම කතාවක්. හානියක් නැහැ. අපිත් කැමැතියි, ඡන්දය තිබෙනවා නම්. අපටත් ඡන්දය තියන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අපි අදහස් ටික යවමු.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

උසාවියකින් කල් තියන්න කියලා තිබුණා නම් නීති ප්‍රශ්නයක් එනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා. කථා කරන්න.

[පූ.භා. 11.36]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව ගෙනෙන්න අපි තීන්දු කළේ, අද ලංකාවේ පළාත් පාලන ආයතන මුළු සංඛ්‍යාව ගත්තොත්, 335 ක් තිබෙනවා. මහ නගර සභා 23 ක් තිබෙනවා. ඒ වාගේම නගර සභා 41 ක් තිබෙනවා. ප්‍රාදේශීය සභා 271 ක් තිබෙනවා. ඒ වාගේම පත්වෙන මන්ත්‍රී සංඛ්‍යාව ගත්තොත් 4486 ක් මුළු ලංකාවෙන්ම පත් වෙනවා. මහ නගර සභා මන්ත්‍රීවරු හැටියට 445 කුත්, ඒ වාගේම නගර සභාවලට 417 කුත්, ඒවාගේම ප්‍රාදේශීය සභාවට 3624 කුත් පත් වෙනවා. ඒ වාගේම තමයි බස්නාහිර පළාත ගත්තොත් පළාත් පාලන ආයතන 48 ක් තිබෙනවා. මහ නගර සභා 06 ක්, නගර සභා 14 ක්, ඒ වාගේම ප්‍රාදේශීය සභා 28 ක්. සියලු සංඛ්‍යාව 48 යි. ඒ වාගේම මහ නගර සභාවලට පත් වෙන මන්ත්‍රී සංඛ්‍යාව ගත්තොත් 175 යි. නගර සභාවට පත් වෙන මන්ත්‍රී සංඛ්‍යාව ගත්තොත් 129 යි. ප්‍රාදේශීය සභාවලට පත් වෙන මන්ත්‍රී සංඛ්‍යාව 565 යි. මන්ත්‍රීවරු 869 ක් පත් වෙනවා, මේ බස්නාහිර පළාතේ තිබෙන පළාත් පාලන ආයතනවලට. 2011.03.31 වැනිදා තමයි ගිය වර පළාත් පාලන මැතිවරණය පවත්වලා ප්‍රාදේශීය සභා, නගර සභා පිහිටවපු දවස. අවසන් වන දිනය තමයි 2015.03.31 වැනිදා. 2015.03.31 දිනට ආයතන 34 ක කාලය අවසන් වෙනවා. එවකට රජය 2015.05.15 දක්වා මාස 1 ½ කින් මෙම ආයතන 34 කාලය දීර්ඝ කරනවා. ඒ වාගේම තවත් ආයතන 06 ක 2015.07.31 තමයි කාලය අවසන් වෙන්නේ. ඒ පළාත් පාලන ආයතන 06 ත් 2015.07.31 දීර්ඝ කරන්නේ නැහැ. එතකොට එක පැත්තකින් පළාත් පාලන ආයතන 34 ක් 2015.05.15 වැනිදා අවසන් වෙනවා. 2015.07.31 තවත් ආයතන 06 ක කාලය අවසන් වෙනවා. ආයතන 40 ක්. පළාත් පාලන ආයතන විසුරුවා හැරලා මේ වන කොට මාස ගණනාවක් වෙනවා . කාලය ඉවර වෙලා. නමුත් එකක්වත් අද වනතුරු ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඊට අමතරව 2015.10.31 වන කොට ආයතන 08 ක්, ඒ කියන්නේ මහ නගර සභා 06 කුත්, නගර සභා 01 කුත්, ප්‍රාදේශීය සභා 01 කුත් කාලය අවසන් වෙනවා. ඒ මහ නගර සභා 06 ත්, නගර සභාවත්, ප්‍රාදේශීය සභාවත් කියන ආයතන 08 ම 2015.12.31 දක්වා පළාත් පාලන අමාත්‍යවරයා විසින් මාස 02 ක කාලය දීර්ඝ කරනවා. ඒ වාගේම 2015.12.31 ට පස්සේ, 2016.06.30 දක්වා නැවත මාස 06 ක් ඒ පළාත් පාලන ආයතන 08 ම කාලය දීර්ඝ කරනවා. එතකොට අපි කල්පනා කරලා බැලුවොත් බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන 40 කට එක නීතියකුත්, ඒ වාගේම අනික් පළාත් පාලන ආයතන 08 ට තවත් නීතියකුත් තමයි මේ පළාත් සභාව තුළ ක්‍රියාත්මක කරලා තිබෙන්නේ.

එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට පැහැදිලිව පෙනෙනවා. මොකද පළාත් පාලන ආයතන කියන්නේ, අපේ ප්‍රදේශයේ ඉන්න ජනතාවට තිබෙන සමීපතම ආයතනය. ප්‍රාදේශීය සභා සභාපති කෙනෙක්, උප සභාපති

[ගරු මෙරිල් පෙරේරා]

කෙනෙක්, විපක්ෂයේ ආණ්ඩු පක්ෂයේ පත් වුණාම ප්‍රදේශයේ ජනතාවට සමීපව වැඩ කරන ආයතනය තමයි ප්‍රාදේශීය සභාව. එතකොට අපි දන්නවා, ප්‍රදේශයේ යම්කිසි පොදු කටයුත්තකදී ඍජුවම මැදිහත් වෙන්නේ පළාත් පාලන ආයතනය. අද මේ මාස ගණන තුළ පළාත් පාලන ආයතන ක්‍රියාත්මක නොවන නිසා ප්‍රාදේශීය සභාවේ ඉන්න ලේකම් සහ නිලධාරීන් ඒක පාලනය කරන නිසා ජනතාව අද විශාල වශයෙන් අපහසුවට පත් වෙලා තිබෙනවා. අපි දකිනවා, එක පැත්තකින් පළාත් පාලන ආයතනවල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්, සභාපතිවරයෙක්, උප සභාපතිවරයෙක් ඉන්න ප්‍රදේශවල පොදු ජනතාවගේ අවශ්‍යතාවය, දවසට අවශ්‍යතාවය ඉටු කරන්න පුළුවන් ආයතනය තමයි ප්‍රාදේශීය සභාව, නගර සභාව සහ මහ නගර සභාව කියන්නේ. අද ඒක කරගන්න බැරිව ජනතාව අපහසුවට පත් වෙලා තිබෙනවා. හැබැයි, එක පැත්තකින් අපි දකින්නේ, මේ බස්නාහිර පළාත තුළ ආයතන 08 කට කාලය දීර්ඝ කරලා ඒ පහසුකම් ටික ලබා දීලා තිබෙනවා. ආයතන 40 කට දීලා නැහැ. ඒ නිසා තමයි උදය ගම්මන්පිල හිටපු ගරු ඇමතිතුමාත් උසාවියට ගිහිල්ලා ඉල්ලීමක් කරලා තිබෙන්නේ, මේ ප්‍රාදේශීය සභා, නගර සභා පවත්වන්න අවස්ථාව ලබා දෙන්නය කියලා. එක පැත්තකින් සීමා නිර්ණයන් කියන එක අද තවම තීන්දු කරලා නැති වුණාට අද අපි පැහැදිලිව දන්නවා, මේක අවුරුදු ගණනාවක් දවසින් දවස කල් යනවා. මේ අවුරුද්දේවත් පළාත් පාලන මැතිවරණය පවත්වන්නේ නැහැයි කියන එක තමයි අපට ආරංචි වෙලා තිබෙන්නේ. එතකොට අපි අවුරුදු 01 ½ කටත් වැඩිය කාලයක් මෙහෙම ප්‍රාදේශීය සභා, නගර සභා පවත්වන්නේ නැතිව, පළාත් පාලන ආයතන මන්ත්‍රීවරු පත් කරන්නේ නැතිව කාලය දීර්ඝ කරන්න ගියොත් අපේ අපහසුව වෙන්නේ විශේෂයෙන් බස්නාහිර පළාතට. ඒ වාගේම දිස්ත්‍රික්ක තුනේ සියලු පුද්ගලයන්ට, තමුන්ගේ ප්‍රදේශයට ලොකු අපහසුවක් වෙනවා කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ.

ඒ වාගේම තමයි මේ පත් වුණු ආණ්ඩුව ස්වාධීන මැතිවරණ කොමිෂන් සභා කියලා පත් කෙරුවා. එතකොට මැතිවරණ කොමිෂන් සභා පත් කෙරුවා. මැතිවරණ කොමිෂන් සභාවට යුතුකමක් තිබෙනවා, මේ විසිරුවා හැරලා තිබෙන පළාත් පාලන ආයතන ටික නැවත පත් කරන්න කටයුතු කරන එක. මධ්‍යම රජයෙන් ඉල්ලුම් කරන එක. ඒ වාගේම මැතිවරණ කොමසාරිස්තුමාට යුතුකමක් තිබෙනවා, මේ පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් පත් කරන එකට අවශ්‍ය පහසුකම් සහ පසුබිම හදන එක. ඒක අත්‍යවශ්‍ය දෙයක්. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ පළාත් පාලන මැතිවරණ පැවැත්වීමෙන් අපට සීමා නිර්ණයන් හදලා කොට්ඨාශ ක්‍රමයට ඡන්දය පවත්වලා, පළාත් පාලන මන්ත්‍රීවරු හැටියට සභාපතිවරු, නියෝජ්‍ය සභාපතිවරු හැටියට මන්ත්‍රීවරු පත් කර ගත්තොත්, අපට මේ පළාත් පාලන ආයතන ශක්තිමත් කරගෙන යන්න පුළුවන්. මොකද, බස්නාහිර පළාතට තමයි බලපාන්නේ. පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා ප්‍රධාන ඇමතිතුමා. අපේ ප්‍රදේශයෙන් යම්කිසි පළාත් පාලන ආයතනයකින් වැඩක් නොකෙරුණොත් ඒක පළාත් සභා මන්ත්‍රීවරු හැටියට අපට යොමු කෙරෙනවා. අපි ගරු ප්‍රධාන අමාත්‍යවරයාට යොමු කරනවා. නමුත් ප්‍රධාන අමාත්‍යවරයාට නිලධාරීන් හරහා තමයි ක්‍රියාත්මක කරන්න වෙන්නේ. ප්‍රදේශයේ තමුන් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් තමුන්ගේ පක්ෂයේ නැති නිසා. ඒ නිසා තමුන්නාන්සේගෙන් ඉල්ලා සිටිනවා. අද මේ යෝජනාව අපි බස්නාහිර පළාත් සභාව හැටියට ගෙනාවේ. ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාවෙන් සහ මධ්‍යම රජයෙන් ඉල්ලන්නේ, මේ පළාත් පාලන මැතිවරණය කල් දාන්න එපා. මේ පළාත් පාලන මැතිවරණය පාර්ලිමේන්තුවේ අනුමත කරපු හැටියට, කොට්ඨාශ ක්‍රමයට මෙය තියන්න ඉක්මන් කරන්න කියන ඉල්ලීම තමයි අපි කරන්නේ. මොකද, මෙය අත්‍යවශ්‍යම දෙයක්. මේක තවත් මේ අවුරුද්ද පුරා කල් ඇරියොත්, මේකට ලොකු අසාධාරණයක් වෙනවා. ඒ අසාධාරණයට වගකිව යුත්තේ, විශේෂයෙන්ම බස්නාහිර පළාත් සභාව සහ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා හැටියට ප්‍රධාන අමාත්‍යවරයා. ඒ නිසා මේ ගැන අවධානය යොමු කරන්නය කියන එක මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

[පූ.භා. 11.45]

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක් හැටියට අපි පිළිගන්නවා. නමුත් මේ පිළිබඳව විවාදයට යන කොට කරුණු කාරණා ගණනාවක් තිබෙනවා. මේ පළාත් පාලන ආයතන ඡන්ද පැවැත්වීම පිළිබඳව නව රජය අරගෙන තිබෙන තීන්දු තීරණ සහ මැතිවරණ ප්‍රකාශයට ඇතුළත් කරලා තිබෙන කරුණු

කාරණාත් එක්ක ගැටළු රාශියක් මතු වෙලා තිබෙනවා. අපට මතකයි. පසුගිය කාලයේ මේ පළාත් පාලන ආයතන සහ පළාත් සභාවල ඡන්දය පාවිච්චි කරපු ආකාරය දිහා බැලුවාම, මැතිවරණ කොමසාරිස්තුමාට පැවරිලා තිබෙන බලය දේශපාලන පක්ෂවලට පවරාගෙන, කොටස් කොටස් වශයෙන් මේ පළාත් සභාවල් ඡන්ද පවත්වපු යුගයක් තිබුණා. යහපාලන ආණ්ඩුවක් හදා ගැනීම සඳහා ජනාධිපති මැතිවරණයට යනකොට ඒ ක්‍රමවේදය පිළිබව රටේ ජනතාව, උගතුන්, විද්වතුන් සහ නොයෙකුත් අය යෝජනා ඉදිරිපත් කළා. අපි ප්‍රතිපත්ති ප්‍රකාශයේත්, ඒ වාගේම පාර්ලිමේන්තු මැතිවරණයට යනකොට අපි ජනතාවට ඉදිරිපත් කරපු මැතිවරණ ප්‍රකාශනවලවත් සඳහන් කරලා තිබෙනවා, පළාත් පාලන ආයතන මනාප ක්‍රමයෙන් ඉවත් කරලා ග්‍රාමීය මට්ටමේ ග්‍රාම රාජ්‍ය සභා ක්‍රමයට යොමු වෙන බවට. අර පරණ ක්‍රමයකටම ගම් මට්ටමින්, මනාප ක්‍රමය ඉවත් කරලා, කොට්ඨාශයකට ඕනෑම පක්ෂයකින් හෝ ස්වාධීනව මන්ත්‍රීවරයෙක් බිහි කර ගැනීමේ අයිතිය ජනතාවට ලබා දෙනවා කියලා. ඒ අනුව ඒ පළාත් පාලන ආයතන පිළිබඳව මෙතුමා හොඳ අධීක්ෂණයක් කරලා ලංකාවේ තිබෙන ප්‍රාදේශීය සභා, නගර සභා, සුළු නගර සභා සහ මහජන නියෝජිතයින් පිළිබඳව විශාල අධ්‍යයනයක් කරලා කරුණු ඉදිරිපත් කළා.

අපි මතක් කරන්න කැමැතියි, මේ අලුත් කොට්ඨාශ ක්‍රමයට එනකොට මෙතුමා කියපු සංඛ්‍යාවට වැඩිය මහජන නියෝජිතයින් පිරිසක් ජනතාවට සේවාව ලබා දීම සඳහා ඡන්දයකින් තෝරා පත් කර ගන්න අවස්ථාව ලැබෙනවා. මේ මනාප ක්‍රමය අහෝසි වුණාට පස්සේ, කොට්ඨාශ ක්‍රමයට ලබා දීම සඳහා සැලසුම් හැදුවාම ඔබතුමා කිව්වාට වැඩිය විශාල සේවාවක් ජනතාවට ලබා දෙනවා හා සමානවම ඒ පළාත් කොට්ඨාශ සංවර්ධනය කිරීමේ කාර්යයට විශාල වශයෙන් දායකත්වයක් ලබා දෙන්න පුළුවන් වෙනවා, පළාත් සභාවේත් බලතල අනුව. ඒ අනුව අද මධ්‍යම ආණ්ඩුව මේ සැලසුම් ක්‍රියාත්මක කරන්න විෂයය භාර අමාත්‍යතුමාට වගකීම් දුන්නාම, විෂයය භාර අමාත්‍යතුමා තීරණයක් ගත්තා, බස්නාහිර පළාතේ තිබෙන මහ නගර සභාව කොළඹ. කෝට්ටේ සහ කොළඹ නගර සභා බල ප්‍රදේශය ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන නීති සම්පාදනය අනුව අයිති වෙන්නේ මහ ආණ්ඩුවට. ඒ නිසා මේකේ ජීවත් වන ජනතාවට බැලුවම නගර සභාවකින් සේවාවක් ලබා දීම සඳහා - ඔබතුමා කියනවා, පළාත් පාලන ආයතන නැහැයි කියලා. පළාත් පාලන ආයතන තිබෙනවා. නිලධාරීන් ලව්වා තමයි ඒවායේ පරිපාලන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ. මහජන නියෝජිතයින් නැති වීම තමයි තිබෙන පාඩුව. පළාත් පාලන ආයතන කියන ආකාරයට නිලධාරීන් පාලනය කරන්න ගියාම, ඒ නිලධාරීන්ට අවශ්‍ය වැඩ ක්‍රියාත්මක වෙනවා කියන එක අපි පිළිගන්නවා. ඒක මේ රටේ ජනතාවට කරන ලොකු අසාධාරණයක්.

හැබැයි, අලුතෙන් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා - පසුගිය රජය හදලා තිබුණා කොට්ඨාශ නිර්ණය කරලා කොයි ආකාරයෙන්ද මේ කොට්ඨාශ කැඩෙන්නේ? කොහොමද බහු ආසන නම් වෙන්නේ කියලා. ඒවා හදලා තිබුණේ, දේශපාලන වාසිය ලැබෙන ආකාරයට ක්‍රියාත්මක කරවීමේ වැඩ පිළිවෙළක් ලෙසටයි. ඊට පස්සේ ස්වාධීන කමිටුවක් දාලා මේවා සංශෝධනය කරන්නය කියන වැඩ පිළිවෙළ යොමු කරන කොට තමයි මේ ප්‍රමාදවීම් ඇති වෙලා තිබෙන්නේ කියන එක අපි මතක් කරන්න ඕනෑ. නැත්නම් දේශපාලන පක්ෂයකට ඕනෑ හැටියට, එහෙම නැත්නම් ජනාධිපතිවරයාට, අගමැතිවරයාට, විෂයය භාර අමාත්‍යවරයාට ඕනෑ ආකාරයට මේ මැතිවරණ කල් දාන්න කිසිසේත්ම යහපාලන රජය කවදාවත් ඒකට කැමැත්තක් ප්‍රකාශ කරන්නේ නැහැ. අපේ අග්‍රාමාත්‍යතුමා කිව්වා, ඉස්සරහාට එන අප්‍රේල් මාසේ වනකොට හැකි ඉක්මණින් මේ ඡන්ද පවත්වන්න එතුමා සියලු වැඩ කටයුතු හදන්න ඇමැතිවරයාට උපදෙස් දුන්නා කියලා. ඇමැතිවරයා මැතිවරණ කොමසාරිස්තුමාගෙන් විමසුවාම එතුමා කිව්වා, මේ තිබෙන විධියට කොට්ඨාශවලට වැඩ කරන්න නම් අපට පුළුවන්. හැබැයි, මේක සංශෝධන කරන්න නම් ආපහු ජනතාවගෙන් විමසලා, ඒ ඒ කොට්ඨාශවල දිසාපතිවරුන්ට යොමු කරලා, ඒ කොට්ඨාශවලින් අරගන්න අදහසුත් එක්ක එකතු කරලා ඒ කමිටුවේ වාර්තාව මම හිතන්නේ ලබන මාර්තු මාසේ අග වනකොට ලබා දීමට වැඩ කටයුතු කරනවා කියලා (බාධා කිරීමක්) මාර්තු මාසේ අග.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

2017.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

2016. ඒ අමාත්‍යවරයාට වාර්තාව දුන්නාම අමාත්‍යතුමා ඒ පිළිබඳව අධ්‍යයනය කරලා මැතිවරණ කොමසාරිස්තුමාට

[ගරු කිත්සිරි කහටපිටිය]

ඒ වගකීම පවරලා වැඩ කටයුතු කරන්න යනකොට මැතිවරණ කොමසාරිස්තුමා හෙට වුණත් ලැහැස්තියි. ප්‍රතිපාදන තිබෙනවා. ඡන්ද තියන්න එතුමාට බලය තිබෙනවා. ඒක දේශපාලන පක්ෂයකටවත්, අගමැතිවරයෙකුටවත්, ජනාධිපතිවරයෙකුටවත් - අපේ තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මැතිවරණ කොමසාරිස්ට තමයි මැතිවරණ පැවැත්වීමේ බලය තිබෙන්නේ. අපි හිතනවා නම් මේ බලය දේශපාලන පක්ෂයකට තිබෙනවා. එහෙම නැත්නම් අපි හිතනවා නම් මේක දේශපාලන නායකයෙකුට තිබෙනවා කියලා. ඒක වැරැදියි. ඒක හරියට අධ්‍යයනය කරලා බැලුවොත් එහෙම, මැතිවරණ කොමිසම පිහිටෙව්වාට පස්සේ, මැතිවරණ කොමසාරිස්වරයාට තවත් බලතල වැඩි වුණා. ඒ මැතිවරණය නම් කළාට පස්සේ සියලුම වැඩ කටයුතු ක්‍රියාත්මක කරවීමේ බලය තිබෙන්නේ ජනාධිපතිවරයාටවත්, අගමැතිවරයාටවත් විෂයය ඇමැතිවරයාටවත් එහෙම නැත්නම් තිබෙන පාලක පක්ෂයටවත් නොවෙයි. මැතිවරණ කොමසාරිස්වරයාට කියන එක විශේෂයෙන්ම අපි මතක් කරලා දෙන්න ඕනෑ.

එහෙම නම් මම දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඇත්තටම හොඳ යෝජනාවක් ගෙනැල්ලා රීති අත්හිටුවන වැඩ පිළිවෙළ පිළිබඳව හරියට අධ්‍යයනය කරලා, ඒ වැඩ කටයුතු කරලා තමුන්නාන්සේ ලංකාවේම තිබෙන පළාත් පාලන ආයතන ටික පිළිබඳව අධ්‍යයනයක් කරලා මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව මම සතුටු වෙනවා. මොකද, මේ මන්ත්‍රීතුමා ඉතාමත් කැපවීමකින් මේවා සොයා බලලා ගෙනාපු එක පිළිබඳව. ඒත් එක්කම මම එතුමාට මතක් කරලා දෙන්න ඕනෑ. ඔබතුමා දේශපාලන වශයෙන් අරගෙන හදවතට, හෘදය සාක්ෂියට එකඟව කථා කළොත් එහෙම ඔබතුමාත් පිළිගන්නවා, සීමා නිර්ණය කිරීමේ වැඩ පිළිවෙළ තුළ අඩුපාඩුවක් තිබුණු නිසා තමයි මේක ප්‍රමාද වුණේ. ඒ නිසා හරියාකාරව කටයුතු කරලා යහපාලන ආණ්ඩුවේ අගමැතිතුමාත්, ඒ වාගේම ජනාධිපතිතුමාත් හැම තිස්සේම බලාපොරොත්තු වෙන්නේ, මේ රටේ අලුත් නීති ක්‍රමවේදයක් එක්ක, අලුත් තාක්ෂණයත් එක්ක ජීවත් වන සමාජයකට විශාල සේවාවක් කිරීමේ වැඩ පිළිවෙළකට යන්නයි. සමස්ත රටේම පුරවැසියන් එහෙම නැත්නම් ඡන්දදායකයින්ගේ ජීවන, ආර්ථික සහ නීත්‍යානුකූල වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා ස්ථිර දියුණු රටක් හැටියට ශ්‍රී ලංකාව පත් කර ගන්න දරන උත්සාහයක් මිසක් දේශපාලන වශයෙන් වැඩ කටයුතු කරනවා නම් අපට තරම් තිබෙන කරදර මම හිතන්නේ ඔබලාට නැහැ. අපේ පක්ෂයේ මිනිස්සු අවුරුදු විසි ගණනක් බැට කෑවා. ගුටි කෑවා. දුක් වින්දා. දෙයක් කර ගන්න බැරි වුණා. ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය නැතුව පක්ෂ දේශපාලනය ඉස්සරහාට ආපු නිසා. ඒක නිසා අද ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනයක් අගමැතිතුමාත්, ජනාධිපතිතුමාත් ක්‍රියාත්මක කරනවා. ඒත් එක්කම අපේ පළාත් සභාවත් ඒ ආකාරයට යන්න අපි දැනටමත් පිඹුරුපත් සකස් කරමින් යනවා. අන්න ඒ වැඩ පිළිවෙළ තුළ ඉදිරියේදී සමස්ත රටේම ආර්ථිකය, විනය, ජනතාවගේ බුද්ධිය උපයෝගී කරගෙන වැඩ කටයුතු කරන්න පුළුවන් වාතාවරණයක් අප ප්‍රධාන පක්ෂ දෙකේම නියෝජිතයින් එකතු වෙලා ඇමැතිකම් අරගෙන හදන වැඩ පිළිවෙළ ජනතාවටත්, රටටත් සේවාවක් ලබා දීලා පළාත් පාලන ආයතන ඡන්දය හැකි ඉක්මණින් පවත්වන්න යහපාලන ආණ්ඩුවට හැකි වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මගේ වන ස්වල්පය අවසන් කරනවා. ස්තූතියි.

[පූ.භා. 11.50]

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙලාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉතාමත්ම කාලෝචිත යෝජනාවක් ගෙනාවා, අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ නීති ගේන්නෙත්, නීති සංශෝධනය වෙන්නෙත් මහජන සුභසිද්ධියට. මහජන පීඩාවට නොවෙයි. අද වනකොට මම හිතන්නේ, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ජනතාවට දැනෙනම කොටස කරන්නේ එතැන තමයි. එතකොට මේ ඡන්දය කල් යනවා. සීමා නිර්ණය කිරීමේ අපහසුතාවය මත කියලා කියනවා. ඒක පේනවා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සීමා නිර්ණය කිරීම කල් යනවා නම් - අවුරුදු හතර නේ පළාත් පාලන ඡන්දයකට තියෙන්නේ? දැන් එකක් ගිහිල්ලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

පරණ ක්‍රමයට හරි තියන්න ඕනෑ.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

පරණ ක්‍රමයට හරි තියන්න ඕනෑ. මොකද, අපේ ගම්බිම්වල ගත්තාම ඉස්සර ප්‍රශ්නයක් වුණාම මන්ත්‍රීවරයාට තමයි ගිහිල්ලා කියන්නේ. අද කියන්න කෙනෙක් නැහැ. ලේකම්තුමාගේ නොම්බරය දන්නේ නැහැ. ඉස්සර මළ ගෙයක් වුණාම - දැන් කටාන ප්‍රාදේශීය සභාව ගත්තොත් එහෙම කටාන ප්‍රාදේශීය සභාවේ වතුර බවුසර් තියෙනවා. වතුර නැති ප්‍රදේශවලට ටක් ගාලා ප්‍රදේශයේ මන්ත්‍රීවරයා ගිහිල්ලා බවුසරය ගෙනැල්ලා දෙනවා. දැන් ඒ වාගේ කරදරයක් වුණාට පස්සේ, මළ ගෙයක් වුණාට පස්සේ, දානයක් වුණාට පස්සේ ඒ ගෙදර කෙනා ලේකම්ව දන්නේ නැහැ. ඉතින් මිනිස්සු අපහසුතාවයට පත් වෙනවා. ලයිට් එකක් දාගන්න විධියක් නැහැ. කුණු ටික දාන්න තැනක් නැහැ. එය කළමනාකරණය කරන්න කෙනෙක් නැහැ. ලේකම්ලා කියන්නේ, නිලධාරීන් කියන්නේ රස්සා කරන අය. මහජන නියෝජිතයා ආවාම නීති කඩන්නේ නැහැ. නීති නවලා හරි වැඩේ කරනවා. කැඩුවොත් නේ දඩුවම් තියෙන්නේ. නමුත් නිලධාරියා නීති කඩන්න ලැහැස්ති නැහැ. රස්සාවට එයා බයයි. ඔහු බය නිසා ඒ කාර්යය කරන කොට අගතිය වෙන්නේ මහජනතාවට. ඒ වාගේම මේ නැති කරලා තිබෙන ජනතා පරමාධිපත්‍ය, ඡන්ද අයිතිය හැමෝටම තියෙනවා. ඡන්දය තියන්න ඕනෑ. දැන් ජනතාව ඡන්දය දාන්න බලාගෙන ඉන්නවා. අපේ කුණු ටික ඇද ගන්න, අපේ ලයිට් එක හදාගන්න, අපේ පැච් එක දාගන්න ඡන්දය කවදාද එන්නේ? ජනතාව බලාගෙන ඉන්නවා. සීමා නිර්ණය කිය කියා, කල් දානවා.

දැන් බලන්න අපේ පළාත් පාලන ඇමැතිවරයා කිව්වා ජුනි, මාසය වෙද්දී ඡන්දය තියන්න පුළුවන් කියලා. නමුත් ඊයේ පත්තරේ ගියා ඇගමැතිතුමා කියලා තිබෙනවා, 2016 ඡන්දයක් නැහැයි කියලා. ඊළඟට යහපාලන ආණ්ඩුවේ තව කෙනෙක් කියනවා කොහොම හරි ඡන්දය තියනවා කියලා. ස්ථිර තීන්දුවක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපට පේන්නේ සීමා නිර්ණය කතන්දරය නොවෙයි. පරණ ක්‍රමයට තියන්න පුළුවන්. තව අවුරුදු හතරක් ගියාට පස්සේ අලුත් ක්‍රමය හදාගන්න. මෙතුමා කිව්වා හොඳම විධියට හදා ගන්නවා. කල් තියෙන්නේ. අවුරුදු හතරට කැහැලා ගිල්ලා වාගේ කල් යනවා. අපිත් දැන් පළාත් සභාවේ අවුරුදු 02 ක් ඉවරයි නේ? පහෙන් දෙකක් ඉවරයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ නිසා අපි බස්නාහිර පළාත් සභාව හරහා මධ්‍යම රජයට බල කරන්න ඕනෑ මධ්‍යම රජයෙන් ඉල්ලීමක් කරන්න ඕනෑ මේ ජනතාවගේ පරමාධිපත්‍යයට අත තියන්න එපා. හැමෝම ඉල්ලනවා. රට ඉල්ලනවා. ජනතාව ඉල්ලනවා. පක්ෂ විපක්ෂ හැම කෙනාම ඉල්ලනවා. එහෙම නම් කාගේ උවමනාවටද මේක කල් දාන්නේ? යුද්ධයක් නැහැ. (බාධා කිරීමක්) මෙතුමා කියනවා වාගේ ප්‍රතිපාදන තියෙනවා නම්, ප්‍රශ්න මුකුත් නැත්නම් ඇයි මේ ඡන්දය තියන්නේ නැත්තේ? අපට තේරෙන විධියට නම් ඡන්දය තියන්න ආණ්ඩුවත් බයයි. ඒකට සම්බන්ධ අයත් බයයි. යහපාලනය ඔක්කෝටම බයයි. හේතුව මොකක්ද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මහින්ද සුළඟ වාසුළියක් වෙලා කැරකෙනවා. මහින්ද රාජපක්ෂත් එක්කලා ඒගොල්ලෝ මේ ඡන්දයට මුහුණ දෙන්න බයයි. මේක තමයි ඇත්ත කාරණය. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොහොම තිබ්බත් මහින්ද පිළ උඩ එනවා. ඒක තමයි ඇත්ත කථාව. ඒ නිසා යහපාලනයට සම්බන්ධ අයයි, යහපාලනයේ අයයි, ආණ්ඩුවයි හැම කෙනාම ඡන්දය තියන්න බයයි. ඡන්දය තියන්න බය නිසා මොකද කරන්නේ? මේගොල්ලෝ ඡන්දය කල් දානවා. අපි ඉල්ලන්නේ (බාධා කිරීමක්) තමන්ගේ අභිමතය වෙනුවෙන් නොවෙයි. ජනතාව සුභසිද්ධිය වෙනුවෙන් ඡන්දය තියන්න. කොට්ඨාශ නිර්ණය කරන්න බැරිකමක් තිබෙනවා නම් රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය කිව්වා වාගේ මනාප ක්‍රමයට තියන්න. මෙතෙක් කල් මනාප එන්න පුළුවන් නම් - දින 100 න් ඡන්ද ක්‍රමය වෙනස් කරනවා. පාර්ලිමේන්තු මැතිවරණය තියෙනවා කියලා. මනාප ක්‍රමයටමයි තිබ්බේ. එහෙම නම් -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉල්ලන්න පක්ෂයක් නැහැ නේ? ඒක නේ වැඩේ?

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔබතුමා පක්ෂයක් හදන්න. ඔබතුමා පක්ෂයක් හදන්න වාගේ කියලා බලාගෙන ඉන්න කොට මට තේරෙනවා. ඔබතුමා පක්ෂයක් හදන්න. රෝස් මන්ත්‍රීතුමියත් ඔතැන ඉන්නවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගොඩක් කථා කරන්න දේවල් නැහැ. මේ රටේ ජනතාව ඉල්ලන්නේ පළාත් පාලන ඡන්දය තියන්න. මොකද, ජනතාවට තේරෙන, දැනෙන තැන තමයි එතැන. ජනතාවට පළාත්

[ගරු අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා]

පාලන මන්ත්‍රීවරයා ගාවට ඉන්නේ අපි. මේ පළාත් පාලන මන්ත්‍රීවරු නැත්නම් ජනතාව අපට තමයි කියන්නේ. ඒක නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ජනතා පරමාධිපත්‍යයට අත තියන්න එපා. ඡන්ද බලයට අත තියන්න එපා. ඡන්දය තියන්න කියලා මම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මඟින් මධ්‍යම රජයෙන් ඉල්ලා සිටිනවා.

[පූ.භා. 11.59]

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කරන අවස්ථාවේදී යම් යම් අදහස් මතු වුණා, මෙහි නීති විරෝධී භාවයක් සහ නැවත ඉදිරිපත් කිරීමක් කියලා. ඇත්ත වශයෙන්ම එකම යෝජනාව තමයි නැවත ඉදිරිපත් කරන්න බැරි. නමුත් වෙනස්කම් සහිත යෝජනා අපට කථා කරන්න පුළුවන්. ඒ වාගේම අධිකරණයට යම් ඉල්ලීමක් ඉදිරිපත් කළා කියලා මේක කථා කරන්න නීතිමය බාධාවක් නැහැ. යම්කිසි නිගමනයක් කර ගන්නයි මේක තියෙන්නේ. මේක අපරාධ පරීක්ෂණයක් නොවෙයි. ඒ වාගේම මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මේ පළාත් පාලන ආයතන අපි ඇති කළේ, එක්සත් ජාතික පක්ෂය විශේෂයෙන්ම මැදිහත් වෙලා බලය විමධ්‍යගත වෙන්න ඕනෑ කියලා. ඒ බලය විමධ්‍යගත කරනවා කියන අදහසේ තමයි මේ පුංචි පුංචි ඒකක ඒ පළාතේ නායකයින් විසින් පාලනය කරන්න ඕනෑ. ඒ කියන්නේ මධ්‍යම ආණ්ඩුවක් යටතේ විමධ්‍යගත කරපු බලය තමයි අද නැවත එක තැනකට ඒකරාශී වීමක් විධියට අපට පේන්නේ. ඒ වාගේම අපි දකිනවා, ප්‍රායෝගිකව අපි හොයලා බලන කොට දැන් මම ඉන්න ආසනය විතරක් අරගෙන බැලුවත් මම දකිනවා, සම්බන්ධීකරණ කමිටු රැස්වීම පසුගිය දිනක තිබ්බා. කටුනායක - සීදුව නගර සභාවේ නියෝජිතයෝ කවුරුත් නැහැ. එතකොට හිතු මනාපේ පාලනයක්. ඒකේ යම්කිසි අඩුපාඩුවක් ගැන කථා කරන්න ලේකම්ට දුරකථන ඇමතුමක් ගන්න කොට ලේකම් ඒ ස්ථානයේ නැහැ. ඊට පස්සේ ජංගම දුරකථනය හොයලා ගන්න කොට සමහර දාට වැඩ කරන්නේ නැහැ. සමහර දාට වැඩ කෙරුවත් මගේ අංකය හඳුනන කොට උත්තර දෙන්නේ නැහැ. කාටද මේවා කියන්නේ? ඉතින් මේක ජනාධිපතිතුමාට කියන්නද? අගමැතිතුමාට අඬ ගහලා කියන්නද? නමුත් මේ ප්‍රශ්නයෙන් පීඩා විඳින්නේ ජනතාව. දැන් ප්‍රදේශයේ කුණු එකතු කරන්නේ නැති ප්‍රශ්න තිබෙනවා. ජල ප්‍රශ්න, කාණු කපන්නේ නැහැ. ගංවතුර ඇවිල්ලා කාණු ටික යට වෙලා අපට පෞද්ගලිකව මැදිහත් වෙන්න සිද්ධ වුණොත් ඒ අය කියනවා ප්‍රතිපාදන නැහැ. අපට අනුමැතියක් දෙන්න විධියක් නැහැ. ආපදාවලට සල්ලි වියදම් කරන්න විධියක් නැහැ. ඉතින් මේ වාගේ ප්‍රශ්න ඇත්ත වශයෙන්ම නිරාකරණය කරන්න ඡන්දය ඉක්මණට තියන්න අවශ්‍යයි.

ඒ වාගේම විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ, මේ ඡන්ද ක්‍රමය ගැන. අද නීති තර්කයක් තිබෙනවා. කොට්ඨාශ ක්‍රමය පැවැත්වීම හොඳයි. මනාප ක්‍රමයේදී යම් යම් මුදල් විවිධාකාරයෙන් වියදම් කරන අය පත් වෙනවා. නමුත් නිසි මහජන නියෝජනයක් වෙන්නේ නැහැයි කියන තර්කය උඩ තමයි කොට්ඨාශ ක්‍රමය අද හඳුන්වලා දීලා ඒ පිළිබඳව කථිකාවක් ඇති වෙලා තිබෙන්නේ. කෙසේ වෙතත් මෙම කථිකාව පළාත් පාලන සම්බන්ධයෙන් ඇති වනකොට ඊළඟට පළාත් සභාවක් පවත්වන්න තිබෙනවා. ඊළඟට මහ මැතිවරණයක් පවත්වන්න තිබෙනවා. මම කියන්නේ, රජයක් විධියට මේ සියලුම දේ, ඒ සීමා නිර්ණය කරන කොට සියලුම මැතිවරණවලට මැතිවරණ කොමසාරිස්වරයා මැදිහත් වෙලා සීමා නිර්ණය කරගන්න ඕනෑ. ඊට පස්සේ තව ටිකක් කල් ගියාම පළාත් සභාවත් කල් දාන්න වෙනවා. ඇයි ඒකේ සීමා නිර්ණය කර ගන්න විධියක් නැහැ. ඊට පස්සේ පාර්ලිමේන්තුවත් අවුරුදු කිහිපයකින් කල් තියන්න වෙනවා. මේවා ගැන සැලසුමක් ඇතිව කලින් සකස් කරගන්න සිද්ධ වෙනවා. එහෙම නැත්නම් මහජනයාගේ කටයුතු දවසින් දවස ප්‍රමාද වෙනවා. ඇත්ත වශයෙන්ම අපි යම්කිසි බලයක් දීලා පාර්ලිමේන්තුවක් පත් කරන කොට ඒ පාර්ලිමේන්තුවට ජනතාව කෙරෙහි වගකීමක් තිබෙනවා. වෙන දේවල් කෙරෙහි නොවෙයි. ජනතාව කෙරෙහි වගකීම තිබෙන්නේ. ජනතාව කෙරෙහි අවධානය යොමු වෙන්න ඕනෑ. ඒ නිසා ජනතාව මූලිකව මුහුණ දෙන ප්‍රශ්න විසඳන්න පාර්ලිමේන්තුවෙන් කටයුතු කරන්න ඕනෑ. ඒ නිසා මම විශේෂයෙන්ම කියනවා. මේ ඡන්දයට අපට අලුත් ක්‍රමයකට නීතිරීති සකස් කර ගන්න කාලයක් ඕනෑ. ඇත්ත. ඒක හදිසියෙන් කරන්න බැහැ. හදිස්සියෙන් සම්මත කරපු පනත්වලින් ජනතාව පීඩා වින්දා අපි දැක්කා. ඒ නිසා කාලය ගන්න ඕනෑ. මම කියන්නේ, යම් පවතින ක්‍රමයකට මේ ඡන්දය තියන්න. හැබැයි එකක් කියන්න ඕනෑ. මේ එක්සත් ජාතික පක්ෂය ඡන්දවලට බය නැහැ. සමහරු කියනවා බයයි කියලා. අපි ඡන්දවලට බය නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමිය බය නැහැ. අපි දන්නවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අපි ඡන්දවලට බය නැහැ. විශේෂයෙන්ම කියන්න ඕනෑ. අපට බයට ඡන්ද කල් දාගන්න උවමනාවකුත් නැහැ. ඒ වාගේම අපි මහජනතාව අතර ඉන්න අය හැටියට අපි ඇත්තටම කෝටි ගණන් සල්ලි වියදම් කරන්නෙත් නැහැ. අපි ඡන්ද ලබා ගනිද්දී කෝටි ගණන් සල්ලි දීලා අපි ඡන්ද ගන්නේ නැහැ. ඒ නිසා කිසිම අවස්ථාවක අපි ඡන්ද තිබීමට පසුබෑමක් නැහැ. නමුත් මෙහි ක්‍රමවේදය පිළිබඳ විවේචන තිබෙනවා. මේ ආණ්ඩුව පත් කරන්න අපි දායක වුණා. නමුත් මේ ක්‍රමවේදය පිළිබඳ විවේචන තිබෙනවා. ඒ වාගේම පුංචි ඡන්දවලට මුහුණ දීපු මන්ත්‍රීවරු අද ගම්වල වැඩක් කරන්න ගියාම සමහර තැන්වලදී නිලධාරීන්ගේ අවමානයට ලක් වෙනවා. වෙනදා සභාපතිතුමා යම්කිසි වැරැදි තීරණයක් ගන්න යනවා නම්, ඒක විවේචනය කරන්න විපක්ෂයක් ඉන්නවා. අද නිලධාරියාගේ ඒකමතික බලය. ලේකම්තුමාට පුළුවන් අනෙක් නිලධාරීන් සේරම බය කරගෙන කැමැති තීන්දුවක් ගන්න. නමුත් ජනතා නියෝජිතයෝ එතැන ඉන්නවා නම්, එතැන මතවාද දෙකක් තිබෙනවා. ඒ දෙක සාකච්ඡා කරලා බහුතර ඡන්දයෙන්, ප්‍රජාතන්ත්‍රවාදී විධියට තමයි තීන්දුවක් ගන්නේ. මේ විසුරුවා හැරපු තැන්වල අද කිසිම ප්‍රජාතන්ත්‍රවාදයක් නැහැ. සමහර නිලධාරීන් මම හිතන්නේ අපේ රාජ්‍ය ආයතන ඔක්කෝම - මේ ඡන්ද පවතින කාලයේ පුදුම විධියට හිස් උදුම්මාගෙන, තමුන්ට උවමනා විධියට පාලනය අරගෙන යනවා. ඉතින් මේ සියල්ල අපේ ජනතාවගේ අවධානයටත්, ඒ වාගේම ආණ්ඩුවල අවධානයටත්, බලධාරීන්ගේ අවධානයටත් යොමු කරමින් හැකි ඉක්මණින් ඡන්දයකට ගිහිල්ලා ප්‍රජාතන්ත්‍රවාදය මේ පුංචි මට්ටමට, පුංචි පළාත් පාලන ආයතනවල ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න පියවර ගන්න කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ. බොහොම ස්තුතියි.

[අ.භා. 12.05]

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පළමුවෙන්ම මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා, අද රටේ ජනතාව ඉල්ලන, ජනතාව බලාපොරොත්තු වන දෙයක් පිළිබඳව යෝජනා ගෙන ඒම පිළිබඳව. ඒ වාගේම මම කනගාටු වෙනවා, අද මේ වැදගත් යෝජනාව සභාවේ සාකච්ඡා කරන වෙලාවේ අපේ අමාත්‍ය මණ්ඩලයේ කවුරුත් මේ සභාවේ නැහැ. අනෙක් පැත්තෙන් විපක්ෂ නායකතුමාත් නැහැ. විපක්ෂයේ සංවිධායකතුමාත් නැහැ. හැබැයි එකෙන් තේරෙනවා, මේ යෝජනාවට මේ යහපාලනයට සම්බන්ධ වෙලා ඉන්න අය තුළ කොපමණ අකැමැත්තක් තිබෙනවාද කියන එක. අද උදේ සභාව පටන් ගන්න කොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ලලිත් වර්ණකුමාර ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් මතු කළා, ඒ පළාතේ කුණු අදින්නේ නැහැයි කියලා. ජගත් විතාන ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් මතු කළා, කාගෙන්වත් අහන්නේ නැතුව නගර මධ්‍යයේ ප්‍රතිමාවක් හදන්න යනවා කියලා. ඒ වාගේ ප්‍රශ්න හැම මන්ත්‍රීවරයාටම, හැම ප්‍රදේශයකම තිබෙනවා. අර අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගමේ මිනිහා දන්නේ නැහැ මිනිහෙක් මළාම ආදාහනාගාරය වෙන් කර ගන්නේ කොහොමද කියලා. ගමේ මිනිහා දන්නේ නැහැ ඒකට සල්ලි බඳින්නේ කොතැනටද කියලා. පළාතේ ඉන්න මන්ත්‍රීතුමාට තමයි ඒක කියන්නේ. හැබැයි ඒ ප්‍රශ්න සියල්ල ඉදිරියේ නායකයෝ අද නැඟුණා වාගේ ඉන්නවා. මේකට එක හේතුවක් තිබෙනවා. යහපාලන ආණ්ඩුව මේ රටේ බලයට පත් වනකොට අපි විශ්වාස කළේ - මේ රටේ ජනතාව විශ්වාස කරපු බොහෝ දේවල් තිබුණා. එකක් තමයි නියම විධියට මැතිවරණ පවත්වයි. සාධාරණව කටයුතු කරයි කියලා. රටේ නියමිත කාලයට මැතිවරණ පවත්වන්නේ නැතුව ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන්නේ කොහොමද? අර මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඕනෑ කරන ටික තියාගෙන ඉන්නවා. එපා වුණු ටික විසුරුවලා දාලා, පැත්තකට දාලා තිබෙනවා. මේකද ප්‍රජාතන්ත්‍රවාදය? නැහැ. ඒක නොවෙයි ප්‍රජාත්න්ත්‍රවාදය. බලන්න මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අවුරුදු දෙකකට කලින් මැතිවරණය පැවැත් වූවා. පරදින, දිනන එක වෙනම දෙයක්. එතුමා විශ්වාස කළා ඡන්දය තියන්න ඕනෑ කියලා. එතුමා කලින් ඡන්දය තිබ්බා. ඊට වඩා හාස්‍යජනක කාරණාව මැතිවරණ කොමිසමක් හැදුවා.

මට මතකයි මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ, ඒ වාගේම දැන් ඔය කථා කරන උදවිය කිව්වා මැතිවරණ කොමිසම හැදුවාට පස්සේ කාටවත් මැතිවරණ කල් දාන්න බැහැ. දූෂණ කරන්න බැහැයි කියලා. දැන් මැතිවරණ කොමිසම හදලා තිබෙනවා. කොමිසමේ සභාපතිවරයෙක් පත් කරලා

[ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා]

තිබෙනවා. පළාත් පාලන මැතිවරණය ගැන වචනයක් කථා කරන්නේ නැහැ. මේ මැතිවරණය ගැන කථා නොකරන්නේ මැතිවරණයකට යන්න බය කට්ටිය. රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා. එතුමිය කිව්වා, මම නම් කැමැතියි මැතිවරණයක් තියෙනවාට කියලා. එහෙම කැමැති අය ඉන්නවා. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ ඒකටයි. නමුත් සමහර අය කැමැති නැහැ, මැතිවරණ පවත්වන්න. විශේෂයෙන්ම අපි යහපාලන ආණ්ඩුවට අභියෝග කරනවා. පුළුවන් නම් පළාත් පාලන මැතිවරණය ලබන මාර්තු මාසේ, අප්‍රේල් මාසේ පවත්වනවා කියලා අපි නොවෙයි කිව්වේ. අද පත්තර බලන්න. ඊයේ පත්තර බලන්න. අද ෆයිසර් මුස්තාපා ඇමැතිතුමා කියලා තිබෙනවා, පළාත් පාලන මැතිවරණය ජූනි මාසේ පවත්වනවා කියලා. පෙරේදා පත්තරවල අගමැතිතුමා කියලා තිබෙනවා, මැතිවරණයක් මේ අවුරුද්දේ නැහැ. මැතිවරණ තියෙන්නේ 2017 කියලා. තවත් ඇමැතිවරයෙක් තව තැනක එක විධියකට කථා කරනවා. ඒ නිසා මේ එක එක්කෙනාට ඕනෑ විධියට ප්‍රජාත්තන්ත්‍රවාදය එහා මෙහා වෙන යුගයක් මේක. විශේෂයෙන්ම මම එක දෙයක් මතක් කරනවා. එක්තරා දේශපාලන පක්ෂයකට මැතිවරණයට මුහුණ දෙන්න බැරුව ඉන්නවා. ඒ මැතිවරණයට මුහුණ දෙන්න බැරි නිසා මේ ආණ්ඩුව මැතිවරණය කල් දානවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ කවුද?

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

කවුද කියලා අහගන්න ඔබතුමන්ලාගේ දේශපාලන නායකයින්ගෙන්. ඒ නිසා මැතිවරණයකට බයයි. රටේ මිනිස්සු මැතිවරණය ඉල්ලනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු නිකම් දෙකේ කොලේට දාලා තිබෙනවා. ඒ නිසා මැතිවරණයට බයේ මැතිවරණ කල් දාන්න එපා. අද පැහැදිලිව අපි කියනවා, තමුන්නාන්සේලාගේ නායකයින්ගෙන් අහලා බලන්න රටේ ජනතා මතය මොකක්ද කියලා. මේ රටේ FCID එක ඕනෑම එකක වාර්තාව දීලා තිබෙනවා. ඒ වාර්තාවේ තිබෙනවා මැතිවරණයක් තිබ්බොත් පරදිනවා කියලා. ඒ නිසා මැතිවරණයක් පවත්වන්න බැහැ. පවත්වන්නේ නැතුව මැතිවරණ කල් දානවා. මේක බලවත් අසාධාරණයක්. ඒ නිසා මැතිවරණයට බයේ කටයුතු කරන්නේ. ඒ වාගේම ඔහොම ගිහිල්ලා, ගිහිල්ලා ලබන අවුරුද්දේ අන්තිම වනකොට උතුරු මැද පළාත් සභා මැතිවරණය එනවා. අමතක කරන්න එපා. 2017 මැයි මාසේ වනකොට උතුරු මැද පළාත් සභා මැතිවරණය එනවා. සබරගමුව පළාත් සභා මැතිවරණය එනවා. 2017 මුල ඡන්දය තියලා ඊළඟට පළාත් සභා මැතිවරණයට යන්න ලැහැස්ති වෙන්න එපා. ඊට කලින් පුළුවන් නම් හොඳ ආණ්ඩුවක් තියෙනවා නම්, වැඩ කරලා තිබෙනවා නම්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කළා නම්, හොරකම නැති කළා නම්, හොරු ටික හිරේ දැම්මා නම්, දූෂණය නැති කළා නම් ඇයි මැතිවරණයකට යන්න බය වෙන්නේ? මැතිවරණයට අපි බය නැහැ. අර අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ කේවල ක්‍රමයට යන්න. හැත්තෑවයි. තිහයයි. එක්කෝ කලින් තිබුණු සමානුපාතික ක්‍රමයට යන්න. අපි ඒකට ලැහැස්තියි. ඒ දෙකෙන් ඕනෑම ක්‍රමයකට යන්න. හැබැයි තමුන්නාන්සේලා මැතිවරණයකට යන්න බයයි. ඒකට හේතුව තමයි මැතිවරණයකට ගියොත් පරදින බව දන්නවා. ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ සියලුම පළාත් පාලන මන්ත්‍රීවරු මේ මාසේ 14 වැනිදා අපි කැඳවලා තිබෙනවා. මේ මැතිවරණය ලබා ගන්න සම්මේලනයක් පවත්වන්න. අවශ්‍ය අරගලය කරන්න. ඒ අරගලයත් අපි කරනවා. සියලුම පළාත් පාලන මන්ත්‍රීවරු එක්තරා ස්ථානයකට කැඳවලා තිබෙනවා. කැඳවලා මැතිවරණයෙන් ලබා ගන්න පුළුවන් ජනතා අරගලය මේ රටේ ක්‍රියාත්මක කරන්න අවස්ථාව ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට මම ස්තුතිවන්ත වෙනවා මෙවැනි වැදගත් යෝජනාවක් අද සභාවට ගෙනැල්ලා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්නට කටයුතු කරන්න එතුමා නඟන හඬ පිළිබඳව. මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 12.11]

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන මැතිවරණ නියමිත කාල පරිච්ඡේදය තුළ නොපැවැත්වීම පිළිබඳව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාව පිළිබඳව අපේ ප්‍රසාදය මේ අවස්ථාවේදී පළමුකොට පුද කරන්න කැමැතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි,

ප්‍රජාතන්ත්‍රවාදී රටක මැතිවරණය කියන එක තුළ ජනතාවගේ අයිතිය තහවුරු කරන්න යම් පාලකයෙක් අපොහොසත් වෙනවා නම්, ඒ පාලකයා ජනතා හිතවාදී පාලකයෙක්ද, ඒ ආණ්ඩුව ජනතා හිතවාදී ආණ්ඩුවක්ද කියන කාරණාව පිළිබඳව අපට යම් ප්‍රශ්නයක් මතු වෙනවා. පාලකයා නිරන්තරයෙන්ම තම පාලන ව්‍යුහය ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයකින් පවත්වාගෙන යනවා නම්, ජනමතයට හිස නමා, ජනතාවට ආචාර කොට, ජනතාවගේ අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් ඔහුගේ පාලන තන්ත්‍රය ක්‍රියාත්මක කිරීම ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය ක්‍රියාත්මක වන රටක සාමාන්‍ය ස්වභාවයයි. මෙය බොහෝ බටහිර රටවල්වලත් ඒ ආකාරයෙන් සිද්ධ වෙනවා. දැන් වඩාත් පෙඩරල් ක්‍රමවේදයකට ක්‍රියාත්මක වන ඇමරිකාව තුළ මේ මැතිවරණ රටාව ඉතාමත් සාධාරණ විධියට සිද්ධ වෙනවා. හැබැයි ඇමරිකාව අනුගමනය කරමින්, ඇමරිකාවේ අතකොළුවක් බවට පත් වෙලා ඉන්න ශ්‍රී ලංකාව තුළ වර්ෂයෙන් වර්ෂය මැතිවරණ පස්සෙන් පස්සට යනවා. මම දන්නේ නැහැ මේකට හේතුව මොකක්ද කියලා. දැන් පසුගිය ආණ්ඩු කාල පරිච්ඡේදය තුළ අපට බොහෝ විට අහන්න හම්බ වුණේ, ලංකාවේ ස්වාධීන කොමිෂන් සභා නැහැ. ස්වාධීන කොමිෂන් සභා ඇති කළ විට මහා විවෘතව ජනතාවගේ ජනතාවාදී ආණ්ඩුවක් ක්‍රියාත්මක කරන්න රට තුළ ඉඩ ප්‍රස්ථාව සැලසෙනවා කියන කාරණාවයි.

**ගරු සුනිල් ජයමිණි - සභා නායකතුමා**
Hon. Sunil Jayamini - Leader of the House

හුසේන් කුමාරයාට කියන්න ඕනෑ.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඔව්. අද වනකොට ප්‍රධාන මැතිවරණ පොරොන්දුවක් කොමිෂන් සභා ස්ථාපිත කිරීම. දැන් කොමිෂන් සභා තිබෙනවා. නමුත් කොමිෂන් සභාවට ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට, ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ජනතාවට ලබා දීමට, කොමිෂන් සභාව අපොහොසත් වෙලා තිබෙනවා. එහෙම නම් මේ කොමිෂන් සභා පත් කිරීමේ අර්ථය පිළිබඳව රජය ජනතාවට පැහැදිලි කිරීමක් කළ යුතුයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන මැතිවරණ කාල පරිච්ඡේදය වසර 04 යි. වසර 04 ක් අවසන් වනකොට සමහර වෙලාවට කියනවා ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ අපි දරන, කවුරු හරි පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා, මන්ත්‍රීවරුන් විවිධ මට්ටමින් වැරැදි කරලා තිබෙනවා. ඒ පිළිබඳව ජනතාව දැනුවත් කරලා ඒවා නිවැරදි කරන්න ඕනෑ කියලා. දැන් අවුරුදු 04 ක් ගෙවිලා ඉවරයි. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පාලන බලයට බහුතරක් තිබුණු ආයතනවල සභාපතිවරුන් වැරැදි කරලා තිබෙනවා නම්, ජනතාවට ඔවුන්ව ප්‍රතික්ෂේප කරන්න අවස්ථාවක් දෙන්න ඕනෑ. ඒ අවස්ථාව තමයි මේ නැති කරලා තිබෙන්නේ. එහෙම නම් සමස්තයක් වශයෙන් මේ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට ජනතාව ඉදිරියට එන්න තිබෙනවා කියපු බාධක, වැරැදි, කම්කටොළු, කරදර මේ සමස්තය ප්‍රෝඩාවක් බවට පත් වෙලා තිබෙන්නේ. ඔවුන් නිර්දෝෂී බව ඔප්පු කරනවා මේ මැතිවරණ පසුපසට ඇද දැමීම තුළ. ආණ්ඩුව මැතිවරණයට මුහුණ දීමට තිබෙන බිය නිසා.

ඒ නිසා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳව කිඹුල් කඳුළු හෙලන ආණ්ඩුවකට වගකීමක් තිබෙනවා, නිවැරදි කාලයට මැතිවරණවලට ඉදිරිපත් වෙලා, තමන් ප්‍රජාතන්ත්‍රවාදීන් බව ඔප්පු කිරීමට. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා අවුරුදු දෙකකට ඉස්සෙල්ලා ගියේ මොන හේතුවක් නිසාද, නැද්ද කියන එක ප්‍රශ්නයක් නොවෙයි. මැතිවරණ නිවැරදිව නියමිත කාල පරිච්ඡේදයේ පවත්වලා තිබෙනවා. පස්සට ගිය හේතුව සහ ඉස්සරහාට ගිය හේතුව අපට වැඩක් නැහැ. නමුත් ජනතාවගේ අයිතිවාසිකමට ගරු කරලා තිබෙනවා. නමුත් අද කරන්නේ, මේ ජනතාවගේ මූලික අයිතිවාසිකම්වලට ඉතාමත් නිර්ලජ්ජිත විධියට පහර එල්ල කිරීමයි. ඒ නිසා මට විටෙක හිතෙනවා, රජයට උවමනාව තිබෙන්නේ, ජනතාව එපා කියන, ජනතාව අප්පිරියා කරන, ජනතාව ප්‍රතික්ෂේප කරන ක්‍රියාවන් කරමින් ජනතාව කුපිත කරලා, ජනතා අරගල මතු කරගෙන හදිසි නීතියත් ඇතුල් කරගෙන මේ රටේ තවත් කණ්ඩායමක් වර්ධනය කිරීමේ පසුබිම සකස් කර ගැනීමද කියන කාරණාවයි. මේක තමයි ඇමරිකන් ස්ටයිල් එක. මේ ඇමරිකන් ස්ටයිල් එකට මේ රටේ අනාගතය නිර්මාණය කිරීමේ පෙරහුරුවක යෙදී තිබෙනවාද කියන කාරණාව දැඩි ලෙස අපේ හදවත් තුළ අද කැකෑරෙමින් පවතිනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේවා විහිළු නොවෙයි. මේවා අනාගතයේදී රටේ ජනතාවගේ ලෙයින් කඳුලින් විසඳෙන ප්‍රශ්න බවට පත් වෙනවා. මේ ප්‍රශ්න කැකෑරිලා, කැකෑරිලා අවසානයේ පුපුරා ගිය අවස්ථාවේ - ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙන්න පුළුවන්. එක්සත් ජාතික පක්ෂය වෙන්න පුළුවන්. ජනතා විමුක්ති පෙරමුණ වෙන්න පුළුවන්. දෙමළ ඊළාම් නිදහස්

[ගරු ජගත් අංගගේ]

පෙරමුණ වෙන්න පුළුවන්. ඒවා නොවෙයි ප්‍රශ්න. මේ රටේ පුරවැසියන්ගේ ජීවිතවලට තිබෙන ගරුත්වය. මානව හිමිකම් කොමිෂන් සභා හැදුවේ මානවයාගේ ගෞරවනීය ජීවිතවලට ඇඟයීමක් කරන්න. වටිනාකමක් දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

හුසේන් කුමාරයා.

**ගරු ජගත් අංගගේ**
Hon. Jagath Angage

ඒ කුමාරවරුන් සේරටම තිබෙන අයිතිවාසිකම් හැමෝටම නැහැ නේ? ඒ නිසා මේ පිළිබඳව යහපත් ජනතා කථිකාවතක් ඇති කරලා, මේ ජනතා අයිතිවාසිකම්වලට හිස නමා ආචාර කරලා මැතිවරණ පවත්වන්න කියන එක අපි රජයට බල කරමින් - ඕනෑම කෙනෙක් ජයග්‍රහණය කරපුදෙන්. ජනතාවගේ අයිතිවාසිකම් ලබා දෙන්න රජයට බල කරමින් ඒ කටයුතු ඉෂ්ට වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 12.06]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙන එන ලද යෝජනාවට එකඟ වෙමින් වහා මැතිවරණය පවත්වමු කියන තේමාව යටතේ තමයි මගේ අදහස් දක්වන්නේ. අපි දන්නවා, පසුගිය කාලයේ අපේ රටේ තිබුණේ, වෙලාවට කලින් මැතිවරණ තියන එක. ඒක තමයි ප්‍රශ්නයක් වෙලා තිබුණේ. ඒකත් වැරැදියි. ඒ වාගේම මැතිවරණ කල් දාන එකත් වැරැදියි. ඔය දෙකම වැරැදියි. ඒ නිසා ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටක් නම්, ඒ රට තුළ නියමිත වෙලාවට, නියමිත විධියට මැතිවරණ තියන්න ඕනෑ. නමුත් ඒක තමයි දැන් ගැටළුවක් වෙලා තිබෙන්නේ. ආණ්ඩුව පැත්තෙන් මේකට ඉදිරිපත් කරන කාරණය තමයි ඇත්තටම සීමා නිර්ණයේ ඇති වෙලා තිබෙන ගැටළු. සීමා නිර්ණයේ ගැටළු තිබෙනවා. පසුගිය ආණ්ඩුව සීමා නිර්ණය හදලා තිබෙන්නේ, තමන්ට ඕනෑ විධියට. එයට කිසියම් ක්‍රමවේදයක් අනුගමනය කරන්න නොවෙයි. හිටපු ඇමැතිවරයෙක් වුණු බැසිල් රාජපක්ෂ මහත්මයා තමයි ඒකට මූලිකත්වය අරගෙන තිබ්බේ. සමහර වෙලාවට කොළඹ දිස්ත්‍රික්කයේ, මම නියෝජනය කරන කැස්බෑව ආසනයේ කොට්ඨාශ කඩන්න බැහැ. තමන්ට ඕනෑ විධියට වාසියි කියලා හිතලා කොට්ඨාශ කඩන්න බැහැ. මොකද, සමාන්තර විධියට පක්ෂ බෙදිලා තිබෙන්නේ. ඒ නිසා එහෙම ගැටළුවක් තිබෙනවා. ඒක එහෙම කරන්න බැහැ.

හැබැයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, (බාධා කිරීමක්) කැස්බෑවේ එහෙම වෙලා නැහැ. හැබැයි තිස්සමහරාමේ යනකොට අපව නැති කරලා තියෙන්නේ. තිස්සමහරාමේ කොට්ඨාශ කඩලා තිබෙන්නේ - හරි නම් කොට්ඨාශයකට, කොට්ඨාශයක් යා වෙන්න ඕනෑ. එක් කොට්ඨාශයක් පැනලා, ග්‍රාම සේවා වසමක් පැනලා, තව ග්‍රාම සේවා වසමක් ඒකට එකතු වෙනවා නම් ඒක වැරැදියි. එහෙම තැනුත් තිබෙනවා. ඒක නිසා එහෙම සමහර ආසනවල, සමහර දිස්ත්‍රික්කවල ඒ කටයුතු කරලා තිබෙන්නේ තමන්ගේ දේශපාලන වාසියට. ඒක නිසා තමයි මේ ගැටළුව මූලිකවම පැන නැඟිලා තිබෙන්නේ. මෙතැනදී අර ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ, ඒ සීමා නිර්ණය පිළිබඳව ගැටළුවක් තිබෙනවා නම්, ආණ්ඩුව කරන්න ඕනෑ. කිසි ප්‍රශ්නයක් නැහැ. පරණ ක්‍රමයට මැතිවරණය තියන්න ඕනෑ. මොකද, ඒක ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනි එකක් නොවෙයි. නමුත් එහෙම තියන්නේ නැහැ. ඒකට හේතුව මොකක්ද? ඒකට හේතුව තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමා විශ්වාස කරනවා, පරණ ක්‍රමයට ගියාට පස්සේ තමන්ට ලොකු පාඩුවක් වෙනවා. එතුමා විශ්වාස කරනවා තවමත් බිම් මට්ටමේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලය තිබෙන්නේ මහින්ද රාජපක්ෂ මහත්තයාට. ඇත්ත කියන්න එපැයි. අත්පුඩි ගහන්න නොවෙයි. ඒක නිසා අලුත් ක්‍රමයට යෑමේ උවමනාව තිබෙන්නේ කාටවත් නොවෙයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමාට. මම ජනාධිපතිතුමා කියන එක පාවිච්චි කරන්නේ නැහැ. රීති ප්‍රශ්නයක් එන්න පුළුවන්. ඒක නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමාගේ උවමනාවට තමයි දැන් මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. එහෙම නම් දැන් ඔබතුමන්ලා කරන්න ඕනෑ, ඉස්සෙල්ලාම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ගෙදර මේ ප්‍රශ්නය කථා කරන්න ඕනෑ. හැබැයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ගෙදර මේක කථා කරන්න විධියක් නැහැ. මේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ළමයි දැන් බෝඩින් වෙලා ඉන්නේ. ඒකයි මේකේ ප්‍රශ්නය. ඒ නිසා බෝඩිමේ ඉඳගෙන තමයි මේ ප්‍රශ්නය කථා කරන්නේ. දැන් බෝඩිමේ ඇන්ටිව හෙට

අනිද්දා වනකොට නැන්දම්මා කර ගනීද දන්නෙත් නැහැ. එතැනට යන්නත් පුළුවන්. ඒ කොහොම වුණත් රටේ ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් තමුන්නාන්සේලා මේ යෝජනාව ගෙනාපු එක ලොකු දෙයක්. ඒ නිසා අපිත් කියනවා ජනතා විමුක්ති පෙරමුණ විධියට ඕනෑ ක්‍රමයකට ඡන්ද ගේන්න. සමහර වෙලාවට සමහර තැන්වල විග්‍රහ වෙනවා මේක අපට පාඩුයි. අපට ඒක ප්‍රශ්නයක් නැහැ. මොකද, එදා සමානුපාතික ඡන්ද ක්‍රමය ගෙනාවේත් අපට වාසි වෙන්න නොවෙයි. නමුත් අපට ඕනෑ විධියට අපි මැතිවරණ ව්‍යාපාරය හසුරුවා ගත්තා. ඒ වාගේම තමයි කොට්ඨාශ ක්‍රමයට ආවත් සමහර කොට්ඨාශ තිබෙනවා අපට ඕනෑ විධියට හසුරුවලා මැතිවරණ ව්‍යාපාරය දියත් කළොත් අපට ඒ වාසිය ගන්න පුළුවන්. ඒ නිසා අපි ඒකට බය නැහැ. ඒ නිසා අපි කියන්නේ ගේන්න. ඕනෑ ක්‍රමයකට ගේන්න. කල් දාන්නේ නැතුව ඉක්මණට මැතිවරණය තියන්න. ඒක තමයි අපි කියන්නේ. ඒක තමයි කරන්න ඕනෑ. ඒ නිසා තමන්ගේ පක්ෂවල තිබෙන අර්බුදය, පුද්ගලයෝ හැටියට මුහුණ දෙන අර්බුදය, ඒක ප්‍රශ්නයක් කරගෙන ජනතාවගේ ඡන්ද අයිතිය විනාශ කරන්න එපා. අපි කියන්නේ ඒකයි. ඒක ඔයගොල්ලෝ විසඳ ගන්න. ඒකට ඔයගොල්ලෝ ඇතුළේ මොන මොනවා හරි උපක්‍රම යොදා ගන්න. හැබැයි ඡන්දදායකයාට අයිතියක් තිබෙනවා තමන්ගේ මහජන නියෝජිතයා පත් කර ගන්න. තමන්ගේ පළාත් පාලන ආයතනයේ නියෝජිතයා පත් කර ගන්න.

ඇත්තටම ගැටළුවක් තිබෙනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අර මළ ගෙදරකට ලයිට් එකක් දාගන්න විධියක් නැහැ. එහෙම ප්‍රශ්නයක් තිබෙනවා. කැස්බෑව ගත්තොත් එහෙම අපේ හිටපු මන්ත්‍රීතුමා ටිකක් නිලධාරී මණ්ඩලය එක්ක ළඟින් ඇසුරු කරන නිසා - දැන් මම දන්නවා සමහර ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයොත් ඒ මන්ත්‍රීවරයාට කථා කරලා ඒ වැඩේ කර ගන්නවා. එහෙම තත්ත්වයට ඒ අය වැටිලා තිබෙනවා. ඒ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඉතින් ඒ නිසා අදාළ මන්ත්‍රීවරයා එහෙම කටයුතු කරන නිසා හොඳයි. නැත්නම් ඇත්තටම ලයිට් එකක්වත් දාගන්න විධියක් නැහැ. පාරවල්වල ලොකු ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම ගොඩනැගිලිවලට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමේ ගැටළු. ඒ වාගේ ලොකු ප්‍රශ්න ටිකක් තිබෙනවා. ඒ වාගේම තමයි අදාළ නිලධාරීන්ට ඒවායේ කටයුතු කිරීමේදී ලොකු ලොකු ගැටළු තිබෙනවා. මාරු වීම් සම්බන්ධ ප්‍රශ්න ඇවිල්ලා තිබෙනවා. අන්තිමේදී මේකේ ඵල විපාක භුක්ති විඳින්න වෙලා තිබෙන්නේ ඒ ප්‍රදේශයේ ජනතාවට. ප්‍රාදේශීය සභාවේ, නගර සභාවේ සේවය ගන්න ඉන්න ජනතාවට. ඒ නිසා ඒ අසාධාරණය සිද්ධ වෙලා තිබෙන්නේ ඒ අයට.

ඒක නිසා වහාම ක්‍රියාත්මක වෙලා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ, විශේෂයෙන් මැතිවරණ කොමිසමක් ඇතුළේ ඒ කිච්ච එක හරි. විශේෂයෙන්ම රජයේ මැදිහත්වීම තමයි මේකට බලපාලා තිබෙන්නේ. ජනාධිපතිතුමාගේ මැදිහත්වීම මේකට බලපාලා තිබෙන්නේ. ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ, පත් කරලා තිබෙන සභාපතිතුමා - සීමා නිර්ණය සම්බන්ධව සභාපතිතුමාත් කටයුතු කරනවා. එක්ක අපි සාකච්ඡාවක් තිබ්බා. කැෆේ සංවිධානයත් එක්ක තිබුණු සාකච්ඡාව. එකේදී එතුමා කිව්වා, අප්‍රේල් මාසේ වනකොට මට වැඩේ ඉවර කර ගන්න පුළුවන් කියලා. අප්‍රේල් මාසේ වනකොට වැඩේ ඉවර කර ගන්න පුළුවන්. මැයි මාසේ තියන්න පුළුවන්. ජූනි වනකොට මැතිවරණය තියන්න පුළුවන්. එතැනින් එහාට මේක කල් දාන්න බැහැ. කල් දාන්න අපි ඉඩ දෙන්නෙත් නැහැ. එහෙම කල් දැම්මොත් එහෙම ජනතාවත් එක්ක එකතු වෙලා අපි පාරට බහිනවා. ලොකු උද්ඝෝෂණ යනවා. තමුන්නාන්සේලාත් එකඟ නම් අපත් එක්ක එකතු වෙන්න පුළුවන්. උද්ඝෝෂණය කරලා ජනතාවගේ ඡන්ද අයිතිය ආරක්ෂා කරලා දෙන්න ඕනෑ. ඒ සඳහා කටයුතු කළ යුතුයි කියමින් විශේෂයෙන්ම මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් මෙතුමා ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[අ.භා. 12.24]

**ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව**
Hon . O. W. Prasanna Sanjeeva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරපු යෝජනාව ඉතාම වටිනා කියන යෝජනාවක්. මොකද, මේ වනකොට පළාත් පාලන ආයතන මැතිවරණ කල් දැමීම තුළ ප්‍රදේශයේ ජනතාවට සහ අනෙකුත් ක්‍රියාකාරකම්වලට බලවත් සේ බලපාන කටයුත්තක් බවට පත් වෙලා තිබෙනවා. අපි දිගින් දිගටම මේ මැතිවරණය පිළිබඳව සාකච්ඡා කළා. මේ මැතිවරණය ඉක්මන් කරලා තියන්න කියන්නේ, අද පළාත් පාලන ආයතන තුළ මේ නිලධාරීන්ට මේ කටයුත්ත භාර දීලා සමහර අවස්ථාවල මේ නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව අපි ඉහළට දැනුවත් කරලා

[ගරු ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව]

තිබෙනවා. මොකද, මහජන නියෝජිතයා, අදාළ ප්‍රදේශයේ පළමුවැනි පුරවැසියා පුටුව තුළ ඉන්න කොට ජනතාවට අවශ්‍ය කරන සේවාවල් සියල්ල හරියට සිද්ධ වුණා. සමහර තැන්වල සිදු වුණේ නැහැ. නමුත් සමහර තැන්වල සිදු වුණා. අද මේක දිගින් දිගටම මේ මැතිවරණය කල් දැමීම තුළ මම හිතන්නේ, සමස්ත රටේම මහ පරිමාණයේ කඩාගෙන වැටීමක් සිද්ධ වෙමින් පවතින්නේ. ඒ වාගේම පළාත් පාලන ආයතන තුළ තිබෙන මුදල් ටික, මුදල්වලට අමතරව තිබෙන වාහන ටික, නොයකුත් යන්ත්‍ර සූත්‍ර කඩාගෙන වැටිලා විනාශ වෙලා. අද රජයට මහත් පාඩුවක් බවට පත් වෙලා තිබෙනවා. අපි මේවා කථා කරන කොට සමහර අවස්ථාවලදී සමහර මන්ත්‍රීවරු එක්කෝ ඒකේ වාසිය ගන්න, ඉන්න ප්‍රධාන නිලධාරියාට දුරකථනයෙන් කථා කරලා කියනවා. මෙන්න ඔබතුමිය සම්බන්ධව, එක්කෝ ඔබතුමා සම්බන්ධව අදාළ පළාත් සභා මන්ත්‍රීවරයා අදාළ රැස්වීමේදී කථා කරනවා. හැබැයි මේ කථා කරන්නේ කාටක්වත් මේක විනාශ කරන්න නොවෙයි. උදාහරණයක් වශයෙන් මේ මැතිවරණය කල් දැමීම තුළ හැමදාම වෙන්නේ, මේ පළාත් පාලන ආයතනවල තිබෙන සියල්ල විනාශ වීමේ කටයුත්ත තමයි වී තිබෙන්නේ. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපේ පක්ෂයේ ගරු සභාපතිතුමා මේ මැතිවරණය තියන්න බලාපොරොත්තු වෙන්නේ අලුත් මැතිවරණ ක්‍රමයකට කියා. හැබැයි අපට ප්‍රශ්නයක් නැහැ. අලුත් ක්‍රමයට තිබ්බත් එකයි. පරණ ක්‍රමයට තිබ්බත් එකයි. හැබැයි අපි කැමැතියි දැන් මේක තියන්න බැරි නම් පරණ ක්‍රමයට හරි තියන්න වැඩේට බහින්න කියන එක තමයි අපි කියන්නේ. මොකද, ඒකට අවශ්‍ය කරන ශක්තිය අපි කණ්ඩායමක් වශයෙන් එකතු වෙලා ඒ වැඩේට ලැහැස්ති වෙලා ඉන්නේ.

එහෙම නම් කොයි මොහොතේ හරි මේක ඉක්මණින් ලබා දෙනවා නම් තමයි අපි අදාළ පළාත් පාලන ආයතනවල ඉන්න නියෝජිතයන්ට අවශ්‍ය කරන කටයුත්ත සිද්ධ කරන්න පුළුවන් වෙන්නේ. මේ වනකොට වැඩ පිළිවෙළ දියත් කරලා තිබෙන්නේ. හැබැයි සමහර තැන්වල සීමා නිර්ණය ගැන කථා කරන කොට ඒකේ වෙනසක්, සංශෝධනයක් කරන්න ඕනෑ කියලා සමහර අවස්ථාවලදී ප්‍රකාශ කළත්, මේ ඉන්න පක්ෂ පාට භේදයකින් තොරව හැම මන්ත්‍රීවරයාම දැනුවත් කරලා තමයි මේ කටයුත්ත කළේ. පළාත් පාලන ආයතන තුළ අපි ඉඳිද්දී, කොළඹ ගෙනැල්ලා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව මේ කටයුත්ත කරන කොට ඔක්කෝම දැනුවත් කරලා - හැබැයි දැන් මේ අවසාන වනකොට කියනවා, ඒ අය ආණ්ඩුව අතට ගත්තාට පස්සේ කියනවා, දැන් මේක සංශෝධනය කරන්න ඕනෑ කියලා. මම හිතන්නේ එදාම මේ කටයුත්ත කළා නම්, කට ඇරලා කථා කරන්න පුළුවන්කම තිබුණා නම් එදා පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ඒ ප්‍රදේශයට අදාළව හිටියා. ඒ පළාත් පලාන ආයතන මන්ත්‍රීවරු හිටියා. එහෙම කථා කළේ නැහැ. එහෙම කථා කළේ නැති නිසා තමයි මම හිතන්නේ අද තමන්ගේ වාසිය ගන්න තමුන්ට ඕනෑ විධියට සමහර තැන්වල හදා ගන්නවාද කියන එක තමයි අපටත් ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ. ඒ නිසා දිගින් දිගටම පළාත් පාලන ආයතන ප්‍රධානීන් මේ වනකොට නොයෙකුත් ආකාරයේ මුදල් වංචා, නොයෙකුත් ආකාරයේ දූෂණ ක්‍රියාත්මක කරනවා. දින 180 ආපු චක්‍රලේඛයෙන් කුණු ඇදපු අපේ අහිංසක සේවකයන් ස්ථිර නොකර අනෙකුත් තනතුරුවලට ස්ථිර නොකර වෙනත් ආකාරයට වැඩ නොකරපු අයව ඒ ආයතනවලට බඳවාගෙන අද අහිංසක මිනිස්සුන්ට හුඟක් අසාධාරණ සිද්ධ වුණා. අද සමහර පළාත් පාලන ආයතන තුළ මේ වනකොටත් සේවකයෝ වැඩිපුර හිටියත් ආපහු ආදේශකයෝ බඳවාගෙන යනවා. හැබැයි, අපි ඉහළ නිලධාරීන්ට කථා කරලා කිව්වත් අද මේක බීරි අලින්නට වීණා වයනවා වාගේ සිද්ධියකට සම්බන්ධ වෙලා තිබෙනවා. අපි ජීවත් වන ප්‍රදේශය තුළ කැළි කසළ ප්‍රශ්නය මහ දරුණු ආකාරයෙන් යනවා. මේවාට ගෙනැල්ලා දාන පස් ටිකෙන් මහ පරිමාණයේ වංචා සිදු වෙනවා. නොයෙකුත් ආකාරයේ කටයුතු වෙනවා. ඉතින් මේවා හරියාකාරව නිරීක්ෂණය කරලා කටයුත්තක් කරන්න මේ මැතිවරණය ඉතාමත් ඉක්මණින් අවශ්‍ය වෙලා තිබෙනවා. අපට වැඩක් නැහැ පරණ ක්‍රමයද, අලුත් ක්‍රමයද කියලා. අපි හෙට කැමැතියි ඒ එන ඕනෑම ක්‍රමයකට මුහුණ දෙන්න. මේ පක්ෂ විපක්ෂ හැම මන්ත්‍රීවරයාම කැමැතියි.

අද මේ වනකොට අපි සියලු දෙනාම හෙට මැතිවරණය මොන ආකාරයෙන් තිබ්බත් අපි මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක එකතු වෙලා අවශ්‍ය කරන කටයුත්ත නිර්මාණය කරන්න අපේ කණ්ඩායම, අපි එක සේ නැඟී සිටින බව මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. එහෙම නම් ඒ මැතිවරණ ක්‍රමය තුළදී අදාළ පළාත් පාලන ආයතන තුළ, සමස්ත රට තුළම එක පැත්තකින් අද මේ ක්‍රියාත්මක වන වැඩ සටහනත් එක්ක මම හිතන්නේ, පළාත් සභා මන්ත්‍රීවරයෙකුට ඒ අදාළ පළාත් පාලන ආයතනයට ගිහිල්ලා මොනවා හරි වැඩක් කර ගන්න ගියාම වීදි

ලාම්පුවක් දාගන්න, නැත්නම් වෙනත් කටයුත්තක් කර ගන්න මම හිතන්නේ, අද කිසිම හැකියාවක් නැහැ. නිලධාරීන්ට දූකරථනයෙන් කථා කරලා කිව්වාට අහිංසක මිනිහෙකුට වතුර ටිකක් දෙන්න විධියක් නැහැ. ලියුම් කැලි පුරවන්න සිද්ධ වෙලා තිබෙනවා. මෙන්න මේවා ගැන තමයි මම හිතන්නේ කැගහලා පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු කියන්නේ. ජනතාවට අවශ්‍ය කරන ශක්තිය නිර්මාණය කරන්න උපදේශක කාරක සභාව දක්වා ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතනය තුළ මේ වැඩ කටයුත්ත සාර්ථකව කරලා දෙන්න ඉක්මණින් පළාත් පාලන මැතිවරණය අප්‍රේල් මාසයට, නැත්නම් මැයි මාසයට කලින් පවත්වන්න කටයුත්ත කරන්න. තමුන්නාන්සේලාගේ ශක්තිය, ධෛර්ය අපට ලබා දෙන්න කියන එක තමයි අපි මේ අවස්ථාවේදී ඉල්ලා සිටින්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බෙහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. මම හිතන්නේ මේ යෝජනාවේ අවශ්‍යතාවය මෙතැන ඉන්න ආණ්ඩු පක්ෂයේ විපක්ෂයේ හැම මන්ත්‍රීවරයෙක්ම පළාත් පාලන ආයතනවලට ඉල්ලලා ආපු අය. මේ ප්‍රශ්නය ගමට දැනෙන නිසා වෙන්න ඇති විශාල මන්ත්‍රීවරු සංඛ්‍යාවක් කථා කරන්න අවස්ථාව ඉල්ලන්නේ. ඒ නිසා කථාව සීමා කරලා අවසන් කරන්න කියන ඉල්ලීම සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලනවා. මීළඟට ලලිත් එල්ලවාල ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.30]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇත්තටම මේ යෝජනාව ගෙන ඒම පිළිබඳව මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අපේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒකත් එක්කම මම මතක් කරන්න ඕනෑ, අපේ මන්ත්‍රීවරුන් කථා කරන අවස්ථාවේදී කිව්වා, මෙය ප්‍රමාද කරන්නේ සීමා නිරණය හරියට වෙලා නැහැයි කියලා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ වාසියට මේක හදලා කියලා. පැහැදිලිවම එහෙම එකක් වෙන්න විධියක් නැහැ. දැන් උදාහරණයකට කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම මේ සීමාවල් ලකුණු කරන කොට මුල ඉඳන්ම මේ තුළ සිටියා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක හදන කොටම පැහැදිලිවම අපෙන් යෝජනා ගත්තා. අපි ඒ යෝජනා දුන්නා. ඊට පස්සේ ඒ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීන්ව කැඳෙව්වා. ඒ අදාළ දිස්ත්‍රික් ලේකම්තුමා. ඊට පස්සේ හැම ජනතා නියෝජිතයෙකුගෙන්ම අදහස් ගත්තා. ගොඩක් වෙලාවට අපි දීපු යෝජනා ඒ විධියටම ක්‍රියාත්මක වෙලා තිබුණේ නැහැ. ඒවා ග්‍රාම සේවා නිලධාරීන් එක්ක කථා කරලා දිස්ත්‍රික් ලේකම්තුමා ඒවා යම් යම් විධියට වෙනස්කම් කරලා තිබුණා. එහෙම තමයි මේක වුණේ. මේක නිකන් මතයක් ගොඩනගන්න හදනවා, වැරැදි විධියට සීමාවල් ලකුණු කළා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ වාසියට ලකුණු කළා. ඒ නිසා මේක කල් දානවා කියලා. පැහැදිලිවම එහෙම එකක් වුණේ නැහැ. ඒක දිස්ත්‍රික් ලේකම්තුමන්ලාගේ මැදිහත්වීම උඩ තමයි මේ සීමා නිර්ණයන් හැදුවේ. මේ කල් දාන්නේ වෙන කිසි දෙයකට නොවෙයි. අපට හොඳටම පැහැදිලියි. මහින්ද රාජපක්ෂ මැතිතුමා නායකත්වය දෙන ඒ කණ්ඩායම රටේ ජයග්‍රහණය කරනවා කියලා දැකලා තමයි එක්සත් ජාතික පක්ෂය ඇතුළු කණ්ඩායම් මේකයට බිය වෙලා කල් දාන්නේ. මේක කල් දාන්නේ වෙන හේතුවකට නොවෙයි. පැහැදිලිව මම මේකත් එක්ක කියන්න ඕනෑ. ඒත් එක්කම මම සතුටු වෙනවා. අද ජනතා විමුක්ති පෙරමුණ ඡන්දය ඉල්ලන එක ගැන. අපට මතකයි, ජනතා විමුක්ති පෙරමුණ එදා ඡන්දය ඉල්ලනවා කිව්වාම, ඡන්දය දාන කොට කිව්වේ, පළමුවැනි ඡන්දය දාන කෙනාගේ අත කපනවා කියපු පක්ෂයක්. ඡන්දය දෙන කොට වෙඩි තිබ්බා. ජනතාව ඡන්දය ඉල්ලුවා. ඡන්දය දෙන කොට ජනතා විමුක්ති පෙරමුණ මොකක්ද කළේ? පළමුවැනි පස් දෙනාගේ අතවල් කපනවා කිව්වා. ඉල්ලපු අපේක්ෂකයන්ව වෙඩි තියලා මැරුවා. එහෙම මරලා අද ඡන්දය දෙන්නය කියන එක ගැන අපි සතුටු වෙනවා. අද ඔබතුමන්ලා වැරැදි කළා කියන එක තේරුම් අරගෙන තිබෙන එක ගැන අපි සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි කියන්නේ මෙපමණයි. අද පළාත් පාලන ආයතනවල වැඩ කරගන්න විධියක් නැහැ. අද සමහර පළාත් පාලන ආයතනවල නිලධාරිවාදයක් තිබෙනවා. උදාහරණයකට ගත්තාම මම ඉන්න පළාත් පාලන ආයතනයම, අද බණ්ඩාරගම පළාත් පාලන ආයතනය උත්සවයක් තිබෙනවා නම් මම යන්නේ නැති තත්ත්වයට පත් වෙලා. මම ඒක වර්ජනය කරලා තිබෙන්නේ. ඒ වෙන මොකුත් නොවෙයි. ඒ අයගේ හිතවාදීන්ට විතරයි ඒ උත්සවවල කටයුතු කරන්නේ. ඒකත්

[ගරු ලලිත් එල්ලාවල]

එක්කම අද පළාත් පාලන ආයතනවල යමක් කර ගන්න නම් අද ජනතාව මුදල් දෙන තත්ත්වයට පත් වෙලා. මුදල් දීලා වැඩ කරගන්න වෙලා. අද හැම තැනම කසළ ටික දාලා. පාරක් පාරක් ගණනේ දාන තැනට පත් වෙලා. මේකට සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ, මේ සියලුදේට වගකියන්න ඕනෑ මේ ඡන්දය කල් දාන එක්සත් ජාතික පක්ෂ රජය. එක්සත් ජාතික පක්ෂ රජය තමයි මේකට සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ. මේ රටේම වෙන ප්‍රශ්නවලට, මේ රටේම තිබෙන ප්‍රශ්නවලට - යහපාලනය කියන වචනය හොඳයි. නමුත් යහපාලනය තේරුම් අරගෙන නැහැ. යහපාලනය කියන්නේ මේක නොවෙයි. යහපාලනය කියන්නේ ජනතාවට හොර බොරු නැතිව වැඩ කෙරෙන්න ඕනෑ. අද පළාත් පාලන ආයතනයේ සිට ඉහළට යනතුරුම හොරකම් කරන රජයක් වෙලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද පළාත් පාලන ආයතනයකට අඩුම ගණනේ ගොඩනැගිලි අයදුම් පත්‍රයක්, ඉඩම් කට්ටියක් අනුමත කිරීමකට සල්ලි නොදී කරගන්න බැරි තැනට අද ඇවිල්ලා. ඒ නිසා මේ සියල්ලට වග කියන්න ඕනෑ, මේ එක්සත් ජාතික පක්ෂ රජය. ඒ නිසා මම පැහැදිලිව කියනවා. මේ පච්කාරකමින් ගොඩ එන්න නම් කඩිනමින් ඡන්දය තියන්න කියලා. මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමා ඉන්න කොට මේ ගොල්ලෝ කිව්වා, ඡන්ද වැඩියි කියලා. මේගොල්ලෝ ඡන්ද තියන්න එපාය කියලා කිව්වා. හැබැයි, එතුමා පැහැදිලිවම දින වකවානු අනුව නියම විධියට ඡන්දය තිබ්බා. තමුන්නාන්සේලා භය නැත්නම්, තමුන්නාන්සේලා හොඳ නම් ජනතාව තමුන්නාන්සේලාට ඡන්දය දෙනවා කියලා - (බාධා කිරීමක්) හරියට වෙලාවට ඡන්දය තිබ්බා. වෙලාවට ඡන්දය තිබ්බා. වෙලාවට ඡන්ද තියන කොට තමුන්නාන්සේලා ඡන්ද වැඩියි කිව්වා. අද තමුන්නාන්සේලා කනගාටු වෙන්න ඕනෑ. රටම ඡන්ද ඉල්ලනවා. තමුන්නාන්සේලා කල් දානවා. ඕවා කරලා තමයි 89 - 90 කාලයේ මහ භීෂණ සමයක් ඇවිල්ලා තමුන්නාන්සේලා තරුණයන් 60,000 ක් මරලා දැම්මේ. ජනතා විමුක්ති පෙරමුණ අද තමුන්නාන්සේලාත් එක්ක එකට එකතු වෙලා හිටියාට දෙගොල්ලෝ එකට එකතු වෙලා රටේ ජනතාව මැරුවේ. එදා තමුන්නාන්සේලාට මතක ඇති. පාරක් පාරක් ගණනේ තරුණයන් ගෙනැල්ලා මරපු හැටි. අද තමුන්නාන්සේලා එකට එකතු වෙලා තමයි - අද තමුන්නාන්සේලා දෙගොල්ලෝ හොඳයි. දෙගොල්ලෝ එකතු වෙලා තමයි මේ රජය පිහිටෙව්වේ. හැබැයි, දෙගොල්ලෝ එකට එකතු වෙලා තමයි රටේ ජනතාව මැරුවේ. එහෙමයි කළේ. ඒ නිසා අපි පැහැදිලිව ඉල්ලනවා. මේ පාපයෙන් ගැලවෙන්න එක්සත් ජාතික පක්ෂයේ අයට අපි කියන්නේ, කරුණාකරලා කඩිනමින් ඡන්දය තියන්න. හැබැයි, මේ ඡන්දය තමුන්නාන්සේලාට පැහැදිලියි. තමුන්නාන්සේලා තීන්දු කරලා ඉවරයි. අපි ජයග්‍රහණය කරනවා කියලා. ඒ නිසා තමුන්නාන්සේලා ඉදිරි මැතිවරණයේදී බලන්න. තමුන්නාන්සේලාට කඩිනමින් පුළුවන් නම් ඡන්දය තියන්න. තව මාසයක් දෙකක් ඇතුළත ඡන්දය තියන්න. අපි මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ රටම ජයග්‍රහණය කරලා පෙන්වනවා කියන එක මම පැහැදිලිව තමුන්නාන්සේලාට මතක් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.36]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේකට විරුද්ධ වෙන්න හැදුවේ පළාත් පාලන ඡන්දය නොතියා ඉන්න ඕනෑ කැමැත්තකට නොවෙයි. මේකෙන් පොඩි ප්‍රශ්නයක් තිබුණා. කොහොම හරි මට මතක හැටියට ඔක්තෝබර් මාසයේත් මෙවැනි යෝජනාවක් ගෙනැල්ලා පළාත් පාලන ඡන්දය මාස දෙකක් ඇතුළත තියන්න කියලා අපි කථා කරලා කවුරුත් ඒකට සහයෝගය දීලා ඒක සම්මත කර ගත්තා. කොහොම හරි තිබ්බේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කළා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් මේ කථා කරපු ගොඩක් දෙනෙක් අපේ ජගත් අංගගේ හිටපු ගරු ඇමතිතුමා එතකොට සුනිල් ජයමිණි හිටපු ගරු ඇමතිතුමා ගොඩක් දෙනෙක් මේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කළා. ඡන්ද තියන්න ඕනෑය කියලත් කථා කළා. ඔක්කෝටම මමත් එකඟයි. මේ ඡන්දය, ඉතාමත් කඩිනමින් තියන්න ඕනෑ ඡන්දයක්. මේක කල් දදා තියන්න බැහැ. හැබැයි, අපට ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඡන්දයට භයයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි නම් භය නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය භයයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ දැන් ඡන්ද මෙතෙක් කල් තිබ්බේ කෑලි කෑලිවලට කඩ කඩා. නගර සභාවේ සිට පළාත් සභාවත් තමන්ගේ වාසියට කෑලිවලට කඩ කඩා ඡන්ද තිබ්බේ. දැන් මේ කිව්වා නේ මැතිවරණ ගැන පොරොන්දුවක් දුන්නා කියලා. ඒ පොරොන්දුවෙන් එකක් තමයි මේ තිබෙන මැතිවරණ ක්‍රමය නැති කරලා, අලුත් මැතිවරණ ක්‍රමයක් ගේනවා කියන එක. දැන් ඒකට තමයි මේ ටිකක් කල් යන්නේ. ඒක නිසා මම ඉතාමත් ඕනෑකමින් ඉල්ලා සිටිනවා. පොඩ්ඩක් ඉවසන්න. අපට ඕනෑ, මේ පළාත් පාලන මැතිවරණය පැත්තෙන් පැත්තට, පළාතෙන් පළාතට - පළාත් පාලන තිහයි, හතළිහයි කඩ කඩ ඡන්දය තියන්න නොවෙයි. අපි ගිය රජය වාගේ කඩ කඩ තියලා සම්පත් ටික ඔක්කෝම එක තැනකට දාලා එහෙම වාසියක් ගන්න බලාපොරොත්තුවක් නැහැ. ඒක නිසා මුළු රටේම පළාත් පාලන ඡන්දය එක දවසක තියන්න තමයි අපෙත් ඕනෑකම. ඒක නිසා අපි විශ්වාස කරනවා. මේ මැතිවරණය අලුත් ක්‍රමයට, ජනතාවට පොරොන්දු වුණු විධියට මේ මැතිවරණය එක දවසක මුළු රටේම පවත්වයි කියලා. මම හිතන්නේ ඊට වැඩිය ප්‍රජාතන්ත්‍රවාදයක්, සාධාරණත්වයක් අපට ඉල්ලන්න බැහැ. මම දන්නේ නැහැ, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේක ගෙනාවේ මොකටද කියලා. අපට ආරංචියක් ඇවිල්ලා තිබෙනවා, පක්ෂයක් හදාගෙන යනවා කියලා. දැන් එතුමාත් පොඩි පක්ෂයක් හදාගෙන තව ටික දවසකින් අර පෙරමුණට එකතු වෙලා පාර්ලිමේන්තුවට යන්න ක්‍රමයක් සොයාගෙන ඇමතිකමක් ගන්න ක්‍රමයක් සොයා ගන්න හදනවාද දන්නේ නැහැ. එහෙම අදහසක් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ තිබෙනවාද කියලා මම දන්නේ නැහැ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමාත් එක්ක කථා කරලා නේ හැදුවේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් තිබෙන අලුත් ක්‍රමය අනුව පොඩි පක්ෂයක් තිබුණොත්, ඡන්ද පොඩි ගණනක් තිබුණොත්, 5000 ක්, 10,000 ක් තිබුණොත් ලෙහෙසියෙන්ම පාර්ලිමේන්තුවට උනත් යන්න පුළුවන්. ඒ නිසා එහෙම අදහසක් මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට තිබෙනවාද නැද්ද කියලා කියන්න මම දන්නේ නැහැ. හැබැයි අද බලන් යද්දී අර හෙළ උරුමය කොහේද ඉන්නේ කියලා අපි දන්නෙත් නැහැ. ගරු මන්ත්‍රීතුමිය ඉන්නවා. ඔබතුමියන්ලා ඉන්නේ ඔය පැත්තේද? මේ පැත්තේද? කොහෙවත් නැති පැත්තකද? ඒකත් ප්‍රශ්නයක්. දැන් මෙතුමන්ලා ප්‍රකාශයක් කළා, අපි ස්වාධීනව ඉන්නවා කියලා. ස්වාධීනව ඉන්නවා කියලා කොහෙද ඉන්නේ කියලා මට තවම තේරෙන්නේ නැහැ. එතකොට අද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දැන් දෙකඩ කැඩිලා තිබෙනවා. ඒක කවුරුත් දන්න රහසක් නේ? දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඡන්දය ඉල්ලන්නේ කෙහෙන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. මම දන්න තරමට නම් ඒ පක්ෂයත් කොහොම හරි ඇවිල්ලා එක්සත් ජාතික පෙරමුණට හේත්තු වෙයි ඡන්දය එද්දී. නැත්නම් ප්‍රශ්නයක්. අද ඡන්දය තියන්න කියලා කියනවා. තියන්න කියලා කිව්වාට, පක්ෂයක් නැහැ තියන්න. ඔබතුමන්ලාටත් හොඳ අවස්ථාවක් තිබෙනවා. පක්ෂය හරියට හදා ගන්න.

[සභාවේ ඝෝෂා]

එන කට්ටිය වෙලාවට එයි.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඔබතුමන්ලාට ඕනෑ හදවන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

වෙලාවට එන කට්ටිය එයි. ඒ නිසා පක්ෂය ටිකක් හදා ගන්න. ඒ කාලයත් ඔබතුමන්ලාට ලැබෙනවා. ඉතින් ඒකත් හොඳයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඔබතුමන්ලාගේ පක්ෂයක් නොවෙයි තිබෙන්නේ. පෙරමුණක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මීට වඩා ප්‍රජාතන්ත්‍රවාදයක් දෙන්නේ කවුද? තමන්ගේ පක්ෂය හදා ගන්න, ලියාපදිංචි කරගන්න අවස්ථාවක් දීලා තිබෙනවා. ඊට වැඩිය මොනවාද ඕනෑ? දැන් බලන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සභාව ගත්තාම ගරු මන්ත්‍රීවරු 104 ක් ඉන්නවා නේ? දැන් මේකේ ආණ්ඩු පක්ෂය කියන්නේ කවුද? මේකේ ආණ්ඩු පක්ෂයේ ඉන්නේ කවුද කියලා අපි දන්නේ නැහැ. විපක්ෂය කවුද කියලාත් අපි දන්නේ නැහැ. විපක්ෂය දන්නෙත් නැහැ. ආණ්ඩු පක්ෂය දන්නෙත් නැහැ. අපි ඡන්දය ඉල්ලුවේ එක්සත් ජාතික පක්ෂයෙන්. දැන් එහෙම එකක් තිබෙනවාද කියලා අපි දන්නෙත් නැහැ. දැන් තිබෙන්නේ එක්සත් ජාතික පෙරමුණක්. දැන් අපිත් ස්වාධීනයි. ඇත්තටම බැලුවොත් අපිත් ස්වාධීනයි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒක මොකක්ද කියලා දන්නෙත් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපිත් ස්වාධීනයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපිත් ශ්‍රී ලංකා නිදහස් පෙරමුණේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි කොහොද ඉන්නේ කියලා තවම දන්නේ නැහැ. ඒකත් ප්‍රශ්නයක්. අපටත් මොකක් හරි හදා ගන්න පොඩි චාන්ස් එකක් දෙන්න. එහෙම හදාගෙන -

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඔය එන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතකොට අපට භය නැතිව ඡන්දයට යන්න පුළුවන්. ඔය මොනවා, කොහොම කිව්වත් තමුන්නාන්සේලාත් පිළිඅරගෙන තිබෙනවා, ඡන්දය තිබ්බොත් අද එක්සත් ජාතික පක්ෂය - එදා ඉල්ලුවත් එක්සත් ජාතික පක්ෂය හැටියට එකට එනවා. මහින්ද කණ්ඩායම දෙකට එනවා. මෛත්‍රී කණ්ඩායම තුනට එනවා කියන එක.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

නැහැ. නැහැ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මහින්ද කණ්ඩායම එකට එනවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

දෙකට එන්නේ නැහැ. අනූ පහයි. පහයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමුන්නාන්සේලාට ඕනෑ මෙදා සැරේ දෙකට ඇවිල්ලා පෙන්වන්න. අර තමුන්නාන්සේලාගේ නායකතුමා ඔව් කියනවා. කොහොම හරි දෙකට ඇවිල්ලා පෙන්වන්නයි ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මේ පළාත් පාලන ආයතන ගැන නොයෙකුත් කථා කිව්වා. අපි දන්නවා, එක පැත්තකින් බලද්දී පළාත් පාලන ආයතනවල ප්‍රශ්නයක් තිබෙනවා. තව පැත්තකින් බලද්දී ජනතාවට සුභදායක පැත්තකුත් තිබෙනවා. අද පළාත් පාලන ආයතනවලට ගිහිල්ලා සමහර පළාත් සභා මන්ත්‍රීවරු, හිටපු මන්ත්‍රීවරු, හිටපු සභාපතිවරු බලෙන් තමන්ගේ වැඩ කරගන්න හදනවා. බලහත්කාරයෙන්. සමහර අය ගිහිල්ලා ටෙන්ඩර් කරන එකටත් බලහත්කාරකම් කරන්න හදනවා. අපි දන්නවා එහෙම දේවල් වෙලා තිබෙනවා කියලා. පාරවල් හදාගන්න බලහත්කාරයෙන් ගිහිල්ලා සමහර අය ගිහිල්ලා උප කාර්යාලවල වණ්ඩි පාට් දාලා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ පිංතූරත් ගලවලා විසික් කරපු කට්ටිය ඉන්නවා. වණ්ඩි පාට් දාලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඇයි ඔබතුමා (බාධා කිරීමක්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කවුද? එයාද කරලා තිබුණේ. මම දන්නේ නැහැ. පත්තරේ නමක් තිබුණේ නැහැ. ඒකයි මම ඇහුවේ. ඔයා කියනවා නම් එයා කියලා - ගජ මිතුරා නේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සභාවේ පෙන්නුවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පෙන්නුවාද? එහෙමනම් කමක් නැහැ. මෙහෙම ප්‍රශ්න තිබෙනවා. එදා වැඩක් කරගන්නේ බලහත්කාරයෙන්. තමන්ගේ ගෝලයා ඉන්නවා නම්, මන්ත්‍රීවරයා හැටියට තමන්ට ඕනෑ පැත්තට තමයි පාරේ තාර ටික දා ගත්තේ. කොන්ක්‍රීට් ටික දාගත්තේ. අද එහෙම වෙන්නේ නැහැ. අද ලයිට් එකක් දාන්න ඕනෑ නම්, පොතක් තිබෙනවා. පොතේ ලියපුවාම, පොතේ ලියා තිබෙන පාරට ලයිට් එක දානවා.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

රුපියල් 1500 ක් පාඩු කරගෙන පොතේ ගිහින් ලියන්න ඕනෑ. රස්සාවට යන්නේ නැතුව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජා-ඇළ නම් එහෙම දානවා. අපේ අනන්ද හරිස්චන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා හිතන් ඉන්නේ පළාත් පාලන මන්ත්‍රීවරයා පත් වෙන්නේ, ගමේ ලයිට් එක දාන එක ගිහිල්ලා කියන්න කියලා. ඒකට නොවෙයි, පළාත් පාලන මන්ත්‍රීවරයෙක් නගර සභාවට, ප්‍රාදේශීය සභාවට පත් කරන්නේ, ඒක කරන්න නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒවත් අයිතියි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් මොකද වෙලා තිබෙන්නේ? (බාධා කිරීම්) දැන් බලන්න. මෙරිල් ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට උපදෙස් දෙනවා, කථා කළා ඇතියි කියලා. එතකොට අවසන් කරන්න කියනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් ආණ්ඩු පක්ෂයේ ඔබතුමාම කියන්න කවුද කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා මේ යෝජනාව සම්බන්ධයෙන් දැන් මම කිව්වා. මන්ත්‍රීතුමන්ලා විශාල පිරිසක් අවස්ථාව ඉල්ලලා තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔව් ඉතින් රීති අත්හිටුවලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමන්ලාට කාලයත් එක්ක පොඩ්ඩක් හිතන්න මම කියන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රීති අත්හිටුවලා තිබෙන්නේ. තව පොඩ්ඩක් කාලය දෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මූලාසනයට කථා කරන්න. ඔබතුමා ඒවාට උත්තර දෙන්න යන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මූලාසනයට කථා කරන්නේ. ඉතින් ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා නම් මැතිවරණය ගැන කථා කරනවා නම් -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හිතේ අමාරුවට කථා කරන්නේ. තව වෙලාව දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේවා උල්ලංඝණය කරපු පසුගිය රජය තරම් රජයක් මේ රටේ තිබිලා නැහැ. දැන් හුඟ දෙනෙක් කියනවා, අවුරුද්දක් ගියාලු. රජය පත් වෙලා තව මාස තුනයි ගිහිල්ලා තිබෙන්නේ. අලුත් රජයට. මේ පළාත් සභාවේ ඇමතිවරු පත් වෙලා තව මාස දෙකයි, තුනයි ගිහිල්ලා තිබෙන්නේ. ඊට ඉස්සෙල්ලා මාස දෙකක් ගියාම ඇමතිවරයෙකුට විශ්වාසභංගයකුත් ගේනවා. ඉතින් මොකක්ද ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. ඒකද ප්‍රජාතන්ත්‍රවාදය? මේ ආණ්ඩුවට යන්න තව කල් දීලත් නැහැ. මාස තුනකින් පුළුවන්ද ආණ්ඩුවකට අලුත් ඡන්ද ක්‍රමයක් ගේන්න. (බාධා කිරීම්) හරි. හය වැනි මාසයේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මාස හයක් කියන්නේ ඉතාමත් පොඩි කාලයක්. අවුරුදු 05 කින් මාස 06 ක් කියන්නේ පොඩි කාලයක්.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

අපට තේරෙනවා කොහෙද යන්නේ කියලා. අවුරුදු 05 න් රටටම කෙළ වෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොඩ්ඩක් කල් දෙන්න.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

තව කල් දුන්නොත් හොඳට තියෙයි.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒක තමයි තාත්තාව මේ සැරේ නැවැත්තුවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තව කී දෙනෙක්ව බිලි බාගනියිද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒක තමයි මේ අයට තිබෙන ප්‍රශ්නය.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

හැබැයි මන්ත්‍රීවරු බායි. ජනතාව බාන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කී දෙනෙක් මේ හදාගෙන යන පක්ෂයෙන් කඩාගනියිද කියලා හයයි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ජනතාව බාන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැබැයි එකක් කියන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරද්දී, එදා මම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාටත් මෙතැනම ඉඳගෙන චෝදනා කළා. අදත් මම කියනවා. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ ආණ්ඩු පක්ෂයක්, විරුද්ධ පක්ෂයක් තිබෙන්න ඕනෑ. අද ඒක නැති කරගෙන යනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කවුද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඉතින් ඒ වැරැදියි. පාර්ලිමේන්තුවේ වුණත් පළාත් සභාවේ වුණත් කොහේ වුණත් ආණ්ඩු පක්ෂයක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම විපක්ෂයකුත් තිබෙන්න ඕනෑ. ජනතාව ඡන්දය දීලා පත් කර ගත්තා නම්, විපක්ෂයේ ඉන්න ඒ අය විපක්ෂයේ ඉන්න ඕනෑ. ඒ අය ආණ්ඩු පක්ෂයට ගිහිල්ලා හේත්තු වෙන එක වැරැදියි. ඒක තමයි ජනතා පරමාදිපත්‍යය කියන්නේ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඡන්දය ඉල්ලලා පරාද වුණු අයට ඇමතිකම් දුන්නේ ඔබතුමන්ලා නේ? ඔබතුමන්ලාගේ ආණ්ඩුව නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අර ගරු මන්ත්‍රීතුමා කිව්වා, ඡන්දයට ගිහිල්ලා ජනතාවට අවස්ථාව දෙන්නය කියලා. ජනතාවට අවශ්‍ය දේ නොවෙයි අද වෙලා තිබෙන්නේ. ජනතාව ඡන්දය දීලා පත් කර ගත්තු කට්ටියද අද පාර්ලිමේන්තුවේ ඉන්නේ? එහෙම කට්ටිය අද නැහැ. හොරකම් කරපු කට්ටිය ගිහිල්ලා ආණ්ඩුවට හේත්තු වෙලා, අද හොඳ කට්ටිය වාගේ මාධ්‍ය ප්‍රකාශ කරනවා. සමහර ඇමතිවරු ප්‍රකාශ කරනවා කැබිනට් එක වෙනුවෙන්. ඒ තරම් හොරකම් කරපු කට්ටිය කොහෙවත් නැහැ. ඒ තරම් හොරුත් ඉන්නවා. ඒ අය ආරක්ෂා වෙනවා. අනික් අයව අල්ලනවා. ඒකත් වැරදියි.

**ගරු අනන්ද හරිශ්චන්ද්‍ර ද සිල්වා**
Hon. Ananda Harischandra de Silva

ඒක යහපාලනය නේ?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

යහපාලනයට කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් ඔබතුමන්ලා කියන්නේ යහපාලනය නොවෙයි කියලාද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කියන්නේ යහපාලනය නොවෙයි කියලාද ඒක. ඔක්කොම කියනවා නම් නොවෙයි කියලා මට විරුද්ධ වෙන්න බැහැ නේ? බහුතරයක් කියන්නේ නොවෙයි කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒක යහ හොරු පාලනය.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පළාත් පාලන ඡන්දය ඉතාමත් කඩිනමින්, පුළුවන් තරම් ඉක්මණින් තියන්න ඕනෑය කියලා මම එකඟ වෙනවා. මේක ජනතාවගේ තිබෙන අයිතිය. ප්‍රජාතන්ත්‍රවාදය මොන ක්‍රමයෙන් හරි විකෘති කරනවා නම්, ඒක කඩනවා නම්, පැහැර ගන්නවා නම් ඒක වැරදියි. ඒ නිසා මේ රජයට අපි කියනවා. පළාත් පාලන ආයතන පවතින්නේ මේ පළාත් සභාව තුළින්. මේ පළාත් සභාවේ කොටසක් හැටියට. පළාත් සභාවක් හැටියට මම හිතන්නේ, කවුරුවත් විරුද්ධ වෙන්නේ නැහැ. මේ ඡන්දය ඉතාමත් ඉක්මණින් තියන්න ඕනෑ. ගරු මන්ත්‍රීවරුන් කිව්වා වාගේ අලුත් ක්‍රමයට බැරි නම් පරණ ක්‍රමයට හරි තියන්න ඕනෑ. එහෙම කරලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ලාන්සා ඇමතිතුමාට -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකත් මතක් කරන්න ඕනෑ ඇත්තටම. මොකද, යහපාලන ආණ්ඩුවේ පළමුවැනි වතාවට - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළමුවැනි වතාවට ලංකා ඉතිහාසයේ අපි දැක්කා 150 ක් STF එක ඇවිල්ලා වට කරපු මිනිහෙක් ගිහිල්ලා නිදහස් උත්සවයේ ජනාධිපතිතුමාවයි, අගමැතිතුමාවයි, අග්‍රවිනිශ්චයකාරවරයාවයි පිළිගන්නවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මේ ආණ්ඩුවේ තරම. ඒ යහපාලනයට වෙලා තිබෙන දේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකත් මතක් කරන්න ඕනෑ. ඉතින් මේ වාගේ යහපාලන ආණ්ඩුවක් - (බාධා කිරීම්)

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ඒකට කියන්නේ යහ හොරු පාලනය කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක තමයි. මේකට එක්සත් ජාතික පක්ෂයට බැණලා වැඩක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇති කරපු දෙයක් මේක. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්න හොරු ටික ඔක්කොම ඇවිල්ලා අපේ පැත්තට එද්දී යහපාලන -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඉතින් හොරු මොකටද ගරු අගමැතිතුමා කැබිනට් එකට ගත්තේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එක්සත් ජාතික පක්ෂය හොරුන්ව අරන් නැහැ. (බාධා කිරීම්) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තමයි හොරුන් ටිකක් හදා ගත්තේ. එක්සත් ජාතික පක්ෂය -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒ කියන්නේ කම්බ හොරුත් එක්ක හොරු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සියලු දෙනාටම, ගමේ තිබෙන සියලුම දේ කර ගන්න තිබෙන එකම ආයතනය මේ පළාත් පාලන ආයතනය. ඒ ආයතනයට අපේ නියෝජිතයන් පත් කර ගන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑය කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.51]

**ගරු සහන් ප්‍රදීප් විතාන**
Hon. Sahan Pradeep Vithana

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා කළ යෝජනාවට ඌණ පූරණයක් එකතු කරන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව සතුටු වෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා, අද පළාත් පාලන ආයතන විසුරුවලා හැරලා, අද මේ ප්‍රදේශවල ජනතාව විශාල අසාධාරණයකට ලක් වෙලා තිබෙන වෙලාවක තමයි මේ යෝජනාව ගේන්නේ. අපි දන්නවා, මව් කුසේ දරුවකු පිළිසිඳ ගත් දවසේ ඉඳලා මරණය දක්වා මේ පළාත් පාලන ආයතනවලින් විශාල සේවාවක් සිද්ධ වෙනවා. එවැනි පළාත් පාලන ආයතන තමයි අද දවසින් දවස ඡන්දය කල් දාලා, පළාත් පාලන ආයතනවලින් කරන සේවය මහජනතාවට ලැබෙන අවස්ථාව, අද නැති කරලා තිබෙන්නේ. අපි දන්නවා අද මාර්ග පද්ධතිය ගත්තොත් ආසනවල විශාල වශයෙන් විනාශ වෙලා තිබෙන්නේ. අද පාරක් හදා ගන්න බැරි තත්ත්වයකට පත් වෙලා. ප්‍රිමික්ස් ටිකක් දාලා පාරක් නඩත්තු කර ගන්න බැරි තත්ත්වයට පත් වෙලා. අද තැන් තැන්වල, පාරවල්වල කුණු ගොඩ ගැහිලා. ඒවා අදින්න ක්‍රමවත් වැඩ පිළිවෙළක් නැහැ. මේ විධියට පළාත් පාලන ආයතනවල පරිපාලන ව්‍යුහය පවා කඩාගෙන වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඉතින් අපි දන්නවා. ප්‍රාදේශීය සභාවක සභාපතිවරයෙක් වේවා, නැත්නම් නගර සභාවක සභාපතිවරයෙක් වේවා මේ අයට විධායක බලයක් ආරූඪ කරලා තිබෙන්නේ, මේ සභාපතිවරු, නගරාධිපතිවරු ඇතුළු පළාත් පාලන නියෝජිතයන් සැබවින්ම පළාත් පාලන ආයතනයක සිටිය යුතු නිසා. නමුත් අද වෙලා තිබෙන්නේ පරිපාලන ව්‍යුහය විතරක් ඉතිරි කරලා, මහජනතාව විසින් පත් කරන, ඒ ජනතාවගේ පරමාධිපත්‍ය අද නැත්තට නැති කරලා තිබෙනවා. ඒ තුළ පළාත් පාලන ආයතනවලින් වන සේවාව අද මහජනතාවට ලබා ගන්න පුළුවන්කමක් නැති තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. මේක මහා බරපතළ තත්ත්වයක්. මේ විසිරීම, එහෙම නැත්නම් මේ ඉහිරිලා යෑම මම හිතන්නේ වසර ගණනාවකින්වත් ආපස්සට ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. අද පළාත් පාලන ආයතනවල ඉන්න නිලධාරීන් ඒ අය ළඟට ගිහිල්ලා බිම් කට්ටි සැලසුමක්, නිවාස සැලසුමක් අනුමත කර ගන්න ගියාම අද ප්‍රදේශයේ ජනතාව විශාල පීඩාවකට පත් කරනවා. නීති කඩන්නේ නැතිව නමලා, නගරාධිපතිවරු, සභාපතිවරු ඒවා අනුමත කරලා දුන්නා. නමුත් ඒ සාධාරණය අද ජනතාවට ඉෂ්ට වෙන්නේ නැහැ. මෙවැනි අසාධාරණකම් ගණනාවක් අද ප්‍රදේශයේ ජනතාවට සිද්ධ වන වෙලාවක මේ පළාත් පාලන මැතිවරණය දවසින් දවස කල් දමන එක ආණ්ඩු කරවන අය කරන ලොකු අසාධාරණයක් හැටියටයි අපි දකින්නේ.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට එක හෙළාම

කැමැත්ත ප්‍රකාශ කරලා අපි මේ කථා කරන්නේ, ඒක මේ වර්තමානය තුළ සිදු විය යුතු කාරණාවක් හැටියට අපි දකින නිසා. ඒ නිසා අපි පැහැදිලිවම ඉල්ලීමක් කරනවා, බස්නාහිර පළාතේ මහ ඇමතිතුමාගෙනුත්. මේ පිළිබඳව ඔබතුමාගේද දැඩි අවධානය යොමු කරලා අතිගරු ජනාධිපතිතුමාට සහ අග්‍රාමාත්‍යතුමාට මේ පිළිබඳව දැනුවත් කරලා, මේ පළාත් පාලන ආයතනවල ධූර කාලය අවසන් වන දවසට පළාත් පාලන මැතිවරණය පවත්වලා අපේ ප්‍රදේශවල ජනතාවට සාධාරණය ඉෂ්ට කරන්න කටයුතු කරන්නය කියන ඉල්ලීම අපි කරනවා. එහෙම නැති වුණොත් වෙන්නේ, ඒ ජනතාව දවසින් දවස තමන්ගේ අවශ්‍යතාවයන් ඉටු කර ගන්නට බැරිව, ඒ ජනතාව පාරට බහින දවස වැඩි ඈතක් නොවන බව අපි පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ. ඒ නිසා අපි දිගින් දිගටම පළාත් සභා මන්ත්‍රීවරු හැටියට ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ නායකත්වය තුළ අයවැය ලේඛන සකස් කරන්න, අපේ බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන නිලධාරීන් එකතු කරලා සාකච්ඡාවක් පැවැත්වුවා. ඒ වෙලාවේදී අපි දැක්කා, ඒ අයවැය ලේඛනවල තිබෙන අඩුපාඩු. ඒ අයවැය ලේඛනවල ජනතාවගේ සුභ සිද්ධියට වෙන් කරන මුදල්වල විශාල අඩුවක් අපි දැක්කා. මාර්ග පද්ධතිය අලුතෙන් හදන්න මුදල් වෙන් කරලා තිබුණේ නැහැ. ඒ අයවැය ලේඛනයේ සමහර ඒවා අති අසාර්ථක තත්ත්වයට පත් වෙලා තිබුණේ. එහෙම නොවෙන්නේ, මහජන නියෝජිතයන් හරහා තමයි මේ ජනතාවගේ ඉල්ලීම් ප්‍රාදේශීය සභා තුළින්, නගර සභා තුළින් ඉටු වුණේ. එහෙම ඉටු නොවුණු නිසා තමයි අද අයවැය ලේඛන අසාර්ථක ලේඛන බවට පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි දැඩිව කියනවා. මෙවැනි අසාර්ථකත්වයක් තුළ මහජනතාව විඳින පීඩාවලට මේ ආණ්ඩු කරවන නායකයන් වගකිව යුතුයි කියන ඒ ප්‍රකාශය අපි කරන්න කැමැතියි. ඒ නිසා මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවට සුභ පතමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 12.56]

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව මම හිතන්නේ, මේ පළාත් සභාව තුළ දෙවැනි වතාවට ඉදිරිපත් වෙන්නේ. හැබැයි, මීට පෙර මෙවැනිම යෝජනාවක් ඇවිල්ලා මේ වාගේ ඔක්කොම එකඟ වෙලා කථා කරපු යෝජනාවක්, එන්නේ නැතිව ඇතියි කියලා මම හිතනවා. ඒ වාගේම විශේෂයෙන්ම අපේ ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මුලින්ම කෑ ගහගෙන හිටියා. නමුත් ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට අන්තිමට කථාවේදී හිතුණා, මේකට විරුද්ධ වෙලා කථා කරලත් බැහැ. කැමැති වෙලා කථා කරලත් බැහැ. හරියට මේ ආණ්ඩුව වාගේ. මේ ආණ්ඩුව වාගේ තමයි එතුමාත් හිර වුණා. මොනවා හරි කියව කියවා ඉඳලා අන්තිමට අර ආණ්ඩුවෙත් තිබෙන්නේ ඡන්ද දෙන, ජනතාව ගැන බලන එක නොවෙයි. කවුද ඉන්නේ එදිරිවාදිව? ඔහුව නවත්වන වැඩ පිළිවෙළ තුළ එතුමා අන්තිමට 150 ක් වට කර ගත් කථාවක් කියලා අයින් වුණා. ඒක තමයි මේ ආණ්ඩුවේ තිබෙන්නේත්. මේ ජනතාවට සුභවාදී දේවල් ගේන්න, ජනතාවගේ ඕනෑ එපාකම් බලන්න නොවෙයි ඇත්තටම තිබෙන්නේ. තමන් රැකෙන්න, තමන්ගේ වට පිටාව හදා ගන්න, තමන් ඉන්නකල් ඒ තනතුරේ ඉන්න වැඩ පිළිවෙළ තමයි යන්නේ. ඒක තමයි මේ සියල්ලටම හේතුව, මුල කියලා මම දකිනවා.

විශේෂයෙන්ම ඇත්තටම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපි සියලු දෙනාගේම එකම මතයක් අද මෙතැන තිබෙනවා. මේ සියලු දෙනාම මහජන පරමාධිපත්‍යයත් එක්ක මෙතැනට ආපු අය හැටියට ජනතාවගෙන්, අපෙන් පල්ලෙහා, අපි දිස්ත්‍රික්කයක් නියෝජනය කරන කොට, ගමේ කොටසක් නියෝජනය කරන්න පළාත් පාලන ආයතනවල මන්ත්‍රීතුමන්ලා හිටියා. අද ඒ අය වෙනුවෙන් තමයි මේ සියලු දෙනාම කථා කරන්නේ. එදා රුපියල් පන්දාහක වාගේ දීමනාවකට හිටපු ඒ මන්ත්‍රීතුමන්ලා මම හිතන්නේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට පින් සිද්ධ වෙන්න විශේෂයෙන්ම මේ දීමනාව රු. 15,000 දක්වා වැඩි කරන්න පුළුවන්කම ලැබුණා. දුරකථන ආදී දීමනා වරප්‍රසාද ලැබුණා. හැබැයි, මාස කිහිපයයි ගන්න පුළුවන් වුණේ. අද දිනයේ මේ ජනතා සේවයට එදා තිබුණු රජය වෙනස් කරලා, එදා හිටපු ජනාධිපති වෙනස් කරලා ජනතා සේවය වැඩියෙන්ම ලබා දෙනවාය කියලා ආපු ආණ්ඩුව, ආපු රජය, ආපු නායකයින් මම හිතන්නේ, අද වන කොට අවුරුද්දකුත් මාසයක් වෙනවා. අදත් 09 වැනිදා. අවුරුද්දකුත් මාසයක් වෙනවා. නමුත් කොමිෂන් නැහැ. මේ නිසා ප්‍රශ්න වැඩියි. ප්‍රජාතන්ත්‍රවාදය ඉටු වෙන්නේ නැහැයි කියා ගෙන ආපු අය කොමිෂන් පත් කළා. අද ස්වාධීන මැතිවරණ කොමිෂන් සභාව කියලා පත් කළා. අපි හිතුවා, එදාට වඩා සාධාරණයක් වෙයි කියලා. අද පොලිස් කොමිෂන් සභාව

[ගරු ලලිත් වර්ණකුමාර]

කියලා පත් කරලා තිබෙනවා. මම හිතන්නේ, ඉතිහාසයේ පොලීසියට විරුද්ධ වැඩිම පැමිණිලි ටික ආවේ මේ කොමිෂන් ටික පත් කළාට පස්සේ. එහෙම නම් ජනතාවට කරපු බොරුව, ඒකේ බොරුව දැන් අද මේ ජනතාව තේරුම් අරගෙන තිබෙනවාය කියන එක අපි දකිනවා.

අර අපේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, උපතේ සිට මිය යන තෙක්ම මේ ජනතාවට ළඟම ආයතනය තමයි පළාත් පාලන ආයතනය. ඒකෙන් වුණු සේවාව සුවිශේෂීයි. මොන පක්ෂයෙන් වුණත්, මොන ආණ්ඩුවෙන් වුණත්, මොන පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් වුණත් ඒ වුණු සේවය සුවිශේෂීයි. අද ඒ සියල්ල නැති වෙලා අපේ මදුරාවල ප්‍රාදේශීය සභාව ගත්තාට පස්සේ බුලත්සිංහල ආසනයේ ඒ මඩු තිබුණා හයක් හතක්. මළ ගෙයක් වුණාම අහිංසක මිනිහෙකුට මඩුවක් ගන්න පුළුවන්කමක් නැහැ. නැකැත් දවසක්, වැහි දවස් වුණොත් එහෙම සල්ලිවලටවත් මඩුවක් ගන්න බැහැ. අද ඒ මඩු ටික දෙන්න නිලධාරීන් කැමැති නැහැ. දෙන්නේ නැහැ. එදා ඒ ජනතාවගේ මුදලින්ම උපයා ගත් බදුවලින් ඒ වාහනවලට තෙල් ටික ගහලා ඒ පුටු ටික දීලා, වතුර ටැංකිය දීලා බැරි කෙනෙකුට එහෙම සේවාවක් කළා. අද ඒ සේවාව නැහැ. බඩු නැතිව නොවෙයි. බඩු තිබෙද්දී ඒ සේවාව කරන්න නිලධාරීන් පස්ස ගහනවා. චක්‍රලේඛ පෙන්වනවා. ඔවුන්ගේ පැන්ෂන් එක රැක ගන්න ඕනෑය කියලා ඉන්නවා. හැබැයි, ඒ අයට ඒ වෙන්දේසි ඉඩමකට, ඒ මුදල් ලැබෙන දේ ආවොත් එදා මහජන නියෝජිතයන් අතර සල්ලි ගත්ත අය සමහර විට ඉන්න පුළුවන්. නමුත් ඔවුන් මනාපයෙන් එන නිසා බහුතරයක් අය හරි බයයි මේ පගා කියන ඒවාට. අද නිලධාරීන් කිසිම හයක් නැහැ. ඒ ජනතාවට ඉඩම් කැබැල්ලක් වුණත් තිබෙන ඕනෑ වගුරු බිමක් මේවා කරලා, ඕනෑ දෙයකට එකඟ වෙලා තමන්ගේ කුට්ටිය ගන්න වැඩ පිළිවෙළ තුළ ඉන්නේ. විශේෂයෙන්ම මදුරාවල ප්‍රාදේශීය සභාවේ අපේ අලුත් ලේකම්තුමියක් ඉන්නවා. අපේ ප්‍රධානම පන්සලක් තිබෙනවා. ඒ පළාතේම ඉන්න නායක හාමුදුරුවෝ. සංඝනායක හාමුදුරුකම හම්බ වෙලා අර භීෂණ සමයේ වුණු අසාධාරණකම් නිසා ඒක ආපහු දුන්නා. ඒ බස්නාහිර පළාත් සංඝනායකකම ආපහු දීපු හාමුදුරු නම අපවත් වුණා. ඒ හාමුදුරුවන්ගේ ගෙවල් මුල ඉඳලා අගට තිබෙන සෑම කෙනෙක්ම අත්සන් කරලා දීලා තිබෙනවා. මේ පාර හාමුදුරුවන්ගේ නමින් නම් කරන්නය කියලා. ඉතින් එහෙම දීලා, මමත් ඉල්ලීමක් මහ ඇමතිතුමාගෙන් ඉල්ලා ගෙන ගිහිල්ලා ඒ ලේකම්තුමියට දීලා කිව්වා මේක කඩිනමින් කරලා දෙන්න. මේ මාසේ පස්වැනිදාට තුන් මාසේ දානේ තිබෙනවා කියලා. එතුමිය කිව්වා, මට ඕවා වැඩක් නැහැ. මහ ඇමතිතුමාගේ ඉල්ලීම්වත්. මම කරන්නේ නීතියට. මාස දෙකක් යනවා. මට මේක ප්‍රසිද්ධ කරන්න ඕනෑ. මම කිව්වා, විරුද්ධ කිසි කෙනෙක් නැහැ. එතැනට ඇවිල්ලා කැඳවලා බලන්න. විරුද්ධ කිසිම කෙනෙක් නැහැ. සියලු දෙනාම ලිඛිතව අත්සන් කරලා දීලා තිබෙනවාය කියලා. නමුත් එහෙම තමයි ඒ අය. අපට නොවෙයි මේ නායක හාමුදුරුවන්ගේ නමවත් ඒ තුන් මාසේ දානේ වෙලාවට ඉස්සෙල්ලා ඒ සියලු දෙනාගේ කැමැත්ත අනුවවත් දාන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. එහෙම ඒකාධිපති තත්ත්වයක් තමයි ඒ නිලධාරීන් කර ගෙන යන්නේ. තමන්ට හිතුණු ගමන් කොහේද යන්න ඕනෑ. වාහනය ගත්තා. කතරගම යන්න ඕනෑ නම් කතරගම යනවා. මඟුල් ගෙදර යන්නෙත් ඒකේ. දානේ ගෙදර යන්නෙත් ඒකේ. ඒක අපට කමක් නැහැ. නමුත් ජනතාවට විය යුතු - අර මම උදේ කිව්වා වාගේ කුණු ටික ගේන තැනට සීමාව ආපු තැනට නවත්වලා, ඒ වරිපනම් ගෙවන ජනතාවට ඒ කුණු ටිකවත් අරගෙන යන්නේ නැතිව තමන්ගේ සුඛ විහරණය වෙනුවෙන් වැඩ කරනවා. නමුත් දැන් එන මුදල් ප්‍රතිපාදන. අද බලන්න අපේ ආසනයේම ගත්තොත් විශාල ප්‍රමාණයක් පාරවල් කාපට් කරලා තිබෙනවා. විශේෂයෙන්ම අපේ නිර්මල කොතලාවල ගරු මන්ත්‍රීතුමා හිටපු නිසා. අද ඒවායේ වතුර ලයින් එක යනවා. කාපට් කරපු පාර හිතුමතේ මෙතැනින් කඩනවා. තව ඉස්සරහායින් තව ටිකක් කඩනවා. ඒ කැඩුණු තැන වහන්නේ නැහැ. එතැනින් තව කැඩී කැඩී ගිහිල්ල, තව අවුරුදු ගණනක් ඉස්සරහාට පරිහරණය කරන්න තිබෙන පාරවල් අද අපේ ප්‍රදේශයේ විශාල ප්‍රමාණයක් කැඩිලා ගිහිල්ලා තිබෙනවා. ඒ තත්ත්වයට වැටුණේ, මේ සම්පත් රකින්න නැත්තේ, නීතියක් නැති වුණේ මේ වැඩ පිළිවෙළ නිසා.

අපි හිතාගෙන හිටියා, මේ පළාත් පාලන ආයතන ටික එක සැරේම ඉවර වෙලා එකසැරේ තියෙයි කියලා. දැන් ඉවර වෙලා තිබෙන්නේ. එහෙම නම් සීමා නිර්ණය වැඩ පිළිවෙළ තුළ අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය තුළ මේ සියල්ල ඉවර කරලා තිබුණා. ඉවර කරලා මේ පසුගිය 2015 ජනවාරි 08 වැනිදා ආයිත් වෙනත් ආණ්ඩුවක් ආවාම ඒ අයත් ආපහු එව්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට.

එක්සත් ජාතික පක්ෂයේ ඒ සියලු දෙනාගේම අදහස් අරන් ආයිත් මේවා වෙනස් කරන්න ඕනෑ නම් වෙනස් කරලා එවන්නය කියලා. අන්න ඒ වෙනස් කරලා ගිය ඒවා තමයි තවම මම හිතන්නේ හදා ගන්න බැරිව තිබුණේ. නැතිව ඒගොල්ලෝ හිතුවා අපට වාසියට කියලා. හැබැයි, අපේ ප්‍රදේශවල නම් ඒවා වෙනස් වුණේ නැහැ. හැමෝටම සාධාරණ විධියට තමයි ඒවා හදලා තිබුණේ. ඒ නිසා වෙනස් වෙන්න ඕනෑ නැහැ. නමුත් සමහර තැන්වල විශාල වශයෙන් වෙනස් වුණු නිසා ඒ සීමා නිර්ණය ටික හදා ගන්න බැරි වෙන්න ඇතැයි කියලයි මම දකින්නේ. ඒ නිසා අපි සියලු දෙනාගේ ඉල්ලීම, අපේ ජනතාවට රජයේ පැත්තෙන් වෙන්න ඕනෑ කාරණාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළින් සිද්ධ වෙනවා. එහෙම නම් මහජන නියෝජිතයෝ හැටියට, මහජන පරමාධිපත්‍ය එක්ක ජනතාවට වෙන්න ඕනෑ කාරණා තිබෙනවා. අද ඒවා කිසි දෙයක් ගමේ සිද්ධ වෙන්නේ නැහැ. අද ඒවා කිසිම දෙයක් නොවෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අද සාමාන්‍යයෙන් ගමේ ජනතාවට ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරු හිටියත් එකයි නැතත් එකයි කියන සාමාන්‍ය මට්ටමට ඇවිල්ලා තිබෙනවා. එහෙම නැත්නම් මේක නැතිම කරලා ඔය විධියටම හැමදාම යන්න අරින්න තිබෙන්නේ මොකද? මේ වැඩ පිළිවෙළේ අවශ්‍යතාවය නොවන විධියට. අපේ එක් මන්ත්‍රීවරයෙක් කිව්වා අද හොඳට වැඩ කටයුතු සිද්ධ වෙනවාය කියලා. මොන පිස්සුද? ඒ නිලධාරියාට අවශ්‍ය තැන විතරමයි සිද්ධ වෙන්නේ. එදා එහෙම නොවෙයි. කොට්ඨාශයට යූ.එන්.පී. මන්ත්‍රීවරු හිටියා. ජේ.වී.පී. මන්ත්‍රීවරු හිටියා. අද අපේ ජේ.වී.පී. මන්ත්‍රීතුමා කිව්වා, එතුමාගේ මන්ත්‍රීතුමා තමයි අද වැඩියෙන්ම කැස්බෑවේ වැඩ කරන්නේ කියලා. ඔව්. නිලධාරීන් ටික හොඳ නිසා. ඒ වාගේ නිලධාරීන් එක්ක හොඳ හැම මන්ත්‍රීවරයාම එහෙම වැඩේ කර ගත්තා. තමන්ගේ ප්‍රදේශයේ ලයිට් එක ගියාම, මරණ ගෙයක් වුණාම, කාණු පද්ධතිය ගැන වැනි නොයෙක් වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වෙනවා.

මේ සායන ටික. විශේෂයෙන්ම, අද MOH එක හරහා මොනවාද සිද්ධ වෙන්නේ? එදා ඩෙංගු වැඩ පිළිවෙළවල් වැනි වැඩ පිළිවෙළවල් මොන තරම් ක්‍රියාත්මක වුණාද? ළදරු පාසල්වල අද මොනවාද සිද්ධ වෙන්නේ? මේක සාමාන්‍යයෙන් එපාම වන තත්ත්වයට මේ රටේ ඉන්නේ ළදරුවෝ කියලා හිතලා තමයි මේ රජය කටයුතු කරන්නේ. මේ හැමෝම මේ රටේ ජීවත් වන පුරවැසියෝ. ළදරුවෝ ගැන හිතන විධියට තමයි මේ රජය කටයුතු කරන්නේ කියන එකයි විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ. ඒ නිසා මම ඉල්ලා සිටින්නේ, මේ වැඩ පිළිවෙළ ඉස්සරහාට ගෙනියලා කවුරු වුණත් කමක් නැහැ. අපේ බුලත්සිංහල ආසනයට ප්‍රාදේශීය සභා තුනක් එකතු වෙනවා. යූ.එන්.පී. එකේ මන්ත්‍රීවරු ඒවා දිනුවත් කමක් නැහැ. එතකොට මහජන පරමාධිපත්‍යයත් එක්ක ඉස්සරහාට යයි. අපි කියන්නේ, දිනන කාට හරි කමක් නැහැ. මේක තියලා ඒ විය යුතු කාරණා ලබා දෙන්න කටයුතු කරන්නය කියන එක ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකතුමාගෙන්, ඒ වාගේම එක්සත් ජාතික පක්ෂ නායකතුමාගෙන් දෙන්නාගෙන්ම ඉල්ලන්නේ. දෙන්නාගෙන් එක්කෙනෙක් හිතනවා නම් මට අවාසියි කියලා. එහෙම නම් අනික් එක්කෙනාට වාසි වෙන්න ඕනෑ. එහෙම නම් එයා මේක අතට අරගෙන මේක ඉක්මණට තියන්නය කියන්න ඕනෑ. දැන් බැලුවාම කාටවත් -

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

අගමැතිතුමා කැමැතියි.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

එහෙම නම් තියන්න පුළුවන්කම ලැබෙන්න එපැයි.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඔබතුමන්ලාගේ එක්කෙනා -

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

අපේ එක්කෙනා? අගමැතිතුමා නේ සේරම බලය. පාර්ලිමේන්තුවෙන්නේ බලය දුන්නේ. 19 වැනි ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට බලය දුන්නා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

එහෙම නම් අගමැතිතුමා ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරන්න ඕනෑ. අගමැතිතුමාට ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරන්නය කියන්න.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ඒක තමයි අපටත් ඕනෑ. 19 වැනි සංශෝධනයෙන් අගමැතිතුමාට සම්පූර්ණයෙන්ම බලය දුන්නා නේ? පාර්ලිමේන්තුවට. ඔය කාටවත් වාසි නැහැ. ඒකයි මට පේන්නේ. ඒ නිසා කවුරු වුණත් කමක් නැහැ ජනතාවගේ සේවය ලබා දෙන්න මෙය කඩිනමින් ඉටු කරන්නය කියලා ඉල්ලා සිටිමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමාට විනාඩි 08 ක කාලයක් ලබා දෙනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එයා කොයි පක්ෂයේද?

[අ.භා. 01.06]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක හොඳයි අහන එක. කොයි පක්ෂයේද කියලා. ඒ නිසා පක්ෂ දෙකම ඉවස ගන්න වෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉස්සර අපි පෙම් හසුන් යවනවා. ඔබතුමා දන්නවා ඇති. ඔබතුමාත් පෙම් හසුන් යවලා ඇති. දැන් කාලේ එහෙම නැහැ. SMS යවනවා. WhatsApp තිබෙනවා. Viber තිබෙනවා. දැන් ඒවායින් තමයි පණිවුඩ යවන්නේ. නමුත් තවමත් පෙම් හසුන් හුවමාරු කර ගන්නවා, අපේ රටේ අගමැතියි, ජනාධිපතියි. ඇයි? අගමැති රට. ලියුම තැපෑලෙන් යන කොට ජනාධිපති පළාත් පාලන ඡන්ද විමසීම කල් දාලා. දැන් මෙහෙමයි ගනුදෙනු කෙරෙන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොකක්ද මේ න්‍යාය පත්‍රය? යහපාලන ජාතික ආණ්ඩු න්‍යාය පත්‍රය කියලා මේකට කියන්නේ. 2012 සංශෝධිත පළාත් පාලන ඡන්ද විමසීම් ආඥා පනතේ විධිවිධානවලට අනුව යෝජනා කරලා තිබෙන්නේ, මේ පළාත් පාලන ඡන්දය කොට්ඨාශ ක්‍රමයට පවත්වන්න. දැන් මොකක්ද මේකේ දේශපාලනය ගරු නියෝජ්‍ය සභාපතිතුමනි? අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා හොඳටම දන්නවා, මේකේ අභ්‍යන්තර දේශපාලනය මොකක්ද කියලා. එතුමාගේ මේ යෝජනාවේ ඒක කියවිලා නැහැ. හැබැයි, මම කැමැතියි, ඒ පිළිබඳව යම් අදහස් කිහිපයක් පළ කරන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ඡන්දය කොට්ඨාශ ක්‍රමයට තිබ්බොත් පාර්ලිමේන්තුවේ වැඩි බලය හිමි එක්සත් ජාතික පක්ෂයට පළාත් පාලන ආයතනවල බලය අහිමි වෙනවා. මේක තමයි ඇත්ත. සමානුපාතික ක්‍රමයට තිබ්බොත් පළාත් පාලන ඡන්දය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරාද වෙනවා. දැන් මේ යථාර්ථය තේරුම් ගන්න ඕනෑ. දැන් අගමැතිතුමා මොකක්ද කරන්න හදන්නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ෆොන්සේකා මහත්මයා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ෆොන්සේකා මහත්තයා ඔයගොල්ලෝ එක්ක නේ ඉන්නේ. ප්‍රශ්නයක් නැහැ. එතුමා හිටියත් පරාදයි. එතුමා හිටියොත් එක්සත් ජාතික පක්ෂය -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා කොහේද ඉන්නේ එතකොට?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මම අද කියන්නම්. එක්සත් ජාතික පක්ෂ ඡන්ද අඩු වෙනවා. (බාධා කිරීම් )

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

වෙලාව වෙන් කරන්න බැහැ. පක්ෂය හදන්න ඕනෑ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එතුමා ස්වාධීනව ඉන්නවාලු.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

දැන් ඔබතුමා කොහේද ඉන්නේ? ඔබතුමාට පක්ෂයක් තිබෙනවාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අනාගතයට බලපාන ප්‍රශ්න අහන්න එපා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අපිත් එක්ක ඉන්නවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ඒකාබද්ධ විපක්ෂයේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමාත් අර වාගේ පක්ෂයක් හදා ගන්න හදනවාද දන්නේ නැහැ, ටක් ගාලා පාර්ලිමේන්තුවට යන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒක කියන්න බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අගමැතිතුමා දන්නවා, කොට්ඨාශ ක්‍රමයට තියලා මේක ජයග්‍රහණය කරන්න නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකට කැඩෙන්න ඕනෑය කියලා. කැඩෙන්නේ කොහොමද? මහින්ද මහත්තයා ඒකාබද්ධ විපක්ෂය හරහා අලුත් කණ්ඩායමක් අරගෙන, පක්ෂයක් හදලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ගැලවිලා ගියොත් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කැඩෙන්නේ. එහෙම වුණොත් තමයි රනිල් වික්‍රමසිංහ මහත්තයාට මේක දිනා ගන්න පුළුවන් වෙන්නේ. හැබැයි, එහෙම ගියොත් මහින්ද මහත්තයා පරාද වෙන්න පුළුවන්. රනිල් මහත්තයා දිනන්න පුළුවන්. හැබැයි, රනිල් මහත්තයා දිනන කොට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට මොකද වෙන්නේ? මෙන්න මෙතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. එතකොට තමයි කියන්නේ, "ගෙදර ගියොත් අඹු නසී. මග හිටියොත් තෝ නසී" කියලා. දැන් එහෙම වුණොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජනාධිපතිතුමා සුළුතර ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට යනවාද? නැත්නම් බහුතර එක්සත් ජාතික පක්ෂයට යනවාද? මෙන්න මෙතැන තමයි ප්‍රශ්නය මතු වෙන්නේ. මේ ප්‍රශ්නය අවසානයේ මොකක්ද වෙන්නේ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකට කැඩුනොත්, යම් විධියකින් මෛත්‍රීපාල සිරිසේන මහත්තයාට ඒ සුළුතරය හිමි වුණොත්, අනිවාර්යයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බහුතර බලය ඉබේම මහින්ද රාජපක්ෂ මහත්තයාට හිමි වීම වළක්වන්න බැහැ. මේ යථාර්ථය මැද්දේ තමයි පළාත් පාලන ඡන්ද විමසීම තිබෙන්නේ. මේක තමයි ඇත්ත. ඉස්සර කිව්වා, ආණ්ඩුව අපි හැමදාම ඡන්ද තියනවා. මේක තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියලා. දැන් යහපාලන ආණ්ඩුව මොකක්ද කියන්නේ? ඡන්ද පවත්වන්නේ නැතිව ඉන්නවා. මේක තමයි ප්‍රජාතන්ත්‍රවාදය කියලා. ඒ නිසා මේ විපරීත ආණ්ඩුවක්. මේ විපරීත ආණ්ඩුව මොකක්ද කරන්නේ කියලා අපිත් අන්ද මන්ද වෙලා, මේ රටේ ජනතාවත් අන්ද මන්ද වෙලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම පළාත් පාලන ආයතනයක ඉඳලා ආපු කෙනෙක් නොවෙයි. හැබැයි, මම දන්නවා ගමේ මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. ගමේ පරිපාලනය, බිම් මට්ටමේ පරිපාලනය සම්පූර්ණයෙන් බිඳ වැටිලා තිබෙන්නේ. (බාධා කිරීම්)

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඔය අතට මොනවාද වෙලා තිබෙන්නේ? කුණු ප්‍රශ්නයකට ගිහිල්ලා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

ගුටි කෑවා නේද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හරියට හරි. සටන් කරන කොට තමයි අතපය කැඩෙන්නේ. අපි සටන් කරනවා. ඒකයි අතපය කැඩෙන්නේ. අපේ එල්ලාවල ගරු මන්ත්‍රීතුමා කිව්වා සීමා නිර්ණය කිරීමේ ප්‍රශ්න තිබුණාය කියලා. සීමා නිර්ණය කිරීමේ ප්‍රශ්න තිබුණා. හැබැයි, ඒවා ලෙහෙසියෙන් විසඳන්න පුළුවන්. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපති, අශෝක පීරිස් මහත්මයා වරක් කිව්වා, පෙබරවාරි මාසේ අවසන් වන කොට මේ සීමා නිර්ණය කිරීමේ ප්‍රශ්න ටික මට විසඳලා ඉවර කරන්න පුළුවන්. අප්‍රේල් 07 වැනිදාට

[ගරු සුසිල් කිඳෙල්පිටිය]

කලින් මේ පළාත් පාලන ඡන්දය තියන්න පුළුවන්ය කියලා. හැබැයි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? දැන් ඡන්දය කල් දාලා තිබෙනවා. ඇයි මෙහෙම වෙන්නේ? සර්ව පාක්ෂික සමුළුවක් කැඳෙව්වා. කැඳෙව්වාම මෙන්න බොලේ එන්න පටන් ගත්තා අඳෝනා දහසක්. යළිත් වරක් අභියාචනා 2000 ක් විතර ඇවිල්ලා තිබෙනවා. මේ 2000 එක්ක වැඩිපුර එන්නේ, එක්සත් ජාතික පක්ෂයේ අභියාචනා. මේක තමයි ඇත්ත. මේක කවුරුත් නොදන්න ඇත්ත. කොහොමද මේ එක්සත් ජාතික පක්ෂයේ අභියාචනා එන්නේ. මේක තව කල් දාන්න ක්‍රමවේදයක් සොයන නිසා. අපි දන්නවා, එක්සත් ජාතික පක්ෂය දිනවන්න නම්, සමානුපාතික ක්‍රමයට එන්න ඕනෑ. ඒ යථාර්ථය පිළිගන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. මතක තියා ගන්න මේ 2012 සංශෝධිත ආඥා පනතේ දුර්වලතා 57 ක් තිබෙනවා. ඒ දුර්වලතා 57 දැන් මැතිවරණ නිලධාරීන් හා නිරීක්ෂකයින් හඳුනාගෙන තිබෙනවා. දැන් ඒක එහෙම නම් ආයිත් සැරයක් යවන්න වෙනවා, නීති කෙටුම්පත් අංශයට. ආයිත් සැරයක් පාර්ලිමේන්තුවට යවන්න තිබෙනවා. දැන් මේ කාරණා සියල්ල සැලසුම් කර ගෙන ආණ්ඩුව උත්සාහ කරනවා, මේක කල් දාන්න. හැබැයි, ආණ්ඩුවට ඕනෑකම තිබුණා, මේක කලින් තියන්න. රනිල් වික්‍රමසිංහ මහත්තයාට ඕනෑකම තිබුණා කලින් තියන්න. අවාසනාවකට රනිල් වික්‍රමසිංහ මහත්තයා බලාපොරොත්තු වුණු විධියට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දෙකට කැඩෙන්නේ නැහැ. කැඩෙනකම් බලාගෙන හිටියේ. හැබැයි, ඒක කැඩෙන්නේ නැහැ. ඒ නිසා තමයි මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙන්නේ. දැන් ආණ්ඩුව සූක්ෂමව කල් දාන්න හදනවා. ඒ නිසා දැන් ආණ්ඩුවට මොකද වෙලා තිබෙන්නේ?

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

කැඩෙන්නේ නැහැ නොවෙයි. කඩන්න බැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හැබැයි ජනාධිපතිතුමාටත් දැන් ඕනෑ, මේක කලින් තියන්න. ඇයි දන්නවාද? දැන් ජනාධිපතිතුමා හයයි මේක නිමිත්තක් කර ගෙන අනේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කැඩුණොත් මම අමාරුවේ කියලා. ඒ නිසා එතුමා බලනවා තව ටිකක් කල් අර ගෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දෙකට කැඩීම වළක්වා ගන්න පුළුවන්ද කියලා. ඒ නිසා මේ යථාර්ථය -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඔබතුමා කොහොමද -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොට්ඨාශ ක්‍රමය තමයි යථාර්ථය. ගරු මන්ත්‍රීතුමනි, මේ යථාර්ථය පිළිගන්න. කොට්ඨාශ ක්‍රමයට ආවොත් එක්සත් ජාතික පක්ෂය පරාදයි. සමානුපාතික ක්‍රමයට ආවොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරාදයි. ඒ නිසා මේක මැද්දේ තමයි මේ පළාත් පාලන ඡන්දය කල් යන්නේ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව එක්ක සියයට දහසක් මම එකඟ වෙනවා. මොකද, ගම් මට්ටමේ තිබෙන තත්ත්වය අපි දන්නවා. ඒ නිසා මේක නිවැරදි කරන්න ඕනෑ. පල්ලෙහා පරිපාලනය ශක්තිමත් කළොත්, පළාත් සභා මන්ත්‍රීවරුන් විධියට අපට සහනදායී වැඩ කටයුතු කර ගෙන යන්න. මේ සම්බන්ධීකරණය අවශ්‍යයි. ගම හදන්න නම් පළාත් පාලන ආයතන ශක්තිමත්ව තිබෙන්න ඕනෑ. මම පෞද්ගලිකව දේශපාලනය බලලා ගම් මට්ටමේ වැඩ කරන කෙනෙක් නොවෙයි. දේශපාලනයෙන් තොරව වැඩ කටයුතු කරන්නේ. ඔබතුමන්ලා සොයලා බැලුවොත් කොළොන්නාව නගර සභාව එක්කත්, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව එක්කත් දේශපාලන භේදයෙන් තොරව වැඩ කරන කෙනෙක් මම. අපේ කටයුතුවලට ලේසියි, අලුතෙන් මේ පරිපාලනය ගොඩ නැංවුවොත්. ඒ නිසා ඒ සඳහා කටයුතු කරන්නැයි මේ රටේ සියලුම බලධාරීනගෙන් ඉල්ලා සිටිනවා. මොකද මම දන්නවා. අර මම කලින් කිව්වා වාගේ, මේ ප්‍රේම සම්බන්ධය එහෙම යන්න අමාරුයි. ඒ නිසා මේ අගමැතිතුමාගෙනුයි ජනාධිපතිතුමාගෙනුයි මම ඉල්ලා සිටිනවා, කරුණාකරලා හැකි ඉක්මණින් පළාත් පාලන

ඡන්දය තියලා පල්ලෙහාම මට්ටම, ගම් මට්ටම, බිම් මට්ටම ශක්තිමත් කරන්නය කියලා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, මට ගැටළුවක් තිබෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් කථා කරන කොට බාධා කරනවා.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එයා අපේ නොවෙයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙම නම් ඔබතුමන්ලා එතුමාව දෙන්න ඕනෑ අපට.

**ගරු රෝස් ප්‍රනාන්දු**
Hon. Rose Fernando

එතුමා විපක්ෂයේ නොවෙයි.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

එතුමා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එහෙම නම් විපක්ෂය ඇතුළේ ඒක -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

අනාගතයට බලපාන ඒවා අහන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සංවිධායකතුමා, මගේ පැත්ත කියන්න තව අවුරුදු තුනක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලබන පාර විසඳලා දෙන්න කෝ ඔය ප්‍රශ්නය. මීළඟට සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

[අ.භා. 01.15]

**ගරු සුසාර දිනාල්**
Hon. Susara Dinal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව පිළිබඳව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ගෙවුණු ජනාධිපතිවරණ සීමාවේදී, ජනාධිපතිවරණ මැතිවරණ වැඩ පිළිවෙළේදී ඒ ආසන්න කාලයේදී අපි දැක්කා ජාත්‍යන්තර වශයෙනුත්, මේ අපේ රටෙත් ජනමාධ්‍ය හරහා ශ්‍රී ලංකාව පිළිබඳව මතයක් ගොඩ නැඟුනා. අපේ රට බොහොම ප්‍රජාතන්ත්‍රවාදය නැති, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන, මානව අයිතිවාසිකම් කඩ වන රටක් විධියට තමයි මේ රට හංවඩු ගහන්න පටන් ගත්තේ. මේක දේශීය දේශපාලන පක්ෂ විසින් කළා. විදේශීය රාජ්‍යයන් විසින් මේක කළා. මේක කිරීම හරහා ජනතාව තුළ මතයක් ගොඩ නැඟුනා, මේ අලුත් වෙනසට අපි ගියොත් අලුත් ආණ්ඩුව අපි පිහිටුවා ගත්තොත්, අලුත් ජනාධිපතිවරයෙක් අපි පත් කර ගත්තොත් එහෙම මේ යහපාලනය කියන, මීට කලින් අපි අත්විඳලා නැහැයි කියලා හිතපු සංකල්පය ඔස්සේ මේ රටට යහපතක් වෙයි කියලා. එතැනදී කියැවුණු ප්‍රධාන කාරණයක් තමයි මැතිවරණ ක්‍රමය සංශෝධනය කරනවාය කියන එක. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මිනිස්සු බලාගෙන හිටියා, මේ අලුත් දේශපාලන ව්‍යුහය තුළ යම්කිසි වෙනසක් සිදු වෙයි කියලා. උදාහරණයක් විධියට පළාත් සභාවට අලුතෙන් තේරී පත් වුණු මන්ත්‍රීවරයෙක් විධියට මමත් බලාගෙන හිටියා මොනවා හරි වෙනසක් මේ රටේ වෙයි කියලා. අපේ සමහර මන්ත්‍රීවරු පසුගිය දවස්වල මගෙන් ඇහුවා, මුල් කාලයේ නම් ඔබතුමා ලොකුවට කථා බහ කළා. හැබැයි, මෑත කාලයේ ඔබතුමාගේ කථා දැක්කේ නැහැ නේ කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අලුත් දේශපාලඥයෝ විධියට අපි බලාගෙන හිටියා, මේ රටේ මොකක් හරි වෙනසක් වෙනවාද? මේ රටේ මේ වෙනස ජනතාවාදී වෙනසක්ද? යහපත් දෙයක් සිද්ධ වෙනවාද කියලා. ඉතා හොඳ කාරණයක් අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, එතුමාගේ කථාවේදී සඳහන් කළා. මේ මැතිවරණ ක්‍රමයන් සම්බන්ධයෙන්. දැන් අපේ සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වේ, සමානුපාතික ක්‍රමය තිබුණොත් එක පැත්තකට වාසියි කියලා ඒගොල්ලෝ හිතනවාය කියලා. ඒ වාගේම අනික් ක්‍රමය තිබුණොත් එහෙම අනික් පැත්තට වාසියි කියලා ඒගොල්ලෝ

[ගරු සුසාර දිනාල්]

හිතනවාය කියලා. මේ තුළ කියවෙන කාරණය මොකක්ද? මේ දේශපාලන පක්ෂ, මේ දේශපාලන නායකයෝ මැතිවරණ ක්‍රමය හිතන්නේ තමන්ට ඡන්දය දිනා ගැනීමේ අවශ්‍යතාවය මත පදනම් කර ගෙන මිසක, ජනතාවගේ වුවමනාව ගැන හිතලා නොවෙයි. මේ මැතිවරණවලදී කිව්වේ, ජනතාවට යහපතක් වන මැතිවරණ ක්‍රමයක් මේ ජනතාවට ගේනවාය කියලා. හැබැයි, අර මන්ත්‍රීතුමා කියපු කථාව ඇත්ත නම් එක්කෝ එක්සත් ජාතික පක්ෂය දිනන්න, නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දිනන්න සුදුසු මැතිවරණ ක්‍රමයක් ගේනවා මිසක, මේ රටේ ජනතාවට වුවමනා කරන මැතිවරණ ක්‍රමයක් ගේන්න නොවෙයි මේ කට්ටියට වුවමනා වෙලා තිබෙන්නේ. එහෙම නම් ජනතාවගේ අභිලාෂයන් ඉටු වෙනවාද? ජනතාවගේ මූලික උවමනා එපාකම් ඉටු වෙනවාද?

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය. මොන මැතිවරණ ක්‍රමය තිබුණත් ඒ අදාළ මැතිවරණ ක්‍රමය ඇතුළේ මැතිවරණය ජයග්‍රහණය කරන්න එතුමන්ලාගේ පක්ෂය අදාළ වැඩ පිළිවෙළ සකස් කර ගන්නවාය කියලා එතුමා කිව්වා. අන්න ඒ තත්ත්වය තමයි අද ජනතාවට අත් විඳින්න සිද්ධ වෙලා තිබෙන්නේ. ජනතාවට දැන් පැහැදිලි වෙනවා, මේ මොන මැතිවරණ ක්‍රමයකින් මැතිවරණය තිබ්බත්, ඒ මැතිවරණ ක්‍රමය ගේන්නේ ජනතාවට තිබෙන ආදරයට නොවෙයි. පාලක පක්ෂයට බලය තියා ගන්න වුවමනාව තිබෙන කැමැත්තට තමයි මේගොල්ලෝ මේ මැතිවරණ ක්‍රමය ගේන්නේ කියලා. අන්න ඒ නිසා මේ යෝජනාව අද ඉතාමත් වැදගත් වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොන මැතිවරණ ක්‍රමය තිබුණත් මැතිවරණය පැවැත්වීම වැදගත් වෙනවා. එක මන්ත්‍රීවරයෙක් කිව්වා, අවුරුදු හතරක් තිබෙනවා. අවුරුදු පහක් ගිහිල්ලා හරි, හයක් හරි ගිහිල්ලා නියම මැතිවරණ ක්‍රමයක් ගේන්න. එතෙක් තිබෙන මැතිවරණ ක්‍රමයට ඡන්දය තියන්නය කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මැතිවරණය නොතැබීම හරහා ගම් මට්ටමේ බිඳ වැටීම, පරිපාලනයේ බිඳ වැටීම අපේ සියලු මන්ත්‍රීවරු පැහැදිලි කළා. ඒ නිසා මේ මොහොතේදී ඒක අපි අමුතුවෙන් කථා කරන්න ඕනෑ නැහැ. නමුත් ජනතාවගේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම ජනතාවගේ තමන්ට කැමැති නියෝජිතයන් තෝරා ගෙන තමන්ගේ ගමේ පාලනය තමන්ගේ නියෝජිතයන් හරහා කර ගන්න තිබෙන අවස්ථාව දිනෙන් දිනම කල් දාන එක අතිශයින්ම ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනි කාරණාවක්. මිනිස්සුන්ගේ මූලික අයිතිවාසිකම්වලට පටහැනි කාරණාවක්. අද අපි දකිනවා, මේ ස්වාධීන කොමිෂන් සභා පත් කළාය කියලා රටේ සැලකිය යුතු වෙනසක් සිද්ධ වෙලා නැහැ. ජනවාරි 08 වැනිදාට කලින් 2015 අපි හිතුවේ, මේවා පත් කළාට පස්සේ මේ රටේ පුදුමාකාර වෙනසක් සිද්ධ වෙයි කියලා. සමාජය සුඛිත මුදිත වෙයි කියලා. පොලීසිය පුදුමාකාර විධියට හරියයි කියලා. අද උදේ මම කිව්වා, ඉස්කෝලේ ඇතුළේ කුඩු බෙදන කථා. කෝ මේවා නවත්වන්න, මේ කොමිෂන් සභාවලින් හරි, කවුරු හරි කරන වැඩ පිළිවෙළක්? සමාජය තුළ සිදු වුණු සියලුම අයථා කටයුතු ඊටත් වඩා විශාල වශයෙන් සිද්ධ වෙනවා. නිලධාරීන් තමන්ගේ අභිමතය පරිදි කටයුතු කරනවා. ජනතාව මේ සියල්ලෙන්ම පීඩා විඳිමින් බලාගෙන ඉන්නවා.

ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මැතිවරණය පැවැත්වීම, මොන ඡන්ද ක්‍රමයක් යටතේ හරි මේක පැවැත්වීම ඉතාමත් වැදගත් වෙනවා. තවත් කාරණයක් තිබෙනවා. අපි අද භාවිතා කරන ඡන්ද ක්‍රමය අපේ රටට හඳුන්වා දීලා ටික කාලයක් යන කොට සල්ලි විසි කරලා, මුදල් මත ඡන්ද කරන ක්‍රමයක් මේ රටේ ව්‍යාප්ත වුණා. අපි පසුගිය මැතිවරණය කරද්දී දැක්කා, සල්ලි තිබෙන අය සල්ලි විසි කරලා ඡන්දය කරපු හැටි. අලුත් දේශපාලඥයකුට, අලුත් දේශපාලන නායකයෙකුට, අලුත් ජනතා නායකයෙකුට ජනතාව අතරින් ඇවිල්ලා මැතිවරණයක් කරන්න හැකියාවක් නැහැ. බඩු බෙදලා, සල්ලි බෙදලා, සල්ලි විසි කරලා ඡන්ද කළා. පසුගිය ජනාධිපතිවරණයේදී කිව්වා, මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න ඕනෑ. මේ සල්ලි විසි කරලා කරන ඡන්ද ක්‍රමය වෙනස් කරන්න ඕනෑය කියලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මේ ගරු සභාවේදී කියනවා, මොන මැතිවරණ ක්‍රමය ආවත් සල්ලි විසි කරන කෙනාට, සල්ලි විසි කරන්න පුළුවන්. සල්ලි විසි කරලා, ඡන්ද ගන්න කෙනාට ඒක කරන්න පුළුවන්. ඒ නිසා මේ සමාජයේ තිබෙන ප්‍රශ්නවලට විසඳුම, මූලික ප්‍රධාන විසඳුම මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම නොවෙයි. ඊට කලින් මිනිස්සුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ස්ථාපිත කරලා ඉන්න ඕනෑ. ඒවා තහවුරු කරලා ඉන්න ඕනෑ. ඒ නිසා පළමුවෙන්ම මේ මැතිවරණය පැවැත්වීමේ වැදගත්කම අපි හඳුනා ගන්නට ඕනෑ. අන්න ඒ නිසා තමයි, කුමන මැතිවරණ

ක්‍රමයකින් හරි, මේ යෝජනාවට අනුව මේ මැතිවරණය පැවැත්වීමේ වැදගත්කම අපි නැවත නැවතත් මේ සභාවේ අවධාරණය කරන්නේ. ඒ නිසා අපි දැක්කා. මේ රජය පත් වුණාට පස්සේ ඇමරිකාවෙන්, එංගලන්තයෙන් වාගේ බටහිර රටවල්වලින් සුභ පැතුම් ආවා. දැන් ඉතින් ප්‍රජාතන්ත්‍රවාදය ලංකාවේ ආරක්ෂා වෙලා තිබෙනවාය කියලා. රාජ්‍ය නායකයෝ ඇවිල්ලා කියනවා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වෙලා තිබෙනවාය කියලා. ආරක්ෂා වෙලා තිබෙනවා නම්, ඒ බව ක්‍රියාවෙන් පෙන්වන්න. මැතිවරණ තියන්න. මැතිවරණ තියලා මේ මිනිස්සුන්ගේ අයිතිවාසිකම් තහවුරු කරන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ කාරණා සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාව නැවත නැවතත් මේ සභාවේ සනාථ කරමින්, මා කියා සිටින්නේ, මේ අවස්ථාවේදී මේ මැතිවරණය පැවැත්වීමේ වැදගත්කම අපි රජයට බල කර සිටිය යුතුයි. ඒ පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් ගරු මහ ඇමතිතුමා හරහා ඒක ජනාධිපතිතුමාට යොමු කරන්නය කියලා යෝජනා කරමින්, මම මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.21]

**ගරු නීල් සුනේත්‍ර ලාල් ප්‍රනාන්දු**
Hon. Neel Sunethra Lal Fernando

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව මට ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ඉතාම කාලෝචිත යෝජනාවක් අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේ සභාවට ඉදිරිපත් කළා. පළාත් පාලන ආයතනයක අවුරුදු අටක් සභාපතිවරයා වශයෙන් කටයුතු කරලා, අපි විශාල අත්දැකීම් සමූහයක් ලබා ගත්තා. ඒ තුළින් තමයි අද අපි පළාත් සභාවට ඇවිල්ලා තිබෙන්නේ. මේ මන්ත්‍රීවරුන්ගේ සිතුම් පැතුම් හඳුනාගෙන කටයුතු කරපු සභාපතිවරු වශයෙන් අද ඉතාමත්ම කියන්න කනගාටුයි. මේ මන්ත්‍රීවරු සමහරු අද සමහර ප්‍රදේශවලට ගිහිල්ලා කුලී වැඩවල යෙදෙන තත්ත්වයක් තිබෙන්නේ. සමහර මන්ත්‍රීවරු. ඉතින් ඒ වාගේ ශෝචනීය තත්ත්වයක් අද පළාත් පාලන ආයතනවලට අත් වෙලා තිබෙන්නේ. විශේෂයෙන්ම සියලුම පළාත් පාලන ආයතන නිලධාරීවාදයට යටත් වෙලා සම්පූර්ණයෙන් ඒකාධිකාරියක් බවට පත් වෙලා තිබෙනවා. සමහර පළාත් පාලන ආයතනවල නිලධාරීන් දෙපැත්තට ඇද ඇද වැඩ කරන්නේ. සමහර වැඩ අධිකාරීවරු කියන දේ ලේකම්වරිය පිළිගන්නේ නැහැ. ලේකම්වරිය දෙන නියෝගය වැඩ අධිකාරී පිළිගන්නේ නැහැ. කාර්යභාර නිලධාරී පිළිගන්නේ නැහැ. මෙන්න මෙවැනි තත්ත්වයක් අද පළාත් පාලන ආයතනවල ඇති වෙලා තිබෙන්නේ. මම හිතන්නේ, දැන් අපට කියන්න කෙනෙක් නැහැ. මේ පළාත් පාලන මැතිවරණය ගැන අපි සියලු දෙනා කථා කළා. දැන් අපට කියන්න තිබෙන්නේ, මේ ඊයේ පෙරේයිදා ආපු මානව හිමිකම් කොමසාරිස් හුසේන් කුමාරයාට තමයි දැන් මේ දුක්ගැනවිල්ල අපට කියන්න වෙලා තිබෙන්නේ. එතුමා මානව හිමිකම් පිළිබඳව කථා කරනවා. උතුරු ප්‍රදේශයට යනවා. ඒ ප්‍රදේශයේ ජනතාව හමු වෙනවා. දැන් මේ පළාත් පාලන ආයතන නියෝජිතයෝ හමු වෙලත්, එතුමාට තමයි මේ දුක්ගැනවිල්ල කියන්න තිබෙන්නේ. වෙන කෙනෙක් නැහැ. ඒ නිසා මම හිතන්නේ, මේකට ප්‍රධාන හේතුව මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ පළාත් පාලන ආයතන මන්ත්‍රීවරුන් සමඟ ඉදිරියටත් එතුමා කටයුතු කිරීමයි. එදා එතුමාට තිබ්බයේ 60% ක ප්‍රමාණයක්. අද 95% කට වැඩි ප්‍රමාණයක් මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වය යටතේ ඒකරාශී වෙලා ඉන්නේ මේ මැතිවරණය ඉල්ලා ගෙන මහජනතාවට සේවය කරන්න. ඒ නිසා අපි නැවතත් වගකිවයුතු අයගෙන් ඉල්ලා සිටිනවා. මේක දෙපැත්තට ඇද ඇද ඉන්න එපා. කඹ ඇද ඇද දෙපැත්තට ඉන්න එපා. යහපාලන සම්මුතිවාදී ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා එකක් කියනවා. අපේ පැත්තේ වගකිවයුතු අය තව එකක් කියනවා. ඒ නිසා තමන්ගේ වාසියට හරවා ගෙන මේ කාර්යය කරන්න එපා. මහජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් බරපතළ ලෙස උල්ලංඝනය වෙලා අද එතුමන්ලාගේ ඡන්ද අයිතිය නැති කරලා තිබෙන්නේ, මේ යහපාලන සම්මුතිවාදී ආණ්ඩුව. අපි ඉල්ලා සිටිනවා, ඉතා ඉක්මණින් මේ මැතිවරණය තියලා මේ ජනතාව වෙනුවෙන් කළ යුතු කටයුතු කරන්න. ගම් මට්ටමේ නැවත පරිපාලනය ඇති කරන්නය කියලා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 01.25]

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා පළාත් පාලන ආයතන ඡන්දය කල් දැමීම සම්බන්ධයෙන්, රීති අත්හිටුවලා ගෙනාපු යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාවක් ලබා දීම ගැන

[ගරු උපාලි කොඩිකාර]

ප්‍රථමයෙන්ම මගේ ස්තුතිය පුද කරනවා. මේ පළාත් පාලන ආයතන අපේ රටේ සුද්දාගේ නිදහසෙන් පස්සේ පෘතුගීසී, ලන්දේසි, ඕලන්ද කාරයෝ මේ රට පාලනය කරලා, 1956 දී එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා අපේ රටේ පළාත් පාලන ඇමතිවරයා හැටියට ගෙනැල්ලා ගම්සභා ක්‍රමය මේ රටේ ඇති කළා. ඉස්සර තිබුණේ, සුද්දාගේ කාලයේ තිබුණේ ගම්මුලාදෑනි ක්‍රමය. ගම්මුලාදෑනි ක්‍රමය අහෝසි කරලා මේ රටට ගෙනාවා ගම් සභා ක්‍රමය. ගම් සභා ක්‍රමය ගෙනැල්ලා මේ රටේ, ගමේ තිබෙන ප්‍රශ්න ගැන කථා කරන්න, ඒ එදා තිබුණු ඒ ගමේ ප්‍රශ්නය කථා කරන්න පුළුවන් ගම් සභා ක්‍රමය ගෙනැල්ලා ඒ නියෝජිතයන්ට සහනයක් ලබා දුන්නා.

එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා නැවත එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ගෙනැල්ලා, මේ පළාත් පාලන ක්‍රමය අහෝසි කරලා දාලා, කල් දාලා මේ වාගේම මේ කාලය ගෙවෙන කොට ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා 1991 දී - අපි, පළාත් සභාවේ මෙතැන ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් 50% ක් 60% ක් ආවේ පළාත් පාලන ආයතනවලින්. 1991 දී. මෙකේ හිටපු සභාපතිවරු, ගරු නියෝජ්‍ය සභාපතිවරු ඒ වාගේම පළාත් පාලන ආයතනවලින් ආපු අය. කොල්වින් ආර්. ද සිල්වා, ඒ වාගේම ඒ.එච්.එම්. ෆවුසි, එතකොට ටී.බී. ඉලංගරත්න මැතිතුමා පළාත් පාලන ඇමතිවරයා හැටියට. මේ වාගේ ඉතිහාසයක් තිබෙන ආයතනයක් තමයි පළාත් පාලන ආයතන. එතකොට පළාත් පාලන ආයතනවල තිබුණු සහනය. අපේ ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා, එදා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කල් දාලා තිබුණු පළාත් පාලන ආයතන, ප්‍රාදේශීය සභා කියලා තවත් බලය විමධ්‍යගත කරලා, පළාත් සභාවලට ගෙනැල්ලා ඒ පළාත් සභා හරහා ඒ ඡන්දය පවත්වලා මේ රටේ මේ පළාත් සභාවලට එන්න, පාර්ලිමේන්තුවට යන්න මේ ගමේ නායකත්වය හැදුවා. දැන් මේ පළාත් පාලන ආයතනයක මේ පනත අනුව බලන්න කරුණු 261 ක් තිබෙනවා. අපේ ගරු මන්ත්‍රීවරු කිව්වා වාගේ ඉපදුනු දරුවාගේ ඉඳලා මේ පාරේ යන බල්ලා, හරකා, මීයා, පූසා මේ සියලුම ප්‍රශ්න විසඳන ආයතනය තමයි අපේ මේ තිබෙන පළාත් පාලන ආයතනය. ඊට අදාළ පනත පළාත් පාලන පනතයි. එතකොට මේ පළාත් පාලන පනත මට පේන්නේ, ටයි කෝට් දාලා ඇමරිකන් ක්‍රමයට අපේ රට පාලනය කරන අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට තේරෙන්නේ නැහැයි කියලා. මොකද, -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමාගේ නෝනාට නගරාධිපතිකම -

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

කරුණාකරලා තමුන්නාන්සේ වාඩි වෙන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බාධා කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

නෝනා නගරාධිපතිකම කරලා තමයි හොඳම නගර සභාව කළේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතුමාගේ නෝනාට නගරාධිපතිකම නැති වුණා. ඇමතිකම නැති වුණා. තව මොනවාද?

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතකොට මේ රනිල් වික්‍රමසිංහ කියන

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

මේ රටේ ඉන්න යහපාලන ආණ්ඩුවේ රටේ අගමැති කියන

***මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

ප්‍රජාතන්ත්‍රවාදය -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක ඉල්ල අස් කර ගන්න. අගමැතිතුමාට මැට්ටෙක් කිව්වා. ඉල්ලා අස් කර ගන්නය කියන්න. ඉල්ලා අස් කර ගන්න. නැත්නම් මම මේක උඩ නගිනවා. ඒ වචනය ඉල්ලා අස් කර ගන්නය කියන්න. අගෞරව වන විධියට

අදහස් ප්‍රකාශ කරනවා. ඔබතුමාගේ නෝනාට නගරාධිපතිකම නැති වුණාට, ඔබතුමාට ඇමතිකම නැති වුණාට ඒවා කියන්න බැහැ. (බාධා කිරීම්)

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, එය -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

ඒක ඉල්ලා අස් කර ගන්නය කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා ඒක ඉල්ලා අස් කර ගන්න. නම් ප්‍රකාශ කරන්න එපා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

රනිල් වික්‍රමසිංහ මැතිතුමාට මේ පළාත් පාලන ආයතනවල තිබෙන වැඩ පිළිවෙළ තේරෙන්නේ නැහැ. පළාත් පාලන ආයතන -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

එම වචනය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. U. George Perera - Chief Opposition Whip

එතුමා ඉල්ලා අස් කර ගන්න ඕනෑ. එතුමා හිටපු ඇමතිවරයෙක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාත් ඒක ඉල්ලා අස් කර ගන්න. එම වචනය හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරනවා.

**ගරු උපාලි කොඩිකාර**
Hon. Upali Kodikara

මෙතුමා ගමේ ජේමිස් අයියාගේ, ජුවානිස් අයියාගේ, සොමි අයියාගේ, කුසුමා අක්කාගේ, ශ්‍රියානිගේ, කුසුමාගේ ප්‍රශ්න ගැන තේරෙන්නේ නැති රාජ්‍ය නායකයෙක් තමයි අපේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා. ඒ අගමැතිතුමාට මේක තේරෙන්නේ නැති නිසා තමයි මේ පනත අනුව තිබෙන - ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ නගර සභා ආඥා පනතේ 10 වැනි ඡේදයේ තිබෙනවා. මේ පනත අනුව කල් දාන්න පුළුවන් මාස 12 යි. එතකොට මේ පනත අනුව කල් දාන්න පුළුවන් කාලය තිබෙද්දී, පළාත් පාලන ආයතනවල බලය තිබෙන්නේ, පළාත් සභාවේ මහ ඇමතිවරයාට. තිබෙන බලය කප්පාදු කරලා තමයි නැවත කල් දාන්න හදන්නේ. එතකොට ඒක කල් දාන්න මේ රටේ පළාත් පාලන ආයතනවල නියෝජිතයෝ පක්ෂ සියල්ලේම හාරදහස් ගණනක් ඉන්නවා. එතකොට මේක කල් දාන්න ඊළඟ හේතුව තමයි රජයට මුදල් නැහැ, මේ අයට දෙන දීමනාව දෙන්න. මේ අයට දෙන්න පුළුවන් දීමනාව දෙන්න මේ රජයට මුදල් නැහැ. මේ රජයට මුදල් නැති නිසා තමයි පළාත් පාලන ආයතන නැවත කල් දාලා ප්‍රජාතන්ත්‍රවාදය නැති කරන්නේ. මානව හිමිකම් ගැන කථා කරනවා. එතකොට උතුරු නැගෙනහිර. දැන් බලන්න. අවුරුදු 30 ක් තිබුණු යුද්ධය මහින්ද රාජපක්ෂ මැතිතුමා අවසන් කරලා ඒ ප්‍රදේශවල පළාත් සභා මැතිවරණය තියලා බලය විමධ්‍යගත කරලා දීලා, පළාත් පාලන ආයතන මැතිවරණය තියලා, ඒ ප්‍රදේශවල මහජන සේවයට ඉඩ දුන්නේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා. එතකොට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත් මේ රටේ මේ පළාත් පාලන ආයතන පනත ගැන හිතලා, මේ වාගේ කටයුතු කරන්නේ ඇයි කියලා මේ අවස්ථාවේ අපි මතක් කරනවා. ඒ නිසා මේක කල් නොදා අපේ සියලුම දේශපාලන පක්ෂ එකතු වෙලා, මේ පළාත් පාලන ආයතනවල නියෝජිතයන්ට අවශ්‍ය සහනය ලබා දෙන්න බණ්ඩාරනායක මහත්තයා 56 දී ගෙනාපු මේ පළාත් පාලන ආයතන පනත. එතකොට ප්‍රේමදාස මහත්තයා මේක තවත් දියත් කරලා ඉස්සරහාට ගෙනාපු ඒ පනත නැවත පළාත් පාලන ආයතන ඡන්දය මොන ක්‍රමයට හරි තියන්න රාජපක්ෂ මැතිතුමා ඒ නායකත්වය දෙන කණ්ඩායම දිනලා මේ රටේ යහපාලන ආණ්ඩුව පෙරළා දාන්න කටයුතු කරනවාය කියන එක මේ අවස්ථාවේ මතක් කරමින් අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 01.31]

**ගරු මංජුල ප්‍රසන්න සම්පත්**
Hon. Manjula Prasanna Sampath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ඉතාමත්ම කාලෝචිත යෝජනාවක්

[ගරු මංජුල ප්‍රසන්න සම්පත්]

මේ සභාවට ගෙනැල්ලා පැය ගණනක් මේ සභාවේ අපි සාකච්ඡා කරමින් අපි අදහස් ප්‍රකාශ කරනවා. මම හිතන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේක මේ සභාවේ කථා කළාට අද අපි දෙගොල්ලන්ටම පුළුවන්, මේ සභාවේ කථා නොකළත් මේ ජාතික ආණ්ඩුව යටතේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉල්ලීමක් ආවොත්, අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අපේ පක්ෂයෙන් ඉල්ලීමක් ආවොත් පවත්වන්න. මේ සභාවේ මේක කථා කරන්න දෙයක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මේ අදහස් ප්‍රකාශ කරන කොට ප්‍රාදේශීය සභා පාලනය යටතේ අපේ රටේ මිනිස්සුන්ට, ජනතාවට විශාල කාර්යභාරයක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තිබුණත්, එක්සත් ජාතික පක්ෂයේ පාලනය තිබුණත් අපේ රටේ ජනතාවට විශාල කාර්යභාරයක් කළා. මේ නිල කාලය අවසන් වුණාට පස්සේ, මේක පළාත් පාලන ලේකම්වරුන්ට පැවරුවාට පස්සේ මම හිතනවා, මේකේ ක්‍රියාකාරීත්වය ඉතාමත්ම පහත් මට්ටමකට ඇවිල්ලා, ජනතාවට වෙන්න තිබෙන සේවාව මේ තුළින් ඉෂ්ට වෙන්නේ නැහැයි කියලා.

උදාහරණයක් වශයෙන් ජනතාවගේ සැලසුමක් අනුමත කරන්න ගියාම, අර මන්ත්‍රීතුමන්ලා කිව්වා වාගේ ලයිට් එකක් දාන්න ගියාම, කුණු ටික අදින්න ගියාම විශාල ගැටළු රාශියකට ඒ ප්‍රදේශවල ඉන්න ජනතාවට මුහුණ පාන්න සිද්ධ වෙනවා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මැතිවරණය කල් දැමීමේ යෝජනාව මම හිතනවා, මේ එහා පැත්තෙන් කථා කරපු මන්ත්‍රීවරු දැම්මේ එක්සත් ජාතික පක්ෂය පිටින්. නමුත් ඒක එහෙම නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මැතිවරණ සංශෝධන පනත 2012 දී ගෙනෙන කොට මම බියගම ප්‍රාදේශීය සභාවේ විපක්ෂ නායකවරයා. අපි ප්‍රාදේශීය සභාවේ මහජන නියෝජිතයෝ වශයෙන් මේ පනත ගැන සාකච්ඡා කරන කොට මම දැක්කා, අපේ පළාත් සභා මන්ත්‍රීවරු ඉල්ලීම් කළා. අපිත් සමඟවත් මේක කථා කළේ නැහැ. මේ කොට්ඨාශ සීමා නිර්ණය කරන කොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි - අපි ප්‍රාදේශීය සභා නියෝජිතයෝ. අපිත් සමඟවත් කථා කළේ නැහැ. මේක මේ රටේ බැසිල් රාජපක්ෂ මැතිතුමාට අවශ්‍ය කරන විධියට එතුමා සියලුම ආසන සංවිධායකවරුන්ට බලය පවරලා - උදාහරණයක් වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මටත් ඉල්ලීමක් ආවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයෙක් මට කථා කරලා ඇහුවා, මට ඕනෑ කොට්ඨාශය මොකක්ද කියලා. මේක කළේ සම්පූර්ණයෙන්ම දේශපාලන වටපිටාවක් අනුව. ඒක එක්තරා දේශපාලන පක්ෂයකට වාසි වන ආකාරයකට. ඊට පස්සේ අපි ජනවාරි මාසේ 08 වැනිදාට පස්සේ අපි එවකට විපක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාව, අපි, එක්සත් ජාතික පක්ෂයේ මහජන නියෝජිතයන්ව දැනුවත් කළා. ඊට පස්සේ එතුමාට අපි කිව්වා, මේ පිළිබඳව අපේ කිසිදු දැනුවත් කිරීමක් නැහැ. අපෙන් අදහස් ගත්තේ නැහැ. ආණ්ඩුවෙන් සමහර අවස්ථාවලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට කැඳවලා පොදුවේ අදහස් ගත්තා. නමුත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒක වුණේ නැහැ. ඒ නිසා මේ පිළිබඳව අග්‍රාමාත්‍යතුමා පැහැදිලිවම කියලා තිබුණා, මේ පළාත් පාලන සීමා නිර්ණය කිරීමේදී සියලුම ජනතාවට අසාධාරණයක් වුණා. ලංකාවේ පළාත් පාලන ආයතන 334 න් 212 කට විරුද්ධව මම හිතන්නේ, මේ කොමිෂන් සභාවට පැමිණිලි ලැබිලා තිබෙනවා. පැමිණිලි 2000 කට අධික ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා. ඉතින් ඒ නිසා ඒ අනුව තමයි සර්ව පාක්ෂික කමිටුව රැස් කරලා ජනාධිපතිතුමායි, අගමැතිතුමායි තීන්දුවක් ගත්තේ. මේ දෙන්නාම. ජනාධිපතිවරයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිවරයා. අග්‍රාමාත්‍යවරයා එක්සත් ජාතික පක්ෂයේ නායකයා. මේ දෙන්නාම තමයි තීන්දුවක් ගත්තේ, මේ මැතිවරණ ක්‍රමය නැවතත් සංශෝධනය කර ගන්න ඕනෑය කියලා. ඒ අනුව තමයි මම හිතන්නේ ජූනි මාසේ දක්වා කල් දාලා තිබෙන්නේ.

අපි එකඟයි මේ මැතිවරණය සමානුපාතික ක්‍රමයට තියන්න. අපි අග්‍රාමාත්‍යතුමා සමඟ සාකච්ඡා කරලා අපට පුළුවන් හෙට වුණත්, මේ සමානුපාතික ක්‍රමයට මැතිවරණය තියන්න අවසර ගන්න. ඒ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අපි ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. ඒ නිසා ඔබතුමන්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා ඉතාමත් ඉක්මණින් මේ සමානුපාතික ක්‍රමයට මැතිවරණය පවත්වන්න. කොට්ඨාශ ක්‍රමයට තිබ්බොත් මේ රටේ ජනතාවට විශාල අසාධාරණයක් වෙනවා. මේ කොට්ටාශ සීමා නිර්ණය කළේ, එක්තරා ඇමතිවරයෙකුට අවශ්‍ය විධියට. කාමරයකට ගිහිල්ලා, මේ කාමරයේදී සාකච්ඡා කරලා, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ගෙන්වලා ඒ මන්ත්‍රීවරුන්ට ඕනෑ ආකාරයට තමයි මේ කොට්ඨාශ තීරණය කළේ. නමුත් ඒකට මම හිතනවා,

අපි දැඩි ලෙස විරුද්ධයි. මේ රටේ ජනතාව විරුද්ධයි. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, ඔබතුමා හරහා. මහ ඇමතිතුමා හරහා. මේ කොට්ඨාශ සීමා නිර්ණය කිරීමේ ගැටළුව නිසා තමයි මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමායි, අග්‍රාමාත්‍යතුමායි තීරණය ගත්තේ සැබෑ ජනතා අවශ්‍යතාවය මත කටයුතු කරන්න. ඒ විධියට ඒ කොට්ඨාශ සංශෝධනය කරලා නැවත වතාවක් මේ මැතිවරණය පවත්වන්න. හැබැයි,මම දන්නා ආකාරයට නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම හිතන්නේ කොට්ඨාශ ක්‍රමයට මැතිවරණය තිබ්බොත් අපට ආරංචි මාර්ග අනුව මේ අවුරුද්දේ මැතිවරණය තියන්නේ නැහැ. ඒක ස්ථිරයි. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, සමානුපාතික ක්‍රමයට හරි මේ මැතිවරණය ඉතාමත්ම ඉක්මනට පවත්වලා සැබෑ ජනතා නියෝජිතයින් මම හිතන්නේ, ප්‍රාදේශීය සභාවලට, පළාත් පාලන ආයතනවලට පත් කරන්න. ඒ එක්කම ගරු අග්‍රාමාත්‍යතුමාට මම හිතන්නේ වචනයක් ප්‍රකාශ කළා අපේ කොඩිකාර මැතිතුමා. ඒ පිළිබඳව වහාම හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න. අග්‍රාමාත්‍යතුමා කිසිම හේතුවක් නිසාවත් මැතිවරණය කල් දාන්නේ නැහැ. එතුමා කිව්වේ, මේ පළාත් පාලන මැතිවරණය පිළිබඳව සමානුපාතික ක්‍රමයට අප්‍රේල් මාසේ මැතිවරණය පවත්වනවාය කියලයි. ඒ නිසා ජනාධිපතිතුමා තමයි තීරණයක් ගත්තේ අන්තිමට මේ මැතිවරණය කල් දාන්න. ජාතික ආණ්ඩුවක් තිබෙන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමාත් එක්ක ඔබතුමන්ලා කථා කරන්න. අපි කථා කරන්නම් අපේ පක්ෂයත් එක්ක. මේ සමානුපාතික මැතිවරණ ක්‍රමයට ඉතාමත්ම ඉක්මණින් අප්‍රේල් මාසේ වන කොට මේ මැතිවරණය පවත්වන්නය කියලා අපිත් ඉල්ලීමක් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 01.37]

**ගරු එස්.එම්. සකාවුල්ලා**
Hon. S.M. Sakaulla

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා විසින් ගෙනාපු යෝජනාවට, මමත් පළාත් පාලන ආයතනයක ඉඳලා මේ පළාත් සභාව නියෝජනය කරන්න ආපු මන්ත්‍රීවරයෙක් හැටියට අදහස් ප්‍රකාශ කරන්න කැමැතියි. මොකද, අපේ රටේ ජනාධිපතිතුමා, ඒ වාගේම අගමැතිතුමා, ඒ වාගේම පක්ෂ විපක්ෂ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු වාගේම පළාත් සභා මන්ත්‍රීවරුන්ව පත් කරන්නේ, අද බිම් මට්ටමේ ඉන්න පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයෝ. ඒ වාගේම අපි දන්නවා. අද ඒ බිම් මට්ටමේ ඉන්න පළාත් පාලන නියෝජිතයන්ට වෙලා තිබෙන අන්ත අසරණ තත්ත්වය පිළිබඳව මේ සභාවේ අපේ ගරු මන්ත්‍රීවරුන් අදහස් ප්‍රකාශ කළා. විශේෂයෙන්ම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරයෙක් යම් යම් කරුණු ඉදිරිපත් කළා. ඒ සම්බන්ධව මම වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. මොකද, අපි පළාත් පාලන ආයතනවල ඉන්න කොට මේ සීමා නිර්ණය කිරීමේ කමිෂන් එක හරහා, එහෙම නැත්නම් ඒ අවස්ථාවට හිටපු ආණ්ඩුවේ ඇමතිවරු සම්බන්ධ වෙලා, ඒ තිබුණු ආණ්ඩුවට පක්ෂ ග්‍රාහීව මේ සීමා නිර්ණය කළාය කියන එක මම සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. මොකද, හේතුව ඒ කාල වකවානුවේදී ඒ සීමා නිර්ණය කිරීමේ කටයුතු කරලා ඉවර වෙලා අපිව කැඳෙව්වා, පාර්ලිමේන්තුවට. පාර්ලිමේන්තුවට කැඳවලා අපට පෙන්නුවා සිතියම. ඒ සිතියම පෙන්වලා, යම් යම් නිර්ණායක ඉදිරිපත් කරලා ඒ අනුව අපට ඒක දැක බලා ගන්න විතරයි අවස්ථාව ලැබුණේ. නමුත් අපට කවදාවත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සඳහා යෝජනා අදහස් ලබා දෙන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. මොකද, අපි අපේ ගමේ මැතිවරණය කරන කොට දිනනවාද? පරදිනවාද? ශ්‍රී ලංකා කවුද? යූ.එන්.පී. කවුද? කියලා තීන්දු කරලා, ඡන්දය දිනනවාද නැද්ද කියලා තීරණය කරන්න ඕනෑ අපි. අපි තමයි ඒවා දන්නේ. ඉහළ පැළැන්තිවල ඉන්න, එහෙම නැත්නම් ඉහළ තනතුරුවල ඉන්න මැති ඇමතිවරු දන්නේ නැහැ.

ඒ නිසා අපේ යෝජනා නැතිව හිතුවක්කාර විධියට යම් යම් අවස්ථාවලදී ඒ සීමා නිර්ණය කරලා මේ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ නිසා තමයි අපේ පසුගිය පළාත් පාලන ආයතනවල සභාපතිවරු ගෙදර ගියේ. අයවැය පැරදුනා. සභාපතිවරු ගෙදර ගියා. ගෙදර ගියාට පස්සේ ගෙදර යනවාද? ඒ සභාවේම මන්ත්‍රීවරයෙක් හැටියට පත් වෙනවාද කියන එක ඒ සම්බන්ධයෙන් තිබෙන ලියවිල්ලේ තිබුණේ නැහැ. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යම්කිසි මන්ත්‍රීවරයෙක් ඉල්ලා අස් වුණොත්, එහෙම නැත්නම් මරණයක් වුණොත් ඊළඟ මන්ත්‍රීවරයා පත් වෙන්නේ කොහොමද කියලා ඒ ලියවිල්ලේ තිබුණේ නැහැ. ඒ නිසා ඒ වාගේ ලොකු අඩුපාඩු තිබුණා. නැවත පසුකාලීනව අවුරුද්දකට පස්සේ ඒ සියලු දේවල් නිවැරදි කරලා නැවත සම්මත කරලා, නැවත අයවැය පරාජය නොවන විධියට නැවත ඒ ලියවිල්ල ගෙනැල්ලා

[ගරු එස්.එම්. සකාවුල්ලා]

පාර්ලිමේන්තුවේ සම්මත කළා. ඒ වාගේ විශාල අඩුපාඩු තිබුණා. අපේ රජය තිබුණු කාලයේ අපි ලොකු අපහසුතාවයන්ට පත් වුණා. ඒ නිසා මම විශේෂයෙන් අපේ අදහස් ප්‍රකාශ කරපු මන්ත්‍රීතුමාට කියනවා, පසුගිය රජයේ යම් යම් අයට ඕනෑ විධියට හැදුවා මිසක්, අපේ පල්ලෙහා මට්ටමේ ඉන්න පළාත් පාලන නියෝජිතයන්ගේ අවශ්‍යතාවය සළකා බලලා මේ කටයුතු කළේ නැහැයි කියලා මම විශේෂයෙන් අවධානය යොමු කරනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න ඕනෑ. මොකද, පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට, නියෝජ්‍ය සභාපතිවරුන්ට තිබුණු පර්මිට් එක. අඩු ගණනේ ඒ පර්මිට් එකවත් එතුමන්ලාට ලැබෙන්නට සැලැස්සුවේ නැහැ මේ යහපාලන රජයෙන්. ඒ නිසා මම ඒ ගැන මේ රජයට අවධානය යොමු කරන්න කැමැතියි. ඒ වාගේම මම වැඩිදුර කථා කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පළාත් පාලන ආයතනවල හිටපු අය ලෙස කියන්නේ, අද ගමේ ඉන්න ජනතාව ඉල්ලන්නේ මැතිවරණයක්. ඒ වාගේම ඒක කොට්ඨාශද, ඒක මිශ්‍ර ක්‍රමයක්ද, ඒක සමානුපාතික ක්‍රමයක්ද කියන එක නොවෙයි. මොකද, අද ලයිට් එකක් දා ගන්න, බෝක්කුවක් හදා ගන්න, එහෙම නැත්නම් කසළ ටික බැහැර කර ගන්න අද ජනතාවට අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ නිසා ඒ අයට ශ්‍රී ලංකා හෝ යූ.එන්.පී. හෝ ජනතා විමුක්ති පෙරමුණ හෝ කියලා නොවෙයි. මහජන නියෝජිතයෙකුගේ අවශ්‍යතාවය තමයි තිබෙන්නේ. ඒ නිසා මොන ක්‍රමයකට හරි මේ මැතිවරණ ක්‍රමය පවත්වන්නය කියලා රජයට බල කරමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 01.42]

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sriwaranasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ආයතන සම්බන්ධව අපේ මීට කලින් කථා කරපු මන්ත්‍රීතුමා අවසන් කරපු තැනින් පටන් ගන්න කැමැතියි. දැන් එතුමා කිව්වා කෙසේ හෝ මේ පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතුයි කියලා. කෙසේ හෝ පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතු නැහැ. මක් නිසාද, පසුගිය ජනාධිපතිවරණයේදීත්, ඒ වාගේම පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදීත් මේ රටේ ජනතාව ජනවරමක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම සමාජ අනුමැතියක් ලබා දීලා තිබෙනවා. මැතිවරණ ක්‍රමය සංශෝධනය කරන්න. එය බිම් මට්ටමින් පටන් ගත යුතුයි. ගම් මට්ටමින් පටන් ගත යුතුයි. ඒ බිම් මට්ටමේ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම අවශ්‍යයි. ඒ මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම කඩිමුඩියේ කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ සඳහා ප්‍රජාතන්ත්‍රවාදීව සියලුම දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කරලා එකගතාවයකින්, සම්මුතියකින් එය කළ යුතුයි. මේ මොහොතේදී පළාත් පාලන ආයතන තුළ යම් අරාජික තත්ත්වයක් ඇති වෙලා තිබෙනවාය කියලා සමහරු ප්‍රකාශ කරනවා. මම කියන්න කැමැතියි. උතුරු පළාත් සභාව විසුරුවා හැරලා අවුරුදු ගණනාවක් පැවතුනා. එහි ආණ්ඩුකාරවරයා යටතේ ඒ පළාත් සභාව පාලනය වුණා. ඒ වාගේම කොළඹ මහ නගර සභාව පාලනය වුණා නිලධාරීන් යටතේ. අවශ්‍ය කරන්නේ ජනතාවගේ අභිලාසය, අපේක්ෂාව කුමක්ද? එයට සාධාරණය සහ යුක්තිය ඉෂ්ට කිරීම. එසේ නැතිව කඩිමුඩියේ, හදිසියේ මේ සමානුපාත ක්‍රමය යටතේ මැතිවරණය තියන්න ඕනෑ. එහෙම නැත්නම් කේවල ක්‍රමය යටතේ මැතිවරණය තියන්න ඕනෑ කියලා බෙදීම නොවෙයි. මේ සඳහා වඩා ප්‍රජාතන්ත්‍රවාදී හරයාත්මකව අපට කළ යුතු වෙනස්කම් ටික මේ මැතිවරණ ක්‍රමයේදී අපි කළ යුතුව තිබෙනවා. ඒකයි අවශ්‍යතාවය. ඒ සඳහා ඒ ඒ දේශපාලන පක්ෂවලට තමන්ගේ පටු දේශපාලන න්‍යාය පත්‍රයන් තිබෙන්න පුළුවන්. සමහරුන්ට කඩිමුඩියේ මැතිවරණ පවත්වලා තමන්ගේ දේශපාලන ජයග්‍රහණ සාක්ෂාත් කර ගන්න කල්පනා කරනවා වෙන්න පුළුවන්. ඒ සඳහා කුමන මැතිවරණ ක්‍රමයකින් හෝ ඡන්දය තියන්න ඕනෑය කියන්න පුළුවන්.

ඒ වාගේම මම කියන්න ඕනෑ, තවත් සමහරු හිතනවා, තමන්ට වාසි දායක කාල පරිච්ඡේදයකදී මේ මැතිවරණය තියන්න ඕනෑය කියලා. නමුත් අපි කල්පනා කරන්නේ, ජනවරමට යුක්තිය සහ සාධාරණය ඉෂ්ට කරවා ගැනීම. ඒ සඳහා හරයාත්මකව මේ මැතිවරණ ක්‍රමයේ වෙනසක් කරන්න ඕනෑ. අපි දැක්කා, ඔය බිම් මට්ටමේ ප්‍රජාතන්ත්‍රවාදය තිබුණාය කිව්වාට, ඔය ජනතා නියෝජිතයෝ පසුගිය කාලයේ හැසිරුණු ආකාරය, ක්‍රියාත්මක කරපු ආකාරය. මොන තරම් අශෝභන, අවලස්සන තත්ත්වයට අපේ පළාත් පාලන ආයතනවල සභාපතිවරු කටයුතු කළාද? ඒ වාගේම ඔවුන්ගේ ක්‍රියාකලාපය මොන තරම් අශීලාචාරද කියන එක අපි

දැක්කා. ඒ නිසා ඔය කියන මැතිවරණ ක්‍රමය යටතේ මේ පත් වන ජනතා නියෝජිතයන්ගේ සැබෑ ස්වරූපය පසුගිය පාලන සමයන්වලදී අපි හොඳට දැකලා තිබෙනවා. ඒ නිසා මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතුයි. සැබෑ ජනතා නියෝජිතයන් තෝරා පත් වන ජනතාවගේ උවමනාව ඉෂ්ට වන මැතිවරණ ක්‍රමයක් අපි සාදා ගත යුතුයි. ඒකයි අවශ්‍යතාවය. අන්න ඒ අවශ්‍යතාවය වෙනුවෙන් අපි පෙනී සිටිනවා. ඒ සඳහා අපි කියන්නේ නැහැ මැතිවරණ හැකි තරම් කල් දාන්නය කියලා. නමුත් අප අතර එකගතාවයක්, සම්මුතියක් ඇති කර ගන්න ඕනෑ. එහිදී මේ සියලු පක්ෂ, කණ්ඩායම් සමග සාකච්ඡාවක් කරන්න ඕනෑ.

හිටපු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා මේ සීමා නිර්ණය සකස් කළා. එතුමා කාගෙන්වත් අදහස් විමසුවාද? අපිත් ඒ සාකච්ඡාවලට සහභාගී වුණා. එතුමාට අවශ්‍ය විධියට තමයි එදා ඒ සීමා නිර්ණයන් කළේ. ඒවා පිටුපස තිබුණේ දේශපාලන වුවමනාවන්. හැබැයි, මෙය සිදු විය යුතු වන්නේ, ඒ දේශපාලන වුවමනාවන් මත නොවෙයි. අද කොහොමද අපි බිම් මට්ටමෙන් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්නේ. ඒ සඳහා සුදුසු මැතිවරණ ක්‍රමය කුමක්ද? ඒ සඳහා සමානුපාතික ඡන්ද ක්‍රමයද? එහෙම නැත්නම් කොට්ඨාශ ඡන්ද ක්‍රමයද? ඒ දෙකේම සම්මිශ්‍රණයක්ද? වඩා සුදුසු කුමක්ද කියන එක පිළිබඳව අපි සාකච්ඡා කරලා තීරණය කරන්න ඕනෑ. ඒ නිසා මේ රටට අවශ්‍ය කරන්නේ, බිම් මට්ටමින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළක්. අන්න ඒ වැඩ පිළිවෙළ සඳහා අපි පෙනී සිටිනවා. ඒ සඳහා ජනවරමක් තිබෙනවා. අන්න ඒ ජනවරම ඉදිරියට ගෙනියන්න, ඒ ජනවරම ශක්තිමත් කරන්න පුළුවන් ආකාරයෙන් මැතිවරණ ක්‍රමයක් යටතේ තමයි පළාත් පාලන මැතිවරණය පැවැත්විය යුතු වන්නේ. එසේ නැතිව වෙනත් පටු දේශපාලන න්‍යාය පත්‍ර ඔස්සේ මේ හදිසියේ මැතිවරණය පැවැත්විය යුතුයි කියලා කවුරු හරි යෝජනා කරනවා නම්, ඒකට අපි එකග වෙන්නේ නැහැ. ඒ වාගේම අපි කියන්න ඕනෑ. මේකට යම් යම් හේතු කාරණා දක්වමින් මැතිවරණය කල් දාන්න නොවෙයි. හැකි තරම් ඉක්මණින් අපි අතර එකගතාවයක්, සම්මුතියක් ඇති කර ගන්න අපි සියලු දෙනාම කටයුතු කරමු. අන්න එවැනි මැතිවරණ ක්‍රමයක් ඇතුලේ පළාත් පාලන මැතිවරණය පවත්වන්න මේ සභාවේ සියලු දෙනාගේ එකගතාවය සහ කැමැත්ත පළ කරන්නය කියලා මම ඉල්ලා සිටිනවා.

[අ.භා. 01.48]

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ මිත්‍ර මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් අපි නම් කැමැතිම දෙයක් ඉක්මණට ඡන්දයට යන්න ඕනෑ කියන එක. අපි දන්නවා. අපේ නායක ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා පාර්ලිමේන්තුවේදීත් විශේෂ ප්‍රකාශයක් කරලා කිව්වා, අප්‍රේල් මාසේ සිංහල අවුරුද්දට කලින් අපි පළාත් පාලන ඡන්දයට යනවාය කියලා. ඒක කාටවත් නැහැයි බැහැයි කියලා කියන්න බැහැ. විවෘතව තමයි කිව්වේ අපි ඡන්දයක් තියනවාය කියලා. එක්සත් ජාතික පක්ෂයට කොට්ඨාශ ක්‍රමය හරි, මනාප ක්‍රමයට හරි, අපට ඕනෑ ඡන්දයට යන්න. මෙතැන මන්ත්‍රී කණ්ඩායම කථා කරපු විධියට අපි ඡන්දයට භය නැහැ. යූ.එන්.පී. කාරයෝ. මෙතැන එක්සත් ජාතික පෙරමුණ කියලා පක්ෂ හතරක් පහක් ඉන්නවා. ආණ්ඩුව පැත්තේ වාඩි වෙලා ඉන්නේ. එහෙම නැත්නම් ඡන්දයක් එන කොට එක්සත් ජාතික පෙරමුණට තමයි ඒගොල්ලනුත් එන්නේ. අද මහ ඇමතිතුමාගෙන් වරප්‍රසාද ගන්න, මහ ඇමතිතුමාගෙන් උදව් ගන්න ඒ කට්ටිය ගිහිල්ලා ඒ පැත්තේ වාඩි වෙලා ඉන්නවා. ඒගොල්ලන්ගේ නායකයෝ ටික, ඒගොල්ලන්ගේ හැම එක්කෙනාම ඉන්නේ ඇමති මණ්ඩලයේ. එක්සත් ජාතික පෙරමුණේ ඇමති මණ්ඩලයේ ඉන්න කට්ටිය. ඒත් අද මහ ඇමතිතුමාගේ ළගට කිට්ටු වෙලා අපි යහපාලන ආණ්ඩුවට මහ ඇමතිතුමාට සපෝට් කරනවාය කියලා ළග වාඩි වෙලා ඉන්නවා. මොකද, වරප්‍රසාද ටික අරගෙන ඒගොල්ලන්ට තිබෙන දේවල් ඔක්කොම උදුරා ගන්න. අපි එහෙම නොවෙයි. එක්සත් ජාතික පක්ෂය කියලා අපට ප්‍රතිපත්තියක් තිබෙනවා. අපි එක්සත් ජාතික පාක්ෂිකයෝ. කවදා ඡන්දයට ගියත් අපි ඡන්දයට යන්න භය නැහැ. කොයි ක්‍රමයට ගියත් අපි ඡන්දය දිනනවා. මට මතකයි. මීට පෙර කථා කරපු සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කිව්වා - මේක ඇවිල්ලා ස්ටූඩියෝ එකක් කරලා.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ජනාධිපතිවරණයට ඔක්කොම එකතු වෙලා ගියේ. පොඩි භයක් තිබුණා තනිවම යන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම හිතන්නේ, මේ යෝජනාව ගෙනාවේ මගේ හිතමිත්‍ර මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේක දැන් ස්ටූඩියෝ එකක් කරලා තිබෙන්නේ. අද රට ඕගොල්ලන්ට සිරස නාලිකාව ඔස්සේ බලන්න පුළුවන්. මගේ මිත්‍ර සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමයි, සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමයි ඒ දෙන්නා විතරයි නළුවෝ.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

දෙන්නයි පෙන්වන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

දැන් ඒක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මෙතැන තිබෙන ප්‍රශ්නය මේක නොවෙයි. කැමරාව දැක්කා නම් එක්සත් ජාතික පක්ෂයට, අපේ නායකතුමාට, ජනාධිපතිතුමා හැම එක්කෙනාටම ගහන්නේ මොකද? අද රෑට ඒක ටීවී එකේ Headline එකේ එන්න ඕනෑ. මම දන්නවා, මේ යෝජනාවට සභාවේ ඉන්න මන්ත්‍රී කණ්ඩායමේ විස්සක් තිහක් විතර අද කථා කළා. මමත් හැමදාම ටීවී එක ගිහිල්ලා බලනවා. අපි යනවාද නැත්නම් කවුරු හරිද කියලා - මගේ නෝනා හැමදාම අහනවා ඔයා මොකද -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙතුමාට අපි එක්ක නොවෙයි ප්‍රශ්නය තිබුණේ. මුජිබූර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාත් එක්ක.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මීට කලින් මේ ආසනයේම තමයි වාඩි වෙලා හිටියේ මගේ හිත මිත්‍ර අද පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීතුමා. අද මේ සෙල්ලමම දාලා නේ පාර්ලිමේන්තු ගියේ. මම කියන්නේ මේක පළාත් සභාව. මම මීට කලිනුත් විශේෂ ප්‍රකාශයක් කරලා අපි මේක ඇතුළට යෝජනාවක් ගේන්න ඕනෑය කියලා මම කියලා තිබෙනවා. මීට කලින් ආපු මහ ඇමතිතුමාටත් මම කියලා තිබෙනවා. අපේ ඉන්න මහ ඇමතිතුමාටත් කියනවා. මේක සාධාරණය ඉෂ්ට කරන්න. මේක ස්වර්ණවාහිනිය හරි රූපවාහිනිය හරි මොනවා හරි ගේනවා නම්, ඒ දෙන්නාට විතරක් තත්පර ගානක් දීලා මේක පොම්ප් කරන්න එපා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මෙතුමා අද කථා කරන්නේම ඕක කියන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මේ පළාත් සභාවේ 2014 අයවැය යෝජනාවේදී දවස් පහේම පෙන්නුවේ මගේ මිත්‍රයාව තමයි. හැමදාම වාගේ ටීවී එකේ පෙන්නුවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ප්‍රශ්නය තිබුණේ මුජිබූර් රහුමාන් එක්ක. දැන් මුජිබූර් රහුමාන් නැහැ නේ?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඉතින් මේක මම කියන්නේ, පළාත් පාලන ඡන්දය කල් දාන්න කියලා අපට වුවමනාවක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගිය ආණ්ඩුවේ අවුරුදු 20 ක් ආණ්ඩු බලය තිබුණා. පළාත් පාලන ඡන්දය කොහොමද තිබුණේ. එක පළාතකවත් එකට තිබ්බාද? ඒගොල්ලන්ට වුවමනා විධියට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

හැබැයි ඡන්දය තිබ්බා නේ?

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඕගොල්ලෝ බයේ ඡන්ද කල් දානවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

පළාත් පාලන ඡන්දය, සෙක්ෂන් 18 කට කඩලා ඡන්දය තිබ්බා. (බාධා කිරීම්) එක්සත් ජාතික පෙරමුණ. ඇයි

මේගොල්ලන්ට පුළුවන් නේ? මේ ඡන්ද කල් දැම්මේ කවුද? ඒගොල්ලන්ගේ ජනාධිපතිතුමා. අපෙත් ජනාධිපතිතුමා. අපි තමයි ජනාධිපතිතුමාව පත් කළේ, යහපාලනයෙන්. ඒගොල්ලන්ගේ ජනාධිපතිතුමා. ඒගොල්ලන්ට පුළුවන් නේ ජනාධිපතිතුමාට කථා කරන්න. පළාත් සභා හා පළාත් පාලන ඇමතිතුමා කවුද? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ෆයිසර් මුස්තාපා. ඇයි එහෙම නම් මෙතැන යෝජනා ගෙනැල්ලා -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඒගොල්ලන්ගෙන් ඇහුවාම කියනවා අගමැතිතුමා එපා කියනවා කියලා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

දෙකම ඒගොල්ලන්ට කළා.

[සභාවේ ඝෝෂා]

පළාත් පාලන ඡන්දයට යන්න. (බාධා කිරීම්) අපේ අගමැතිතුමා, අපේ නායකතුමා මේ රටේ නැති වෙලාකව තමයි මේ ඡන්දය කල් දැම්මේ. මහ නගර සභාවලටත්, නගර සභාවලටත් මාස හයක කාලය දුන්නේ. ඒ නිසා මම කියන්නේ, මේක නිකම් ස්ටූඩියෝ එකක් කර ගන්නේ නැතුව මේක ඇතුළේ තව කොපමණ දේවල් අපට කථා කරන්න තිබෙනවාද? (බාධා කිරීමක්) මගේ වරප්‍රසාද ප්‍රශ්නයක් කථා කරන්න මෙතැන අධ්‍යාපන ඇමැතිතුමා නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඉන්නවා. ඉන්නවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අධ්‍යාපන ඇමැතිතුමා කෝ? උදේ 10.30 ට සීට් එකෙන් නැඟිටලා ගියා. 01.30 වනකල් අධ්‍යාපන ඇමැතිතුමා මෙතැන නැහැ. අධ්‍යාපනය ගැන කථා කරන්න අධ්‍යාපන ඇමැතිතුමා නැහැ. ඉතින් මෙතැනට ඇවිල්ලා අපට තිබෙන වරප්‍රසාද, අපට තිබෙන ප්‍රශ්න ගැන කථා කරන්න ඇමැති කෙනෙක් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා උදෙන් එන්න එපැයි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

උදේ හිටියාට වැඩක් නැහැ. දැන් අපට කථා කරන්න, පැය තුන හතරක් තිස්සේ ඇමැතිතුමා මෙතැන නැහැ නේ? අධ්‍යාපනයේ ප්‍රශ්න ගැන කථා කරන්න. අපට වරප්‍රසාද අදින්න තිබෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

උදේ හිටියා. එතුමා රැස්වීමකට ගියා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

එතුමාට ඡන්දය දීලා මෙතැනට එවලා තිබෙන්නේ. අවුරුදු 05 ක් -

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

මහ ඇමැතිතුමාට කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කථා කරන්න ප්‍රධාන ඇමැතිතුමා ඉන්නවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අපි කියන්නේ, පළාත් සභාව, පළාත් පාලනය හොඳ දෙයක් තමයි. අධ්‍යාපන ඇමැතිතුමා තව ඇමැති කෙනෙක් නේ? මහ ඇමැතිතුමා - අර වරප්‍රසාද කියන පොඩි කෑල්ල මම මෙතැන ගන්න ඕනෑ. ඒක නිසා අපට එපා කියලා අපි කියන්නේ නැහැ. අපට ඕනෑ ඡන්ද තියන්න තමයි. අපි ඡන්දවලට ආසයි. මහ ඡන්දයේදී අපි දින්නා. පළාත් පාලන ඡන්දය තිබ්බා නම් අපි දිනනවා. ඔබතුමන්ලා කවුරුත් හිතන්න එපා, 90% ක් අපි දිනලා ඉවරයි කියලා.

[ගරු එම්.එස්.එම්. ෆයිරොස්]

ඔයගොල්ලන්ට එන්න පක්ෂයක් නැහැ. සිරසේ රට පෙන්නනලා M මහින්ද. B බැසිල්. G ගෝඨාභය. මේක මොකක්ද? විහිළුවක්ද?

[සභාවේ ඝෝෂා]

සලකුණක් නැහැ. ඔබතුමන්ලාට ඕනෑ ඡන්ද කාලේ තව දික් කරන්න. ඒක නිසා නිකම් බොරුව මෙතැන ගෙනියන්නේ නැතුව ඇත්ත කථා කරන්න.

[සභාවේ ඝෝෂා]

හැකි ඉක්මණින් ඡන්දය තියන්න කියමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාගෙන් අවසරයි. ඒ වාගේම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන. පළමුවෙන්ම කියන්න කැමැතියි අපි කථා කළාට පළාත් සභාවේ ගණපූරණය නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***පළාත් සභාව ගණන් කොට ගණපූරණය නොමැති බව පෙනීගියෙන් කැඳවීම් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී. පසුව ගණපූරණය ඇති විය.***

*Provincial council counted, and a Quorum not being present, the Division bells were ordered to be rung, Later, a Quorum being present.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සභාවේ ගණපූරණය සම්පූර්ණයි. දැන් ඔබතුමිය කථා කරන්න.

[අ.භා. 01.59]

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වෙලාව වෙන් කර දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම අපි අද පළාත් පාලන මැතිවරණය ගැන කථා කරනවා. හැබැයි පළාත් සභා ගැන ඊට වැඩිය දේවල් කථා කරන්න තිබෙනවා. ජනවාරි මාසේ කථා කරපු දේවල් දෙසැම්බර් වනකල් වුණේ නැති විශාල ප්‍රමාණයක් පළාත් සභාව ඇතුළේ තිබෙනවා. පළාත් පාලන නියෝජිතවරයෝ පත් කිරීම ගැන කථා කරනවා. ඒ නියෝජිතවරයෝ කොපමණ දේවල් කරනවාද කියන එක ගැන මම හිතන්නේ පසුගිය වසර කිහිපය තුළ අපි දැනුවත් වුණා. විශේෂයෙන්ම කාන්තාවක් විධියට හරියට පළාත් පාලන මැතිවරණය තියන්නේ නැතුව, හරි හමන් පළාත් පාලන නියෝජිතයෝ නැතුව, කාන්තාවන් සියයක් දූෂණය කරපු සභාපතිවරු හිටපු පළාත් පාලනයක් තමයි අපට තිබුණේ. ගස් කපපු. හොර වැඩ කරපු. අපි දැක්කා. පසුගිය දවස්වල පත්තරවල තිබුණේ පළාත් පාලන ආයතනවල කරපු නරකම දේවල්. වැරැදි වැඩිපුරම කළේ පළාත් පාලන නියෝජිතයෝ. මේ දේශපාලනයේ ගෞරවය නැති කළේ, වැඩිපුරම පළාත් පාලන නියෝජිතයෝ. හැම කෙනෙක්ම නොවෙයි. හොඳ අය හිටියා. වැඩ කරපු අය හිටියා. නමුත් දේශපාලඥයාගේ ගෞරවය නැති වන විශාල වැඩ කොටසක් කරලා තිබෙන්නේ, පළාත් පාලන ආයතනවල ඉන්න සභාපතිවරු තමයි. අපි ඒ ගැන කනගාටුවට පත් වෙනවා.

ඒ නිසා අපි පවතින රජයෙන්, විපක්ෂයෙන් දේශපාලන ක්ෂේත්‍රයේ ඉන්න හැම කෙනෙකුගෙන්ම ඉල්ලන්නේ, තියන්නත් වාලේ පළාත් පාලන මැතිවරණ තියලා වැඩක් නැහැ. පළාත් පාලන මැතිවරණයක් තියනවා නම්, එහි සංශෝධනය විය යුතු දේවල් සියල්ල සංශෝධනය වෙලා හරිහමන් විධියට ජනතාවට ගරු සේවයක් වන - ජා-ඇළ ආසනයේ ඉස්සර සභාපති හිටියාට වැඩිය දැන් වැඩ කරනවා. කොමසාරිස්තුමිය එක්ක හරියට කථා කළොත් එතුමිය හරියට වැඩ ටික කරලා දෙනවා. ලයිට් ටික දාලා තිබෙනවා. සමහර සභාපතිවරු පත් වුණාට පස්සේ පත් වෙන පක්ෂයට විතරයි වැඩ කරන්නේ. ආසනයේ ඉන්න සියලුම අයට වැඩ කරන අය ඉතාමත් අඩුයි. එහෙම වෙන්න බැහැ. සභාවක නගරාධිපති කෙනෙක්, සභාපති කෙනෙක් කියන්නේ, ඒ ආසනය තුළ ඉන්න පක්ෂ විපක්ෂ සියලු දෙනාට සේවය කළ යුතුයි. එවැනි හරිහමන් පළාත් සභාවක් නගර සභාවක් මේ රට තුළ හැදෙන්න ඕනෑ. පසුගිය වසර කිහිපය තුළ වාගේ ජරාජීර්ණ වූ පළාත් පාලනයක් මේ රටට අවශ්‍ය නැහැ. ඒ නිසා

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ කාලේ මෙතුමිය හිටියේ කොහේද දන්නේ නැහැ.

**ගරු නිරෝෂා අතුකෝරල**
Hon. Nirosha Athukorala

ඒ කාලේ මම හිටියේ යාපනේ. ඒ කියන එක මම මේ පළාත් සභාවෙන් ඉල්ලා සිටිනවා. හැබැයි ඉතින් අපි මේ පළාත් සභාව තුළ මෙවැනි යෝජනා විවාද කරලා තිබෙනවා. මම හිතන්නේ එකක්වත් අද වනකල් නම් ඉෂ්ට වෙලා නැහැ. කථා කරනවා විතරයි. කථා කරන දේවල් අහන්න විපක්ෂයත් නැහැ. ආණ්ඩු පක්ෂයත් නැහැ. (බාධා කිරීම්) ඒ නිසා අපි ඉල්ලා සිටින්නේ, මේ රටට ගරු සේවයක්. මහජන නියෝජිතයෙක් කියන්නේ, ඉතාම වටිනා පුද්ගලයෙක්. ලෝකයේ නැවක් ගිලෙන වෙලාවට පුංචි දරුවෙක් හිටියත්, මහජන නියෝජිතයෙක් හිටියත් බේර ගන්නේ මහජන නියෝජිතයා. මොකද, දරුවා නොවෙයි. මහජන නියෝජිතයෙක් කියන්නේ ඒ තරම් වටිනා දෙයක්, ගරු සේවයක්. ඒ ගරු සේවයට ගැළපෙන ගරු පුද්ගලයෝ මේ ආයතනය තුළ ස්ථාපිත නොකළොත් එහෙම අපේ දේශපාලන නායකයන් පිරිහී යන බව අපට අවධානයෙන් කියන්න සිද්ධ වෙනවා. ගිය කාලය තුළම සිද්ධ වුණේ මේ නිසා. ඒ නිසා යහපාලනය තුළ යහපත් පාලනයක් මේ රටට උදා කරන්න ඕනෑ, මේ පළාත් පාලන මැතිවරණයෙන් කියන එකයි මම යෝජනා කරන්නේ.

විශේෂයෙන්ම කාන්තාවන්ට ගරු කරන පිරිමින් දේශපාලන ක්ෂේත්‍රයට එනවා නම් කාන්තාවන්ට දේශපාලනය කිරීම ඉතාම යහපත් විධියට කරන්න පුළුවන්. අද කාන්තා දේශපාලනය මේ රට තුළ ඉතාමත් අඩුයි. මොකද, පුරුෂාධිපත්‍ය නිසා කාන්තාවන්ට දේශපාලනය කරන්න ඉතාමත් අපහසුතාවයක් තිබෙන නිසා කාන්තාවන්ට ගරු කරන පිරිමින් පළාත් පාලනයට ආවොත් අපට වැඩ කරන්න ඉතාම පහසුයි. ඒ නිසා එවැනි පුද්ගලයන්ව දේශපාලන ක්ෂේත්‍රයට ගේන්න කියන එක ඉල්ලා සිටිනවා. සියලු දෙනාටම ස්තූතිවන්ත වෙනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

***[නැඟී සිටියේය. ]***
*[Stood.]*

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මම මේ වරප්‍රසාද ප්‍රශ්නය මෙපමණ පරක්කු වෙලා ගත්තේ අපේ අධ්‍යාපන ඇමැතිතුමා මෙතැන නැති නිසා. ඇත්තටම කොළඹ කලාප කාර්යාලයේදී ව්‍යුහ කමිටුව අපි තීන්දුවක් අරගෙන තිබුණා 08 වැනිදා, ඊයේ උදේ පළමුවැනි ශ්‍රේණියට ළමුන් ගන්න රැස්වීමක් තියෙනවා කියලා. ව්‍යුහ කමිටුවේ සභාපතිතුමා මෙතැන ඉන්නවා. ඊයේ උදේ 08.00 ට විතර කොළඹ අධ්‍යාපන කාර්යාලයෙන් මට Call එකක් ආවා. මන්ත්‍රීතුමා අද රැස්වීම Cancel. වෙන දවසක රැස්වීම තියෙනවා. ඔබතුමා ඊට කැඳවනවා කියලා. මේ කථාව මම මෙතැන කියන්නේ, බස්නාහිර පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරු 104 දෙනාටම බලපාන දෙයක්. මේක මගේ වරප්‍රසාද ප්‍රශ්නයක් විතරක් නොවෙයි. මේක හැම කෙනාගේම, මහ ඇමැතිතුමාගේත් වරප්‍රසාද ප්‍රශ්නයක්. මේක මම කථා කරන්න ගත්තේ අධ්‍යාපන ඇමැතිතුමා විෂයය භාර ඇමැතිතුමා නිසා. ව්‍යුහ කමිටුවෙන් අපට කියපු නිසා අපි ඊයේ රැස්වීමට ගියේ නැහැ. ඊයේ 02.00 ට විතර -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා කෙටියෙන් කියන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඇමැතිතුමා මගේ ප්‍රශ්නය අහලා උත්තර දෙන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට කෙටියෙන් කියන්න ඕනෑත් නැහැ. දිගට කියන්න ඕනෑත් නැහැ. මට තේරෙන්නේ නැහැ එතුමා මොකක්ද කියන්නේ කියලා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මම තේරෙන භාෂාවෙන් කියන්නම්.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

පොඩ්ඩක් ඉන්න. ඕක මුල ඉඳලා කියන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

හරි. මම ඒක කියන්න තමයි පටන් ගත්තේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ ප්‍රශ්නය කෙටියෙන් කියන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට විතරක් නොවෙයි. මහ ඇමැතිතුමාටත්, කාටවත් ඔබතුමා කියන එක තේරිලා නැහැ. පැහැදිලි කරලා දෙන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගරු ඇමැතිතුමා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක්. මන්ත්‍රීතුමා කියනවා. මේක තේරෙන ආකාරයෙන් ඇහුම්කන් දෙන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඔබතුමන්ලා මේක කනේ දාගන්න කෝ? මම කියන දේ හොඳට තේරුම් ගන්න පුළුවන් නේ ඇමැතිතුමා. හැම කෙනාගේම මේසේ Head Phone තිබෙනවා නේ? ව්‍යුහ කමිටුවේදී අපට ගිය රැස්වීමේදී කිව්වා 08 වැනිදා උදේ රැස්වීමක් තියෙනවා. පළමුවැනි ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ ප්‍රශ්න සම්බන්ධව කියලා. ඊයේ උදේ මට කොළඹ කාර්යාලයෙන් Call එකක් එනවා. කොළඹ අධ්‍යාපන කාර්යාලයේ අධ්‍යක්ෂතුමා කියලා. ඊයේ අර රැස්වීම Cancel කියලා. මන්ත්‍රීතුමා එන්න එපා. රැස්වීම අද නැහැ කියලා. ඊට පස්සේ මට දැන ගන්න ලැබුණා, ඊයේ දවල් 02.00 වනකොට එතැන රැස්වීම තියලා තිබුණා. ව්‍යුහ කමිටුවේ සභාපතිතුමයි, අර්ෂාඩ් මන්ත්‍රීතුමායි එතැන ඉඳලා තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් එතැන ඉඳගෙන එම ළමයින්ගේ දෙමව්පියන් එතැනට ගෙනැල්ලා, ඒ මන්ත්‍රීතුමා මේ ටික භාර අරගෙන තිබෙනවා. ඉතින් මම අහන්නේ මේක ඇවිල්ලා ඒ.ඊ. ගුණසිංහ විද්‍යාලයේ-

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ඕක ෆායිස් මන්ත්‍රීතුමාගේ වැඩක්ද? අර්ෂාඩ් මන්ත්‍රීතුමාගේ වැඩක්ද?

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

නැහැ, නැහැ. ඇමැතිතුමා මේක බස්නාහිර පළාත් සභාව. මේ පළාත් සභාවට ගරුත්වයක් තිබෙනවා. මේ පළාත් සභාවේ තිබෙන ගරුත්වය අපි නැති කර ගන්න හොඳ නැහැ. අපට තිබෙන බලතල අපි පාවිච්චි කරන්න ඕනෑ. අපට බැහැ මේක පාර්ලිමේන්තුවට උකස් තියන්න. ඒක කරන්න ඉඩ දෙන්න බැහැ. අපි උදේ 08.30 වනකොට මෙතැන වාඩි වෙලා 02.00, 02.30 වනකල් කෑම කන්නේ නැතුව මෙතැනට වෙලා වැඩ කරන්නේ මොකටද? නැත්නම් අපට මෙතැනට එන්න අවශ්‍යතාවයක් නැහැ. අපි වැඩියෙන්ම බලාපොරොත්තු වුණා දක්ෂ අධ්‍යාපන ඇමැතිවරයෙක් අපට ලැබෙයි කියලා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට තේරෙනවා. වෙලාව ඉතුරු කරමුද?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා දැන් ප්‍රශ්නය පැහැදිලියි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

තව තියෙනවා. ප්‍රශ්නය ඉවර කරන්න දෙන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

විනාඩියක් දෙන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මට ප්‍රශ්නය ඉවර කරන්න දෙන්න ඕනෑ. එතකොට තමයි මට උත්තරය බලාපොරොත්තු වෙන්න පුළුවන්. මේ කලාප

අධ්‍යක්ෂතුමා ඇයි මේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාව ඔතැනට ගෙනැල්ලා කටයුතු කරන්නේ? මේ ෆාතිමා ඉස්කෝලය, කහිරියා ඉස්කෝලය - ෆාතිමා ඉස්කෝලයට දාන ළමයින්ගෙන් ළමයි 167 ක් Reject වෙලා තිබෙනවා. කහිරියා ඉස්කෝලේ ළමුන් අනූ ගණනක් Reject වෙලා තිබෙනවා. ඒ දෙමව්පියෝ ටික ගෙනැල්ලා - අපට ව්‍යුහ කමිටුව ගැන විශ්වාසයක් තිබෙනවා. මගේ ලේකම්තුමා, ෆායිස් මන්ත්‍රීතුමා අද එතැන සභාපතිතුමා වුණු එක ගැන මට සන්තෝෂයි. මේ සභාවේ මම අවුරුදු 13 ක් ඉන්නවා. ඒ මන්ත්‍රීතුමාටත් අවුරුදු හතරකට, පහකට කලින් මම මේ සභාවට ඇවිල්ලා වාඩි වුණු කෙනෙක්. අධ්‍යාපන ඇමැතිතුමා කිව්වා ෆායිස් මන්ත්‍රීතුමා ව්‍යුහ කමිටුවේ සභාපති කළා කියලා. මම සන්තෝෂ වුණා. අපට වැඩ කරන්න කවුරු හිටියත් අපට කමක් නැහැ. මම කියන්නේ ඇයි මේ අපව අසරණ කරලා, අපව අයින් කරලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඔළුවේ තියාගෙන නටන්නේ? මේකේ මොනවාද තියෙන්නේ? ගිය සිකුරාදා - (බාධා කිරීමක්)

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

සංවිධායකතුමා ඔබතුමා මේක විසඳන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ගිය සිකුරාදා සුගතදාස ක්‍රීඩාංගණයේ ෆාතිමා විද්‍යාලයේ උත්සවය. 2016 ක්‍රීඩා උත්සවය පටන් ගත්තා. උදේ 07.00 ට පටන් ගත්තා. මට ආරාධනා පත්‍රය ලැබුණේ 02.30 ට එන්න කියලා. එතැනට ගිය ගමන් එක කොලේම නෝට් 02 ක් ගහලා තිබෙනවා. 02.30 ට ෆයිරෝස් මන්ත්‍රීතුමා ආරාධිත අමුත්තා. 04.00 ට මුජිබුර් මන්ත්‍රීතුමා, ෆායිස් මන්ත්‍රීතුමා ආරාධිත අමුත්තෝ. එකම උත්සවය පැය 02 යි. මම අහන්නේ විළුවක්ද කරන්නේ? ඉස්කෝලේ ළමයින්වත් මෝඩයාට අන්දවනවා නේ? මම යනකොටත් මේ ළමයි බැන්ඩ් ගහනවා. උදේ අව්වේ වේලි වේලි ඉඳලා. මමත් සිංහ කොඩිය උස්සනවා. ඊළඟට මේ අයත් සිංහ කොඩිය උස්සනවා. මටත් ජාතික ගීය ගායනවා කරනවා. මේ අයටත් ජාතික ගීය ගායනා කරනවා. විදුහල්පතිවරු මොකක්ද මේ කරන්නේ? මම අහන්නේ මේ මොකක්ද කරන්නේ? අසරණ ළමයින්. (බාධා කිරීමක්) අධ්‍යාපන ඇමැතිතුමා මේක පොඩ්ඩක් තේරුම් ගන්න. පළාත් සභාවේ ගරුත්වය නැති කර ගන්න එපා. බස්නාහිර පළාත් සභාව කියන්නේ, පාර්ලිමේන්තුවට පස්සේ තිබෙන්නේ බස්නාහිර පළාත් සභාව.

[සභාවේ ඝෝෂා]

මේක විළුවක් කර ගන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමන්ලා පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම කනගාටුව පළ කරනවා මගේ කල්‍යාණ මිත්‍ර එතුමා ලංකාවට සීනි නොගෙන ආවොත්, පරිප්පු නොගෙන ආවොත් අපට සීනිත් නැහැ. පරිප්පුත් නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි අල, ලූණු?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම නැති වෙලාවේ මට පරිප්පු බෙදපු එක ගැන මම පළමුවෙන්ම කනගාටුව පළ කරනවා. ඒ නිසා මොහොමඩ් ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා දන්නවා මම කොතරම් සංවේදීව එතුමාට කන් දෙනවාද කියලා. මට ඔය මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්න, ෆායිස් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්න මේ ගෙදර ආරවුල් ඔක්කෝම මට කියනවා. මම ඒවා කවදාවත් හෙළි කරන්නේ නැහැ. හෙළි කළොත් මේගොල්ලෝ එළියේදී ගහගන්නවා. මම හෙළි කරන්නේ නැහැ. දැනුත් අවංකව කියනවා. හැබැයි මම ඔබතුමාගේ හඬට සවන් දීලා එක තීන්දුවක් ගන්නවා. මීට පස්සේ කලාපයේ ඉන්න සියලුම පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වයෙන් පමණක් ව්‍යුහ කමිටුව රැස් කරන්න කියලා. බොහොම ස්තුතියි.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

අද 02.30 ට රැස්වීමක් තියෙනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අද තියෙන ඒවා ඕනෑ දෙයක් තියා ගත්තදෙන්. අද 02.30 ට තියන්න බැහැ. අද කලාප අධ්‍යක්ෂතුමන්ලා මම එනකල් මගේ අමාත්‍යාංශයේ බලාගෙන ඉන්නවා. එතුමන්ලා එතැනට එන්න ඕනෑ.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේ වැරැදි අවබෝධයක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් ඒක නිවැරැදි වෙනවා. නැවත -

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

මේකේ පුංචි වැරැද්දක් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ආයිත් කථා කරන්න දෙන්න බැහැ.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

අපි නිවැරැදි කළා නේ?

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

වැරැදි අවබෝධයක් තිබෙනවා. ව්‍යුහ කමිටුවට මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා පැමිණිලා නැහැ. ව්‍යුහ කමිටුවෙන් ගෙන්නලා නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් ඇමැතිතුමා කිව්වේ ගෙන්නන්න එපා කියලා.

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

අපි අධ්‍යක්ෂතුමාට කියලා තිබෙනවා සියලුම මන්ත්‍රීවරුන් දැනුවත් කරන්න කියලා. කවදාවත් ව්‍යුහ කමිටුවට මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඇවිල්ලා නැහැ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ව්‍යුහ කමිටුවේ ගත්ත තීන්දුව තමයි පළමුවැනි ශ්‍රේණියට අර ඉස්කෝල දෙකට දාන්න බැරි ළමයි ටික අටවැනිදා ගෙනැල්ලා ඉස්කෝල වෙන්න කරන්න ඕනෑ කියලා. ඇයි මට බොරු කියලා මාව නතර කරලා එතුමාව එතැනට ගෙනාවේ. කවුද ඒක කළේ? ඒ තුප්පහි වැඩ කරපු මිනිහා කවුද?

**ගරු මොහොමඩ් ෆායිස්**
Hon. Mohamed Faiz

ඒක අධ්‍යක්ෂතුමා තමයි කරලා තිබෙන්නේ. ඒක අධ්‍යක්ෂතුමාගේ වැරැද්දක්. එතුමාට අපි කියලා තිබෙනවා ඔක්කෝටම කියන්න කියලා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් හරි. ඇමැතිතුමා නියෝගයක් දුන්නා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

මීට පස්සේ අපි ව්‍යුහ කමිටුවට යන්නේ නැහැ. එතැන සාධාරණයක් වෙන්නේ නැහැ. මම මීට කලිනුත් ඇවිල්ලා අයවැය කථාවේදී කිව්වා. කොළඹ කලාප කාර්යාලයේ අධ්‍යක්ෂතුමා ඇවිල්ලා එක පැත්තකට අදිනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාව ඔළුවේ තියාගෙන එතුමා නටන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මන්ත්‍රීතුමා, දැන් ඇමැතිතුමා විසඳුමක් දෙනවා.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

කොළඹ දිස්ත්‍රික්කයේ ඉන්න අක්‍රම් ඇමැතිතුමාව අද වනකල් කැඳවලා ලියුමක් ඇරියේ නැහැ. කෝල් එකක් දුන්නේ නැහැ. අසාධාරණයක් කරන්න එපා.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

මේක මැද කොළඹ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රශ්නයක්. මැද කොළඹ එකතු වෙලා සංවිධායකතුමා මේක විසඳන්න.

[සභාවේ ඝෝෂා]

අගමැතිතුමාට කියලා මේකට විසඳුමක් දෙන්න.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

පක්ෂ පාට නැතුව වැඩ කරන්න පුළුවන් කෙනෙක් දාන්න ඕනෑ.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න. මට ප්‍රශ්නයක් තිබෙන්නේ මම විශ්වාස කළා ෆයිරෝස් මන්ත්‍රීතුමා කිසි දවසක මුසාවක් නොකියාවි කියලා. අද එතුමා පහු වෙලා ඇවිල්ලා මට චෝදනා කරලා තිබෙනවා. මම උදේ ඉඳලා මෙතැන හිටියා. මම එළියේ හිටියේ නිකම් නොවෙයි. මම බෙල් එකට දුවගෙන ආවා. එතකොට මම කවදාවත් තමුන්නාන්සේට විරුද්ධවවත්, කන් නොදීවත් කරලා නැහැ. දැන් එක ඉවරයි. ඊළඟ එක තමයි. අදින් පස්සේ මම නියෝගයක් දෙනවා පළාත් සභා මන්ත්‍රීතුමන්ලා සෑම අයම කලාපයේ ව්‍යුහ කමිටුවට අනිවාර්යයෙන්ම කැඳවලා මීට පස්සේ සාකච්ඡාව තියන්න කියලා. ඒකට පාර්ලිමේන්තුව නියෝජනය කරන අය කැඳවන්න එපා කියනවා. ඒ වාගේම ඒවායේ නායකත්වය දරන ජ්‍යෝෂ්ටත්වය සහ තනතුරට ප්‍රධාන කොට ඇති කෙනා තමයි ව්‍යුහ කමිටුවේ සභාපති ධූරයට අපි වාඩි කරවන්නේ.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

ඔබතුමා කියන එක මම පිළිගන්නවා. ඔබතුමා කියන එකට ඇත්ත වශයෙන්ම අපි සන්තෝෂ වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මගේ කනගාටුවක් තිබෙනවා මොහොමඩ් ෆයිරෝස් ගරු මන්ත්‍රීතුමා මට එහෙම චෝදනා කරපු එක ගැන.

**ගරු එම්.එස්.එම්. ෆයිරෝස්**
Hon. M.S.M. Fairoz

නැහැ, ඇමැතිතුමා අපි අසරණ වෙලා ඉන්නේ. (බාධා කිරීම්) ළමයින්ව ඉස්කෝලේ දාගන්න රැස්වීමට සංවිධායකවරයාත් ඇවිල්ලා. ඇමැතිතුමා දුක තේරුම් ගන්න ඕනෑ. මේ වෙන දේවල්වලට අපි කොපමණ අසරණ වෙනවාද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ළමයින් දාන ප්‍රශ්නය අපි මැදිහත් වෙලා, සාකච්ඡා කරලා, ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ඔබතුමා දන්නවා. දැන් කන්ටේනර්වල ළමයින් ඉන්නවා. මම ඇමැතිවරයා හැටියට ඇස් පියාගෙන ඉන්නේ නැහැ. නමුත් මට සමහර ඒවාට ක්ෂණික උත්තර දෙන්න බැහැ. මගේ අමාත්‍යාංශයේ නිලධාරීන් එක්ක සාකච්ඡා කරලා විධිමත් උත්තරයක් දෙන්න ඕනෑ. ඒකට කලබල වෙන්න එපා. ඒක ඉතාම නිවැරදිව අපෙන් කෙරෙනවා. කිසි දේකට සැකයක් හිතන්න එපා. අපි ඒ විධියට වැඩ කරගෙන යමු. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 02.14]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාලය වෙන් කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා මේ සභාවට ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව ඉතාම වැදගත් කාලෝචිත යෝජනාවක්. මේ සභාවේ අදහස් දැක්වීමේදී සඳහන් වුණා, අදහසක් මතු වුණා, වර්තමානය වනකොට ප්‍රාදේශීය සභාවල නිලධාරීන්ගේ සේවාව මහජන නියෝජිතයන්ගේ සේවාවට වඩා ඉතා හොඳයි කියලා. මම දන්නේ නැහැ මොන අදහසින් මේක කියනවාද කියලා. ප්‍රාදේශීය සභාවකින් සිද්ධ වන සේවාවල් පිළිබඳව තිබෙන අවබෝධය ඒකෙන්ම හිතාගන්න පුළුවන්, මොනතරම්ද කියන කාරණාව. ප්‍රාදේශීය සභාවක ඉන්න මහජන නියෝජිතයින්, ප්‍රාදේශීය සභාවක සිදු වන සේවාව පිළිබඳව අපි සඳහන් කරන්නේ, උපතේ සිට මරණය දක්වා සියලුම සේවාවල් ප්‍රාදේශීය සභාවකින් ප්‍රදේශයේ ජනතාවට සිද්ධ වෙනවා කියලා අපි විශ්වාස කරනවා. එහෙම බැලුවාම මහජන නියෝජිතයෝ ජනතාව පිළිබඳව සංවේදීව, නීති රීතිත් එක්ක ජනතාවගේ අවශ්‍යතා ඉෂ්ට කරන්න මහජන නියෝජිතයෝ මොන තරම් උත්සුක වෙනවාද, සංවේදී වෙනවාද, කැප වෙනවාද කියන කාරණාව ප්‍රාදේශීය සභාවක හිටපු සභාපතිවරයෙක් හැටියට

[ගරු ගුණසිරි ජයනාත්]

මමත්, මූලාසනයේ ඉන්න ඔබතුමා හොඳින්ම දන්න කාරණයක්.

ප්‍රාදේශීය සභාවක මහජන නියෝජිතයෝ නොමැති අඩුව අද මොනතරම් දුරට ප්‍රායෝගික මේ සේවාවේ තිබෙන වැදගත්කම අවබෝධ කරගත්තොත් මේ සභාවේ ඉන්න අති බහුතරයක් මහජන නියෝජිතයෝ හොඳින්ම දන්නවා. හැබැයි ඒ මහජනතාවගේ ප්‍රායෝගිකව තිබෙන ගැටළු පිළිබඳව මහ පොළොවේ ගැටළුව අවබෝධ කර නොගත්තු හැබැයි, ඉහළින් උඩින් ජීවත් වන සුළුතරයක් මේක හරියට අවබෝධ කරගෙන නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ නිසා තමයි හෙළ උරුමය නියෝජන කරන හිටපු ඇමැතිතුමාත්, මන්ත්‍රීතුමියත් මේ සභාවේ අදහස් දක්වලා සභාවෙන් එළියට බැහැලා ගියේ. මේකේ ප්‍රායෝගික තත්ත්වය නොදන්න කුහකකමින් කටයුතු කළ නිසයි කියන කාරණාව මම මේ වෙලාවේ ඔබතුමා මගින් ඒ අයට දැනුම් දෙන්න කැමැතියි.

විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා විසුරුවා හැරලා අවුරුද්දකට ආසන්න කාලයක් වෙනවා. ජනතාවට වග කියන පාලනයක් නොමැති තත්ත්වයකට ප්‍රාදේශීය සභා පත් වෙලා තිබෙනවා. අපි දන්නවා නිලධාරීන් හරහා - අපි සියලු දෙනාට දොස් කියන්නේ නැහැ. මේ නිලධාරී පාලනය හරහා ජනතාවගේ අවශ්‍යතා සියයට සියයක් ඉෂ්ට වෙන්නේ නැහැ. එක උදාහරණයක් හැටියට කිව්වොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම නියෝජනය කරන බියගම ප්‍රාදේශීය සභාව හරහා අද ජනතාව ඉතාම අපහසුතාවයකට පත් වෙලා තිබෙනවා, නිවසක් හදාගන්න ගොඩනැගිලි අයදුම් පත්‍රය අනුමත කර ගන්න ගියාම. අද නිලධාරීන්ගේ ග්‍රහණයට හසු වෙලා තිබෙනවා. මම මේක අපේ ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ පළාත් පාලන උපදේශක කාරක සභාවේදීත් කිව්වා. කෙටි උදාහරණයක්. ප්‍රධාන අමාත්‍යාංශයේ ඉන්න නීති නිලධාරිතුමියගේ ඥාතියෙකුගේ ගොඩනැගිලි අයදුම් පත්‍රයක් බියගම ප්‍රාදේශීය සභාවෙන් අනුමත කර ගන්න ගියාම සිද්ධ වුණු අකරතැබ්බය. සැලසුම් කමිටුවට එනවා නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරිවරයෙක්. ඔහු ප්‍රකාශ කරලා තිබෙනවා, මේක මට අනුමත කරන්නත් පුළුවන්. නැත්නම් නිකම් ඉන්නත් පුළුවන් කියලා. ඔන්න නිලධාරිවරුන් හරහා සේවාව සපයා ගන්න යැමේදී සිද්ධ වන ප්‍රායෝගික තත්ත්වය. හැබැයි සභාපතිවරයා සහ මහජන නියෝජිතයෝ, මන්ත්‍රීවරු මේ සභාවේ හිටියා නම් නිලධාරීන් ඔහොම ප්‍රකාශ කරන්නේ නැහැ. මේක තමයි අද මහජන නියෝජිතයෝ නැති ප්‍රාදේශීය සභාවට අත්පත් වෙලා තිබෙන තත්ත්වය. මේක තමයි ඉරණම. ඒක නිසා කවුරු හරි කියනවා නම් නිලධාරිවරුන් හරහා ජනතාවට වඩා සේවයක් සිද්ධ වෙනවා කියන එක මම නම් කිසිසේත් පිළිගන්නේ නැහැ.

වර්තමාන ආණ්ඩුව යහපාලනය කිව්වාට යහපාලනයක් නොවෙයි සිද්ධ වෙන්නේ. යහපාලනය නම් යහපාලනය වචනයේ අර්ථය නම් ඒ අර්ථය අනුව සේවාවන් සිද්ධ වෙන්න ඕනෑ. මම දන්නේ නැහැ මේ සභාවේ අදහස් ප්‍රකාශ වුණු හැටියට එක අවස්ථාවක සඳහන් වුණා අගමැතිතුමා ඡන්දය තියන්න එකඟයි. ජනාධිපතිතුමා මේකට එකඟ නැහැයි කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපතිතුමා වර්තමාන ජනාධිපතිතුමා. අපි දන්නේ නැහැ එතුමා විරුද්ධද කියලා. නමුත් එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් සඳහන් කළා, අගමැතිතුමා එකඟයි. ජනාධිපතිතුමා විරුද්ධයි කියලා. හැබැයි කිසි අවස්ථාවක අගමැතිතුමා නිල වශයෙන් මාධ්‍ය හරහාවත් ප්‍රකාශයක් කරලා නැහැ. ඒ නිසා ඒ ප්‍රකාශය අපට පිළිගන්න බැහැ.

එක්සත් ජාතික පක්ෂයේ විපක්ෂ නායකතුමා නැහැ. විපක්ෂයේ සංවිධායකතුමා මේ වෙලාවේ ඉන්නවා. එහෙම නම් අගමැතිතුමා නිල ප්‍රකාශයක් මේ රටට දෙන්න. පළාත් පාලන ඡන්දය තියන්න. මම එකඟයි. නමුත් රටේ ජනාධිපතිතුමා තවම එකඟත්වය දුන්නේ නැහැයි කියලා. ඔබතුමා හරහා විපක්ෂයේ සංවිධායකතුමා දැනුවත් කරනවා. ඒ ප්‍රකාශය අගමැතිතුමා හරහා රටට දෙන්න. එහෙම නැතුව බොරු කියන්න එපා. බොරු කියලා මේ පළාත් සභාවත්, ජනතාවත් නොමඟ යවන්න එපා. අද ඇත්ත සිද්ධිය සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. මහ පොළොවේ තිබෙන ගැටළුව. වර්තමාන සමාජයේ තිබෙන ගැටළුව. මැතිවරණයක් තිබ්බොත් කොට්ඨාශ ක්‍රමයට වෙන්නේ මොකක්ද කියන එක අද අවබෝධයක් හැම කෙනාටම තිබෙනවා. මනාප ක්‍රමයේදී වෙන්න මොකක්ද කියන එකත් අපි කාටවත් අවබෝධය තිබෙනවා. ඒ නිසා බොරු නොකර සැබෑවට යහපාලනයක් බලාපොරොත්තු වෙනවා නම්, යහපාලනය අනුව කථා කරනවා නම් මේ පළාත් පාලන මැතිවරණය තියලා මහජන නියෝජිතයෝ ඒවාට පත් කරගෙන පළාත් පාලන ආයතන සක්‍රීයව, ජනතාවට වග කියන සේවාවන් සපයන ආයතන

බවට පරිවර්තනය කරන්න කියන කාරණාව අපි මේ වෙලාවේ මතක් කරනවා.

ඒ වාගේම හෙළ උරුමයේ මන්ත්‍රීතුමිය මැරිලා උපන්නා වාගේ කථා කළා. ඇයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම එහෙම කියන්නේ ? පසුගිය පාලන සමයේ හිටපු සභාපතිවරු, මනත්‍රීවරු සේවාවන් සපයපු විධිය ගැන විවරණයක් කළා. ඒගොල්ලෝ කොහේද හිටියේ? යාපනේ. ඒගොල්ලෝ කොහේද හිටියේ? මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ ආණ්ඩුවේ ඇමැතිවරු. එතකොට බුදියගෙනද හිටියේ? දැන්ද ඇහැරිලා තියෙන්නේ? දැන් ඇහැරිලා. මේ පළාත් සභාවට ඉල්ලුවේ සන්ධානයෙන්. අද ඒ මන්ත්‍රී ආසන දෙකේ ඉඳගෙන ඉන්නේ එක්සත් ජනතා නිදහස් සන්ධානයේ මහින්ද රාජපක්ෂට පිංසිද්ධ වෙන්න, මේකෙන් ඉල්ලලා. (බාධා කිරීමක්) දෙන්නම එළියට බැහැලා ගියා. මම දන්නේ නැහැ මොකට ගියාද කියලා. දෙන්නම එකට ගියේ. ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් මම ප්‍රශ්නයක් යොමු කරනවා. නිශාන්ත වර්ණසිංහ හිටපු ඇමැතිවරයා මාධ්‍ය හරහා ප්‍රකාශයක් කළා, බස්නාහිර පළාත් සභාවේ ඒගොල්ලෝ ඉන්නේ ස්වාධීනවයි කියලා. මම ඔබතුමා හරහා ලේකම්තුමාට මේ ප්‍රශ්නය යොමු කරන්නේ. එතුමන්ලා ස්වාධීනව නම් මේ පළාත් සභාවේ ඉන්නේ. ඒ නිසා ආණ්ඩු පක්ෂයේ ඉන්න බැහැ. ඒ නිසි ආසනය ඊළඟ සභා වාරයේදී ඒ අයට සපයලා දෙන්න. නිසි තැන. ඒක ඔබතුමා හරහා ලේකම්තුමාට ඒ ප්‍රශ්නය යොමු කරනවා. ඒ ගැන ඊළඟ සභාවේ කටයුතු කරන්න කියන කාරණාව මතක් කරමින් යහපාලන ආණ්ඩුවට අපි ආරාධනා කරනවා. කියන ආකාරයෙන් යහපාලනයක් කරනවා නම් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා මාධ්‍ය හරහා එහෙම ප්‍රකාශයක් කරලා තිබෙනවා නම්, ඒ මාධ්‍ය ප්‍රකාශ කරපු දැන්වීම් පත්‍රිකාව සභාවට ඉදිරිපත් කරන්න කියලා මම මේ අවස්ථාවේ ඉල්ලනවා.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

හරි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමාට ඒක ඉදිරිපත් කරනවා. යහපාලන ආණ්ඩුව රටේ ජනතාවට යහපාලනයක් ගේනවා නම්, දිගින් දිගටම පළාත් පාලන මැතිවරණය කල් දාන්නේ නැතුව එළැඹෙන ආසන්නම දිනයේ පළාත් පාලන මැතිවරණයට දින තබලා මහජනතාගේ ජනතා බලය උරගා බලන්නය කියලා යහපාලන ආණ්ඩුවට අපි ආරාධනා කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 02.22]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද දින අපේ මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාවට කථා කරන්න ලැබීම ගැන වඩාත් සන්තෝෂ වෙනවා. ඇත්ත වශයෙන්ම අද පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු නැති වීම, හුඟක් අඩුපාඩුවක් ලෙස දැනුනත්, සමහර පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරු හිටියත්, සමහර දේවල් මහජන නියෝජිතයන්ගෙන් සේවාවන් නිසි ලෙස ඉටු වෙනවා කියන එක මට කොහොමත් පිළිගන්නත් බැහැ. සමහර මන්ත්‍රීවරුන්ගේ නිවෙස්වල වීදි ලාම්පු තියාගෙන මහජන සේවාවන් කරන්නේ, එතුමන්ලාට හිතුනු කාලයට පමණයි. නමුත් දැන් අලුත් පළාත් පාලන ආයතන නීතිය අනුව, කොට්ඨාශ ක්‍රමය හුඳුන්වා දීපු අවස්ථාවක මම හිතනවා, ඒකේදී බැලූ බැල්මට කොට්ඨාශයේ ග්‍රාම වසම, සමහර තැන්වල ග්‍රාම වසමත් වෙනස් කරලා තිබෙනවා. ඒ වාගේම සුළු පක්ෂ, සුළු ජාතීන් නියෝජනය වන විධියට ඒක හරි ගස්සලා නැහැ. නමුත් එක පක්ෂයකට විතරක් පාලනය තුළ රැඳීමට එය හදලා තිබෙනවා. මම හොඳින් ඒ ගැන අවබෝධයෙන් බැලුවාම ඒක එක පක්ෂයකට පමණක් පාලනය එන විධියට තමයි ඕක හදලා තිබෙන්නේ. නමුත් සුළු පක්ෂ, සුළු ජාතීන්ට එන විධිය බොහොම අමාරු තත්ත්වයකට හදලා තිබෙනවා. ඒ මායිම හරියට නිවැරැදි කරන්න ඕනෑය කියන එකයි මගේ බලාපොරොත්තුව.

ඒ වාගේම තමයි මේ තුළ මාධ්‍ය ප්‍රශ්නය කථා කළා. දැන් මාධ්‍ය ප්‍රශ්නය ඇත්ත වශයෙන්ම මේ රට තුළ ඉන්න ජනතාව අතර බලන කොට 65% ක්ම නරක තත්ත්වයට තමයි අද පත් වෙලා තිබෙන්නේ. ඒ කියන්නේ, උසස් මට්ටමේ ඉඳලා පල්ලෙහා මට්ටම එනතුරු. ඒ කියන්නේ හැම වර්ගයේම බලන කොට මුදල්වලට තමයි මූලිකත්වය අද දරන්නේ. නමුත් මේ ජනතාව අතරත්, දේශපාලකයන් අතරත් බලාපොරොත්තු වෙන්නේ බලය කොහොමද අත්පත් කරගෙන, තමන් බලයට පත් වෙලා, තමන් මේ රට පාලනය කරලා, මුදල් හම්බ කරන්න පුළුවන් තැනකට

[ගරු එම්. ෂාෆි රහීම්]

තමයි දැන් මේ රට යොමු වී ගෙන යන්නේ. රටේ පාලනයත් වෙනස් කරන්න, විදේශ බලවේග මේ රට තුළට ඇවිල්ලා එක එක විදේශ බලවේග හරහා තමයි මේ රට පාලනය කරන තත්ත්වයට උදා වෙලා තිබෙන්නේ. නමුත් අපි නිවැරැදිව, අපි සෑම දෙනාම මේ පළාත් සභාව තුළ බස්නාහිර පළාත් සභාවේ අපි 104 දෙනෙක් පත් වෙලා අපි හිතන්න ඕනෑ, රට වෙනුවෙන් රටේ යහපත වෙනුවෙන් ජනතාවට මොන වාගේ සේවාවක්ද කරන්න පුළුවන්ද කියලා. අපි හතරට පහට කැඩිලා තමන්ට වාසිය ගන්න, තමන්ට රටේ නායකත්වය ගන්න, තමන්ට අග්‍රාමාත්‍ය තනතුර ගන්න, ඒ වාගේම මේ අමාත්‍ය ධූරයන් ගන්න අපි කේලම් කියලා එක එක්කෙනා වෙන් කරලා, මේ රටේ අපි එක එක විධියට වැඩ කටයුතු නොකර අපි බලාපොරොත්තු වෙන්න ඕනෑ, මේ එක්සත් රටේ අපි මේ දේශය තවත් රටවල්වලට වඩා ඉහළ තත්ත්වයට ගෙන යන්න පුළුවන් ආකාරයට අපි සෑම දෙනාම එක් රැස් වී වැඩ කටයුතු කරන්න ඕනෑ. ඒකේදී තමයි අපට මේ රටේ ඉන්න ජනතාව වෙනුවෙන් සේවාව කරන්න පුළුවන් වෙන්නේ. එය අපට තිබෙන කාලය තුළ අපි අනිවාර්යයෙන්ම කළ යුතුයි. එම නිසා අපි මේකේදී බලාපොරොත්තු වෙන්නේ හැකි ඉක්මණින් ජනතාවට මැතිවරණය අත්‍යවශ්‍යයි. මැතිවරණය නිසි ලෙස නිවැරැදි කාලය තුළ කරන්න ඕනෑ. නමුත් පළාත් පාලනය මේ අලුත් ක්‍රමයට තියෙනවා නම්, අපටත් සුළු පක්ෂවලටත්, සුළු ජාතීන්ටත් අනික් පක්ෂවලටත් - එක පක්ෂයක් විතරක් දිනීමට මේක හදපු නිසා, මේක නිවැරැදි ලෙස හදන්න තවත් කාලයක් ගියත්, මාසයක් දෙකක් ගියත්, මෙය නිවැරැදි ලෙස හදන්න මේ ගැන අවධානය යොමු කරලා, මේ බුද්ධිමතුන් සෑම දෙනාම එක් රැස් වෙලා මෙය නිවැරැදි කළ යුතුයි.

මම ගිය මාසයේ විතර ප්‍රාදේශීය ලේකම්තුමන්ලාගෙන් මේ ගැන විස්තර අහන කොට ප්‍රාදේශීය ලේකම්තුමන්ලාටත් මේ ගැන කිසිම අවබෝධයක් නැහැ. හැම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලන කොට ඒ ලේකම්තුමන්ලා කියනවා, මේ ගැන මම දන්නේ නැහැ කියලා. බොහොම අමාරුවෙන් සමහර විස්තර ගන්න අපට උදා වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි ගම්පහ දිස්ත්‍රික්කයේ පැලියගොඩ UC එකේ, වත්තල UC එකේ හදලා තිබෙන මැප් එකේ සමහර ග්‍රාම සේවා වසම් වෙනස් කරලා තිබෙනවා. නමුත් මේ ගැන මම දිසාපතිතුමා එක්ක, මේ සම්බන්ධව ඉන්න ලේකම්තුමාත් එක්ක කථා කරපුවාම කිව්වා, තවම අපි මේ ගැන තීරණයක් අරගෙන නැහැ. මේ තීරණය අරගන්න තවම කාලයක් යයි කියලා එතුමන්ලා කිව්වා. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේකේදී අපි සෑම දෙනාම පක්ෂ විපක්ෂ නැතිව එක් රැස් වෙලා මේ රටේ, මේ බස්නාහිර පළාත් සභාවේ ඉන්න පළාත් සභා මන්ත්‍රීවරු සෑම දෙනාම එකතු වෙලා මේ රටේ දියුණුව සඳහා අපි සෑම දෙනාම එකමුතු වෙලාවැඩ කරමුයි කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 02.28]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පිළිතුරු කථාව ලෙස දීර්ඝ කථාවක් කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. මම පළමුවෙන්ම කියන්න ඕනෑ. මෙතැන මේ වේලාවේ නොසිටියත් සියලුම මන්ත්‍රීවරු 21 කට ආසන්න පිරිසක් ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලු ගරු මන්ත්‍රීවරු මේ ගැන සාකච්ඡා කළා. ඒ සියලු දෙනාටම බොහොම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාත්, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමාත් මේ සභාවේ කථා කෙරුවා, මේ පළාත් පාලන ආයතන සහ මේ ඡන්දය පැවැත්වීමේදී කාලයෙන් කාලයට පවත්වනවා කියලා. ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, මේක ඔබතුමාගේ පැත්තෙනුත් කිව්වා. නමුත් මේක පැහැදිලිව කියන්න ඕනෑ. 1988 පළාත් සභා පිහිටුවාට පසු 1993 නැවත පළාත් සභා ඡන්දය පවත්වන කොට එවකට හිටිය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තමයි කොටස් වශයෙන් ඡන්ද තියන්න පටන් ගත්තේ. අපට හොඳට මතකයි. බස්නාහිර පළාතේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනිය අපේක්ෂිකාව හැටියට ඉල්ලන කොට බස්නාහිර පළාත වෙනම පැවැත් වුවා. ඒ වාගේම දකුණු පළාත වෙනම පැවැත් වුවා. ඒ කාලයේ පැවැත් වූවාට පසු තමයි දිගින් දිගටම, එම පක්ෂයත් ඒ වාගේම අපේ ආණ්ඩු පක්ෂයත් ඒ වාගේ කැල්ලෙන් කැල්ලට පත් කෙරුවා. නමුත් අද වන කොට සියලුම ප්‍රාදේශීය සභා, නගර සභා විසුරුවලා අහවරයි. කාලය ඉවරයි. මේ පළාතේ ගත්තොත් 40 ක කාල සීමාව අහවරයි. අවසන් කාලය ඉවරයි. ඒ වාගේම අනිකුත් ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා අවේම කාලය අහවරයි. කාලය අවසානයි. ඒ නිසා අද ලංකාවේ තිබෙන සියලුම පළාත් පාලන ආයතන හැටියට මහ නගර

සභා, නගර සභා, ප්‍රාදේශීය සභාවන්හි අවුරුදු 04 ක කාලය අවසානයි. කාලය අවසන් නිසා සියලුම මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා එකට තියන්න පුළුවන්. ඒ එක පැත්තක්.

ඒ වාගේම තවත් පැත්තකින් ගත්තොත් ඉතිහාසයේ මීට පෙර පාර්ලමේන්තුව, පළාත් සභාව මේ වාගේ කල් දාලා තිබෙනවා. පාර්ලිමේන්තුව අවුරුද්දකට කල් තබලා තිබෙනවා. ඒ වාගේම පළාත් සභාව කල් තබලා තිබෙනවා. ප්‍රාදේශීය සභාවත් අවුරුද්දකට කල් තබන්න පුළුවන් අවස්ථාව තිබෙන කොට තමයි මේ ප්‍රාදේශීය සභා කාලය අවසන් කෙරුවේ. අපේ ගිය රජය කාලයේ මේ වාගේ අවුරුද්දක කාලසීමාව දික් කරලා තිබෙනවා. නමුත් අද වන විට ඒ කාල සීමාව දික් කෙරුවේ නැහැ. ඒ නිසා අපි දන්නවා, පාර්ලිමේන්තුවේ ඉන්නේ රටක් හැටියට, රටට වග කියන්න අමාත්‍යාංශ හා විෂයයන්වලට වග කියන්න. පළාත් සභා තිබෙන්නේ දිස්ත්‍රික්ක තුනට වග කියන්න. හැබැයි, මේ පළාත් පාලන ආයතනය තිබෙන්නේ තමුන්ගේ ගමේ, කොට්ඨාශයේ මහජනතාවට වග කියන ආයතනයක් හැටියට.

ඒ නිසා අත්‍යවශ්‍යම ආයතනය තමයි, ගමට වග කියන ආයතනය තමයි ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා. ඒ නිසා අපි විශ්වාස කරනවා, අද මේ ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලු ගරු මන්ත්‍රීවරු ඒකමතිකව මේ ගැන කථා කළා. අඩුපාඩු කථා කළා. මෙහි ඉන්න වැඩි බහුතරයක්, කථා කරපු අයගෙන් 90% ක් ප්‍රාදේශීය සභා, නගර සභාවලින් මෙතැනට පත් වුණු මන්ත්‍රීවරු. අර ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමා කියපු විධියට මේ ගැන අවබෝධයක් නැතිව කථා කෙරුවා නම්, ඒ අය ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභාවල නොසිටිය මන්ත්‍රීවරු. මොකද ඒ ගැන දන්නේ නැහැ. ඒ ගොල්ලෝ එක කාලයකට ප්‍රාදේශීය සභා සභාපතිවරුත් එක්ක එකට ඉඳලා වැඩ කරලා, වැඩ නොවුණා කියලා අද කියනවා, ප්‍රාදේශීය සභාපති නැති වුණාම වැඩ කරගන්න පුළුවන් කියලා. ඒ කාලයේ ආණ්ඩුවත් තිබුණා. ඒ වාගේම සභාපති හිටියා. හැබැයි, ඒ ආණ්ඩුවෙන්ම තමයි ඡන්දය ඉල්ලලා පත් වුණේ. ඊට පස්සේ නැවත එක්සත් ජාතික පෙරමුණට ගිහිල්ලා වෙනම පැති වලින් ඡන්දය ඉල්ලනවා. අද නැවත ඇවිල්ලා මෙතැන වාඩි වෙලා ඉන්නවා. ඒ වාගේ ප්‍රතිපත්තියක් නැතිව එක් එක් පැත්තට ගිහිල්ලා - අද කථා කරන කොටම තේරෙනවා. ප්‍රාදේශීය සභාව ගැන, නගර සභාව ගැන අවබෝධයක් නැතිවයි කථා කරන්නේ කියලා. ඒ නිසා මම මීට වැඩිය දීර්ඝව කථා කරන්නේ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි මේ යෝජනාව ගෙනාවේ මේක අත්‍යවශ්‍ය දෙයක් නිසා. බස්නාහිර පළාතේ මේ තිබෙන ප්‍රධාන ආයතන 48 ම වගකියන්න ඕනෑ, පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා හැටියට ප්‍රධාන අමාත්‍යවරයා. එතුමාට වගකීමක් තිබෙනවා. ඒ වාගේම යම්කිසි ගමක, ප්‍රාදේශීය මට්ටමේ මහජනයාට අසාධාරණයක් වුණාම, ඒ වෙනුවෙන් පෙනී සිටින්න පුළුවන් වෙලා තිබෙන්නේ, අද පළාත් සභා මන්ත්‍රීවරයාට. මොකද, පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයාට අයිති නිසා. ඒ නිසා ඔබතුමාගේ මාර්ගයෙන් අපි එතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ ගැන ජනාධිපතිතුමාටත්, ඒ වාගේම ආණ්ඩුවටත් මතක් කරලා මේ ඡන්දය පවත්වන්න, ක්‍රියාත්මක කරන්න, ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න නම් මේ ඡන්දය පවත්වලා ඉක්මණින් ක්‍රියාත්මක කරන්නය කියලා අපි ඉල්ලා සිටිනවා. බොහොම ස්තූතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මෙරිල් පෙරේරා ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරු 21 දෙනෙක් කථා කළේ පළාත් පාලන ආයතනවල තිබෙන වැදගත්කම, වටිනාකම මහජනතාවට තදින් දැනෙන නිසා කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා එම යෝජනාවට මම හිතන්නේ කවුරුත් එකඟතාවය මතයි කථා කළේ. එම යෝජනාව සම්බන්ධයෙන් එකඟතාවය විමසනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. දැන් මම මීට පෙරත් මෙය කිව්වා. මේකට වැඩ පිළිවෙළක් හදන්නය කියලා. දැන් මේ වාගේ අත්‍යවශ්‍ය යෝජනා, රීති අත්හිටුවලා යෝජනා ඉදිරිපත් කරනවා. සභා ලේකම් කාර්යාලයේ මන්ත්‍රීවරු පෞද්ගලික මන්ත්‍රී යෝජනා හැටියට ඉදිරිපත් කරපු යෝජනා පෙළක් තිබෙනවා. මම යෝජනාව දාලා දැන් අවුරුද්දක්, එකහාමාරක් විතර වෙනවා. තවමත් ඒ යෝජනාව ගත්තේ නැහැ. ඊට පස්සේ ඉස්සරහාට එම

[ගරු ලලිත් එල්ලාවල]

යෝජනා ඉදිරිපත් කරන කොට ඒවා කල් ඉකුත් වූ යෝජනා වෙනවා. ඉතින් ඒක නිසා කරුණාකරලා - මේ වාගේ අත්‍යවශ්‍ය යෝජනා ගෙනෙන්නත් ඕනෑ. හැබැයි, පැහැදිලිවම ඒවාට වැඩ පිළිවෙළක් හදන්න. ඒ යෝජනා සභාවේ ගන්න. මම මේ දෙවැනි වතාවට කියන්නේ. තුන්වැනි වතාවේ කියන්නේ නැහැ. තුන් වැනි වතාවේ අපි ක්‍රියාමාර්ගයක් ගන්නවා. මේ යෝජනා දාපු අය පෙළට බලාගෙන ඉන්නවා. මම එදත් කිව්වා, මේකට වැඩ පිළිවෙළක් හදන්නය කියලා. ඒ නිසා මම පැහැදිලිව කියන්නේ, ඒක අපට කරන ලොකු අසාධාරණයක්.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හෙට සභා කටයුතු කාරක සභාවට ඔබතුමාගේ අදහස ඉදිරිපත් කරනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒකට ඉක්මණ් වැඩ පිළිවෙළක් ගන්නය කියලා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තූතියි.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.34 ට, 2016 පෙබරවාරි මස 23 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Accordingly, the Provincial Council was adjourned at 02.34 a.m till 09.30 a.m, on 23.02.2016*